

පාසල 4

# 01

ඩැරල් රිවර්ස් දැඩි සොම්නසට පත්ව සිටියා. එය ඇගේ බෝඩිං පාසල, මැලෝරි ටවර්ස් බලා ආපසු යන දිනයයි. එමෙන්ම මෙවර ඈ ඇගේ කුඩා නැගණිය, ෆෙලිසිටි ද කැටුව යනවා.

“අපි මේ සැරේ කාර් එකේ නොගිහින් කෝච්චියේ යන එක හොඳයි.” ඩැරල් කිව්වා. “ඔයත් අනිත් ළමයි එක්ක යන නිසා කීපදෙනෙක්ම අඳුනා ගන්න පුළුවන් වෙයි. සැලී යන්නෙත් කෝච්චියේ.”

සැලී ඩැරල්ගේ හොඳම මිතුරියයි. ඇගේ පළමු වාරයේ සිට වසර හතරක පමණ කාලයක් ඔවුන් ඉඳ තිබුණේ එකටයි.

“මම හිතනවා සැලී වගේ යාළුවෙක් මටත් ලැබෙයි කියලා.” ෆෙලිසිටි මඳ ලැජ්ජාවකින් කිව්වා. “මම ඔයාට වඩා ලැජ්ජයි ඩැරල්, මම දන්නවා කවුරුත් එක්ක කතා කරන්න තරම් ධෛර්යයක් මට නැහැ කියලා ! අනික මිස් පොට්ස් මා එක්ක තරහා වුණොත් මම පොළොව පළාගෙන යනවා !”

පොට්ස් ගුරුතුමිය පළමු පන්තිය භාර මෙන්ම ඩැරල්ගේ නිදන කාමර මෙන්ම ෆෙලිසිටිට ද යන්න සිදුවන නිදන කාමර ඇති උතුරු කුලුනේ නිවාස භාර ගුරුතුමියයි.

සාමාන්‍යයෙන් කොන්වෝල්සිහි මැලෝරි ටවර්ස් බලා ඔවුන් ගියේ මෝටර් රථයෙන්. මෙවර එය අපහසු නිසා රිවර්ස් මහතා ඔවුන්ව ලන්ඩන් බලා කැටුව ගොස් ඔවුන්ව පාසල් දුම්රියෙන් පිටත් කර හරිනවා. මින් පෙර සමහර විටක ෆෙලිසිටි ද තම සොහොයුරියව දුම්රියපොළ දක්වා කැටුව විත් පිටත්ව යන අයුරු දැක තිබුණ අතර දුම්රිය වේදිකාවේ සිනාසෙමින් දොඩමළුව සිටි දැරියන් දැක බියට

පත්ව තිබුණා. මෙවර ඇය ද ඉන් එක් අයෙකු වීමට යනවා ! තම ටෙනිස් පිත්ත බඳා ගත් ඈ එළඹෙන වාරය ගැන සතුටින් සිතුවා.

ඔවුන් මෝටර් රථයෙන් ලන්ඩන් බලා පිටත් වුණා. තම නිවස දර්ශනයෙන් අතුරුදහන් වන විට ෆෙලිසිටිගේ හදවතට දුකක් ඇති වුණා. ඇයට එය නැවත දකින්න ලැබෙන්නේ තවත් පූර්ණ තෙමසකින් පසුවයි. පසුව ඩැරල් දැරියන් ගැන කියන්නට වූ හෙයින් ඈ සතුටු සිතක් මවා ගත්තා.

"මම හිතන්නේ විල් සහෝදරයෝ හත් දෙනා එක්ක අශ්වයෝ පිට එයි කියලා." ඈ කිව්වා. "එයාලා ඉස්කෝල පාර දිගේ එද්දි බලන්න ලස්සනයි. පළමු වාරයේදී එයා තාත්තා එක්ක කාර් එකෙන් එන්න තීරණය කරලා තිබුණත් එයා එයාගේ අශ්වයා, තන්ඩර් අරගෙන සහෝදරයෝ හත් දෙනා එක්ක අශ්වයෝ පිට ආවේ."

"විල්ගේ නියම නම විල්හෙල්මිනා නේද ?" මතක් කරමින් ෆෙලිසිටි කිව්වා. "ගුරුවරුන් එයාට කියන්නේ විල් කියලා ද ?"

"ටික දෙනෙක්" ඩැරල් කිව්වා. "ප්‍රින්සිපල් කොහොමවත් එහෙම කතා කරන්නේ නැහැ. ඒ වගේම අපේ හතර පන්තිය භාර මිස් විලියම්ස් කතා කරන්නෙත් නැහැ. එයා ටිකක් සැරයි. හරිම නීතියට වැඩ. මම මුලදී අකමැති වුණාට දැන් කැමතියි."

ඔවුන් දුම්රිය පොළට පැමිණීමට එතරම් වෙලා ගතවූ බවක් නොපෙනුණ අතර ප්‍රීතියෙන් ඉපිලුණ දැරියන් කණ්ඩායම් මැදින් ගොස් උතුරු කුලුන සඳහා වෙන් වූ දුම්රිය මැදිරිය ඉක්මනින් සොයන්නට වුණා. ෆෙලිසිටිට ලැජ්ජාවක් හා නුහුරු බවක් දැනුණා. අපොයි, මේ තරම් ළමයි පිරිසක්. ඔවුන් එකිනෙකා හඳුනන බව පෙනුණ අතර ඈ කිසිවෙක් හැඳුනුවේ නැහැ. ඕ, හරි, සැලී සිටියා. ඩැරල්ගේ යෙහෙළිය ඔවුන් දෙසට එමින් සිටියා. ඇගේ මුහුණේ සිනාවක් රැඳී තිබුණා.

"හෙලෝ ඩැරල් ! හෙලෝ ෆෙලිසිටි ! අන්තිමට ඔයත් ඇත්තටම මැලෝරි ටවර්ස්වලට එනවා. හරිම අපූරුයි. මමත් අලුතෙන්ම එන කෙනෙක් නම් කියලා හිතෙනවා. එතකොට මට තව අවුරුදු ගණනක් මේ විදිහට එන්න පුළුවන්, ඔයාට වගේම. ඔයා දන්නේ නැහැ ඔයා මොනතරම් වාසනාවන්ත ද කියලා!"

"මට මතකයි, කවුරු හරි පළමු දවසේදි මටත් එහෙම කිව්වා." ඩැරල් කිව්වා. "එතකොට මට දොළහයි. දැන් මට දාසයක් වෙන්නයි යන්නේ. අපොයි මොන තරම් වයස ද"

"ඔව්, අමතක කරන්න එපා මේ වාරය ඉවර වෙද්දි අපි හොඳටම වයසට ගිහින් කියලා දැනෙයි." සුපුරුදු කටහඬක් ඩැරල් පසුපසින් නැගුණා. "අපිට ඉස්කෝල සහතික විභාගයට වැඩ කරන්න තියෙනවා. මේ වාරය අවසාන වෙද්දි මගේ කොණ්ඩය පැහිලා තියෙයි. !"

"හෙලෝ, ඇලිසියා !" ඩැරල් උණුසුම්ව කිව්වා. "කොහොමද නිවාඩුව හොඳද ? මෙන්න, මගේ නංගි, ෆෙලිසිටි. එයා මේ වාරයේ අලුත්."

"ඇත්ත ද ?" ඇලිසියා කිව්වා. "හරි, දැන් මම අපේ නෑදෑ නංගිව හොයන්න ඕනෑ. එයත් මේ වාරයේ අලුත් කෙනෙක්. මෙයා කොහාට ගියාද ? දැනට දෙසැරයක් එයා නැති වුණා !"

ඈ අතුරුදහන් වූ අතර ඩැරල් හා සැලී හඬ නගා සිනාසුණා. ඇලිසියා කිසිදු අලුත් ඥාති සොහොයුරියක් ගැන කරදර නොවන බව ඔවුන් පැහැදිලිව දැන සිටියා. කෙසේ වෙතත් ඒ මොහොතේම මෙන් ඇය වැනිම වූ අවුරුදු දොළහක පමණ දැරියක් ද අතින් ඇදගෙන නැවතත් ඈ දර්ශනය වුණා.

"මෙයා ජූන්" ඈ කිව්වා. "ඔයා එහෙනම් ෆෙලිසිටි එක්ක යාළු වෙන්න ජූන්. ඒ මොකද ඔයාලා දෙන්නා මේ වාරයේ නිතරම එකට ඉන්නවා වගේම තව අවුරුදු ගණනක් යන තුරු එකට ඉඳියි ! ෆෙලිසිටි හරියට ඔයාව අඳුනා ගත්තට පස්සේ තව දුරටත් ඔයා එක්ක එකට ඉඳියි ද කියන එක නම් සැක සහිතයි !"

ඇය මෙය හිතා මතා කියන්නක්දැයි බලා ගැනීමට ඩැරල් ඇලිසියා දෙස බැලුවා. කට සැර ඇලිසියා ගැන කිසිවෙකුට කිසිවක් කිව නොහැකිය ! ජූන්ගේ වැරැද්දක් නොපෙනුණ අතර ඇගේ මුවින් හා නිකටින් අධිෂ්ඨාන පූර්වක බවක් පළ වුණා. යම් ආධිපත්‍යයක් ගන්නට සැරසෙන බවක් ඇතැයි ඩැරල් සිතුවා. එහෙත් පාසලේ පහළම පන්තියේ සිටින කෙනෙකුට එවැනි අවස්ථාවක් නොලැබෙන බව ඈ දැන සිටියා. තමා නිසි තැන නොසිටියහොත් වැඩි මහලු දැරියන් ඒ ගැන වග බලා ගනු ඇත. ඔවුන් කෙනෙකු සුදුසු තැන බල කර හෝ ඉන්දවනු ඇත.

"අන්න" සැලීට හා ඩැරල්ට වැලම්ටෙන් අනිමින් ඇලිසියා පෙන්නුවා. "අර, ගොන්ඩොලින් මේරි, කාර් එකෙන් එන්නේ නැතිව කෝච්චියේ යන්න එනවා. වෙනදා වගේම පරණ රඟපෑම් පෙන්වනවා!"

ෆෙලිසිටි හා ජූන් කැරකී බැලුවා. ඔවුන් දුටුවේ තඹවන් කෙස් කළඹක් හා විශාල ලා නිල් පැහැ ඇස් ඇති දැරියක් තම මවට හා ආයාට සමු දෙන ආකාරයයි. එය ඉතා සංවේදී සමුගැනීමක් වූ අතර ඉකිබිඳුම් හා සුසුම් ලෑම් හොඳින් ඇසෙන්නට වුණා.

"ගොන්ඩොලින් හැමදාමත් ඔහොම තමා" ඇලිසියා පිළිකුලින් කිව්වා.

"ඔය වයසේදීත් ! පළමු පන්තියේ ළමයෙක් පළමු වතාවට ගෙදරින් පිට යනවා නම් සමාව දෙන්න පුළුවන්. ඒත් අවුරුදු ...හළොවක ළමයෙක්, නේ ද ?"

"හරි, ඒක ඒතරම් වෙලාවක් තියෙන්නේ නැහැ." සැලී කිව්වා. ...ගොන්ඩොලින් කෝච්චි පෙට්ටියට නැග්ගට පස්සේ, මම හොඳටම ...න්නවා, එයාට අමතක වෙනවා. අඩුම තරමේ අම්මට අත ...නන්නවත්."

සැලීගේ මව ඩැරල්ගේ දෙමව්පියන් සමග කතාවට වැටී සිටියා. ...දුළු හෝ දුක්මුසු හැඟීමක් ඒ මුහුණේ තිබුණේ නැහැ ! තම මව හා ...ා ඥානාන්විතව කටයුතු කරනු දුටු ඩැරල් ස්තුතිපූර්වක වුණා. ඇය ...ලිසිටි දෙස බලා තම බාල සොහොයුරිය උනන්දුවෙන් හා සතුටින් ...ිනු දැක සොම්නසට පත් වුණා.

"මෙන්න, මිස් පොට්ස්" පළමු පන්ති භාර ගුරුතුමිය නම් ...ස්තුවක් ද අතැතිව පැමිණෙන විට සැලී කිව්වා. "හෙලෝ මිස් ...ට්ස්, හැම කෙනෙක්ම එකතුකර ගත්තා ද ?

"මම හිතන්නේ හරි" පොට්ස් ගුරුතුමිය කිව්වා. "අයිරින් විතරයි ... ඕ, මේ ඉන්නේ, අයිරින් මම හිතන්නේ මුලින්ම මට පැමිණීම ...තා කරන්න ඕනෑ කියන එක ඔයාට අමතක වෙන්න ඇති නේද? ...යන්ගේ පිහිටෙන් බෙලින්ඩා යන්නේ කාර් එකේ. ඒකෙන් එක ...යකගෙන් මම නිදහස් වෙනවා. දැන්, ඔයාලා කෝච්චි පෙට්ටියට ...ගා නම් හොඳයි. පිටත් වෙන්න තව තියෙන්නේ විනාඩි හතරයි."

දුම්රිය මැදිරිවලට පළමුව නැගීමට එහි පොරයක් ඇතිවුණා. ඩැරල් හා සැලී ෆෙලිසිටිව ඔවුන්ගේ මැදිරියට ඇද ගත්තා. "අලුත් ළමයි මිස් පොට්ස් එක්ක එයාගේ පෙට්ටියේ යන්න ඕනෑ." ඩැරල් කිව්වා. "ඒත් අපිත් එක්ක ඔයාට යන්න පුළුවන්කම තියෙනවා අම්මා, තාත්තා, ආයුබෝවන් ! අපි විස්තර ලියලා ඉරිදාට ලියුමක් එවන්නම්."

"ආයුබෝවන් !" ෆෙලිසිටි ඉතා සියුම් හඬින් කිව්වා. "නිවාඩු කාලයක් ලැබෙන නිසා එන්න පුළුවන්."

"දෙවියන්ගේ පිහිටෙන් ගොන්ඩොලින් මේ පෙට්ටියේ නැහැ." ඇලිසියා කිව්වා. "අඩුම තරමේ එයාගේ පවුලේ අතීත කතා ඇහෙන්න නැති එකත් ලොකු දෙයක්. නිවාඩු කාලයේදී එයාලටයි, බල්ලන්ටයි සිද්ධ වුණ දේවල් ගැන වැඩකට නැති කතා."

සෑම කෙනෙක්ම සිනාසුණා. දුම්රිය නියාමක නළාව පිම්බා. දොරවල් වැසුණා. දුම්රිය සෙමින් ඉදිරියට ඇදුණා. දෙමව්පියෝ හා දැරියෝ උමතුවෙන් මෙන් අත් වැනුවා. ඩැරල් තම අසුනට බර වුණා.

"ආයෙත් මැලෝරි ටවර්ස්වලට !" ඈ සතුටින් කිව්වා. "අනේ, අපේ මැලෝරි ටවර්ස් !"

# 02

එය දිගු ගමනක් වුව ද මැලෝරි ටවර්ස්හි දුම්රිය පොළ වෙත අවසානයේ ඔවුන් ළඟා වුණා. දුම්රිය මැදිරිවලින් පිටතට පැන ගත් දැරියෝ එක් රාත්‍රියකට පමණක් සෑහෙන දේවල් සහිත කුඩා ඇඳුම් බෑග ද පන්දු පිති ද රැගෙන වඩා යෝග්‍ය ආසන සොයා ගැනීමට පාසල් බස් රථවලට දුව ගියේ පාසල වෙත යන ඉතිරි දුර ගෙවා ගැනීමටයි.

ෆෙලිසිටි වෙහෙසට මෙන්ම තැතිගැනීමට පත්ව සිටියා. කිසිම වෙහෙසක් නොපෙන්වුව ද ඩැරල් මහත් ප්‍රමෝදයට පත්ව සිටියා. "දැන් අපි හැමෝටම ඉස්කෝලේ බලා ගන්න පුළුවන්." ඈ ප්‍රීතියෙන් ෆෙලිසිටිට කිව්වා. "මම කියන කොට ඉස්කෝලේ ඉස්සරලාම දකින දර්ශනය බලාගන්න"

එලෙස, මීට වසර හතරකට ඉහතදී ඩැරල් දැක ගෙන තිබූ පාසලේ පළමු ඡායා මාත්‍රය ෆෙලිසිටි ද දැක ගත්තා.

"හරි ලස්සනයි." ෆෙලිසිටි ඩැරල්ට කී අතර ඩැරල් ඇඩි සතුටට පත්වුණා. තම සොයුරිය ද තම පාසලේ තබා ගැනීමට ලැබීම ඉතා කදිම දෙයක් වුණා. ෆෙලිසිටි ඉතාම සාර්ථක අයෙකු වන බවට ඇයට ඇඩි විශ්වාසයක් තිබුණා.

පළමුව මෝටර් රථවලින් ඒ වන විට පැමිණ සිටි දැරියෝ පාසල් මාවතේ තැන තැන නතරව සිටියේ දුම්රියෙන් පැමිණෙන දැරියන්ව පිළිගැනීමටයි. විශාල පිවිසුම් දොරටුවෙන් බස්රථ ඇතුළු වන විටම ප්‍රීතිමත් කෑකෝගැසීම් ඝෝෂාවක් නැගුණ අතර දැරියෝ රොත්ත පිටින් දුව ගොස් ඔවුන්ගේ මිතුරියන්ට බස්රථවලින් බැසීමට උදව් කළා.

"හෙලෝ, බෙලින්ඩා" අයිරින් කෑ ගැසුවේ තම අත් බෑගය බැරිකර පහළට බැස එමින්. "ලස්සන චිත්‍ර මොනවා හරි ඇන්දා ද?"

"ඩැරල් !" ලැජ්ජාශීලී බවක් පළ කළ පහළොස් වියැති දැරියක් කතා කළා. "සැලී ! ඇලිසියා !"

"හෙලෝ, මේරි ලෝව් ! කවුරු හරි ඔයාගේ ඇඟට මකුළුවෙක් දැම්ම ද, මේ නිවාඩු කාලයේ ?" ඇලිසියා කෑ ගැසුවා. "බෙටීව දැක්කාද ?"

බෙටී ඇලිසියාගේ හොඳම මිතුරියයි. ඇය ද මුබරි මෙන්ම දඟකාරියක් ද වුණා. ඈ පැමිණ ඇලිසියාගේ පිටට තද පහරක් ගැසුවා.

"මම ඉන්නවා. ඔයාලා හුඟාක් පරක්කුයි, කෝච්චිය වෙනදාට වඩා පරක්කුයි වගේ."

"අන්න, මෙල්විස්" සැලී කෑ ගැසුවා. "අර ඩැෆනි, අර බලන්නකෝ, ජීන්. විල්ව දැක්කා ද ?"

"ඔව්, වෙනදා වගේම එයා තන්ඩර් පිටේ ආවේ. එයා තවම ඉස්තාලයේ ඇති." ශූර බුද්ධියකින් යුතු ස්කොට්ලන්ත දැරිය, ජීන් කිව්වා. නිහඬ, දක්ෂ දැරියක වූ ඈ තව දුරටත් ඩැරල් සමග එකම පන්තියේ නොරැඳී ඉහළ පන්තියකට යාමට සිටියා. "එයාගේ සහෝදරයින්ගේ ඉස්කෝලය කලින් පටන් අරගෙන ඇති නිසා එයාලා ආවේ නැහැ. මේ වතාවේ හුඟාක් වැදගත් පිළිවෙළට අශ්වයෝ බලාගන්න කෙනෙක් එක්කයි ආවේ. බොහොම සන්සුන් ගමනක්."

අවට සිදුවන කලබල නොතැකූ ෆෙලිසිටි තැතිගත් සතුටින් යුතුව බලා සිටියා. ඩැරල්ට තමාව සම්පූර්ණයෙන්ම අමතක නොවනු ඇතැයි ඈ සිතුවා. ඇලිසියා ඇගේ ඥාති සොහොයුරියව සම්පූර්ණයෙන්ම අමතක කර තිබුණා. බාලවයස්කාර ජූන්, ෆෙලිසිටි වෙතට පැමිණ සිනාවක් පෑවා. "මේ ලොකු කෙල්ලෝ හරියට කෑගහනවා නේද ?" ඈ කිව්වා. "කුඩා අපි එයාලට වැදගැම්මකට නැහැ. අපි අපේ පාඩුවේ යන්න යමුද ? එයාලට අපිත් ඉන්නවා කියලා මතක් වුණ වෙලාවට හොයන්න පටන් ගනියි."

"ඕ, එපා" ෆෙලිසිටි කී නමුත් ජූන් ඇගේ අත මිරිකා ගෙන ඇයව ඉවතට ඇදගෙන ගියා. "නැහැ, එන්න. මම දන්නවා ඉස්සරලාම අපි මේට්‍රන්ව හම්බවෙලා අපේ සෞඛ්‍ය සහතිකයයි, මේ වාරයේ

අපි ළඟ තියාගන්න සල්ලියි එයාට භාර දෙන්න ඕනෑ. අපිම ගිහින් එයාව හොයා ගනිමු."

"ඒත් ඩැරල් කැමති වෙන එකක් නැහැ....." ජූන් විසින් ඇයව ඇඩිව පසෙකට කැඳවාගෙන යන අතරේ ෆෙලිසිටි කතා කරන්නට වුණා.

අවසානයේ තම නැගණිය සොයා ඩැරල් වටපිට බලන විටදියි ඈ දැන ගත්තේ ඇය එහි නොමැති බව !

"ෆෙලිසිටි කොහේද ?" ඈ කිව්වා. "අපොයි ! එයාට මොනවා වුණා ද ? මම දන්නවා අලුතෙන් ආපු ගමන් කෙනෙකුට මොන තරම් අපහසුවක් දැනෙනවා ද කියලා. මට ඕනෑ වුණේ එයා මා ළඟම ටික වෙලාවක් තියා ගන්න. එයා මොන ලෝකයක ගිහින් ද ?"

"කලබල වෙන්න එපා." හැඟීමකින් තොරව ඇලිසියා කිව්වා. "මම අපේ පොඩි ජූන් ගැන කරදර වෙන්නේ නැහැ. එයාට තනියම හැමදෙයක්ම කරගන්න පුළුවන්. ඒ පොඩි කෙල්ල ගැන හිතා ගන්න බැහැ. එයා ලෝකයේ තියෙන හැම කපටිකමක්ම දන්නවා."

"හරි, ඒත් ෆෙලිසිටි එහෙම නැහැ." ඩැරල් කිව්වා. "ෂහ්, එයා කොහේ ගිහිල්ල ද ? දැන් විනාඩියකට ඉස්සර මෙතැන හිටියනේ."

"මගේ අත් බෑග් එක කවුරු හරි දැක්කා ද ?" අයිරින්ගේ කටහඬ විලාපයක් ලෙසින් නැගුණා.

"හරි, කොහොම හරි, අපි මේට්‍රන් ළඟට ගිහින් සෞඛ්‍ය සහතිකයි සල්ලියි භාර දීලා ෆෙලිසිටි එයා ළඟට ආවද කියලා අහමු." සැලී කිව්වා. "මේ හරියේ දැන් කවුරුත් නැහැ. එයා කොහොමවත් මෙහේ ඉන්න පාටක් නැහැ."

ඒ වන විට පැයක් පමණ තිස්සේ දැරියන්ගේ සෞඛ්‍ය සහතික හා මුදල් භාර ගනිමින් ඉතා කාර්යක්ෂමව වැඩෙහි නිරතව සිටි නේවාසිකාගාර පාලිකාව වෙතට ඔවුන් ගියා. ඇය දැක ඩැරල් සතුටට පත් වුණා. කරුණාවන්ත, කඩිසර හා දැඩි නමුත් පළපුරුදු කෙනෙක්.

"හෙලෝ ඩැරල් ! ඔහෝ ඇලිසියා, දඟ වැඩවලට ලෑස්ති වෙලා ඇවිදින් වගේ මම හිතන්නේ."

"අම්මා කියනවා ඔයා ඔය විදිහට එයාටත් කිව්වා කියලා, එයා ආපහු ඉස්කෝලයට එද්දි." සිනාවක් නගමින් ඇලිසියා කිව්වා.

"ඔව්. එයත් හුඟාක් නරක කෙනෙක්." සිනාසෙමින් පාලිකාව කිව්වා. "ඇත්තටම ඔයා වගේ නරක නැහැ, ඇලිසියා. ඒක නොවෙයි, අපිට කතාවක් තියෙනවා. මේ වාරයේ 'අණ්ඩ දැමීම කොහෙද කරන්නෙ' කියන එක ගැන. ඒක අමතක කරන්න එපා. අහා අයිරින්, ඔයත් ඉන්නවා. සෞඛ්‍ය සහතිකය තියෙනවා ද ?"

අයිරින් බියට පත් වුණා. පසුව ඈ මඳ සිනාවක් නැඟුවා. "ඔයා මට විහිළු කරනවා, මේට්‍රන්" ඈ කිව්වා. "වෙනදා වගේ ඒක තැපෑලෙන් එන්න ඇති."

"නැහැ. මේ සැරේ නැහැ." පාලිකාව කිව්වා. "ඒකයි කාරණය. අනිවාර්යයෙන් ඒක ඔයාගේ කුඩා බෑග් එකේ ඇති. අද උදේ මට හුඟාක් ලියුම් තිබුණා ! ඒත් සෞඛ්‍ය සහතික තිබුණේ නැහැ. ගිහින් ඒක හොයාගෙන එන්න අයිරින්."

ඩැරල් ෆෙලිසිටි සොයා වටපිට බැලුව ද ඇයට කුඩා ඇරිය දැක ගත නොහැකි වුණා. ඇයට සැබැවින්ම සිත් වේදනාවක් මෙන්ම මඳ කෝපයක් ද දැනුණා. ළමයි අතර අතරමං වී මංමුළා නොවීමට තමා අසලින්ම සිටින ලෙස කියා තිබියදීත් ෆෙලිසිටි මෙහෙම දෙයක් කළේ ඇයි ?

"මේට්‍රන්..." ඈ කතා කළා. "මගේ නංගි ෆෙලිසිටි එහෙම දැක්කා ද ?"

"ඔව්" පාලිකාව කිව්වා. "මේ දැන් ටිකකට කලින් එයා ඇවිදින් සෞඛ්‍ය සහතිකය භාර දුන්නා. එයා කිව්වා එයාගේ සල්ලි ඔයා ළඟ කියලා. එයා මෙහාට ආව එක බොහොම අපූරුයි, ඩැරල්."

ඩැරල් මවිතයට පත් වුණා. කැඳවාගෙන ඒමට පෙර ෆෙලිසිටි ඇත්තෙන්ම පාලිකාව වෙතට පැමිණ සෞඛ්‍ය සහතිකය භාර දීලා. එය කෙසේ හෝ ෆෙලිසිටිගේ ස්වභාවය නොවෙයි. ඈ එතරම් ලැජ්ජාශීලියි.

"එයා කොහේ ගිහිල්ලා ද ?" ඈ විමතියෙන් හඬ නැඟුවා.

"එයා නිඳන කාමර බලන්න ගියා." කී පාලිකාව බෙලින්ඩා සමග ගනුදෙනුවට හැරුණ අතර බෙලින්ඩා තම මුදල් සියල්ලම නැති වූ බවක් පෙන්වමින් සුන් වූ බලාපොරොත්තුවෙන් යුතුව සාක්කු සියල්ලම කණපිට පෙරළාගෙන සිටියා.

"බෙලින්ඩා ! ඇත්තටම පොරොන්දුවක් හැටියට මේ කියන්නේ. ඊළඟ වාරයේදී ඔයාවයි, අයිරින්වයි වෙන කුලුනකට යවන්න කියලා මම මිස් ග්‍රේලින්ට කියනවා. ඔයාලා දෙන්නත් එක්ක මේ තරම් ඔට්ටු වෙන්න සිද්ධ වුණොත් මට පිස්සු හැදෙයි. සැලී, ගිහින් බලන්න අයිරින් එයාගෙ සෞඛ්‍ය සහතිකය හොයාගෙනද කියලා."

සැලී අයිරින් සොයා නිඳන කාමරයට යාමට පිටත් වූ අතර ඩැරල් ෆෙලිසිටි සොයා පිටත්ව ගියා. තම කුඩා බෑගයේ තිබූ සියල්ල ඇඳ ඇතිරිලි මත විසුරුවාගෙන, වැලපෙන විලාපයකින් ඇඳ මත වාඩි වී සිටි අයිරින්ව සැලීට හමුවුණා. එහෙත් එතැන සෞඛ්‍ය සහතිකයක් තිබුණේ නැහැ.

"ඕ, අයිරින්, ඔයා නම් ඇත්තටම මොට්ටියක්." කී සැලී අයිරින්ගේ රාත්‍රී ඇඳුම අතගා බලා ගසමින් එම වටිනා ලියවිල්ල එහි ඇත්දැයි සොයා බැලුවා. "මම හිතුවේ ඔයාගේ අම්මා මේ සැරෙත් ඒක තැපෑලෙන් එවලා කියලයි."

"එයා එහෙම තමයි කරන්නේ." අයිරින් කෙඳිරි ගෑවා. "එයා ඒක වරද්දන්නේ නැහැ. එයා පුදුම විදිහට හොයලා බලන්නේ."

"හරි, මට කියන්න පුළුවන් මේ සැරේ එයා ඒක තැපෑලට දාන්න කියලා ඔයාටම කියන්න ඇති කියලයි." සැලී කිව්වා. "ඔයාට ඒකත් අමතක වෙන්න ඇති."



හදිසි ආලෝකයක් අයිරින්ගේ හාස්‍යජනක මුහුණ පුරා පැතිරුණා. ඈ සැලීගේ පිටට පහරක් ගැහුවා. "සැලී, ඔයා කිව්වා හරි !" ඈ කිව්වා. "ඒකම තමයි සිද්ධ වුණේ. ඒක තැපෑලට දාන්න කියලා අම්මා මට දුන්නා තමයි, ඒත් මට අමතක වුණා."

"හොඳයි, ඔයා කොහේද ඒක දැම්මේ ?" ගෙදර කාමරයේ මේසය උඩ දාලා ආව ද ? මට සැකයි." තරමක් නොඉවසිල්ලෙන් සැලී ඇසුවා.

"නැහැ, එහෙම දෙයක් වුණේ නැහැ." අයිරින් ජයග්‍රාහීව කිව්වා. "මම ඒක වැඩි පරිස්සමට තොප්පිය ඇතුළේ රෙදි වැස්ම ඇතුළට දැම්මා. එතකොට මම තැපැල් කන්තෝරුවට යන අතරමගදි ඒක නැති නොවෙයි කියලා. ඒත් මම තැපැල් කන්තෝරුවට ගියාට පස්සේ මම ආවේ මොකටද කියලා අමතක වෙලා මුද්දර ටිකක් අරගෙන ගෙදර ගියා. ඒක තොප්පිය ඇතුළේ කියලා මට හොඳටම විශ්වාසයි. දැන් මට මතක් වෙනවා, දවස පුරාම තොප්පිය දාගෙන ඉන්නකොට මට හරි අපහසුවක් දැනුණා."

අනෙක් ඇඳ යටට පෙරළී ගොස් තිබූ අයිරින්ගේ හිස් වැස්ම සොයා ගැනීමට තවත් කාලයක් ගත වුණා. එහෙත් අයිරින්ගේ මහත් සතුටට හිස් වැසුම තුළ රෙදි කඩට යටින් සහතිකය සහිත ලියුම් කවරය එලෙසම තිබුණා. එය ද රැගෙන ඇය මහත් විනෝදයකින් පාලිකාව සොයා වේගයෙන් දුව ගියා

"මම ඒක නැති නොකර තැපෑලට දාන්න හිතාගෙන තොප්පිය ඇතුළට දා ගත්තා." ඈ පැහැදිලි කළා. "ඒත් මට අමතක වුණා. ඒක මාත් එක්කම දැන් ඉස්කෝලයට ඇවිදින්."

පාලිකාවට මේ කිසිම වචනයක අගක් මුලක් නොතේරුණ ද අයිරින්ගේ සුපුරුදු නොසැලකිල්ල නිසා සිදු වූ තවත් එක් දෙයක් ලෙස සියල්ල අමතක කර ඈ සහතිකය ස්තුති පූර්වකව භාර ගත්තේ අයිරින් එය නැවත නැති කිරීමට පෙරයි.

"ඩැරල්ට එයාගේ නංගි හම්බ වුණා ද ?" ඈ අයිරින්ගෙන් ඇසුවා. එහෙත් අයිරින් ඒ ගැන දැන සිටියේ නැහැ. "මම ගිහින් බලන්නම්." කී ඈ නැවත ඉබාගාතේ ඇවිද ගියා.

ඩැරල්ට ෆෙලිසිටිව හමුවී තිබුණා. ෆෙලිසිටි, ජූන් හා තවත් දැරියන් කීප දෙනෙකු සමග පළමු පන්තියේ දැරියන්ගේ නිදන

කාමරයේ සිටිනු ඩැරල් දුටුවා. ජූන් තුන්වන පන්තියේ දැරියක මෙන් අනෙක් දැරියන්ට හර බර ලෙස කතා කරමින් සිටි අතර ෆෙලිසිටි ඇය අසලම ලැජ්ජාශීලීව සවන්දීගෙන සිටියා.

"ෆෙලිසිටි !" ඩැරල් ඇය වෙතට යමින් කතා කළා. "ඇයි ඔයා මා එනතුරු බැලුවේ නැත්තේ ? ඔයා තනියම ගිහින් මේට්‍රන්ව හම්බ වෙන්න හිතුවේ ඇයි ? ඔයා දන්නවා මමත් යන්නයි හිටියේ කියලා"

"ඕ, මමයි එයාව එක්ක ගෙන ගියේ" ජූන් කිව්වා. "මම හිතුවා එයත් මා එක්ක යන එක හොඳයි කියලා. අපි දෙන්නම අලුත්නේ. මම දන්නවා ඇලිසියා මා ගැන කරදර වෙන්නෙ නැහැ කියලා. ඉතින් මට හිතුණා ඔයත් ෆෙලිසිටි ගැන කරදර වෙන එකක් නැහැ කියලා. අපි සෞඛ්‍ය සහතික භාර දුන්නා. ඔයාට තියෙන්නෙ ෆෙලිසිටිගේ සල්ලි භාර දෙන්නයි."

"මම ඒක දන්නවා." තම ගරුත්වය රැකගනිමින් ඩැරල් කිව්වා. පළමු පන්තියේ මෙම අලුත් දැරිය එසේ තමාට කතා කිරීමට තරම් කොතරම් දඩබ්බර ද ! ඈ ෆෙලිසිටි වෙතට හැරුණා.

"මට හිතෙනවා ඔයා මාත් එක්ක යන්න හිටියා නම් හොඳයි කියලා !" ඈ කිව්වා. "මට ඕනැ වුණේ ඔයාගේ නිදන කාමරය, හැමදේම මම ම පෙන්වන්න."

# 03

තම නිදන කාමරය වෙත ආපසු ගිය ඩැරල් කෝප වූ හා ව්‍යාකූල වූ සිතුවිල්ලෙන් යුතුව රාත්‍රියට අවශ්‍ය දේවල් කුඩා බෑගයෙන් ඉවතට ගන්නට වුණා. ෆෙලිසිටිට නිදන කාමරය, ඇගේ ඇඳ හා සියලුම දේවල් පෙන්වන්නට ඇයව පාසලේ රවුමක් කැඳවාගෙන යාමට ඇය මහත් සේ බලාපොරොත්තු සහගතව සිට තිබුණා. ඇගේ නැගණිය ඇයව නොතකා කෙසේ නම් ජූන් සමග ඇයව හැර ගියේ ද ?

"ඔයාට ෆෙලිසිටිව හම්බ වුණාද ?" ඇලිසියා ඇසුවා.

"ඔව්" ඩැරල් කෙටියෙන් කිව්වා. "එයා ඔයාගේ අර නැනත් එක්ක ගිහින්. මොකක්ද එයාගේ නම, ජූන්. මට ඒක අමුතු දෙයක් විදිහට පෙනෙන්නේ. ඔයා හිතන්නේ අපි නේද මේ පොඩි අයව රවුමක් එක්ක යන්න ඕනෑ. මම පළමු වෙනි වතාවට මෙහාට එද්දි මට හිතුණේ අක්කා කෙනෙක් හරි, නෑදෑ කෙනෙක් හරි මෙහෙ සිටියා නම් හොඳයි කියලා."

"ඕ, ජූන්ට පුළුවන් තමන්ගේ දෙපයින්ම හිටගන්න." ඇලිසියා කිව්වා. "එයා හරි අමාරුකාර, හිතපු දේ කරන වැඩිරියක්. එයා තමන්ගේ දේවල් තනියම කර ගන්නවා. එයාට මගේ ආරක්ෂාවක් වුවමනා නැහැ. බලන්නකෝ එයා තර්ක කරන හැටි. වහලේ උළු උඩ යන්න කතා කරන්නේ."

"මම නම් එයාට ඒ තරම් කැමැත්තක් නැහැ." ඩැරල් කිව්වේ ෆෙලිසිටිව ජූන් ඇගේ තටු යටට නොගනිනු ඇතැයි සිතමින්. නිසැකවම ජූන් වැනි කෙනෙකුට ෆෙලිසිටි කැමති නොවනු ඇත.

"නැහැ, එයා ලැජ්ජා තියෙන කෙනෙක් නොවෙයි." ඇලිසියා කිව්වා. "අපි හැමෝම එහෙමයි ! දන්නවානේ, ඒක අපේ පවුලේ දුර්වලකමක්."

ඩැරල් ඇලිසියා දෙස බැලුවා. ඇය එය පවුලේ අඩුපාඩුවක් බවට ලැජ්ජාවකින් තොරව කතා කළ බව පෙනුණා. සැබැවින්ම ඇය කතා කළේ එය ආඩම්බරයක් ලෙසයි. සැබැවින්ම, ඇලිසියා කට සැර ඇඩි කෙනෙක් වුව ද ඇය මැලෝරි ටවර්ස්හි සිටි අවුරුදු ගණන ඇයව යම් දුරකට මොළොක් කිරීමට බොහෝ සේ බලපා තිබුණා.

එදින සැඳෑවේ ගුප්ත ලෙස ගැඹුරු නිල් පැහැයක් ගත් මහා සයුර දර්ශනය වන තැනක් වූ එය ඉතාම කදිම නිඳන කාමරයක් ලෙස පෙනුණා. ගල්පර මත රළ හැපෙන ශබ්දය ඈතින් ඇසෙන බව දැරියන්ට දැනුණා. ගල් තලාව මත පිහිටා තිබූ පිහිනුම් තටාකය සිහි වූ ඩැරල් එය ග්‍රීස්ම ඍතුවේ වාරය නිසා ඒ ගැන සිතත්ම ඇගේ හදවත ප්‍රීතියෙන් පොපියන්නට වුණා. අවුරුද්දේ හොඳම කාලය....

පරෙවි පිහාටුවලින් සැදුණ මෝස්තරයෙන් යුතු ඇඳ ඇතිරිලි ඇති ඇඳන් නිඳන කාමරයේ පේළියට තබා තිබුණා. නිඳන කාමරයේ කෙළවරේ සීතල හා උණුසුම් ජල කරාම සහිත මුහුණ සෝදන බේසම් සැකසී තිබුණා.

ගමන තුළදී මුහුණේ තැවරුණ දූවිලි සෝදා ගැනීමට මුහුණට වතුර ඉස ගනිමින් අයිරින් සෝදන බේසමක් අසල සිටියා. අනෙක් කිසිම කෙනෙකුට වඩා ඇය නිතරම පැමිණියේ කුණු තවරාගෙනයි. අනුවණ ලෙස හැසිරෙන මෙම දැරිය සංගීතයට උපන් හපන්කම් ඇති ගණිතයට ඉතා දක්ෂ මෙන්ම අනෙක් විෂයන්ට ද මහත් උනන්දුවක් ඇති අයෙකු බව කිසිවෙකුට අනුමාන කිරීමට හෝ නොහැකි වුණා. සෑම කෙනෙක්ම ඇයට ඇලුම් කළ අතර සෑම කෙනෙක්ම ඇයට සිනාසුණා.

මුහුණ සෝදන අතරේ ඇය තනුවක් මුමුනන්නට වුණා. "ටම්ටි - ටුම් - ටම්ටි - ටුටි -ට,ට,ටා !

"ඕ, අයිරින්, සති ගණනක්ම අපිට ඔය තාලය ද අහන්න වෙන්නේ" ගොන්ඩොලින් ඇසුවේ ඇය නිතරම අයිරින්ගේ ගායනා හා මිමිනීම් මහත් වදයක් ලෙස මැසිවිලි නඟමින් නොසතුටින් සිටින නිසයි. අයිරින් ඒ ගැන කිසිදු තැකීමක් කළේ නැහැ. නිතර කැපී පෙනීමට හැකි නම් ඒ සඳහා වෙහෙසෙන ගොන්ඩොලින් මෙයින් තවත් වියරු වැටුණා.

"අයිරින්" ඇය ආවේගයෙන් හඬ නැඟුව ද ඒ මොහොතේම දොර විවර වී අලුත් දැරියන් දෙදෙනෙකු කැඳවාගෙන නේවාසිකාගාර පාලිකාව ඇතුළට ආවා.

"ළමයි, මේ අය බෙටන් නිවුන්නියෝ" ඈ තම ප්‍රියජනක හඬින් කිව්වා. "මෙයා කොනී, මේ රූත්. මෙයාලා හතර පන්තියේ අය. මෙයාලා ඉන්නෙත් මේ නිදන කාමරයේ. සැලී, ඩැරල්, ඔයාලා මේ අය ගැන බලා ගන්න, හරි ද ?"

නැඟිට ගත් දැරියෝ නිවුන්නියන් දෙස බැලුවා. ඔවුන්ගේ පළමු සිතුවිල්ල වූයේ 'නිවුන්නියන් වුණාට මොන තරම් වෙනස් ද ?' යන්නයි.

රූත්ට වඩා කොනී උස් මහත් හා නිර්භීත බවක් පළ කළා. ඒ අතර රූත් බොහෝ දුරට කුඩා වූවාක් මෙන්ම තරමක ලැජ්ජාශීලී බවක් පළ කළා. පුළුල් සිනාවක් පෑ කොනී සියලු දෙනාට හිස නමා ආචාර කළා. රූත් වටපිට බැලීමට හෝ හිස එසවූයේ නැති තරම්. ඈ තම සහෝදරියට මඳක් පසුපසින් සිටගෙන සිටියා.

"හෙලෝ, නිවුන්නියෝ !" ඇලිසියා කිව්වා. "ඉස්කෝලයේ තියෙන හොඳම නිදන කාමරවලට තමයි ඔයාලා ඇවිදින් ඉන්නේ.! අර අතන තියෙන්නේ ඔයාලගේ ඇඳන් වෙන්න ඇති. අර එකටම තියෙන හිස් ඇඳන් දෙක."

"රෑට ඕනෑ දේවල් ගෙනාවා ද ?" ඩැරල් ඇසුවා. "හරි, එහෙම නම් හොඳයි. ඔයාලා ඉක්මනට ඒවා එළියට අරගන්න එක හුඟාක් හොඳයි. රෑ කෑම ඉක්මනින්ම ලැබෙයි. තව ටිකකින් සීනුව ගහයි."

"ඒක නම් හොඳයි." මිත්‍රශීලී සිනාවක් පාමින් කොනී කිව්වා. "මට නම් හරිම බඩගිනියි. අපි තේ බීලා හුඟාක් වෙලා ගත වුණා."

"ඔව්, පළමු රෑ කෑම උපරිම ඉහළයි." සැලී කිව්වා. "මට දැන්ම සුවඳ එනවා." කොනී හා රූත් නාසය උඩට හරවා ඉව ඇල්ලුවා. ඔවුන්ගේ කුසගින්න වැඩි වී තිබුණා.

"බෙටන් නිවුන්නියෝ !" සුපුරුදු පරිදි ඇලිසියා විහිළු කළ අතර හැමෝම හඬ නගා සිනාසුණා.

"එන්න." කොනී, රූත්ට කිව්වා. "අපි ඉක්මන් කරමු. යතුරු මා ළඟ, මේ තියෙන්නේ."

බෑග් දෙකම කඩිනමින් විවෘත කළ ඈ ඇතුළත වූ දේවල් එළියට ඇද දැම්මා. ඉන් කීපයක් අහුලා ගත් රූත් අසරණව වටපිට බැලුවා.

"මෙන්න, මේවා අපේ ලාච්චු වෙන්න ඕනෑ. අපේ ඇඳන් ළඟමයි තියෙන්නේ." කී කොනී සියලු දේවල් ඉතා කාර්යක්ෂමව තැන්පත් කරන්නට වුණා. සේදීමට වුවමනා ද්‍රව්‍ය, සෝදන බේසම වෙතට ගෙන ගිය ඈ රූත්ට අඬ ගැසුවා.

"එන්න රූත්, අපි මුහුණ සෝදා ගනිමු. මගේ මුහුණේ කුණු!" රූත් ඇය හා සම්බන්ධ වීමට ගොස් ඔවුන් තුවාවලින් වතුර පිස දමන විටම රාත්‍රී කෑම සඳහා සීනුව නාද වුණා. ප්‍රීතියෙන් එක්වර කෙරෙන ඝෝෂාවක් නැඟුණා.

"හුරේ ! මම හිතන්නේ නියම කෑමක් තියෙයි. මම නම් කැමති බැදපු තාර මස්, ග්‍රීන් පීස්, අලුත් අර්තාපල්, හකුරු පුඩිමක් එක්ක චීස් ගොඩාක්..." බෙලින්ඩා කියන විට කාගේත් කටට කෙළ ඉනුවා.

"අපූරු බලාපොරොත්තුවක් !" ඩැරල් කිව්වා.

එලෙසම ඉතා ප්‍රණීත රාත්‍රී භෝජනයක් සැකසී තිබුණා. ප්‍රථම දින රාත්‍රී භෝජනය නිතරම එලෙස වුණා. තක්කාලි සමග පිසූ ඌරුමස්, විශාල සලාද බන්දේසිවල ඇමූ බැදපු අර්තාපල්, ඇපල් කේක් හා සීතල ක්‍රීම් ලෙමනේඩ් මේස මත තැන්පත් කර තිබුණා.

"අගෙයි !" කොනී, රූත්ට කිව්වා. "මෙහේදී අපට ලැබෙන්නේ මේ වගේ කෑම නම් අපි හරි වාසනාවන්තයි ! අපි ගිය අනිත් ඉස්කෝලවලට වඩා හුඟාක් හොඳයි !"

"මම කැමති නැහැ ඔයාලව රවට්ටන්න." ඇලිසියා කිව්වා. "ඒත් මම හිතන්නේ ඔයාලට මුලින්ම කියලා තිබුණොත් හොඳයි. ඕනෑම වාරයක පළමු හා අවසන් දවස්වල විතරයි මේ වගේ කෑමක් ලැබෙන්නේ. කොන්වෝල්ස්වලට එන දුර ගමන නිසා අපිට හුඟාක් බඩගිනි බව දන්නා හින්දයි මෙහෙම ලැබෙන්නේ. හෙට රෑට ළමයිනේ, හොදිවල පොඟවලා කන්න පානුයි, කෝපියි විතරයි."

සුපුරුදු පරිදි ඇලිසියා වඩාත් බරපතළ තත්ත්වයක් මවාපාමින් සිටි අතර නිවුන්නියෝ බියපත් බවක් පළ කළා. ඩැරල්, ෆෙලිසිටිව සොයා ගැනීමට වටපිට බැලුවා. ඈ කොහේද ? ඇත්තෙන්ම ඇයට

ෆෙලිසිටිව හතර පන්තියේ මේසයේ තබා ගත නොහැකි වුව ද වචනයක් හෝ කතා කිරීමට තරම් හැකි දුරකින් ඇයව තබා ගැනීමට ඇට අවශ්‍ය වුණා.

ඈ සිටියේ කතා කිරීමට තරම් නොහැකි දුරකින්. එමෙන්ම ඈ සිටියේ එම දඩබ්බර ජූන් සමගයි. ජූන් ඇයට අතින් පයින් රඟ දක්වමින් කතා කරමින් සිටි අතර ෆෙලිසිටි මහත් සන්තෝෂයෙන් සවන්දීගෙන සිටියා.

ඩැරල්, ෆෙලිසිටි හා ජූන් දෙස බලා සිටින බව ඇලිසියා දුටුවා. "එයාලා ඉක්මනටම එකතුවෙලා !" ඈ ඩැරල්ට කිව්වා. "බලන්න ෆෙලිසිටි ජූන්ගේ කතාව අහගෙන ඉන්න හැටි. ජූන් එයාගේ පවුලේ විස්තර කියන හැටි අහගෙන ඉන්න වටිනවා ! ඒ ගෙදර අයත් අපේ ගෙදර අය වගේම පිස්සෝ රැළක්."

බරපතළ හැඟීමකින් තොරව ආවාට ගියාට වැඩ කරන තම හිතුවක්කාර පවුලේ උදවිය ගැන ඇලිසියා කියන හැලි ගැන ඩැරල්ට සිහිපත් වුණා. ජූන් ද එලෙසම විය හැකි යැයි ඇයට සිතුණා. එහෙත් එමෙන්ම ෆෙලිසිටිට තමාව එතරම් නොවටිනා බව දැනුණ ඇගේ සිත රිදුණා.

රාත්‍රී කෑමෙන් පසු, ඩැරල් වෙතට ගොස් යම් යම් දේවල් අසා ගැනීමට ෆෙලිසිටිට දැඩි අවශ්‍යතාවයක් තිබුණ ද තමා ඇය වෙතට යන බව කියත්ම ජූන් ඇයව පසුපසට ඇද්දා.

"ඔයා යන්න ඕනැ නැහැ." ජූන් කිව්වා. "පොඩි අය ලොකු අය පස්සේ එල්ලීගෙන යන එකට එයාලා කොයිතරම් අකමැති ද කියලා ඔයා දන්නේ නැද්ද ? අපි ඇලිසියායි, ඩැරලුයි පස්සේ එල්ලීගෙන ගියොත් හැම කෙනාටම අපිව එපා වෙනවා. ඇත්තටම, ඇලිසියා මට කිව්වේ මගේ දේවල් මම ම කරගත්තොත් හොඳයි කියලා. ඒ මොකද, පළමු පන්තියේ අය මොන තරම් කුඩා වැදගැම්මකට නැති අය ද කියනවා නම් එයාලට අපි දිහා බලන්නවත් වුවමනාවක් නැතිලු"

"එයා කොයි තරම් නපුරුද ?" ෆෙලිසිටි කිව්වා. "ඒත් ඩැරල් එහෙම නැහැ."

"එයාලා කවුරුත් එකයි. ලොකු පන්තිවල අය." ජූන් කිව්වේ වැඩිහිටියෙකුගේ ස්වරයෙන්.

"ඉතින් අපි මොනවාටද ඒ අය ගැන කරදර වෙන්නේ ? ඇන ගන්න ඕනැ අපේ දේවල් තනියම කරගන්න, නැද්ද ? ක නැහැ ඔයා බලාගෙන ඉන්න, අක්කා ඇවිදින් ඔයාට කතා කරනෑ එයා එන්නේ නැත්නම් එයා ඔයා ගැන කරදර වෙන්නේ නැ එයා ආවොත් එයා නැතිව ඔයාට කිසිම දෙයක් කර ගන්න බැ එයාගේ පිහිට හැමතිස්සෙම ඔයාට ඕනැ කියන එක එයාට හිතෘ දෙන්න එපා. ඔයාට තනියම හිටගන්න පුළුවන් කියලා ඔයා එය පෙන්නුවොත් එයා ඔයාට හුඟාක් සලකයි. දැනටමත් ඔයා හුඟ හොඳට වැඩ කරගන්න බව පෙනෙනවා !"

"ඒක ඇත්ත." ෆෙලිසිටි කිව්වා.

"ඔයා කියන එකත් හරි, ජූන්. මම නිතරම අහලා තියෙන එයා අවඥාවෙන් කියනවා තමන්ගේ වැඩ තනියම කරගන්න බ අය ගැන හා හිත හදාගන්න බැරි අය ගැන. කොහොම වුණත් හුඟ අලුත් .ළමයින්ගේ අක්කලා නැහැ එයාලව බලාගන්න. මම අලු ඉස්කෝලයකට ආවා කියලා මටත් බැහැ මාව බලාගන්න අක් කෙනෙක් ඉන්නවා කියලා හිතන්න."

ජූන්, ෆෙලිසිටි දෙස කොතරම් ප්‍රශංසා මුඛයෙන් බැලී ද ය ෆෙලිසිටිට තමා ගැන මහත් සේ සංතෝෂ නොවී සිටිය නොහැ වුණා.

"ඔයාගේ නුවණක්කාරකම ගැන මම සතුටු වෙනවා." ජූ කිව්වා. "මම හිතුවා ඔයා එහෙම ඇති කියලා. හලෝ, මෙන්න ඩැර එනවා, අන්තිමට. දැන් එයාව බදාගෙන අඬන්න එහෙම එපා."

"හිතුවා ද මම එහෙම කරයි කියලා ?" ෆෙලිසිටි අමනාපයෙ කිව්වා. ෆෙලිසිටි ඩැරල් එත්ම ඇයට සිනාවක් පෑවා.

"හෙලෝ ෆෙලිසිටි, කරදරයක් නැහැ නේද ?" ඩැර කරුණාවෙන් ඇසුවා.

"ඔයාට උදව්වක් හරි මොනවා හරි ඕනෑ ද ?"

"අනේ එපා ඩැරල්, ඒත් මම කරදරයක් නැතිව ඉන්නවා. ඩැරල්ගෙන් තවත් යම් යම් දේ ඇසීමට තිබෙන බව සිතුණ ද ෆෙලිසිට එය අමතක කරමින් කිව්වා.

"ගිහින් පිහිනුම් තටාකය බලන්න කැමති ද ?" ඩැරල් ඇසුවා. "අපිට තව වෙලාව තියෙනවා වගේ."

පළමු රාත්‍රියේ, පළමු පන්තියේ දැරියන් රාත්‍රී ආහාරය අවසන් වූ වහාම නින්දට යා යුතු බව ඩැරල්ට අමතකව තිබුණා. එහෙත් ජූන් එය දැන සිටියා. ෆෙලිසිටි වෙනුවෙන් ඈ උත්තර සැපයුවා.

"අපිට දැන්ම නිඳා ගන්න යන්න සිද්ධ වෙන හින්දා ෆෙලිසිටිට ඒක බලන්න යන්න බැරි වෙයි." ඈ සන්සුන්ව කිව්වා. "අද ඌ නොවෙයි, අපි හිතාගෙන ඉන්නේ හෙට උදේ කෑමට ඉස්සර යන්නයි. එතකොට තමයි වඩදිය රැල්ල එන්නේ කියලයි මම අහලා තියෙන්නේ."

"මම කතා කළේ ෆෙලිසිටිට, ඔයාට නෙමෙයි." හතර පන්තියේ දැරියකගේ අහංකාර ලීලාවෙන් ඩැරල් කිව්වා. "ඕනෑවට වඩා ලොකු වෙන්න හදන්න එපා, ඔයාගේ තරමට ඉන්න, ජූන්." කී ඈ ෆෙලිසිටි වෙතට හැරී තරමක් කේන්තියෙන් කතා කළා.

"හොඳයි, ඔයා මේ විදිහට හැඩ ගැහෙන එක ගැන මට සතුටුයි ෆෙලිසිටි. ඔයා මගේ නිදන කාමරයේ නැති එක ගැන මට දුකයි.ඒ හතර පන්තියේ ළමයින්ට විතරයි ඒකේ ඉන්න දෙන්නේ."

මහා හඬින් සීනුවක් නාද වුණා. "අපිට නිඳාගන්න යන්න වෙලාව." ජූන් කිව්වා. ඇය සෑම දෙයක්ම දන්නා බවක් පළ කළා. "අපි ගියොත් හොඳයි, මම ෆෙලිසිටිව බලා ගන්නම් ඩැරල්."

එසේ කියමින්, මෙල්ල කළ නොහැකි ජූන් තම අත ෆෙලිසිටිගේ අතේ පටලවාගෙන ඇයව පසෙකට ඇදගෙන යන්නට වුණා. ඩැරල්ගේ කෝපය දැඩිව නැගෙන්නට වුණා. ඈ පිටව යන දැරියන් දෙස තරහින් රවා බලා සිටි අතර ආපසු හැරී ෆෙලිසිටි ඇයට ඉතා මිහිරි මෙන්ම සමාව අයදින්නක් බඳු වූ සිනාවක් පෑ විට ඉතා සුළු ලෙස ඇගේ කෝපය සන්සිඳුණා.

'ලැජ්ජා නැති ජූන් වසංගත ලෙඩක් වගේ !' ඩැරල් සිතුවා. "ජීවිතයේ කාටවත් නුදුන්න විදිහේ හොඳ පාරක් දෙන්න මට හිතෙනවා."

04

ප්‍රථම දිනයේ නින්දට යාම ඉතාම විනෝද දෙයක් වූයෙ
විශේෂයෙන්ම ගිම්හාන සෘතුවේදී, ජනේල විවෘතව තබන නිසාත
දිවා ආලෝකය බොහෝ වේලාවක් දීප්තිමත්ව පවතින නිසා හා අව
දර්ශනය ඉතා චමත්කාරජනක නිසයි.

දැරියන් සමූහයක් සමග සිටීමත්, නිවාඩු කාලය ගැන කතා බ
කිරීමත්, එළඹෙන වාරයේ සිදුවිය හැකි දේ ගැන කල්පනා කිරීමත
වැනි දේ ඉතා සුන්දර වුණා.

"පාසල් සහතික පත්‍ර විභාගය පැවැත්වෙන්නේ මේ වාරයේ."
ඩැෆනි කෙඳිරි ගෑවා. "මට නම් බයේ බැහැ. මුළු නිවාඩු කාලයේම
මට ඒකට අමතර පාඩම් කරන්න සිද්ධ වුණත් මම කිසිම දෙයක්
දන්නේ නැහැ කියලයි හිතෙන්නේ !"

"හරි, මිස් විලියම්ස් මේ වාරයේදී අපිව මරවලා වැඩ ගනියි."
ඇලිසියා ඉතා දුඃඛිත ස්වරයෙන් කිව්වා.

"හරි, ඔයා ඒ ගැන කරදර වෙන්න ඕනෑ නැහැ." විල් කිව්වා.
මේ වනතුරු කිසිදු කතා බහක් නොකර සිටි ඇය අනෙක් අය තනිකර
දමා සිටියා. ඇය පළමුව පාසලට ආ දින දෙක තුනේදී ඇය කියා
තිබුණේ ඇයට දැනෙන්නේ "ගෙදර ගැන දුක" නොව "අශ්ව දුක"
යන්න දැන සිටි දැරියෝ ඇය ගැන වැඩි උනන්දුවක් දැක්වූවේ නැහැ.
ඈ ඉතා ළෙන්ගතුව ඇගේ දෙමව්පියන්ට අයත් හා සහෝදරයින්ට
අයත් අශ්වයින්ට ඇලුම් කළ අතර උන් නැති පාළුවෙන් දුක් වුණා.

ඇලිසියා ඇය දෙස බැලුවා. "ඇයි මට ඒ ගැන කරදර වෙන්න
එපා කියලා ඔයා කියන්නේ ? ඈ ඇසුවා. "ඔයාලා වගේම මමත් ඒක
ගැන හිතන්න ඕනෑ !"

"හරි, මම කියන්නේ ඔයාට ඇත්තෙන්ම වැඩ කරන්න ඕනෑ නැහැ, ඇලිසියා." විල් කිව්වා. "කරදර නොවී ඔයාට ඉගෙන ගන්න පුළුවන්කම තියෙනවා. නිවාඩු කාලයේදී මටත් අමතර පන්ති තිබුණා, ඒක පුදුම හිසරදයක්. මට අයියලා එක්ක අශ්වයෝ පදින්න කොයිතරම් වුවමනාව තිබුණත් මට මැරීගෙන පාඩම් වැඩ කරන්න සිද්ධ වුණා. ඒත් කොයි හැටි වුණත්, ඕනෑ ඔට්ටුවක්, ඔයා නිවාඩු කාලයේදී අමතර පන්ති කළේ නැහැ."

"මෙල්විස්, ඔයත් මේ සැරේ ඉස්කෝල සහතික විභාගයට ලියනවාද ?" ඩැරල් ඇසුවා. පසුගිය වසරේදී මෙල්විස් තදබල ලෙස අසනීප වූ අතර ඇයට ඇගේ කටහඬ අහිමි වුණා. එය ඉතා මනරම්, මධුර හා ළගන්නා සුලු කටහඬක් වුව ද අසනීප වීම හේතුවෙන් එය නැතිව ගියා. ඇය නිතර කියමින් සිටියේ ඇය අනාගතයේ ඔපෙරා ගායිකාවක වන බව වුව ද මේ වන විට ඇය එසේ කියනු කිසිවෙක් අසා තිබුණේ නැහැ. සැබැවින්ම බොහෝ දැරියන්ට මෙල්විස්ට පුදුමාකාර කටහඬක් තිබූ බව පවා අමතකව තිබුණා.

"ඒක ප්‍රශ්නයක් නැහැ. මමත් ලියනවා." මෙල්විස් කිව්වා. "ඒත් මම පාස්වෙන එකක් නැහැ. මට ඒ ගැන ඒතරම් විශ්වාසයක් නැහැ. ඒක නොවෙයි, ඔයාලා දන්නවාද, දැන් මගේ කටහඬ ටික ටික හරි යනවා. !"

මෙල්විස්ගේ අහිමි වූ කටහඬ හැමෝටම සිහිපත් වූ විට නිහඬ විරාමයක් ගතවුණා.

"අනේ ! ඇත්තද ?" සැලී කිව්වා. "ඒක ඔයාට හොඳයි, මෙල්විස්. ආයෙත් ගායනා කරන්න පුළුවන් නම් කොයිතරම් හොඳද ?"

"දැන් මම ඒතරම් ගායනාවලට යන්නේ නැහැ." මෙල්විස් කිව්වා. "ඒත් මේ වාරයේදී මට දැන ගන්න පුළුවන් පුහුණුවීම් කරන්න තරම් මගේ කටහඬ සුදුසු තත්ත්වයකට එයි ද කියලා."

"අපි සුබ පතනවා ඔයාට, මෙල්විස්." ඩැරල් කිව්වා. මෙල්විස්ට එම අරුම පුදුම කටහඬ තිබුණ කාලයේදී ඇය කටහඬක් පමණක්ම බවත් ඒ හැර ඇය තුළ කිසිත් නැති බවත් දැරියන් සිතූ ආකාරය ගැන ඩැරල්ට සිහිපත් වුණා. අවුන්සයක හෝ වෙනත් කිසිදු චරිත ලක්ෂණයක් නැති හුදු වැදගැම්මකට නැති කෙනෙක්. එහෙත් දැන් මෙල්විස් තුළ සැහෙන පමණ චරිත ශක්තියක් වූ අතර ඇයට කටහඬ ගැන සිහිපත් කිරීම ද දුෂ්කර වුණා.

"මේ !" මේරි ලෝව්ගේ කටහඬ නැඟුණා. "මම ඉන්න පැත්තේ කෙළවරේ තියෙන හිස් ඇඳ කාටද ? එතැන කාගෙවත් බඩු නැහැ."

ඇරියෝ ඔවුන්ගේ සංඛ්‍යාවත් ඇඳන් සංඛ්‍යාවත් ගණන් කළා. "ඔව්, ඒ ඇඳ වැඩියි." ඩැරල් කිව්වා. ඒකට කවුරුහරි එන්නේ නැති නම් ඒක ඔතන තියෙන්නේ නැහැ. තවත් අලුත් කෙනෙක් එනවා ඇති."

"අපි හෙට අහලා බලමු !" ඇනුම් අරිමින් ඇලිසියා කිව්වා. "නිවුන්නියන්ට කොහොමද ? කරදරයක් නැහැ නේ ද ?"

අලුත් ඇරියෝ දෙදෙනා විනීතව පිළිතුරු දුන්නා. "හොඳින් ඉන්නවා. බොහොම ස්තුතියි."

"සුබ රාත්‍රියක්" කී ඩැරල් සිනාවක් පෑවා. ඔවුන් ද ප්‍රති සිනා පෑවා. තමා ඔවුන්ට ඇලුම් කරන බවක් ඩැරල්ට සිතුණා. කෙසේ වෙතත් ඔවුන් දෙදෙනාම එක හැඩ හුරුකමින් යුතු වන්නට තිබුණේ යැයි ඈ සිතුවා. එවිට එය මහත් විනෝදයක් වන්නට තිබුණා. එහෙත් සැබැවින්ම ඔවුන් දෙදෙනා පැහැදිලි ලෙස එකිනෙකාගෙන් වෙනස් වුණා.

ෆෙලිසිටි කරදරයකින් තොරව සිටිනවාදැයි හදිසියේම ඩැරල්ට කල්පනා වුණා. ගෙදර ගැන දුක්වීමක් ඇයට නැතැයි ඈ සිතුවා. ජූන්ගේ ඇඳ ඇගේ ඇඳට යාබදව නොතිබුණ හොත් කතා කිරීමට ඔවුන්ට කාලයක් නොලැබෙනු ඇත. මොන තරම් අප්‍රියජනක ළමයෙක් ද ! ඩැරල් සිතුවා. ඇයට තියෙන කපටිකම ! එය ඇදහිය නොහැකි තරම් !

ඊළඟ උදයේ, අවදිවීමට සීනුව නාද වන විට කෙඳිරිගෑම් හා වැලපීම් හඬ රාශියක් එක විට නැඟුණා. කිසිවෙක් ඇඳන්වලින් සෙලවුණේ නැහැ.

"ඒයි, අපි නැඟිටින්න ඕනෑ" අවසානයේ ඩැරල් කිව්වා. "ඉක්මන් කරන්න. හැම දෙනාම. දෙවියනේ, අර බලන්න ගොන්ඩොලින්, තවත් හොඳටම නිදි !"

ඩැරල් සැලීට ඇසක් ඉඟි මැරුවා. ගොන්ඩොලින් තද නින්දේ පසු නොවුන මුත් ටික වේලාවක් ඇඳේ ගුළිවී සිටීමට ආශා කළා.

"එයා පරක්කු වෙයි." සැලී කිව්වා. "ඉස්සරලාම දවසේ උදේ එයා කරදරේ වැටෙන්න ඉඩ දෙන්න හොඳ නැහැ. අර ස්පොන්ජ්

කැල්ලකට වතුර ටිකක් අරගෙන මෙයාගේ මුහුණට ඉහින්න, ඩැරල්!"

මේ ප්‍රකාශය වාරයකට විසි වරක් පමණ පාවිච්චි වුව ද එහි බලපෑම නිතරම සාර්ථක වුණා. අමනාපයෙන් තම ඇස් විවර කළ ගොන්ඩොලින් නැගිට ඇඳෙහි වාඩි වුණා. "මගේ මුහුණට වතුර ඉහින්න ?" ඈ කෝපයෙන් බණින්නට වුණා. "උදෙන්ම මොනවාට නැගිටින්නද ? ගෙදරදි නම්....."

"ඔව්, ගෙදරදි නම් අපි අට වෙනකම් නැගිටින්නේ නැහැ." එක්වර ඇරියෝ බොහෝ දෙනෙක් හඬ නගා කියා මහ හඬින් සිනාසෙන්නට වුණා. මේ වන විට ගොන්ඩොලින් මේරිගේ විලාප ඔවුන්ට හොඳින් හුරුව තිබුණා.

"තවමත් ඔයාගේ අර නාකි ආයා හුරතල් කර කර ඔයාට ඇඳ එහෙම හදලා දෙනවාද ? තවමත් රිදී හැන්දකින් ඔයාට කන්න දෙනවා ද ?"

"කට වහගන්න ඇලිසියා." ඩැරල් කිව්වා. "දැන්ම ම එයත් එක්ක රණ්ඩු අල්ලන්න පටන් ගන්න එපා."

ඇලිසියා සැලීට වැලමිටෙන් ඇන නිවුන්නියන් දෙසට හිස දික් කර පෙන්නුවා. කොනී, රූත් වෙනුවෙන් ඇගේ ඇඳ හදමින් සිටියා.

"මට ඒක කර ගන්න පුළුවන්." රූත් විරෝධය පෑව නමුත් කොනී ඇයව පසෙකට තල්ලු කළා. "මට වෙලාව තියෙනවා රූත්. මේ වගේ දේවල්වලදි ඔයා පරක්කුයි. අපේ අනිත් ඉස්කෝලයේදීත් මමයි ඔයාට මේවා කරලා දුන්නේ. ඉතින් මට මෙහෙදිත් එහෙම කරලා දෙන්න පුළුවන්." කැරකී අනෙක් අය දෙස බැලූ ඈ ඔවුන් බලා සිටින බව දුටුවා.

"විරෝධයක් තියෙනවා ද ?" ඈ තරමක් දුරට දබරයට බරව ඇසුවා.

"අපොයි නැහැ." ඇලිසියා තම මෘදු කටහඬින් කිව්වා. "ඔයා කැමති නම් ඔය විදිහට ඔයාට පුළුවන් මගේ ඇඳත් හදලා දෙන්න. ඔය වගේ දේවලදි මමත් පරක්කුයි !"

මෙම ප්‍රකාශය පිළිතුරු දීමට තරම් වටිනා එකක් ලෙස කොනී සිතුවේ නැහැ. ඈ රූත්ගේ ඇඳ සැකසීමේ වැඩය කරගෙන

ගියා. තරමක් අසරණ බවක් පළ කරමින් රූත් පසෙකින් සිටගෙන සිටියා.

"ඔයාලා ආවේ කොයි ඉස්කෝලයෙන් ද ?" රූත් අමතමින් ඩැරල් ඇසුවා. එහෙත් දැරිය පිළිතුරු දීමට පෙර කොනි පිළිතුරු දුන්නා.

"අපි ගියේ යෝක්ෂයර් පල්ලියේ ඉස්කෝලෙට. ඒක අපූරු ඉස්කෝලයක්, ඒත් මේ ඉස්කෝලෙ තරම් අපූරු නෑ."

ඉන් හතර පන්තියේ දැරියෝ සතුටට පත්වුණා. "ඔයාලා ඒ ඉස්කෝලෙදි හොකී හරි ලැක්රෝස් හරි සෙල්ලම් කළා ද ?" තම ප්‍රශ්නය රූත්ට යොමු කරමින් සැලී ඇසුවා.

"හොකී" කොනී නැවතත් පිළිතුරු දෙමින් කිව්වා. "මම කැමතියි හොකීවලට, ඒත් ලැක්රෝස්වලටත් මම කැමතියි."

"ඔයත් ලැක්රෝස්වලට කැමතියි කියලා හිතෙනවා ද ?" සැලී තවත් වතාවක් තම ප්‍රශ්නය රූත්ට යොමු කරමින් ඇසුවේ දැරියට කතා කිරීමට දිවක් නැතිදැයි සැක සිතමින්.

"ඕ, රූත් හැමතිස්සේම කැමති මම කැමති දේවලටමයි !" නැවත වතාවක් පිළිතුරු දුන්නේ කොනීයි.

රූත් තමාගේම වචනයක් කිසි දින කතා කර තිබේදැයි ඇසීමට සැලී සැරසෙන විට උදේ ආහාරය සඳහා සීනුව නාද වුණා.

උතුරු කුලුනේ සියලුම දැරියන් එක්ව විශාල කෑම කාමරයට පිරෙද්දී ඩැරල් මහත් උනන්දුවෙන් ෆෙලිසිටිව දැක ගැනීමට බලා සිටියා.

ඉතා මනා ලෙස පිළිවෙළට සැරසුණ ෆෙලිසිටි කෑම කාමරය තුළට පැමිණුණා. ඇය ඇතුළට එනු දුටු පොට්ස් ගුරුතුමිය මීට අවුරුදු කීපයකට පෙර පළමු උදෑසන කෑම සඳහා ඩැරල් ද මෙලෙස ලැජ්ජාවෙන් හා බියගුලු බවක් දක්වමින් පැමිණි අයුරු සිහියට නඟා ගත්තා.

ඇය ඉදිරියෙන් දක්නට ලැබුණේ, මෙය තම ප්‍රථම උදේ ආහාරය ලෙස සිතනවාට වඩා තමා තුන්වන පන්තියේ දැරියක ලෙස සිතා හැසිරෙන ජූන්වයි.

ෆෙලිසිටි ඩැරල්ට සිනාවක් පෑ විට උදය ආහාරයට පෙර තමා නැතිව ෆෙලිසිටි පිහිනුම් තටාකය බලන්නට ගොස් තිබුණ බව මොහොතකට අමතක කළ ඩැරල් උණුසුම් සිනාවක් පෑවා. තම කුඩා නැගණිය එදින පන්තියේ පරීක්ෂණය හොඳින් කර අවශ්‍ය මට්ටමේ සිටින බව ඔප්පු කරනු ඇතැයි ඈ සිතුවා.

තම නිදන කාමරයේ හිස් ඇඳක් ඇති බව හදිසියේම සිහිපත් වූ සැලී පොට්ස් ගුරුතුමියට කතා කළා.

"මිස් පොට්ස් !, අපේ නිදන කාමරයේ වැඩිපුර ඇඳක් තියෙනවා. ඒක කාටද කියලා දන්නවා ද ? එන්න ඕනෑ හැමෝම ආපසු ඇවිදින්."

"ඕ, ඔව්." පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඉන්න බලන්න. අද තව එක අලුත් ළමයෙක් එනවා. ඔව්, ක්ලැරිසා කාටර්. දැනුයි මට මතක් වුණේ. දැනටමත් එයාට ලියුමක් ඇවිදින් තිබුණා. මේ තියෙන්නේ. සැලී, මේක එයාට ලැබෙන්න එයාගේ කණ්ණාඩි මේසය උඩින් තියන්න. හොඳද ?"

සැලී අතට යැවීමට ලියුම අතට ගත් ගොන්ඩොලින් ඒ වෙත බැල්මක් හෙළා නැවත හොඳින් කියවා බැලුවා. එහි ලිපිනය ලියා තිබුණේ 'ගරු ක්ලැරිසා කාටර්' යනුවෙන්.

'ගරු ක්ලැරිසා කාටර්' ගොන්ඩොලින් කල්පනා කළා. ඇය මහත් සතුටට පත් වුණා. "එයා මගේ යාළුවා වුණොත් ! එයා ආවට පස්සේ මම එයාව බලා හදා ගන්නවා. මම කරන්න පුළුවන් හැම දෙයක්ම කරනවා !"

නිතර ලස්සන, පොහොසත් හෝ දක්ෂකමක් ඇති අය පසුපසින් වැටී සිටීමට ඉතා ප්‍රිය කළ ගොන්ඩොලින් තරමක් හිස උදුම්මාගත් දැරියක්. දැරියගේ මුහුණ දුටු ඇලිසියා සිනාවක් පෑවා. 'ගොන්ඩොලින් ගරු ක්ලැරිසා කාටර්ගේ ඇගේ එල්ලෙන්නයි යන්නේ ' ඈ සිතුවා. 'දැන් අපිට හොඳ විකාර වැඩ ටිකක් බලා ගන්න පුළුවන් !'

හතර පන්තිය භාර වූවේ මෘදු බවින් යුතු වුව ද විනය ගැ
ඉතා සැලකිලිමත් වූ හා ඇඩි ප්‍රතිපත්තිගරුක වූ විලියම්ස් ගුරුතුමියට
බොහෝ විට හතර පන්තිය වගකීම් දරන හා මහන්සියෙන් වැඩ කර
හොඳ සිසුවියන් සිටින පන්තියක්. එසේ වුව ද මේ වසරේදී සමහ
විටක විලියම්ස් ගුරුතුමිය කරදරවලට මුහුණ පෑවා. එම පන්තිය
එතරම් ම අඩු කල්පනා ඇති දැරියන් සිටියා !

'ඒ වුණත් මම හිතන්නේ එයාලට පාසල් සහතික පත්‍ර විභාග
සමත් වෙන්න පුළුවන්' විලියම්ස් ගුරුතුමිය සිතුවා. 'ගොන්ඩොලි
හැර අනිත් කිසිම කෙනෙක් ඇත්තටම මෝඩියෝ නොවෙයි. නිවා
කාලයේදී පිළිවෙළට අමතර පන්ති කෙරිලා නිසා ඩැෆනි හුඟාක්
දුරට හොඳයි. මෙල්විස් පුදුම විදිහට හැඩ ගැහිලා. ඒ වගේමයි වි
ලෝව් අසමත් වෙයි ම කියලා එයා හිතාගෙන හිටියට, එයා සම
වෙනවා කියන එක හුඟාක් දුරට කියන්න පුළුවන් !'

ඇගේ පන්තිය සමන්විත වූයේ උතුරු කුලුනේ දැරියන්ගෙ
පමණක් නොව අනෙක් කුලුනුවල හතර පන්තියේ දැරියෝ ද එ
සිටියා. ඇලිසියාගේ මිතුරිය, බෙටී හිල්, මේ අයගෙන් එක්කෙනෙක
ඇය ද ඇලිසියා මෙන්ම කට සැර දැරියක් වුව ද ඇලිසියා මෙ
ඉක්මන් කල්පනාකාරී දැරියක් වුණේ නැහැ. ඇය සිටියේ බටහි
කුලුනේ වූ අතර ඇලිසියාට හා බෙටීට උතුරු කුලුනේ එක්ව සිටීමට
ඉඩ නොදීමට තරම් වගකිව යුත්තන් අකාරුණික හා ඇඩි වීම ගැ
ඔවුන් නිතරම කත් කෙඳිරි ගෑවා !

ග්‍රේලින් මහත්මිය, විදුහල්පතිනිය, වරක් උතුරු කුලුන භා
ගුරුතුමිය, පොට්ස් මහත්මියගෙන් අසා තිබුණා ඇත්තෙන්ම බෙටීගෙ
දෙමව්පියන් ලියා ඉල්ලා තිබූ පරිදි බෙටීව උතුරු කුලුනේ තබා ගත
හැකි ද කියා.

"මට ඇලිසියාව විතරක් බලාගන්න පුළුවන්" පොට්ස් ගුරුතුමිය කිව්වා. "එහෙම නැති නම් බෙටීව විතරක් බලා ගන්න පුළුවන්. ඒත් ඒ දෙන්නාම එකම තැනක තියාගන්න එක නම් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මට එක මොහොතකටවත් සැනසිල්ලක් නැති වෙයි. මට විතරක් නොවෙයි, මම්සලීට වුණත් එහෙම වෙයි."

"මම ඔයා කියන දේට එකඟයි." ග්‍රේලින් මහත්මිය කිව්වා. එලෙස උතුරු කුලුනේ බෙටීට සිටීමට ඉඩකඩක් නැති බව සඳහන් කරන ලද ලිපියක් බෙටීගේ දෙමව්පියන් වූ හිල් පවුල වෙත යැවුණා. එසේ වුව ද, ඇලිසියා හා බෙටී වෙනස් කුලුනු දෙකක දුරස්ථව වාසය කළ ද ඔවුන්ගේ ඇඩි මිත්‍රත්වය රැක ගැනීමට ඔවුන් සමත් වුණා. ඔවුන් නිතරම පන්තියේදී හමුවුණා. එක්ව ඇවිදීම් හා ගවේෂණ චාරිකාවල නිරත වුණා. එමෙන්ම දඟවැඩ හා නපුරු වැඩ ද සැලසුම් කළේ ඔවුන් එක්වයි.

යාච්ඤාවලට පසුව, උතුරු කුලුනේ ඇරියෝ පන්තිවලට උද්‍යෝගයෙන් දිව ගියා. ඔවුන්ට අවශ්‍ය වුණේ තමන්ටම කියා ඩෙස්ක හා පුටු ද, තම භාණ්ඩ තැන්පත් කර ගැනීමට සුදුසු තැන් ද, ජනේලවලින් මනරම් දසුන් පෙනෙන තැන් ද තම තමාගේ හිතවතියන් සමග එකට සිටින තැන් ද තෝරා ගැනීමයි.

අනෙක් ඇරියෝ තම තමන්ගේ ඩෙස්ක තෝරා ගන්නා තුරු නිවුන්නියෝ පසෙකට වී බලා සිටියා. එතෙක් තම තෝරා ගැනීම් නොකර සිටීම හොඳ බව ඔවුන් දැන සිටියා. ඇත්තෙන්ම ඩෙස්ක කීපයක් ඉතුරු වන තුරු කාලය ගත වූ පසු එහි ඉතිරිව තිබුණේ නැගෙනහිර කුලුනෙන් පැමිණිය යුතු ඇරියන්ට හා ක්ලැරිසා කාටර්ටත්, ඔවුන්ටත් අයත් ඒවා වූ හෙයින් ඔවුන් තමන්ගේ ඩෙස්ක තෝරා ගත්තා.

"අපි එක තැනක ඉඳිමු." කී කොනී ඇගේ හා රූත්ගේ පොත් යාබද ඩෙස්ක දෙකකට දැමුවා. අහෝ, ඔවුන්ට හිමි වූයේ කවුරුත් පිළිකුල් කරන පළමු පේළියේ ඩෙස්ක දෙකක් වූ අතර සුපුරුදු ලෙස අවසාන පේළිය පළමුව ද අනෙක් පේළි දෙවනුව ද පිරී ගොස් තිබුණා. කෙඳිරීමට හෝ සටහන් කොළ හුවමාරු කර ගැනීමට හැකියාවක් ලබා ගත හැකි එකම පේළිය වූයේ අවසන් පේළියයි.

"මේ වාරයේ නායිකාව කවුරු වෙයිද කියලයි මම කල්පනා කරන්නේ." ඇලිසියා ඩැරල්ගේ සිතුවිලිවලට බාධා කරමින් හඬ

නැඟුවා. "ජීන් ඉහළ පන්තියට ආලා නිසා එයා වෙන්න බැහැ. ඒ නිසා මම නම් නොවෙයි. ඇයි, මිස් ග්‍රේලින්ට මා ගැන විශ්වාසයක් නැහැ !"

"මම හිතන්නේ, සැලී තෝරා ගනියි" ඩැරල් කිව්වා. "අපි දෙවැනි පන්තියේ ඉන්න විට සැලී තමයි පන්ති නායිකාව. එයා හරිම අපූරුවට නායකකම කළා. හැබැයි මට මතක හැටියට නම් ඔයා ඒකට කැමති වුණේ නැහැ, ඇලිසියා !"

"ඔව්, මම කැමති වුණේ නැහැ." ඇලිසියා අවංකවම කිව්වා.

"මම හිතුවේ මමයි නායිකාව වෙන්න ඕනැ කියලා. ඒත් දැන් මම ඒ වගේ මෝඩ අදහස් අතහැරලා ඉන්නේ. මට තේරෙනවා කිසිම දෙයක නායකකමට මම ගැළපෙන්නේ නැහැ කියලා. මම කිසිම දෙයක් ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ."

ගොන්ඩොලින් ඉදිරි පෙළේ අසුනක් තෝරාගෙන ! සෑම කෙනෙක්ම මහත් විමතියට පත් වුණා. ඇලිසියා සැක මුසු කල්පනාවෙන් යුතුව ඇයට ඇස ගසාගෙන සිටියා. ඇය විලියම්ස් ගුරුතුමියගේ පස්සේ වැටෙන්න යනවාද ? නැහැ, මේ ලෝකයේ කාටවත් ඒක කරන්න බැහැ. විලියම්ස් ගුරුතුමියට එය එතරම් විශේෂත්වයක් ලෙස පෙනෙන එකක් නැහැ ! එහෙනම් ගොන්ඩොලින්ගේ මේ අසාමාන්‍ය තෝරා ගැනීමට හේතුව මොකක්ද?

"අන්න, හොඳයි.!" හදිස්සියේම ඇලිසියා කිව්වා. සෑම කෙනෙක්ම පුදුමයෙන් ඇය වෙතට නෙත් හෙළුවා.

"අන්න හොඳ මොකක් ද ?" බෙටී ඇසුවා.

"මට මේ දැන් කල්පනා වුණේ අපේ හුරතල් ගොන්ඩොලින් ඉස්සරහ පේළිය තෝරා ගත්තේ ඇයි කියලා." ඇලිසියා සරදම් හඬින් කිව්වා. "මුලදී මම හිතුවා එයාට පිස්සු හැදිලා කියලා. ඒත් මම දැන් දන්නවා !"

ගොන්ඩොලින් රවා ඇය දෙස බැලුවා. ඇය ඇත්තෙන්ම ඇලිසියාගේ නපුරු කට දැන සිටි නිසා එයට බිය වූ අතර ඇලිසියා නිවැරදිවම සැබෑ කාරණය සොයාගෙන ඇති බව ඈ දැන ගත්තා.

එහෙත් ඇලිසියා එක්වරම ඒ ගැන පන්තිය දැනුවත් කළේ නැහැ. ගොන්ඩොලින් දෙස උපහාසාත්මක සිනාවක් පෑ ඈ කතා කළා. "අපේ ග්වේන්, මම ඔයාව පාවා දෙන්නේ නැහැ. ඔයාට බොහොම

ගරු කටයුතු හේතුවක් තියෙනවා ඉස්සරහ පෙළ තෝරා ගන්න, නැද්ද ?"

කිසිවෙකුට, අඩුම තරමේ බෙටීට හෝ ඇය අදහස් කරන දෙය සිතා ගැනීමට නොහැකි වුණා. එහෙත් ගොන්ඩොලින් එය දැන සිටියා. ඇය ඉදිරි පෙළේ අසුනක් තෝරාගෙන තිබුණේ ගරු ක්ලැරිසා කාටර්ට එම පෙළේ අසුනක් තෝරා ගැනීමට සිදුවන බව අනිවාර්යය නිසයි. එමෙන්ම ඇය අසලම සිට ඇයට උදව් කිරීමට ලැබීම කොතරම් වාසනාවක්දැයි ඇය සිතා තිබුණා.

එදින උදයේ සෑම කෙනෙක්ම කුමන හෝ කටයුත්තක යුහුසුලුව නිරත වුණා. ඩැරල් පන්තියේ වැඩ රාජකාරි ලයිස්තුවක් සකසමින් සිටියා. තීන්ත කුඩු පිරවීම, පන්තියේ මල් සකස් කිරීම, කළුලෑල්ල පිරිසිදු කිරීම, අවශ්‍ය ලිපි ද්‍රව්‍ය බෙදා දීම වැනි දේවල්, වාරය පුරාම සතියකට එක් දිනක් සෑම දැරියකටම තවත් කෙනෙකුගේ සහයෝගය ඇතිව මේ රාජකාරි ඉටු කිරීමට සිදු වුණා.

විවේකයට මදක් ප්‍රථමව, විලියම්ස් ගුරුතුමිය දැරියන්ට තම ඩෙස්කවල ඇති දේ පිළිවෙළට තබන ලෙස කිව්වා. "මට හිතෙනවා ඔයාලට කියන්න පොඩි දෙයක්." ඈ කිව්වා. "ඒකට විනාඩි දෙකක් විතර යයි. ඒත් මට විශ්වාසයි ඒක ඔයාලා දැන ගන්න ඕනෑ දෙයක් කියලා."

"එයා කියන්න යන්නේ මේ වාරයේ නායිකාව වෙන්නේ කවුද කියලයි." සැලී ඩැරල්ට කෙඳිරුවා. "අර බලන්නකෝ, ගොන්ඩොලින්! දැක්කද එයාගේ මූණේ හැටි. එයා හිතාගෙන ඇති එයාව පත් කරයි කියලා."

"මම හිතන්නේ ඔයාලා කවුරුත් දන්නවා ජීන් පාසල් සහතික පත්‍ර විභාගය සමත් වුණ නිසා ඉහළ පන්තියට ගියා කියලා." විලියම්ස් ගුරුවරිය කිව්වා. "එයා තමයි ඉස්සරලා නායිකාව වෙලා හිටියේ. ඉතින් එයා දැන් ඉහළට ගිහින් නිසා අපි අලුත් නායිකාවක් තෝරා ගන්න ඕනෑ."

ඇය මොහොතක් නිහඬව උනන්දුවෙන් සවන්දීගෙන සිටින පන්තිය සිසාරා බැලුවා. "මම මේ කාරණය ගැන මිස් ග්‍රේලින්, මිස් පොට්ස්, මම්සලී ඩූපොන්ට් එක්කයි මම්සලී රොජර් එක්කයි සාකච්ඡා කළා." විලියම්ස් ගුරුතුමිය කිව්වා. "අපි හැමෝම එකඟ වුණා පන්ති නායිකාව හැටියට ඩැරල් රිවර්ස්ව තෝරා ගන්න."

ඩැරල් තදින් රතු වුණා. ඇගේ හදවත වේගයෙන් ස්පන්දන වන්නට පටන් ගත්තා. සෑම කෙනෙක්ම, යම් දිනක ඇලිසි තෝරා ගනු ඇතැයි මහත් සේ බියට පත්ව සිටි ගොන්ඩොලින් ප අත්පොළොසන් දී ප්‍රීතියෙන් හඬ නැගුවා.

"මට හොඳටම විශ්වාසයි, ඩැරල්, අපේ තේරීම හරි කියලා." විලියම්ස් ගුරුතුමිය කිව්වේ ලැජ්ජාව මුසු සතුටින් මුහුණ රතු කරග ඩැරල් වෙත ඇගේ සුපුරුදු සෞම්‍ය මඳ සිනාවක් පාමින්. "ම හිතන්නේ නැහැ අපේ තේරීම ගැන අපට පසුතැවිලි වෙන්න කිසි දෙයක් ඔයා කරයි කියලා."

"නැහැ, මිස් විලියම්ස්. මම ඒ වගේ දෙයක් කරන්නේ නැහැ." ඩැරල් ස්ථිර හඬින් කිව්වා. ඇයට මේ මොහොතේම තම දෙමව්පියන් හමුවට ගොස් ඔවුන්ට මේ ගැන කීමට ඇත්නම් යයි සිතුණා. හතර පන්තියේ නායිකාව ! යම් තැනක නායිකාවක වීමට ඈ මහත් සේ වුවමනාවෙන් සිටියා. එමෙන්ම ඇයට එම වරය ලැබුණ ප්‍රථම අවස්ථාව මෙයයි. පන්තියේ මෙතෙක් කල් සිටි හොඳම නායිකාව වීම ඇගේ අරමුණයි.

ෆෙලිසිටි කුමක් කියනු ඇත්ද ? 'ඇත්තමයි, මගේ අක්කා තමයි හතර පන්තියේ නායිකාව !' එලෙස කියන්නට ලැබීම ෆෙලිසිටිට මහඟු අවස්ථාවක් වනු ඇත. ෆෙලිසිටි සතුටටත්, ආඩම්බරයටත් පත් වනු ඇත.

විවේකයේදී ඩැරල් ෆෙලිසිටි සොයා කඩිමුඩියේ දුව ගියා.

"ෆෙලිසිටි ! මට තියෙනවා ඔයාට කියන්න හොඳ ආරංචියක්. හතර පන්තියේ නායිකාව හැටියට මාව තෝරාගෙන !"

"ඕ, ඩැරල් ! මොනතරම් අපූරු ද !" ෆෙලිසිටි කිව්වා. "අපොයි, මට නම් පුදුම සතුටක්, ඩැරල්, මම ඒක කියන්නම ඕනැ. අපි හැමෝම අලුත් ළමයි අද උදේ මිස් ග්‍රේලින්ව හම්බ වෙන්න ගියා. එයා කිව්වෙත් ඔයා කියපු දේවල්මයි. ඔයා මුලින්ම ආපු දවසේ කියපු දේවල්. එයා නම් හරිම අපූරු කෙනෙක් !"

"ඔව්, මිස් ග්‍රේලින් අපූරු කෙනෙක්" ඈ ෆෙලිසිටිට කිව්වා.

"ඔයත් ඒ වගේ අපූරුයි" ෆෙලිසිටි ආඩම්බරයෙන් ඩැරල්ට කිව්වා. "මගේ අක්කා පන්ති නායිකාවක් වීම කොයිතරම් අපූරු ද !"

# 06

හිතර පන්තියට අලුතින් ඒමට සිටි අවසාන දැරියගේ පැමිණීම ගැන ගොන්ඩොලින් දැඩි විමසිල්ලෙන් සිටියා. අවසානයට පැමිණීමට සිටියේ ක්ලැරිසායි. පන්තියේ විශේෂ යෙහෙළියක් නොමැතිව සිටි එකම දැරිය ගොන්ඩොලින් වූ අතර අලුතින් පැමිණි නිවුන්නියන් සමග මිත්‍රත්වයක් ගොඩ නඟා ගැනීමට උත්සාහ කිරීම පලක් නොවන බව ගොන්ඩොලින්ට සිතුණේ නිතර නිවුන්නියන් එකිනෙකා සමග බැඳී සිටීමට ප්‍රිය කරන බව පෙනුණ නිසයි.

'කොහොම වුණත් මට එයාලව ගැළපෙන්නේ නැහැ.' ගොන්ඩොලින් සිතුවා. 'එයාලා හැම තිස්සේම සෙල්ලම්වලටයි, ක්‍රීඩාගාරයටයි, ඇවිදීම්වලටයි එළියට යනවා. ඇයි නියම ගැහැනු ගති තියෙන ගැහැනු ළමයි මෙහේ නැත්තේ ? හෙමින් කතා කරන, නිශ්ශබ්දව පොත් කියවන අය, ලැක්රෝස් පිටියේ උඩ පැන පැන දුවන හරි, අර එපා කරපු සීතල පිහිනුම් තටාකයට පනින හරි අය නොවෙයි!"

අසරණ කම්මැළි ගොන්ඩොලින් ! දැරියන්ට මහත් සතුටක් හා විනෝදයක් ගෙන දෙන කිසිම දෙයකින් ඈ රසයක් වින්දේ නැහැ. දුව පැන කරන සියලු දේ ඈ පිළිකුල් කළ අතර පිහිනුම් තටාකයේ සීතල වතුර ගැන ඇයට තිබුණේ බලවත් නොකැමැත්තක්.

ඩැෆනි හා මේරි ලෝව් ද පිහිනුම් තටාකය ප්‍රිය කළේ නැහැ. එහෙත් ඔවුන් ටෙනිස් ක්‍රීඩාවට හා ඇවිදීම්වලට ප්‍රිය කළා. ඔවුන් දෙදෙනාම අසුන්ට බියක් දැක්වූ හෙයින් ඔවුන් අසුන් පැදවීමට ගියේ නැහැ. උදය ආහාරයට පෙර සෑම දිනම තන්ඩර් පිට රවුමක් යන විල්, තන්ඩර්ට සූකිරි කැටයක් හෝ දීමට ඌට ළං නොවන හා ඌ අඩි පොළොවේ හප්පන විට ඉන් බියට පත්ව යටිගිරියෙන් හඬ තළමින් ඉවත දුවන මේරි ලෝව්, ඩැෆනි හා ගොන්ඩොලින් දෙස බැලුවේ

උපහාසයෙන් යුතුවයි. ඇය, ඩැරල් හා අලුත් නිවුන්නියෝ දෙ
එක්ව සතියට දෙවරක් අසුන් පැදවීමට කටයුතු යොදාගෙන තිබූ අ
විල්ගේ උසස්ම මිතුරිය, තුන්වන පන්තිය භාර පීටර්ස් ගුරුතුමි
ඔවුන් සමග පැමිණියා. කඳු හෙල් මතින් කෙරෙන මෙම ගමන්ව
ඔවුන් අතිමහත් ලෙස විනෝදයක් ලැබුවා.



ෆෙලිසිටි පළමු පන්තියේ ඇරියක් නිසා ඇයට මෙම ගමන
සඳහා අවසර ලැබුණේ නැහැ. ඩැරල්ගේ සිත් තැවුලට මෙන් ඇයට
දැන ගන්නට ලැබුණේ අසුන් පැදවීමට හැකි පළමු පන්තියේ සිටින
අනෙක් එකම ඇරිය ජූන් බවයි. මෙලෙස ඔවුන් දෙදෙනාටම විනෝද
විය හැකි, දෙදෙනාටම පොදු යමක් තිබීම නිසා ඔවුන් තවත් සමීප
මිතුරියන් වනු ඇතැයි ඩැරල් කනස්සල්ලෙන් යුතුව සිතුවා.

ඩැෆනි හා මේරි ලෝව් මිතුරියන් වූ අතර මෙල්විස් ද නිතරම
ඔවුන් පසුපස වැටී ඔවුන් සමග කල් ගත කළා. හැකි සෑම විටම
ඔවුන් සමග මෙල්විස් එක් වීම ගැන ඔවුන් එතරම් නොතැකුවේ
ඔවුන් ඇයට ඇලුම් කළ නිසයි. කිසිම මිතුරියක් අවශ්‍ය නොවූ නිසා
විල්ට විශේෂ මිතුරියක් සිටියේ නැහැ. ඇගේ මිතුරුකමට සිටියේ
තන්ඩර්. විල් වඩාත් ගැළපුණේ පිරිමි දරුවන් ඇසුරටයි. ඒ ඇයට
සහෝදරයින් හත් දෙනෙක් සිටි නිසා ඇයට වඩාත් තේරුණේ ගැහැනු
දරුවන්ගේ හැසිරීම් නොව පිරිමි දරුවන්ගේ හැසිරීම් නිසයි. ඇය

කටයුතු කරන ආකාරය අනුව ඇය ද පෙනුණේ පිරිමි දරුවෙක් මෙන්මයි. සූටන් මහතාගෙන් වඩු වැඩ ඉගෙන ගැනීම තෝරා ගත් හතර පන්තියේ එකම දැරිය ඇය වූ අතර ඔහුගේ ඉගැන්වීම් ප්‍රිය කළ පළමු හා දෙවැනි පන්තිවල දැරියන් සමග එකට එම පන්තිවලට සහභාගී වීමට ඈ කිසිදු පැකිළීමක් දැක්වූයේ නැහැ. මේ වන විට ඇය තම පියාට දුම් බොන පයිප්පයක් ද, කුඩාම සහෝදරයාට සෙල්ලම් නැවක් ද, මවට කෑම බඳුන් තබන ආධාරකයක් ද සාදා තිබුණ අතර එම්බ්‍රොයිඩර් වැඩ කරන්නියන් තම නිර්මාණ ගැන සතුටු වන තරමටම හා ගෙත්තම් කරන්නියන් තමන්ගේ ගෙතූ ලේන්සු ගැන සතුටු වන තරමටම ඈ තම නිර්මාණ ගැන සතුටු වුණා.

මෙලෙස තමා සමග ගමනක් යාමට කිසිවෙකු නැතිව හෝ තමා සමග ආශ්‍රය කිරීමට කිසිවෙකු නැතිව හෝ කිසිවෙකු සමග යමකට කැකිරි පලා සිනාසීමට හෝ මිත්‍රත්වය සඳහා කෙනෙකුගෙන් ආරාධනා නැතිව හෝ සිටියේ ගොන්ඩොලින් පමණයි. එය නොතකන බව ඇය බොරුවට ඇඟවුව ද එය ඇගේ සිතට තදින් බලපෑවා. එහෙත් දැන් ගරු ක්ලැරිසා කාටර් පැමිණි විට ඇයට එම අවස්ථාව උදා වනු ඇත. තමාට ඇත්තෙන්ම හොඳම මිතුරියක් ලැබුණ විට ඇගේ මව කොතරම් සතුටු වනු ඇති ද !

මෙලෙස, ක්ලැරිසාගේ පැමිණීම අපේක්ෂාවෙන් ගොන්ඩොලින් මඟ බලා සිටියා. චමත්කාර ඇඳුමින් සැරසී උසස් පන්නයේ මෝටර් රථයකින් පැමිණෙන දැරියක ඇගේ සිතේ මැවී තිබුණා. ගරු ක්ලැරිසා කාටර් ! 'මගේ යාළුවා' ගොන්ඩොලින් සිතුවා. 'අම්මා, මේ මගේ හොඳම යාළුවා, ගරු ක්ලැරිසා කාටර් !' තමා තම මවට හා මහලු ආයා, වින්ටර් මහත්මියට ඇයව හඳුන්වා දෙන අයුරු ගොන්ඩොලින් සිතේ මවා ගත්තා.

ඈ මෙම සිතුවිලි කිසිවක් අනෙක් දැරියන්ට හෙළි කළේ නැහැ. ඇය සැලසුම් කරන දෙය ඔවුන් දැනගතහොත් ඇයට ඔවුන් කතා කරන්නේ කුමන වචනදැයි ඈ දැන සිටියා. අලි ඔළුව, කපටි, වංචාකාරී! ප්‍රසිද්ධ නැතිනම් පොහොසත් අයගේ පස්සේ එල්ලෙනවා! ඒක තමයි හුරතල් ගොන්ඩොලින්ගේ හැටි !

තේ වේලාව වනතුරුත් ක්ලැරිසා පැමිණියේ නැහැ. ගොන්ඩොලින් සෙසු පිරිස ද සමග තේ මේසයේ වාඩිවී සිටි නිසා විදුහල්පතිනිය අමුතු දැරියක සමග පැමිණෙන තුරුම ඇයට ක්ලැරිසාව දැක ගත නොහැකි වුණා.

ගොන්ඩොලින් වැඩි උනන්දුවකින් තොරව හිස ඔසවා බැලුවා. කුඩා දැරිය එතරම් උස් මහත් දැරියක් නොවෙයි. සමහර විට දෙවැනි පන්තියේ දැරියක් තරම් වුණා. සනකම් කාච සහිත උපැස් යුවළක් පැලඳ සිටි ඇගේ දත් ඉදිරියට ඒම වැළකීමට ඉදිරි දත් පෙළට කම්බියක් යොදා තිබුණා. ඇගේ එකම ලස්සන වූයේ සුන්දර තඹවන් පැහැ ගත් මදක් රැලි සහිත කෙස් කළඹ පමණක් බව පෙනුණා. තවත් පාන් පෙත්තක් අතට ගත් ගොන්ඩොලින් ජෑම් බෝතලය සෙව්වා.

අලුත් දැරිය කොතරම් කුළෑටි ද කිව හොත් ඇය ඇත්තෙන්ම ගැහෙමින් සිටියා ! මෙය දුටු ඩැරල්ට ඇය ගැන දුක සිතුණා. ඇය ද ප්‍රථම දිනයේ පැමිණ මෙලෙස තමා නොහඳුනන දැරියන් විශාල සංඛ්‍යාවකට මුහුණ දෙන විට ඇයට ද තමා ගැහෙන බවක් හැඟුණා.

ඩැරල්ගේ පුදුමයට මෙන්, ශ්‍රේලින් මහත්මිය හතර පන්තියේ මේසය වෙත දැරිය කැඳවාගෙන ආවා. මම්සලී ඩූපොන්ට් තේ බොමින් මේසයේ ප්‍රධාන කෙළවරේ වාඩි වී සිටියා.

“ඕ, මම්සලී” ශ්‍රේලින් මහත්මිය කතා කළා. “මෙයා තමයි ක්ලැරිසා කාටර්, හතර පන්තියට එන අන්තිම අලුත් ළමයා. මෙයාට තැනක් හොයලා දීලා, තේ බොන්න සලස්වන්න පුළුවන් ද ? තේ බීම ඉවර වුණාට පස්සේ මේ පන්තියේ නායිකාවට පුළුවන් වෙයි මෙයාව බලා ගන්න.”

මහත් විමතියට පත් ගොන්ඩොලින්ගේ අතින් පාන් පෙත්ත වැටෙන්නට ගියා. දෙවියනේ, ඇයට ඇගේ අගනා අවස්ථාව අහිමි වූ තරම් ! මේ කුඩා අවලස්සන දැරිය ක්ලැරිසා වීමට පුළුවන් ද ? ඔව්, ඒ ඈ තමයි. දැන් ඈ ඉක්මන් කර තම සැලසුම් ක්‍රියාත්මක කළ යුතුයි.

ගොන්ඩොලින් පසෙක ඉඩකඩක් තිබූ අතර ඈ කොතරම් කඩිමුඩියෙන් නැඟී සිටියේ ද යත් හැපුණු ඇය නිසා ඩැෆනිගේ තේ කෝප්පය නොවැටී බේරුණේ අනූනවයෙන්.

“ක්ලැරිසාට පුළුවන් මා ළඟ වාඩිවෙන්න.” ඈ කිව්වා. “මෙතැන ඉඩ තියෙනවා.”

ගොන්ඩොලින් පසෙක වාඩි වී ගුළිවී සැඟවී නොපෙනී සිටීමට තරම් ක්ලැරිසාට මහත් වුවමනාවක් තිබූ නිසා ඈ එය සතුටින් පිළිගනු පෙනුණා. ඇලිසියා ඩැරල්ට වැලමිටෙන් ඇන්නා. “හරි හදිස්සියක් යාට තියෙන්නේ, නැද්ද ?” ඇය කෙඳිරුව අතර ඩැරල් සිහින් ඬක් නැඟුවා.

ගොන්ඩොලින් ඉතා පියකරු බවක් පෙන්වූවා. ගොන්ඩොලින් ව්‍යාජ ලෙස මවාපාන මෙම මිත්‍රශීලී බවට ඇලිසියා නම් දී තිබුණේ 'බොරු හුරතලය' ලෙසයි. ඈ ක්ලැරිසා දෙසට නැඹුරු වී මිත්‍රශීලී මඳ සිනාවක් නැගුවා. "මැලෝරි ටවර්ස්වලට සාදරයෙන් පිළිගන්නවා. මම හිතන්නේ ඔයාට මහන්සියි වගේම බඩගිනි ඇති. මේ පාන් කන්න බටර් එක්ක."

"මට හිතෙන්නේ මට මොකවත් තවම කන්න බැහැ කියලා. ස්තුතියි." ඇඩි කුළෑටි බවින් මහත් අසහනයට පත්ව සිටි ක්ලැරිසා කිව්වා. "ඒත් ඔයාට ස්තුතියි."

"ඕ, ඔයා මොනවා හරි කන්න ඕනෑ"කී ගොන්ඩොලින් බටර් තැවරූ පාන් පෙත්තක් ගත්තා. "මම මේකට ජෑම් ටිකක් ගාන්නම්. මේක රහ බලන්න තරම් වටිනා ජෑම් එකක්."

එයට විරෝධය පෑමට තරම් ක්ලැරිසාට එඩිතරකමක් තිබුණේ නැහැ. හැකිතාක් දුරට නොපෙනී සිටීමට ඈ ඇකිළී ගුළිවී වාඩි වී සිටියා. කිසිවෙකුට නොපෙනෙන පරිදි හැංගී සිටීමට ඇයට වුවමනා වුණා. ඇය ඉතා කුඩා පාන් කැබැල්ලක් සපා ගත් අතර ඇයට එක කටකට වැඩිය විකා ගිල ගැනීමට අපහසු බවක් පෙනුණා.

මෙම අලුත් කුළෑටි දැරියට තමා කොතරම් මිත්‍රශීලී ලෙස කතා කරමින් ඇයව සහනයකට පත්වන අයුරින් කොතරම් ප්‍රියමනාප ලෙස හැසිරෙන්නේදැයි අන් අය සිතනු ඇතැයි යන හැඟීමෙන් යුතුව ගොන්ඩොලින් මිහිරි ලෙස ක්ලැරිසා සමග කතාවට වැටුණා. මෙහිදී රැවටුණේ මම්සලී පමණයි.

'අනේ අපූරු ළමයා, ගොන්ඩොලින්' ඈ සිතුවා. "අහ්, ප්‍රංශ පාඩමේදී නම් මෝඩ කෙල්ලක් තමයි, ඒත් බලමුකෝ, ලැජ්ජාවෙන් වෙව්ලන මේ සාමාන්‍ය අලුත් ළමයාට එයා මොන තරම් සිත් ඇදගන්න විදිහට කතා කරනවා ද කියලා !"

තේ වේලාවෙන් පසු මම්සලී ඩැරල්ව ඇමතුවා. "ඩැරල්, ඔයා ක්ලැරිසාව ඇනට බලාගන්න, හොඳද ? එයාට අලුතින් ටිකක් අමුත්තක් දැනෙයි. ඒක තේරෙනවා නේද ?"

"මම්සලී, මට හරිම කනගාටුයි. මට යන්න සිද්ධ වෙනවා පන්ති නායිකාවන්ගේ රැස්වීමකට, මේ දැන්ම." ඩැරල් කිව්වා. "තව විනාඩි පහක්වත් නැහැ සැලී, නැත්නම් බෙලින්ඩා හරි....."

"මම බලාගන්නම්කෝ එයාව" ගොන්ඩොලින් වහාම ඉදිරිපත් වී කිව්වා. "මම එයාට වටපිටාව පෙන්වලා රවුමක් එක්ක යන්නම්. මම ඒකට හරිම කැමතියි."

ඇය ක්ලැරිසාට දීප්තිමත් සිනාවක් පෑ අතර ඉන් අලුත් දැරිය වික්ෂිප්ත වූ අතර සෑම කෙනෙකුටම යම් අපහසුවක් දැනුණා. ඈ තම අත ක්ලැරිසාගේ අත හා පටලවා ගත්තා. "එන්න, යමු" කෙනෙකු ඉතා කුඩා ළමයෙකුට ආමන්ත්‍රණය කරන ස්වරයකින් ඈ කිව්වා. "ඔයාගේ කුඩා බෑග් එක කොහේද ? මම ඔයාට නිදන කාමරය පෙන්වන්නම්. ඒකේ ඔයාට තියෙන්නේ හරිම අපූරු තැනක් !"

ඇය ක්ලැරිසා සමග පිටතට ගිය අතර සෑම කෙනෙක්ම මුහුණු ඇද කර කෙඳිරි ගෑවා. "ඒවගේ දෙයක් කරන්න තරම් හිතට හයිය ගන්න ගොන්ඩොලින් මේරිට පුළුවන් කියලා විශ්වාස කරන්න පුළුවන් ද ?" ඇලිසියා කිව්වා. "මොන තරම් පුහු අහංකාරයක් ද ? අවංකවම, මැලෝරි ටවර්ස්වලට ආව දා ඉඳලා ගොන්ඩොලින් හොඳයි කියන්න ටිකක්වත් වෙනස් වෙලා නැහැනේ !"

"මමත් හිතනවා ඔයා හරි කියලා." ඩැරල් කිව්වේ මේ කාරණය සලකා බලමින් හිස පැත්තකට ඇල කරගෙනයි. "ඒක ඇත්තටම හරි අමුතු දෙයක්. මම හිතුවේ වාර කීපයක් මෙහේ ඉද්දි ඕනෑම කෙනෙක් ටිකක් හරි හොඳට හැදෙනවා කියලයි. ඉතින්, ගොන්ඩොලින් මෙහේ අවුරුදු ගණනක් හිටියනේ. ඒත් එයා තවමත් හොර වැඩ කරන, පහත්, කම්මැළි, වැඩකට නැති පුස්සක්. !"

"ඔයා හොඳ කෙනෙක් වුණේ කොහොමද, ඩැරල් ?" ඇලිසියා සරදම් ලෙස ඇසුවා. "ඔයත් ඒ තරම් වෙනස් වෙලා කියලා මට කියන්න බැහැ !"

"එයා හැදෙන්න ඕනැ කියලා වැදගත් විදිහට හිතට ගත්තා." සැලී ඇයට පක්ෂපාතව කතා කළා.

"කොහොම හරි මම මගේ තරහා පාලනය කර ගත්තා." ඩැරල් කිව්වා. "මම දැන් වාර ගණනකින් තරහින් පිපිරුණේ නැහැ. ඔයාලා ඒක දන්නවා. ඒක මැලෝරි ටවර්ස් මට කරපු එක දෙයක්."

"කයිවාරු ගහන්න එපා." සිනහා නගමින් ඇලිසියා කිව්වා. "මේ ළඟදි මම දැක්කා ඔයාගේ ඇස් අමුතු විදිහට දිලිසෙනවා, ඩැරල් අහා, ඔව්, ඇත්තමයි ! ඔයා පරිස්සම් වෙන්න !"

ඩැරල් එය ඇඩි සේ ප්‍රතික්ෂේප කිරීමට සැරසුණ ද, වහා නැවතුණ ඇගේ දෙකම්මුල් රත්පැහැ වන්නට වූවා. ඔව්, ඇලිසියා කී පරිදි ඇගේ ඇස්වල 'දිස්නයක්' ඇති බව ඇයට දැනුණා. වසංගතයක් බඳු වූ කුඩා ජූන් ගැන කතා කරන විට ඇගේ කෝපය නිසා ඇසේ දිලිසුමක් තිබූ බව සැබෑවක් වූ අතර සැබවින්ම එයට කළ හැකි දෙයක් ඇයට තිබුණේ නැහැ. එහි වරදක් තිබුණේ නැහැ. ඇය කෝපයෙන් රත් නොවන තාක් කල් හා ඇය නැවත එලෙස හැසිරෙන්නේ නැති තාක් කල් කිසිවෙකුට ඇයට ඉක්මන් කෝපය ගැන චෝදනා කළ නොහැකියි.

"මම ඔයා ගැනත් තරහින් රත්වෙලා දිලිසෙන ඇස්වලින් බලයි, ඇලිසියා." ඈ හඬ නඟා සිනාසෙමින් කිව්වා. "කොහොම වුණත් පන්ති නායිකාවක් දිලිසෙනවා, ඒ හින්දා ඔයා කියන දේවල් ගැන පරිස්සම් වුණොත් හොඳයි !"

# 07

හතර පන්තිය ඉක්මනින්ම වැඩවලට හුරුවුණා. විලියම්ස් ගුරුතුමිය කදිම ගුරුවරියක වූ අතර පාසල් සහතිකපත් විභාගයේදී විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීමට ඈ මහත් ලෙස අධිෂ්ඨාන පූර්වක වුණා. මම්සලී ඩූපොන්ට් හා මම්සලී රොජර් යන දෙදෙනාම හතර පන්තියට ඉගැන්වූ අතර ඉන් වඩා හොඳ ගුරුවරිය වූයේ මම්සලී රොජර් වුව ද පෞෂ්ටිමත් මම්සලී ඩූපොන්ට් දැරියන් සමඟ වඩා කුලුපගව හා හාස්‍යයට ප්‍රිය ලෙස හැසිරුණ නිසා වැඩි ප්‍රතිඵල පෙන්වූයේ ඇයයි. අනෙක් මම්සලීට වඩා හොඳින් දැරියෝ ඇය සමග බොහෝ වැඩ කළා.

එම සුන්දර ගිම්හාන වාරයේ මහන්සියෙන් වැඩ කිරීමට සිදුව තිබූ නිසා දැරියෝ කන් කෙඳිරි ගෑවා. "පිහිනන්න, ටෙනිස් ගහන්න නැතිනම් මල් පිපුණ මැද මිදුලේ ටිකක් ඇවිදින්න තියෙන වෙලාවේදී අපිට පොත්වලට ඔළුව ඔබාගෙන ඉන්න සිද්ධ වෙලා" ඇලිසියා කිව්වා. "මම අද රෑ පන්තිය එළියේ කරමු කියලා මිස් විලියම්ස්ට යෝජනා කරනවා. එයා ඒකට ඉඩ දෙයි."

පුදුමයක් ලෙස විලියම්ස් ගුරුතුමිය එයට කැමති වුණා. හතර පන්තියේ බොහෝමයක් දැරියන් ඇයට විශ්වාස කළ හැකි බවත්, අවශ්‍ය වූ විටෙක පන්ති නායිකාව ලෙස ඩැරල්ට දැරියන්ව මෙල්ල කර ගැනීමට හැකි බවත් ඈ දැන සිටියා. වැඩ කළ යුතු වේලාවේදී දැරියන්ව වැඩට යොමු කර ගැනීමේ හැකියාව ඩැරල්ට ඇති බව ඈ දැන සිටියා. එලෙස සවස තේ පානයෙන් පසුව ඔවුන් පිටතට ගියේ වාඩි වීමට පුටු කොට්ටා ද රැගෙනයි. ගිම්හානයේ සැඳෑ හිරු කිරණ අවට පැතිරී තිබුණා.

ගොන්ඩොලින්ට පිටතට යාමට අවශ්‍ය වුණේ නැහැ. ඇත්තෙන්ම, ඇයට පමණයි අවශ්‍ය නොවුණේ. "ඔයා නම් එළියට යන එක හරිම පිළිකුල් කරනවා." පුදුමයට පත් ඩැරල් කිව්වා. "එන්න එළියට, ටිකක් නැවුම් හුළං වැදිලා ව්‍යායාම ටිකක් ලැබුණොත් ඔයාගේ ඔය මහත ගතියයි, නාසය උඩ තියෙන ලපයි නැතිව යයි."

"එක එක්කෙනාගේ ඇඳ කුඳ කියන්න එපා." උඩඟු බවක් මවා ගත් ගොන්ඩොලින් කිව්වා.

ඇය සමග සිටි ක්ලැරිසා ගොන්ඩොලින් දෙස පුදුමයෙන් බැලුවා. ඇගේ බැල්ම දුටු ග්වේන් වහාම තම අත ක්ලැරිසාගේ අතෙහි පටලවා ගත්තා.

"ඔයත් පාඩම්වලට එළියට යනවා නම්, ඇත්තමයි, මමත් එනවා." ඈ කිව්වා. "ඒත් අපි හෙවණකින් වාඩි වෙමු. හමේ රතු ලප එනවාට මම කොහොමවත් කැමති නැහැ." ළමෝ සියලු දෙනාම මැද මිදුල වෙත ගියා.

පැයකට පමණ පසුව මැද මිදුලට පැමිණි විලියම්ස් ගුරුතුමිය උතුරු කුලුනේ හතර පන්තිය ඉතා මනාව හා සාමකාමීව පාඩම් සඳහා සූදානම් වනු දැක ඉමහත් සතුටට පත් වුණා.

"දැන් වෙලාව හරි" ඈ කිව්වා. "ක්‍රීඩා ටීචර්ගෙන් ඔයාලට පණිවිඩයක් තියෙනවා. ඔයාලට නාන්න පිහිනුම් තටාකය සූදානම්. ඒ නිසා තව පැය භාගයකින් ඔයාලට එතැනට යන්න පුළුවන්. ඔයාලට ඊයෙත් නාන්න බැරිවුණ නිසා ඉක්මන් කරන්න."

අනපේක්ෂිත ලෙස ලැබුණ සැඳෑ ස්නානය හා පිහිනීම ගැන මහත් සතුටට පත් ඩැරල්, සැලී හා ඇලිසියා ඇඳුම් මාරු කර ගන්නා කාමරයට දුව ගියා. සියල්ලෝම කතා බස් කරමින් මහ හඬින් සිනාසෙමින් ගමන් කරන්නට වූ අතර ඔවුන් පසුපසින් පැමිණියේ ග්වේන්, ඩැෆනි හා මේරි ලෝව්ගෙන් සමන්විත තරමක් දුකට පත් පිරිසයි. ඒ ඔවුන් තිදෙනා වතුරට බැසීම ඇඩී සේ අප්‍රිය කිරීම නිසාය. ක්ලැරිසා පැමිණියේ නැරඹීමටයි. ඇගේ දුර්වල හෘදයවස්තුව හේතුවෙන් ඇයට පිහිනීමට හෝ ටෙනිස් ක්‍රීඩා කිරීමට අවසර තිබුණේ නැහැ.

"හරිම වාසනාවක්" පිහිනුම් ඇඳුම ඇඳගනිමින් ගොන්ඩොලින් කිව්වා.

"පිහිනන්න නැහැ. ටෙනිස් ගහන්න නැහැ. මටත් දුර්වල හදවතක් තිබුණ නම්"

"මොන තරම් නපුරු දෙයක් ද කියන්නේ," සැබැවින්ම කම්පනයට පත් ඩැරල් කිව්වා. "තමන්ට එහෙම දෙයක් වෙන්න කියලා ඔයා ප්‍රාර්ථනා කරන්නේ කොහොමද ? ඒවා කරන්න හොඳ නැහැ, මේවා කරන්න හොඳ නැහැ කියලා හැම තිස්සෙම හිත හිතා ඉන්න වුණොත් ඒක මොන තරම් භයානක ද ?"

"ඒක ඇත්තටම භයානකයි." ක්ලැරිසා තම ලැජ්ජාශීලී සියුම් හඬින් කිව්වා. "මගේ මේ අසනීපය නොතිබුණා නම් මට ගෙදරදීම ඉගෙන ගන්න සිද්ධ වෙන්නේ නැහැ. මටත් ඔයාලා වගේ ඉස්කෝලේ යන්න තිබුණා. කොහොම වුණත් දැන් හුඟක් සනීප නිසයි අන්තිමට මට ඉස්කෝලේ එන්න අවසර ලැබුණේ."

මෙය ක්ලැරිසා කළ දිගු කතාවක් වුණා. බොහෝ විට ඈ නිතර නිහඬයි. එසේ හෙයින්, ඇය කතා කරන අතරතුර ඇය රත් පැහැ ගැන්වුණ අතර කතාව අවසන් වූ වහාම හිස පහත් කරගත් ඈ ගොන්ඩොලින් පසුපස සැඟවෙන්නට උත්සාහ කළා.

"පව්, අහිංසක ක්ලැරිසා." ගොන්ඩොලින් අනුකම්පාවෙන් කිව්වා. "ඔයා ඒ තරම් වැඩ කරන්න එපා. දන්නවානේ. ඔයා හුඟාක් මහන්සි වෙලා වැඩ කළොත් මොනවා වෙයිද කියලා ?"

"ඕ, ඔව්. මගේ හදවත ඇතුළෙන් වේගයෙන් ගැහෙන්න පටන් ගන්නවා. හරියට පපුව ඇතුළේ කුරුල්ලෙක් ඉන්නවා වගේ." ක්ලැරිසා කිව්වා. "ඒක හරිම නරකයි. ඒ වෙලාවට මට ඕනැ හාන්සිවෙලා හති අරින්න."

"ඇත්තට ?" ගොන්ඩොලින් තුවායෙන් සිරුර දවටා ගනිමින් ඇසුවා.

"හොඳයි, ඔන්න බලන්නකෝ, ක්ලැරිසා, මටත් හදවතේ අමාරුවක් තියෙනවා කිව්වොත් ඒක ගැන නම් මම ටිකක්වත් පුදුම වෙන්නේ නැහැ. ඒක දන්නේ තියෙන කෙනා විතරයි. මම හුඟාක් වෙලා පිහිනන්න හැදුවොත් මට හුඟ බය හිතෙනවා. අනික හොඳට ටෙනිස් සෙල්ලම් කළාට පස්සේ මගේ පපුව ගැහෙන්නේ මෝලක් වගේ. ඇත්තටම හුඟාක් රිදෙනවා."

"ඔයාට හදවතක් තියෙනවා කියලා අහන්න ලැබුණ එකත් ලොකු දෙයක්." ඇලිසියා හැකි පමණ මෘදු හඬින් කිව්වා. "කොහෙද අනේ ඒක තියෙන්නේ ?"

හිස ගැස්සූ ගොන්ඩොලින් ක්ලැරිසා සමග ඉවතට ගියා.

"එයා හරිම නපුරියක්, නේද ?" ඇගේ හඬ ආපසු අනෙක් දැරියන් වෙත පාවී ආවා. "මට එයාව පෙන්නන්න බැහැ. කවුරුවත් එයාට ඇත්තටම කැමති නැහැ."

ඇලිසියා අප්‍රසාදයෙන් හඬක් නැගුවා. "ගොන්ඩොලින් මේරි මොන වගේ විසක් අසරණ ක්ලැරිසාගේ කන්වල පුරවයි ද දන්නේ නැහැ." ඈ කිව්වා. "මම හිතන්නේ නැහැ ගොන්ඩොලින්ට ඒ අසරණ ළමයාව සම්පූර්ණයෙන් පාලනය කරන්න ඉඩදෙන එක හොඳයි කියලා. ඒක හරි නැහැ. මේ ගැන ඔයා මොනවා හරි කරන්න ඕනෑ. ඩැරල්. එහෙම නේද ?"

ඩැරල් මෙම ඍජු පහරදීමට කැමති වුණේ නැහැ. එහෙත් ඇලිසියා නිවැරදි බව හදිසියේම ඇයට වැටහුණා. ගොන්ඩොලින් හට කුඩා දුර්වල ක්ලැරිසාව හිතුමනාපයට නැටවීමට ඉඩ නොදීමට තමා වගබලා ගත යුතු බව ඇයට සිතුණා. ඇය තම පළමු වාරයේදීම සෑම දෙයක් ගැනම වැරදි අවබෝධයක් ලබාගනු ඇත. කෙනෙකු පළමුව ලබා ගන්නා අදහස් බොහෝ දුරට පැළපදියම් වීමට ඉඩ ඇත !

තටාකයේ බැස නෑම විනෝදයක් වුණා. ඇත්තෙන්ම, හොඳ පිහිනුම්කාරියෝ තරගවල නියුතු වුණා. නොගැඹුරු අන්තයේ සිට මේරි ලෝව් දිය යට ගිලෙමින් මතුවෙමින් ඉඳ හිට අත්පහර කීපයක් දී පිහිනමින් සිටියා. ඇය වතුර පිළිකුල් කළ ද නිතර ඉක්මනින්ම වතුරට බැස ගත්තා. ඩෆ්නි ද සුපුරුදු පරිදි වෙව්ලමින්, ජලයට බැස මේරි ලෝව් අසලම ජලයේ ගිලෙමින් සිටියේ ඩැරල් ඇයව තරගයකට සම්බන්ධ කර නොගන්නේ නම් මැනවයි සිතමිනුයි. මෙල්විස් ඉතා සෙමින් පිහිනමින් සිටියා. ජලයට ඇති නොකැමැත්ත ඇය තුරන් කර ගෙන තිබූ නමුත් වැඩි දුර නොපිහිනීමට ඈ වග බලා ගත්තා. එමෙන්ම පසුගිය වසරේ අසනීප වීම හේතුවෙන්, පමණට වඩා ටෙනිස් ක්‍රීඩා නොකර ප්‍රවේසම් වීමට ඇයට සිදුව තිබුණා.

තටාක ඉවුරේ සිට වෙව්ලමින් සිටියේ ගොන්ඩොලින් පමණයි. ඇලිසියා, ඩැරල් හා සැලී ඇයව වතුරට තල්ලු කිරීමට මහත් සේ

ආශා කළ ද තටාකයෙන් පිටතට ඒමට ඔවුන් කිසිසේත් ප්‍රිය කළේ නැහැ.

"ග්වෙන් ඉක්මනට වතුරට බැස්සේ නැතිනම්, එයා කවදාවත් වතුරට බහින්නේ නැහැ." ඇලිසියා කිව්වා. "එයාට බහින්න කියන්න, ඩැරල් ! කියන්න. අර තරහ බැල්මක් දාගෙන ඔයාගේ නියෝගයක් නිකුත් කරන්න !"

එහෙත් ඩැරල්ගේ කෑගැසීම්වලින්වත්, දෙපා පමණක් ජලයට දමා ගැනීම හැර වෙනත් යමක් කිරීමට ගොන්ඩොලින් පෙලඹුණේ නැහැ. මැද මිදුලේ සිටියදී උණුසුම්ව සිටි ඇය දැන් තටාකයේදී අයිස් මෙන් සීතලව සිටියා. "උඉඉඉ...ඉ හ් !"



ඒ මොහොතේ ගොන්ඩොලින්ගේ පසෙකින් සිටගෙන සිටීමට ක්ලැරිසා දුව ආවා. ගල් තලාවේ ලිස්සන තැනක පය ගැටුණ ඇය තදින් ගොන්ඩොලින්ගේ සිරුරේ ගැටුණා. ගොන්ඩොලින්ව ඊළඟට කෙළින්ම වතුරට වැටුණා. !

"ෂරාප් !" බියපත් මහා බෙරිහන් දීමක් ද සමග ගොන්ඩොලින් තටාකය ඇතුළේ. එකිනෙකා තරයේ වැලඳගත් ඇරියෝ ඇස්වලින් කඳුළු පතින තුරු හඬ නඟා සිනාසුණා.

"අර බලන්නකෝ, ක්ලැරිසාගේ මුහුණේ හැටි." ඩැරල් සිනහව වළකාගත නොහැකිව කිව්වා. "එයා හොඳටම බය වෙලා !"

"කවුද මාව තල්ලු කළේ ?" වතුරේ ගිලෙමින් ජලය විසුරුවමින් මතුපිටට එන අතරේ ගොන්ඩොලින් කෝපාවිෂ්ටව තදින් ඇසුවා.

"උඹලා හැමෝම නපුරු යක්ෂණියෝ !"

# 08

තමා පිහිනුම් තටාකයට තල්ලු කළේ ක්ලැරිසා බව ඇසෙන විට ගොන්ඩොලින්ට එය ඇදහිය නොහැකි වුණා. සමාව අයදින්නට සූදානම්ව සිටින ක්ලැරිසා සිටින තැන බලා ඈ ඇවිද ගියා.

"කව්ද මාව තල්ලු කළේ, ක්ලැරිසා ?" ඈ තදින් ඇසුවා. "එයාලා හැමෝම කියනවා ඔයා කියලා, මෝඩියෝ ! ඔයා කොහොමද මට එහෙම දෙයක් කරන්නේ; හිතාගෙන ඇති ඔයත් මට එහෙම කරනවා කියලා !"

"අනේ, ගොන්ඩොලින්, මට හරිම දුකයි. ඒත් ඒ මම තමයි." මහත් දුකට පත් ක්ලැරිසා කිව්වා. "මම ලිස්සලා වැටුණා. එතකොට ඔයාව හැප්පුණා.... ඉතින් ඔයා වතුරට වැටුණා. ඇත්තෙන්ම මම ඒක හිතලා කරපු දෙයක් නොවෙයි, මට ඇත්තටම ඒ ගැන දුකයි !"

"ඕ, එහෙම නම් කමක් නැහැ." ගොන්ඩොලින් කිව්වේ එතරම් සමාව අයදින ක්ලැරිසා වැනි දැරියක් ඇක ගැනීමට කැමැත්තෙනුයි. "මට නම් වුණේ හරිම නරක දෙයක්. ඇත්තෙන්ම, අර ගල් පතුලේ වැදිලා මගේ කකුළ හුඟාක් රිදුණා. ඒත් කමක් නැහැ, ඒක බැරිවීමකින් සිද්ධ වුණ දෙයක් හින්දා."

ක්ලැරිසා තව දුරටත් සමාව අයදින බැල්මෙන් බලා සිටින්නට වූ අතර එය ගොන්ඩොලින්ගේ ඔද්දල් වූ හැඟීම්වලට දිව ඔසුවක් බඳු වුණා. ගරු ක්ලැරිසා එලෙස නිහතමානී ලෙස සමාව අයැදීම ඇයට මහත් සතුටක් වුණා. ක්ලැරිසාට අනුකම්පාව දක්වා, හැකි තරම් දුරට මිහිරි ලෙසට ඇයට සැලකීමට ගොන්ඩොලින් හිත හදා ගත්තේ කෙනෙකුට ලැබිය හැකි ඉතාම උසස් මිතුරිය තමා බව ඇයට ඒත්තු ගැන්වීමටයි.

එහෙත් අනෙක් අය ඇගේ එම සතුටට අකුල් හෙළුවා. ඔවුන් නිතර නිතර අසලට පැමිණ කෑ ගසන්නට වුණා. "නියම තල්ලුව" ඊළඟට ක්ලැරිසා දෙසට හැරී කෑ ගැසුවා. "බොහොම අගෙයි, ක්ලැරිසා. ඔයා නියමෙට එයාව වතුරට දැම්මා ! මේ, ක්ලැරිසා, ඒක ලස්සන තල්ලුවක්. ආයෙත් එහෙම කරන්නකෝ !"

"අනේ, මම එයාව තල්ලු කළේ නැහැ." ඒ හැම විටකම ක්ලැරිසා විරෝධය පෑවා. "ඔයාලා දැක්කනේ, මම තල්ලු කළා නොවෙයි."

"එහෙම ලස්සන තල්ලුවක් මගේ ජීවිතේට දැකලා නැහැ." ඇලිසියා කී අතර ක්ලැරිසා ඇත්තටම හිතාමතා තමාව වතුරට තල්ලු කළාද නැද්ද යන්න ගැන ගොන්ඩොලින් සැබැවින්ම සැක සිතන්නට පටන් ගත්තා ! ඉන් පසුව අවාසනාවකට මෙන් හදිස්සියේම මෙම කෑගැසීම්වල ඇති හාස්‍යජනක පැත්ත දුටු ක්ලැරිසා නවතා ගත නොහැකි ලෙස හඬ නඟා සිනාසෙන්නට පටන් ගත්තා. මින් සැබැවින්ම කුපිත වූ ග්වේන්, ක්ලැරිසා කෙරෙහි කේන්තියෙන් යුතු වූ අතර ඇගේ කේන්තිය දුටු ක්ලැරිසා මහත් බියට පත්ව නැවතත් මුලදී මෙන්ම සමාව අයදින්නට වුණා.

"අර බලන්න නිවුන්නියෝ" ඇලිසියා සැලීට කිව්වා. එදෙස බැලූ සැලී හඬ නඟා සිනාසුණා. කොනී ඉතා ප්‍රවේසමෙන් රූත්ගේ සිරුරේ තෙත මාත්තු කරමින් සිටියා. තම සොහොයුරිය ඇගේ කාර්යය අවසාන කරන තුරු රූත් ඉවසිල්ලෙන් සිටගෙන සිටියා.

"ඇයි කොනී එයාට ඕනෑ දෙයක් තනියම කරගන්න ඉඩ දෙන්නේ නැත්තේ ? සැලී ඇසුවා. "රූත්ට පුළුවන් එයාගේ ඕනෑම වැඩක් තනියම කර ගන්න. ඒත් කොනී නිතරම දකින්නේ එයාට බැහැ කියලා. කොනී ඕනෑවට වැඩිය එයාව පාලනය කරනවා !"

"ඒ වගේම පාඩම් වැඩවලදී කොනීව රූත්ගේ අහලකින්වත් තියන්න බැහැ." ඇලිසියා කිව්වා. "හැම ඒකම රූත් තමයි කොනීට උදව් කරන්නේ. එහෙම නැතිනම් කොනීට වැඩ කරන්න බැහැ. කොනීට වඩා හුඟාක් දක්ෂ රූත්."

"එහෙම තියෙද්දිත් හැම තිස්සෙම එයා රූත්ව පාලනය කරනවා!" ඩැරල් කතාවට එක්වෙමින් කිව්වා. "මට නම් ඒක පේන්න බැහැ. රූත් මේවා ඉවසගෙන ඉන්න හැටිත් මට පේන්න බැහැ."

"ඒ ගැන එයාලා එක්ක කතා කරන්න." ඇලිසියා හදිසියේම කිව්වා. "ඔයා පන්ති නායිකාව නේද ?"

ඩැරල් තම තොල සපා ගත්තා. ඇයි ඇලිසියා හැම විටම මෙලෙස ඇගේ වැරදි සොයමින් දොස් කියන්නේ ? එක් හේතුවක්, මඳ ඊර්ෂ්‍යාව විය හැකි බව ඈ සිතුවා. තමාට හොඳ පන්ති නායිකාවක වීමට නොහැකි බව ඇලිසියා දැන සිටි අතර එවැනි හැකියාවක් ඇති අයට ඊර්ෂ්‍යා කළ ඈ ඔවුන්ව අපහසුවට පත් කළා. ඩැරල් ඒ ගැන කිසිදු තැකීමක් නොකළ යුතු වුව ද ඒ ගැන සිත කරදර නොකරගෙන සිටීමට ඇයට නොහැකි වුණා.

"ඔයාට දැන් හුඟාක් වැඩ තියෙනවා, නේද ?" ඇලිසියා සිරුරේ තෙත පිස දමමින් තවදුරටත් ඇසුවා. "ෆෙලිසිටි නංගිව බලා ගන්න තියෙනවා. ක්ලැරිසාට ගොන්ඩොලින් ඕනෑවට වඩා විස පොවනවාද බලන්න තියෙනවා. රූත්ට ටිකක් පණ දෙන්න වෙනවා. ඒ වගේම එයාට එයාගේ වැඩ තනියම කර ගන්න උදව් කරන්න වෙනවා. අපේ පාඩම් පන්තියට බාධා කරන්න ආවොත් බෙටීට බනින්න වෙනවා."

තමා තුළ නැවතත් කෝපය බුර බුරා නැගෙනු ඩැරල්ට දැනුණා. එවිටම සීතල අතක් ඇගේ උරහිස මත පතිත වුණා. ඒ සමගම ඇයට ඇසුණේ සැලීගේ ශාන්ත කටහඬ. "හැම දෙයක්ම සිද්ධ වෙන්නේ හොඳ වෙලාවට ! කලබල වෙලා වැඩ අවුල් කරගන්න ඕනැ නැහැ නේද, ඩැරල් ? මේ හැම දෙයක්ම ඔයාට එක පාර කරන්න බැහැ."

ඩැරල් ඉතා දිගු සුසුමක් ඇද සැහැල්ලුවෙන් එය පිට කළා. එයම තමයි ඇය කිව යුතුව තිබුණේ. ඉතා ශාන්ත කටහඬකින් ! දෙවියන්ගේ පිහිටයි. ඈ තමාටම කියා ගත්තා.

ඈ සැලීට ස්තුතිපූර්වකව මඳ සිනාවක් පෑවා. ෆෙලිසිටි ගැන ටිකක් වැඩිපුර සොයා බැලීමටත්, ඇයව බාධාකාරී ජූන්ගෙන් ඉවත් කර තැබීමටත් ඈ අධිෂ්ඨාන කර ගත්තා. ක්ලැරිසාට ගොන්ඩොලින් කරන බලපෑම අවම කිරීමට වෙනත් අයෙකු ක්ලැරිසාගේ ඇසුරට පත් කිරීමට ඈ සිතට ගත්තා. එමෙන්ම ඈ හිමින් සීරුවේ රූත්ට කතා කර ඇයට කුඩා දරුවෙකුට මෙන් කොනීට සලකන්නට ඉඩ නොදෙන මෙන් කීමට සිතා ගත්තා.

ඊළඟ දිනයේදී ඩැරල්ට සේදුම් කාමරයේ දී රූත්ව මුණගැසීමට අවස්ථාවක් ලැබුණ අතර කොනී නැති හෙයින් ඇයට තනිව කතා කිරීමට හැකිවුණා.

“කොහොමද, ඔයා මැලෝරි ටවර්ස්වලට කැමතිද, රූත් ?” ඈ ඇසුවේ රූත්ට පිළිතුරු දීමට ඉඩ ලැබේදැයි සැක කරමින්.

“මම කැමතියි” රූත් කිව්වා.

“මම හිතනවා ඔයා මෙහේ ඉන්නේ සතුටින් කියලා.” ඩැරල් කිව්වේ තමාට කියන්නට අවශ්‍ය දෙය කෙසේ ඉදිරියට ගෙන යන්න දැයි සිතමින්. මඳ නිහැඬියාවක් ගත වූ පසුව රූත් විනීතව කතා කළා.

“ඔව්, බොහොම ස්තූතියි.”

ඇගේ කටහඬෙහි සතුටු ස්වරයක් ගැබ් වුණේ නැහැ. ඩැරල්ට සිතුණේ එහෙමයි ! ඇයි එහෙම වුණේ ? ඇය හොඳ මට්ටමක සිටියා, ඇය ක්‍රීඩාවලට දක්ෂකම් දැක්වූවා, ඇය කෙරෙහි අප්‍රසන්නව බැලීමට යමක් තිබුණේ නැහැ. එමෙන්ම ගිම්හාන වාරය ඉතා ප්‍රියජනකයි ! ඇත්තෙන්ම ඇය සතුටින් සිටිය යුතුයි.

“ආ, රූත්” ඩැරල් කතා කළේ මෙවැනි කතාවකට තමාට වඩා සැලී හොඳින් ගැළපෙන බව සිතමින්. “....ආ.... අපි සිතුවේ ඔයාටම ... ආ.. හරි, කොනී ඕනෑවටත් වැඩියෙන් ඔයාව බලාගන්න හදන එක, ඉතින් ඔයාට බැරිද... හරි, මීට වඩා ඔයාගේ වැඩ ඔයාම කරගෙන ටිකක් .... මම කියන්නේ....?

“ඔයා කියන්න හදන දේ මට හොඳටම තේරෙනවා.” හාස්‍යජනක තරහක් මුසු ස්වරයකින් රූත් කිව්වා. “ඔයා කියන දේ කාට නොතේරුණත් මට තේරෙනවා !”

රූත්ගේ සිත රිදී කෝප වී ඇතැයි ඩැරල්ට සිතුණා. ඈ නැවතත් උත්සාහ කළා. “ඇත්තටම, මම දන්නවා ඔයාල නිවුන්නියෝ කියලා. ඒ වගේම නිවුන් අය හුඟාක් එකම විදිහට තමයි ඉන්නේ. ඉතින්.. අනික්.... නිතරම එකට... ඉතින් මට තේරෙනවා කොනී ඔයාට හුඟාක්... මම කියන්නේ හරිම කිට්ටු වෙලා, ඔයා ගැනම....”

“ඔයාට ඒක තේරෙන්නේ නැහැ. කොහොමවත් තේරුම් ගන්න බැහැ.” රූත් කිව්වා. “ඔයා කැමති නම් කොනීටත් කතා කරලා බලන්නකෝ. මම හිතන්නේ නැහැ මේ දේවල් ටිකක්වත් වෙනස් වෙයි කියලා !”

මෙසේ කියමින් රූත් ඇඩි පියවර තබමින් පිටතට ගියා. ව්‍යාකූලත්වයටත් තරමක කේන්තියටත් පත් ඩැරල් සේදුම් කාමරයේ තනි වුණා.

'කොනීට කතා කරන එකෙත් කිසිම වැඩක් වෙන එකක් නැහැ. මට ඒක විශ්වාසයි' ඩැරල් සිතුවා. 'එයත් රූත් වගේම ගිනි පුපුරක් වෙන්න ඇති. එයා රූත්ව නාස්ති කරනවා! ඒත් රූත්ට එහෙම විනාශ වෙලා කොනීගේ පස්සේ යන හෙවණැල්ලක් වෙන්න ඕනැ නම් අපිට මොකද ! මේක නවත්වන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ !'

මෙය විශේෂ දුෂ්කර කටයුත්තක් නිසා මේ සඳහා විසඳුම් සෙවීමට වෙහෙසීම අරුත් සුන් බව තීරණය කළ ඩැරල් කාමරයෙන් පිට වුණා. 'නිතරම එකට සිටින, එකම පුද්ගලයෙකු ලෙස හැඟීමෙන් බැඳුණ නිවුන්නියන් වෙන් කිරීමට කාටවත් බැහැ.' ඈ සිත සාදා ගත්තා. "ඒත්, සමහර නිවුන්නියන් හුඟාක් දුරස්ථව හිටියත් එක්කෙනෙක් හිතේ අමාරුවෙන් හරි අසනීපයෙන් හරි ඉන්නවා නම් අනිත් කෙනාට ඒක දැනෙනවා. මේ දෙන්නා මා එක්ක තරහා කරගන්න එකේ තේරුමක් නැහැ. එයාලා කැමති විදිහට ඕනෑම දෙයක් කරපුවාවේ !"

ඉන්පසු ඇය ෆෙලිසිටි හමුව එදින සැඳෑවේදී ඇවිදීමට යාමට ඇයට කතා කළා. ෆෙලිසිටි මහත් සොම්නසට පත් වුණා. හතර පන්තියේ නායිකාව සමග ඇවිදීමට යාම මහත් ගරුත්වයක් ලෙස ඈ දුටුවා.

"ඕ, ඔව්, මම එන්න ආසයි" ඈ කිව්වා. "මම හිතන්නේ අද රෑට කරන්න දෙයක් ජූන් තවම යොදා ගෙන නැහැ."

"එයා මොනවා හරි යොදාගෙන තිබුණත් අපිට මොකද ?" ඩැරල් නොඉවසිල්ලෙන් කිව්වා. "ඔයාට පුළුවන් ඇත්තෙන්ම බැහැ කියන්න. අපිට ළඟකදි එකතු වෙලා කතා කරන්නත් බැරි වුණා."

"මිස් පොට්ස්ට මම හුඟාක් කැමතියි." ෆෙලිසිටි කිව්වේ ඩැරල් නිතරම නොඉවසිලිවන්ත වන විට කතාවේ මාතෘකාව ඇය වෙනස් කිරීමට දැන සිටි නිසයි. "මට තවමත් එයා ගැන ටිකක් බයක් තියෙනවා. ඒත් මගේ පන්තියේ වැඩ ටිකක් ඉස්සරහට ගිහින්, ඇත්තමයි, ඩැරල්, ඉතින් මට මේ පළමු වාරයේ වැඩ හුඟාක් ලේසියි වගේ ! හුඟාක් දුරට හොඳයි !"

"ඔව්, හුඟාක් හොඳයි" ඩැරල් එකඟ වුණා. "ඒක තමයි හොඳ ඉස්කෝලයකට ආපුවහම සිද්ධ වෙන්න ඕනැ. සාමාන්‍ය ඉස්කෝලයක දී නම් කෙනෙක් පහළ පන්තිවල වැඩවලින් ඉස්සරහට එනවා, ඒත් නරක බෝඩිං ඉස්කෝලයකට ගියොත් ඉහළට එන්න අවුරුදු ගණනක් යනවා ! ආ, කොහොමද ජූන්ගේ වැඩ ?"

"හරිම ඉහළයි, එයා උනන්දුවෙන් වැඩ කරනවා නම්" සිනාවක් පාමින් ෆෙලිසිටි කිව්වා. "එයා හරිම විනෝදයක්, පුදුම විකාර වැඩ කරන්නේ. ඔයා දන්නවානේ, ඇලිසියා වගේමයි මම හිතන්නේ."

එවිටම ඈතින් සීනුවක් නාද වනු ඇසුණා. "හරි, අද හැන්දෑවේ හම්බවෙමු." ඩැරල් කිව්වා. "අපි අර කඳු ළඟට යමු. ඒත් ගිහින් මේක ජූන් එක්ක එහෙම කියන්න එපා. එයාව එක්ක එන්න එපා. අපි දෙන්නා විතරයි යන්නේ, හරි ද ?"

"හරි" ෆෙලිසිටි සතුටු බවක් පළ කරමින් කිව්වා.

එහෙත් කරුමයක මහත. එදින සවස පාසල් සඟරාවේ ඉසව්ව සඳහා විභාගයට වාඩි වන සිසුවියන්ගේ රැස්වීමක් කැඳවා තිබූ අතර ඩැරල්ට එයට සහභාගී වීමට සිදු වුණා. ඉතා සුළු මොහොතකට හෝ ෆෙලිසිටි සමග තනිව කෙටි දුරක් හෝ යාමට තමාට අවස්ථාව ලැබේදැයි ඈ කල්පනා කළා. නැහැ, ඇයට බැරිවුණා, ඈ කළ හැකි හොඳම දේ කළා.

ඈ තම සොහොයුරියට දෙවැනි පන්තියේ දැරියක අත පණිවිඩයක් යැව්වා. "හේයි, ෆෙලිසිටි" දෙවැනි පන්තියේ දැරිය මොර දුන්නා. "හතර පන්තියේ නායිකාව, ඩැරල් රිවර්ස්ගෙන් සුබ ආරංචියක්, එයා කියනවා එයාගේ චූටි නංගි එක්ක ඇවිදින්න යන්න වෙලාවක් දැන් නැතිලු. වෙන දවසක බලමු කියනවා."

තරමක කෝපයෙන් යුතුව ෆෙලිසිටි පණිවිඩකාරිය දෙස බැලුවා. "ඔයා ඇත්තටම කියන්නේ එයා කියපු දේ නොවෙයි." ෆෙලිසිටි කිව්වා. "මොනවාද එයා කිව්වේ ?"

"ඒ ටික විතරයි." කී දෙවැනි පන්තියේ දැරිය සෙමින් ඇවිදගෙන ගියා. ෆෙලිසිටි පණිවිඩය හරි හැටි පරිවර්තනය කර ගත්තා. ඒ සමගම ඇයට මහත් කලකිරීමක් දැනුණා.

"අද ඩැරල්ට කොහේවත් යන්න ලැබෙන්නේ නැහැ." ඈ ජූන්ට කිව්වා.

"මම හිතන්නේ එයාට මොකක් හරි රැස්වීමක් වෙන්න ඇති."

"ඕනෑම ඔට්ටුවක්, එයාට කිසිම වැඩක් නැහැ." අවඥා සහගතව කුඩා ජූන් එක්වරම කිව්වා. "මම දන්නවා ඔය හතර පන්තියේ ලොකු කෙල්ලෝ ගැන. ඇලිසියාට මාව කිසිම ගණනක් නැහැ. ඩැරල්ට ඔයා ගැන කිසිම ගණනක් නැහැ. අපි එයාලට කරදර කරයි කියලා එයාලා බයයි. අපි මොනවටද එයාලට බරක් වෙන්නේ. අනේ, මෙන්න මෙහෙ එන්න, අපි රවුමක් ගහලා එමු !"

# 09

තම කටයුතු බහුල වීම නිසා ක්ලැරිසා සම්බන්ධව කළ යුතු දේ දින කීපයක් යන තුරු ඩැරල්ට අමතකව තිබුණා. ඇත්තෙන්ම හදිසියේම ඇගේ එදිනෙදා කටයුතුවලින් දින පුරා කාර්ය බහුල වුණා. ඩැරල් නොසිතූ පරිදි පන්ති නායිකාවන්ට බොහෝ යුතුකම් හා වගකීම් තිබුණා. එමෙන්ම මෙම වාරයේ සවස් වරුවල සූදානම් පාඩම් ද බොහෝ තිබුණා.

මේ වන විට ගොන්ඩොලින් ක්ලැරිසාව ඇඩි ලෙස ඇගේ පැත්තට නම්මාගෙන තිබුණා. පන්තියේ දී ඇය අසලම වාඩි වී සිටි ඇ හැකි සෑම විටම ක්ලැරිසාගේ උදව්වට සැදී පැහැදී සිටියා.

තමාට මේතාක් දුරට හමු වූ ඉතාම කරුණාවන්ත ඇරිය ගොන්ඩොලින් බව ක්ලැරිසාට සිතුණා. නමුත් තමාට බොහෝ දෙනෙකුගේ ඇසුර නොලැබී ඇති බව ඇයට දැනුණේ නැහැ. තනිකම හා ආගන්තුක බව දැනී ඈ ගොන්ඩොලින්ගේ මිත්‍රත්වය සාදරයෙන් පිළිගත්තා. ගොන්ඩොලින්ගේ නීරස පවුලේ කතා ඈ ඇති පදමට අසා තිබුණා. ගොන්ඩොලින් කියන පරිදි ඒ සියලු දෙනා ඉතා අරුම පුදුම අය වුව ද මේවා අසන ක්ලැරිසාට ඔවුන් සැවොම පෙනුණේ එකම ආකාරයේ මන්ද බුද්ධික, මොට්ට පිරිසක් ලෙසයි !

රෝල්ස් රොයිස් මෝටර් රථ, කුඩා මුහුදු යාත්‍රා හා විශාල මන්දිර ගැන දැන ගැනීමට උනන්දුවෙන් ගොන්ඩොලින් නොයෙක් ප්‍රශ්න ඇසුව ද ඇගේ ඇඩි උනන්දුවෙන් යුතු ප්‍රශ්න නොසැලකූ ක්ලැරිසා තම පවුල ගැන කතා කළේ ඉතා ස්වල්පයයි. එහෙත් ක්ලැරිසා තම ගම්බද නිවස ගැන හා මෝටර් රථ නොව එකම මෝටර් රථය ගැන කතා කිරීම ගැන ග්වේන් නොසතුටින් සිටින හා කලකිරී සිටින බව ක්ලැරිසා දුටුවා.

ක්ලැරිසාට තිබුණේ දුර්වල හදවතක් හෙයින් ඇය ක්‍රීඩාවලට හෝ ශාරීරික අභ්‍යාසවලට නොයන නිසා අනෙක් දැරියන් ආශ්‍රය කිරීමට ඇයට එතරම් අවස්ථාවක් ලැබුණේ නැහැ. ඇයට සිදුවුණේ ඒ වේලාවන්හිදී විවේක ගැනීමට හෝ අනෙක් දැරියන් ක්‍රීඩා කරන අයුරු බලා හිඳීමටයි. එය ද ඇයට මහත් නීරස දෙයක් ලෙස පෙනුණා. එයින් තමාට සිටින එකම හිතවතිය ගොන්ඩොලින් සමග එක්ව කල් ගත කිරීමට අවස්ථාව ලැබෙන තුරු ඈ උනන්දුවෙන් මඟ බලා සිටියා.

ඒ ඩැරල් මෙම කාරණයට අත ගසන තුරු පමණයි. එක් සැඳෑවක ගොන්ඩොලින්ගේ ලා රන්වන් හිසත්, ක්ලැරිසාගේ තඹවන් හිසත්, කෑලි එක්කොට පින්තූර සාදන ප්‍රහේලිකාවකට නැඹුරුව තිබුණේ සියලු දෙනා එළිමහනේ සිටිය යුතුව තිබූ වේලාවකයි. මේ පිළිබඳව සැබැවින්ම යමක් කළ යුතු යැයි ඩැරල් සිතට ගත්තේ ඒ මොහොතේයි. ඈ මෙල්විස් වෙතට ගියා. කෙසේ වෙතත්, මෙල්විස්ට තමාගේම කියා යෙහෙළියක් නොසිටි අතර ඈ සමහර විටක නිතර එකට සිටින ඩැෆනි හා මේරි ලෝව්ට එකතු වුණා. ක්ලැරිසා වෙනුවෙන් ද වෙන් කිරීමට ඇයට ප්‍රමාණවත් තරම් කාලයක් තිබුණා.

"මෙල්විස්" ඩැරල් කතා කළා. අපි හිතන්නේ හුරතල් ගොන්ඩොලින් ක්ලැරිසා එක්ක ගත කරන කාලය වැඩියි කියලයි. ඔයාට පුළුවන්ද ක්ලැරිසාව ටිකක් ඔයා එක්ක තියාගෙන එයාට කතා කරන්න ?"

මෙල්විස් විමතියටත්, සතුටටත් පත් වුණා. "ඔව්, පුළුවන්, ඩැරල්." ඈ කිව්වා. "මම ඒකට ආසයි." උපැස් පැලඳි කුඩා නිහඬ ක්ලැරිසා ගොන්ඩොලින් සමග මැනවින් පෑහෙන බව ඈ රහසින් සිතුව ද, ඩැරල් එය වෙනස් විදිහකට දකින්නේ නම් එහි ද යම් වරදක් නොතිබිය යුතු බව ඈ සිතුවා ! මෙලෙස ඉතා කීකරුව සමීපව එල්ලී සිටින ග්වේන්ගෙන් ක්ලැරිසාව ගලවා ගැනීමට උත්සාහ කරනු පිණිස ඇය කටයුතු ඇරඹුවා.

"මාත් එක්ක පිහිනුම් තටාකය ළඟට යන්න එන්න, ක්ලැරිසා" ඉතා ප්‍රසන්න ලෙස සිනාවක් පාමින් ඈ කිව්වා. "මම අද නාන්නේ නැහැ. ඒත් ගිහින් අනිත් අය දිහා බලාගෙන ඉඳිමු. එයාලට කිමිදෙන්න කාසි විසිකරන්න කෙනෙක් ඕනෑ."

ක්ලැරිසා එක්වරම නැඟී සිටියා. ග්වෙන් රවා බැලුවා. "ඕ, ක්ලැරිසා, ඔයාට දැන්ම යන්න බැහැ."

"ඇයි, අපිට කරන්න ඒ තරම් දෙයක් නැහැනේ ?" පුදුම වූ ක්ලැරිසා කිව්වා. "ඔයත් එන්න."

"බැහැ. මට ටිකක් මහන්සියි වගේ." කී ගොන්ඩොලින් ක්ලැරිසා තමා සමග නවතිනු ඇතැයි බොරු මහන්සියක් පෙන්නුවා. එහෙත් ඈ නැවතුණේ නැහැ. තමාට යාමට කතා කිරීම ගැන මෙල්විස් ගැන පැහැදුණ ඈ මෙල්විස් සමග ගියා. ක්ලැරිසාට තමා ගැන එතරම් හැඟීමක් තිබුණේ නැහැ. පලකට නැති සාමාන්‍ය හා නීරස කෙනෙකු ලෙස ඇය තමා ගැන සිතා ගත් අතර බොහෝ දැරියන්ට ඇයව පෙනුණේ ද එලෙසයි !

ඇය පිහිනුම් තටාකයේ සිට ආපසු පැමිණි පසු ගොන්ඩොලින් වැඩි කතාබහින් යුතු නොවූ අතර ඇසූ දෙයකට පිළිතුරු දුන්නේ ද කෙටියෙන් හා එතරම් මිත්‍රශීලී නොවන කටහඬකින්. ක්ලැරිසාට එය ප්‍රහේලිකාවක් වුණා.

"මේ, මම මෙල්විස් එක්ක ටිකක් ඇවිදින්න ගිය එක ගැන ඔයා තරහා නැහැ නේද ?" අවසානයේ ඈ ඇසුවා.

ගොන්ඩොලින් ඇඩි ස්වරයෙන් කතා කළා. "ක්ලැරිසා ඔයා මම දන්න තරම් මෙල්විස් ගැන දන්නේ නැහැ. එයා වගේ ළමයෙක් එක්ක ඔයා යාළුවෙනවා දකින්න ඔයාගේ පවුලේ උදවිය කැමති වෙන එකක් නැහැ. ඔයා දන්නවාද ගිය අවුරුද්දේ එයා කරපු දේ ? මේ ළඟ ටවුමක තරග වගයක් තිබුණා. දන්නවනේ, හරිම පහළ මට්ටමේ මිනිස්සුන්ගේ වැඩකට නැති සංදර්ශනයක්. ඉතින් එයා ඇත්තටම ඒකට සහභාගී වෙන්න තනියම ගියා !"

එවැනි දෙයක් තනියම කිරීමට තරම් තමාට ධෛර්යයක් කිසිදාක නැති බව සිතූ ක්ලැරිසා සැබැවින්ම භීතියට පත් වුණා.

"ඉතින් මොකද වුණේ" ඈ කිව්වා. "කියන්නකෝ"

"හරි, ආපහු එන්න තියෙන අන්තිම බස් එක මෙල්විස්ට අල්ලාගන්න බැරි වුණා." තවමත් ඇඩි ස්වරයෙන් ගොන්ඩොලින් කිව්වා. "පහුවදා උදේ පාන්දර තුනට විතර මිස් පීටර්ස්ට එයාව හම්බ වුණා පාර අයිනක වැටිලා ඉන්නවා. ඊට පස්සේ එයාට හොඳටම

අමාරු වෙලා කටහඬත් නැතිව ගියා. ඊට ඉස්සර එයා හිතාගෙන හිටියේ එයාට තිබුණේ සුපිරි කටහඬක් කියලයි. ඔයා දන්නවානේ, මම නම් ඒක ඒ තරම් ලොකු දෙයක් කියලා හිතුවේ නැහැ. ඒ කටහඬ නැතුව ගිය එකම එයාට ලොකු දඬුවමක් වුණා."

"අහිංසක මෙල්විස්" ක්ලැරිසා කිව්වා.

"ඒත් මට නම් හිතෙන්නේ එයාව මේ ඉස්කෝලෙන් අස් කළා නම් හොඳයි." ගොන්ඩොලින් කිව්වා. "මම මේ ටිකවත් ඔයාට කිව්වේ ක්ලැරිසා, මෙල්විස් ඔයා එක්ක යාළුවෙන්න තරම් වටිනා කෙනෙක් නොවෙයි කියන එක පෙන්වලා දෙන්න. මම කියන්නේ ඔයාට එයා එක්ක යාළුවෙන්න අදහසක් එහෙම තියෙනවා නම්....."

"අපොයි නැහැ, මට එහෙම හිතුණේ නැහැ." ක්ලැරිසා කඩිනමින් කිව්වා. "මම නිකම්ම එයා එක්ක තටාකය ළඟට ගියා විතරයි. මම නම් ඔයා කිව්වා වුණත් ආයෙත් එයා එක්ක කොහේවත් යන්නේ නැහැ, ග්වේන්. ඇත්තමයි, ග්වේන්."

ගොන්ඩොලින් ඇය කියනු ඇතැයි බලාපොරොත්තු වූ දෙයම අසරණ මෙන්ම දුර්වල ක්ලැරිසා කිව්වා. එලෙස කෙටි ඇවිදීමකට යාමට කතා කරන්නට ඊළඟ වතාවේ මෙල්විස් පැමිණි විට ක්ලැරිසා එය ප්‍රතික්ෂේප කළා.

"ඒගැන දුක්වෙන්න එපා, ක්ලැරිසා." ගොන්ඩොලින් කිව්වා. "ඇත්තටම ඔයා එයාගේ වටේ කැරකෙනවාට එයා කැමති නැහැ." ගොන්ඩොලින් මෙය කිව්වේ මෙල්විස්ටයි.

සිත රිදී කෝපයට පත් මෙල්විස් ඩැරල් සොයා ගොස් තමා තව දුරටත් අඥාන කුඩා දැරියක වූ ක්ලැරිසා ගැන කිසිදු තැකීමක් කරන්නට යන්නේ නැති බව සැල කළා ! ඒ වෙනුවෙන් තවත් කෙනෙකු සොයා ගැනීම වඩා යහපත් බව ද ඈ කිව්වා. ඩැෆනි කෙසේ වෙයි ද?

ඒ මොහොතේම පැමිණි ඩැෆනිට තම නම කියවෙනු ඇසුණා. තරමක් සිත රිදී සිටි ඩැරල් මෙල්විස්ව ක්ලැරිසා විසින් ප්‍රතික්ෂේප කරන ලද බව කියා, ඩැෆනි යමක් කිරීමට උත්සාහ කළ යුතු බව කිව්වා. එය කුමක් වෙයි ද ?

"මමත් මොනවා හරි කරන්න උත්සාහයක් කරන එක ඒ තරම දෙයක් නොවෙයි. ගොන්ඩොලින් මේරිගේ ගණන් ටිකක් බස්සන්න" සිනාවක් නගමින් ඩැෆනි කිව්වා. එලෙස ඇය ද ක්ලැරිසාගේ වැඩයට අත ගැසූ නමුත් කුමක් හෝ බොරු හේතුවක් දක්වමින් ක්ලැරිසා නිතරම මඟ හැරියා. ඩැෆනි ගැන ද යමක් ක්ලැරිසා සමග කීමට ගොන්ඩොලින්ට තිබුණා !

"බලන්නකෝ ක්ලැරිසා." ගොන්ඩොලින් කිව්වා. "ඩැෆනි ඇත්තටම මේ වගේ ඉස්කෝලයකට ගැළපෙන්නේ නැහැ. මම මේ කියන දේ ඔයා වෙන කවුරුවත් එක්ක එහෙම කියන්න එපා. ඒත් මීට අවුරුද්දකට දෙකකට උඩදි ඩැෆනි හොරකම් කරලා අහුවුණා !"

ක්ලැරිසා බියපත්ව ගොන්ඩොලින් දෙස බැලුවා. "මට නම් ඒක අදහන්නවත් බැහැ."ඈ කිව්වා.

"හරි, ඒ ඔයා දන්න තරම නිසානේ." ග්වෙන් කිව්වා. "ඒත් එයා හොරෙක් වුණා. එයා සල්ලි, රන් බඩු වගේ දේවල් තමයි හොරකම් කළේ. අනික එයා මේ ඉස්කෝලෙදි විතරක් නොවෙයි හොරකම් කරලා තියෙන්නේ. එයාව අහුවුණාට පස්සේ මිස් ග්‍රේලින් කිව්වා එයාට හැමදේම පොදු කාමරයට ඇවිදින් අපිත් එක්ක කියන්න කියලා. ඉතින් අපිට සිද්ධ වුණා එයාව අස්කරනවාද නැද්ද කියන එක තීරණය කරන්න. මේක ඇත්තම කතාවක්. ඔයත් දැනගන්න එක හොඳයි."

ක්ලැරිසා තරමක් සුදුමැලි වුණා. ඩැෆනි මේරි ලෝව් සමග සිනාසෙමින් මැද මිදුලේ සිටින ස්ථානය දෙසට ඇගේ නෙත් යොමු වුණා. ඇයට එය ඇදහිය නොහැකි වුණා. එමෙන්ම ගොන්ඩොලින් කිසිම කිසිදාක එවැනි බොරුවක් ගොතා නොකියන බව ද ඈ සිතුවා.

"ඉතින්, ඔයාලා හැමෝම කිව්වාද එයාව අස්කරන්න එපා කියලා." අවසානයේ ඈ ඇසුවා.

"හරි, මම තමයි මුලින්ම කිව්වේ එයාට තවත් අවස්ථාවක් දෙන එක හොඳයි කියලා. මම එයාව බලාගන්නම් කියලත් කිව්වා." ගොන්ඩොලින් කිව්වේ පට්ටපල් බොරුවක්. එවැනි දෙයක් කීවේ ගොන්ඩොලින් නොව අහිංසක මේරි ලෝව් බව ක්ලැරිසා දැන සිටියේ නැහැ. "ඒ නිසා එයාව තවමත් තියාගෙන ඉන්නවා. දැන් ඔයාට දකින්න පුළුවන් වෙයි ක්ලැරිසා, එයා ඔයාට ඒ තරම් ගැළපෙන යාළුවෙක් නොවෙයි කියලා. තේරුණා ද ? ඔයාට හිතෙයි. එයා ඒ

තරම් විශ්වාස කරන්න තරම් පුළුවන් කෙනෙක් නොවෙයි කියලා."

"ඔව්, මට එහෙම හිතන්න බැහැ." ක්ලැරිසා කිව්වා. "අපොයි, ඩැෆනියි, මෙල්විසුයි මේ තරම් නරක අය කියලා මට හිතාගන්නවත් බැරි වුණා." ඇය බියපත් පෙනුමෙන් කිව්වා. "මම හිතන්නේ ඒ වගේ තවත් නරක කතා නැතුව ඇති කියලා."

"ඔයා අහලා තියෙනවාද කිසිම හේතුවක් නැතිව ඩැරල් මට කී සැරයක් පිහිනුම් තටාකයේදී ගහලා තියෙනවාද කියලා ?" ගොන්ඩොලින් ඇසුවා. එම සිද්ධියට ඈ කවදාවත් සමාව දීමට හෝ අමතක කිරීමට සූදානම්ව සිටියේ නැහැ. "ඊට පස්සේ දවස් දෙකතුනක් යනතුරු මට කකුල හොල්ලන්න බැරිව හිටියා. ඔයා දන්නවාද අර පහේ පන්තියේ ඉන්න කෙල්ල, එලන් ? හරි, එයා විභාගයට කලින්දා රෑ විභාග ප්‍රශ්න පත්‍ර අරගෙන ප්‍රශ්න බලා ගන්න හැදුවා ! එයා ඇත්තටම එහෙම කළා."

"අනේ, තවත් නම් ඕවා ගැන කියන්න එපා." ක්ලැරිසා කිව්වේ මැලෝරි ටවර්ස් යනු මෝඩ, හොර, කපටි, වංචනිකයින්ගෙන් ගහන හොර ගුහාවක් බව සිතීමට පටන් ගනිමිනුයි.

"ඒ වගේම කවුරුත් ලොකුවට හිතාගෙන ඉන්න විල්, එයත් ගිය වාරයේ වංචාවයි, අකීකරුකමයි නිසා නරක චරිතයක් වෙලයි හිටියේ" ගොන්ඩොලින් කියාගෙන ගියා. ඇගේ විසකුරු කටහඬින් ක්ලැරිසාගේ දෙසවන් පිරුණා. "ඔයා දන්නවාද, මිස් පීටර්ස් විල්ගේ අකීකරුකම නිසාම එයාගේ අශ්වයා, තන්ඩර්, ආපහු ගෙදර යවනවා කියලා එයාට තර්ජනය කළා කියලා ?"

"මට නම් තවත් ඒවා ගැන අහන්න ඕනැ නැහැ." ක්ලැරිසා අසතුටින් කිව්වා. "ඇත්තටම එපා වෙනවා."

මේ අතර ගොන්ඩොලින්ගේ නිමක් නැති කෙඳිරීම්වලින් ක්ලැරිසා බේරා ගැනීමේ අධිෂ්ඨානයෙන් යුතුව ඩැරල් ඉදිරියට පැමිණියා. "හේයි, ක්ලැරිසා" ඈ ප්‍රීතිමත් හඬකින් කෑ ගැසුවා. "ඔයා තමයි මම හොය හොයා හිටියේ ! එන්න, මට පන්තියේ පෝච්චියට දාන්න මල් ටිකක් කඩන්න උදව් වෙනවා ද ?"

ක්ලැරිසා මුල් ඇදගත් කලක මෙන් වාඩි වී සිටියා. "එන්න!" ඩැරල් නොඉවසිලිමත්ව කෑ ගැසුවා. "මම ඔයාව හපා කන්නේ නැහැ. මම ගහයි කියලා බය ද ?"

"අනෙක්" ස්ලැට්ගො තැබිරිමෙට ඉතා සොකින් වූ අතර [illegible] ශොන්ජෙවාලියර්ට දුන් පොරොවල් ගැන සතුටු ඇයට ඒ [illegible] වූහ. 'මම හිතන්නේ එයා මට ඉටු දෙන එකක් නැහැ !'

"ප්‍රථමල් ශොන්ජෙවාලියර් මයාට පරණ එකක් ගැන එක [illegible] මට හිතෙන හැටි සිටින්න ඇති. නේද ?" ඒ වැරල් [illegible] එකු වනු දැන සිටුරවම හරි දේ ප්‍රහාර කල මට දැන ගන්නා.

'සාද්දරිකාර ශොන්ජෙවාලියර්' ඇ කීවුවා. 'එයා නම් විකෘති නැතිස්සේ !'

## 10

සති තුන හතරක් ගත වුණා. පාසල් සහතික පත්‍ර විභාගයට සූදානම්ව සිටි අය බොහෝ වෙහෙසී වැඩ කළ අතර සමහරෙකු තරමක් සුදුමැලිව සිටිනු දක්නට ලැබුණා. එය තරමක් බුරුල්ව සැහැල්ලුවෙන් වැඩ කළ යුතු කාලය බව විලියම්ස් ගුරුතුමිය තීරණය කළා.

"දවස පුරා විනෝද වෙන්න පුළුවන් ගමනක් යමුද ?" ඈ යෝජනා කළා. "අපි ලැන්ග්ලි කන්දට පයින් යනවා."

ලැන්ග්ලි කන්දට යන පා ගමන කා අතරත් ජනප්‍රිය වූ විනෝද චාරිකාවක්. එය ඉතා සුන්දර ගමනක් වූ අතර කඳු ශිඛර මතින් යන අතරේ හාත්පස පෙනෙන ගම්බද පරිසරය හා මහා සාගරය අසිරිමත් දසුනක් වුණා.

"හරි, ඔයාට ස්තුතියි, මිස් විලියම්ස් ! ඒක හරිම විනෝදයක් වෙයි." ඩැරල් කිව්වා.

"නියමයි !" වැඩිමහල් දැරියන්ගේ භාෂාවට ලක්වන පළමු පන්තියේ දැරියන් අතර ජනප්‍රිය වූ වචනයක් ඇලිසියා කිව්වා.

"ලැන්ග්ලි කන්ද ?" ක්ලැරිසා ඇසුවා. "ඉතින්, එහේ තමයි අපේ පරණ ආයා ඉන්නේ."

"එයාට ලියුමක් යවලා අහන්න අපිට එයාලාගේ ගෙදරින් තේ බොන්න පුළුවන්ද කියලා." ගොන්ඩොලින් කිව්වා. ඈ කිසිසේත් පා ගමන්වලට කැමැත්තක් දැක්වූවේ නැහැ. "එයා හුඟාක් සතුටු වෙයි ඔයාව දකින්න ලැබුණොත්."

"ඔයා නිතරම අනිත් අය ගැන හුඟාක් කරුණාවන්තව හිතනවා, ගොන්ඩොලින්" ක්ලැරිසා කිව්වා. "ඇත්තෙන්ම, මම ලියුමක් ලියනවා, එයා අපිට හොඳ තේ වේලක් දෙයි. මම දන්නවා එයා පුදුම රහට කෑම හදනවා."

මෙලෙස ඈ ලැන්ග්ලි කඳු පාමුල වෙසෙන පරණ ආයාට ලිපියක් ලිව්වා. 'දෙවියන්ට පින් සිද්ධ වෙන්න අනිත් අයත් එක්ක අපිට කන්දේ උඩටම යන්න සිද්ධ වෙන එකක් නැහැ !' ගොන්ඩොලින් සිතුවා. 'මම දැන් හුඟාක් දක්ෂ විදිහට හිතනවා !'

මහලු ලූසී මහත්මිය වහාම ආපසු ලියුමක් ලිව්වා. "අපිට එයාලගේ ගෙදරින් තේ බොන්න පුළුවන්." ක්ලැරිසා කිව්වා. "එයා කියනවා හොඳ සංග්‍රහයක් ලෑස්ති කරනවා කියලා. අපූරු දෙයක් වෙයි !"

"අපි දැන්ම අවසර ඉල්ලා ගත්තොත් හොඳයි." ගොන්ඩොලින් හදිසියේම කිව්වේ පාද චාරිකාව දිනයේම මෙය හදිසියේ දැන ගන්නා ඩැරල් මුරණ්ඩුව එම අදහසට එරෙහි වනු ඇතැයි සැකයෙනුයි. "ගිහින් මිස් විලියම්ස්ගෙන් අහන්න, ක්ලැරිසා."

"අනේ, බැහැ, ඔයා යන්න." ගුරුවරියකගෙන් මොන යම් දෙයක් හෝ ඇසීමට බිය වූ ක්ලැරිසා කිව්වා. එහෙත් විලියම්ස් ගුරුතුමියගෙන් කිසිදු උපකාරයක් බලාපොරොත්තු වීම එතරම් යහපත් නොවන බව ගොන්ඩොලින් දැන සිටියා. "බැහැ" යන්න ප්‍රතිපත්ති මත පිහිටා ලැබෙන පිළිතුර බව ඇය දැන සිටියේ විලියම්ස් ගුරුතුමිය ඇගේ යටි අරමුණ සෘජුව දැකීමට සමත් නිසයි ! විලියම්ස් ගුරුතුමියට ගොන්ඩොලින් ගැන කිසිදු විශ්වාසයක් නොතිබූ අතර ඇය යම් උපකාරයක් ඉල්ලුවහොත් එය ප්‍රතික්ෂේප වන බව ගොන්ඩොලින් හොඳින් දැන සිටියා.

මේ හෙයින් අවසර ගැනීමට යාමට සිදු වුණේ ක්ලැරිසාටයි. මහත් ආයාසයෙන් ගොත ගසමින් තමාට අවශ්‍ය දෙය කියා ගත් ඈ මහලු ආයා විසින් එවන ලද ආරාධනය ද ඉදිරිපත් කළා.

"ඔව්, ඔයාට පුළුවන් එයාලගේ ගෙදර තේ බොන්න යන්න. හැබැයි තවත් එක ගැනු ළමයෙක් එක්ක විතරයි." විලියම්ස් ගුරුතුමිය කිව්වේ සන උපැස් පැලඳ, දත් ඇන්දේ කම්බියක් ඇමූ ක්ලැරිසා එතරම්

සිත් ගන්නා රූ සපුවක් නැති ඇරියක් බව සිතමිනුයි. ඇගේ මුහුණේ නිතර ඇඳී තිබූ බියගුලු පෙනුම ඇගේ පෙනුම වඩාත් අවලක්ෂණ කළා !

චාරිකාව සඳහා වූ දවස උදා වුණා. එය ඉතා දීප්තිමත්, පියකරු හා සුන්දර උණුසුම් දිනයක් වන ලකුණු පහළව තිබුණා.

"මුළු දවසේම එළියේ ඇවිදින්න !" ඩැරල් ප්‍රමෝදයෙන් යුතුව කිව්වා. "ඒ වගේම අපූරු දවසක්. මම කියන්නේ අපේ නාන ඇඳුම් අරගෙන යමු කියලා. කඳු පාමුල ගල් වළක් තියෙනවා. අපිට ඒකේ නාන්න පුළුවන්."

"ඔයාලට දවල් කෑම අරගෙන යන්න වෙනවා. කන්ද මුඳුනේ තියෙන තේ කඩෙන් අපිට තේ බොන්න පුළුවන්." විලියම්ස් ගුරුතුමිය කිව්වා.

"මම කුස්සියේ වැඩ කරන අයට කිව්වා සැන්විච්, කේක් කපන්න ඔයාලව උදව් කර ගන්න කියලා. එතකොට ඒවා ඔයාලට ගෙනියන්න පුළුවන්. දැන් යන්න. ඉක්මනට හැම දේම ලෑස්ති කරගන්න !"

ඔවුන් කඩිමුඩියේ දුව පැන සියල්ල සූදානම් කර ගත් පසු ඊළඟ පැය භාගය තුළදී සියල්ලෝම තම දිවා ආහාර වේල ද රැගෙන කඳු මුඳුන බලා යන මාවතේ පෙළ ගැසී යමින් සිටියා.

"අපි දැන් හුඟ දුරක් ආව වගේ මට පෙනෙන්නේ" මෙල්විස් කිව්වා.

"එහෙම හිතෙනවාද ? මම හිතන්නේ ඒ තරම් දුරක් ආවේ නැහැ කියලයි." පුදුමයක් පෙන්වමින් ඩැරල් කිව්වා. "ඒ වගේම, මේ වගේ ගමනකදී ඔයා කනවා වගේ දෙගුණයක් ලොකු බත්මුලක් ගේන්න ඕනැ, මෙල්විස්. මට පෙනෙන්නේ ඔයා කන්නේ හුඟාක් අඩුවෙන් කියලයි."

ගොන්ඩොලින් හා ක්ලැරිසා අනෙක් අයට හුඟාක් පිටුපසින් හති දමමින් ආවා. ඩැරල් ඔවුන්ට ඉක්මන් කරන ලෙස කෑ ගැසුවා. ඔවුන් දෙදෙනා වෙන් කිරීමට එතරම් වෙහෙස ඇරුව ද නැවතත් ඔවුන් එක්ව සිටිනු දැක ඇගේ සිත රිදුණා.

"දුවගෙන ඉක්මනට ආවොත් ක්ලැරිසාගේ පපුව රිදෙනවා."

දෝෂාරෝපණය කරන ස්වරයකින් ගොන්ඩොලින් කිව්වා. "ඔයා ඒක දන්නවානේ, ඩැරල්"

"ඕ, ග්වේන්, මේ වාරයේදී මට හදවතක් තියෙනවාද කියලා ඇනුණෙවත් නැහැ." ක්ලැරිසා කිව්වා. "මම හිතන්නේ මට දැන් හොඳටම සනීපයි. මට අමාරුවක් නැතිව දුවලා යන්න පුළුවන්."

"හොඳයි" ගොන්ඩොලින් ඇඩිව කිව්වා. "මම ටිකක් කල්පනා කළේ මගේම හදවත ගැන ක්ලැරිසා. මේ ළඟදි ඉඳලා අමුතු දේවල් සිද්ධ වෙනවා. පපුව ඇතුළේ කුරුල්ලෙක් තටු ගහනවා වගේ, ඔයා දන්නවානේ."

ක්ලැරිසා බියපත්ව බැලුවා. "ඕ, ග්වේන්, මුලදී මටත් වුණේ එහෙම දෙයක් තමයි. ඔයාට පරිස්සම් වෙන්න සිද්ධ වෙනවා. ඔයා දොස්තර කෙනෙක් හම්බ වුණොත් හොඳ නැද්ද ?"

"අපොයි, ඕනැ නැහැ. මට එහෙම හිතෙන්නේ නැහැ." ගොන්ඩොලින් නිර්භීතව කිව්වා. "කිසිම දෙයකට මම මේට්‍රන් ළඟටවත් යන්නේ නැහැ. එයා මේවා ලොකුවට ඇඟට ගන්නවා. අනික එයා මම කියන දෙයක් පිළිගන්නෙත් නැහැ. එයා හරිම වස එක්කෙනෙක්, ඔයා දන්නවානේ."

වරක් හෝ දෙවරක් නිවාස පාලිකාව වෙතට ගොස් තිබූ ක්ලැරිසා ඇය ඉතා කරුණාවන්ත හා අවබෝධයෙන් කටයුතු කරන අයෙකු ලෙස දැක තිබුණා. සෑම වාරයකදීම, වෙහෙසකර දේවල් කිරීමෙන් මඟහැර සිටීමට ගොන්ඩොලින් නිතර නිතර පාලිකාව හමුවී බොරු ලෙඩ ගත් බවක් හෝ ඒ නිසාම ගොන්ඩොලින් කියන කිසිවක් පාලිකාව පිළිනොගන්නා බව ක්ලැරිසා දැන සිටියේ නැහැ.

"අර බලන්න කොනී," සෙසු පිරිස සමග ක්‍රමයෙන් එක්වෙමින් ග්වේන් කිව්වා. "රූත්ගේ බෑග් එකත් එල්ලාගෙන, ඒ වගේම එයාගේ එකත් අරගෙන. රූත් මේවා කොහොම ඉවසාගෙන ඉන්නවාද මන්දා?"

"හරි, එයාලා නිවුන්නියෝ" ක්ලැරිසා කිව්වා. "මම හිතන්නේ දෙන්නාට දෙන්නා උදව් කර ගන්න එයාලා කැමතියි. අපි එයාලා ළඟට දුවලා ගිහින් එයාලා එක්ක කතා කරමු."

එහෙත් සුපුරුදු පරිදි කතා බහ කෙරුණේ රූත් විසින් නොව කොනී විසින්මයි !

"ගමන් යන්නම හොඳ ලස්සන දවසක්" රෑත් දෙස බලා ක්ලැරිසා කිව්වා.

"හුඟාක් ලස්සන දවසක්." කී කොනී තමා රැගෙන යන ගමන් මල්ලේ ඇති කෑම වර්ග ගැන කියවන්නට පටන් ගත්තා. ග්වෙන් රෑත්ට කතා කළා. "ඔයාගේ නැති වුණ පැන්සල හම්බ වුණා ද? අර රිදී පාට එක ?" ඈ ඇසුවා.

එයට උත්තර දුන්නේ ද සුපුරුදු ලෙස කොනියි. "ආ ඔව්, ඒක ඩෙස්කයේ මුල්ලකට තල්ලු වෙලා තිබුණා."

"රෑත් අර බලන්න අර සමනළයා දිහා." රෑත්ව කතා කරවීමට සිතට ගත් ක්ලැරිසා කිව්වා. "ඌ මොන වර්ගයේ එකෙක් ද ?"



"ඌ පළල් පියාපත්වල ලප ඇති සමනළයෙක්" කොනී කීවේ එම සුන්දර ජීවියා වෙත රෑත් බැල්මක් හෙළීමටත් පෙරයි. ඉන්පසුව ග්වෙන් හා ක්ලැරිසා ඔවුන්ගේ උත්සාහය අතහැර දැම්මා. කොනී

යමක් කීමට පෙර රුත්ව කතා කරවීම කිසිවෙකුට කළ නොහැකි දෙයක්.

කඳු මුඳුනට නැඟ දිවා ආහාරය ගැනීම කළ නොහැකි තරමට ඔවුන් වෙහෙසට හා කුසගින්නට පැමිණ තිබූ හෙයින් කන්ද පෙනෙන මානයේ සිට ඔවුන් රැගෙන ආ ආහාර සතුටින් අනුභව කරන්නට වුණා.

"ඩැරල්, ක්ලැරිසාටයි මටයි මිස් විලියම්ස් අවසර දුන්නා මේ ලැන්ග්ලි කඳු පාමුල ජීවත් වෙන ලුසී නෝනා, ඒ කියන්නේ ක්ලැරිසාගේ පරණ ආයාගේ ගෙදර ගිහින් තේ බීලා එන්න කියලා." ගොන්ඩොලින් කීවේ තමා යමක් කියන විට අනෙකා එයට විරෝධය පාන විටකදී පාවිච්චි කළ යුතු යැයි ඈ දැන සිටි විනීත කටහඬින්.

"හරි, ඒත් මම ඒ ගැන දැනගෙන හිටියේ නැහැ." ඩැරල් කිව්වා. "ඇයි ඔයාලා මේ බවක් කල් ඇතිව කිව්වේ නැත්තේ ? මම ඒක ඇත්ත කියලා පිළිගන්නද ? ඔයාලා දැන් මේක කියන්නේ කන්ද නැඟලා ඊට පස්සේ නාන එකෙන් මඟ හැරලා ඉන්න ද ?"

"ඇත්තෙන්ම නැහැ ඩැරල්" ගොන්ඩොලින් කීවේ ඉතාමත් ගෞරවයෙන් ! "ඔයා ක්ලැරිසාගෙන් අහන්නකෝ."

ඩැරල් කෙරෙහි තරමක් කුළෑටි බවක් දැක්වූ ක්ලැරිසා ලුසී මහත්මියගෙන් ලද ආරාධනාව දැක්වූවා. "එහෙනම් හරි" එය ආපසු දෙමින් ඩැරල් කිව්වා. "අනේ, අපොයි, ග්වේන්, කොහොම හරි කන්ද නගින එකෙනුයි, නාන එකෙනුයි ඔයා බේරුණා. ඔයා නම් හරිම දක්ෂ කෙනෙක් !"

අනවශ්‍ය ස්තුතියක් කිරීමට තරම් අනුවණ නොවූ ගොන්ඩොලින් ක්ලැරිසා යමක් කියනු ඇතැයි බලාපොරොත්තු වුණා. 'පුදුම නායිකාවක් ! මේ විදිහට අපිව සැක කරන්න !' යනුවෙන් කීමට මෙන් ක්ලැරිසා බලා සිටියා.

ග්වේන් හා ක්ලැරිසා හැර ගිය දැරියෝ මහා කන්ද නැගීමට සැරසුණා. තනිවූ දෙදෙනා තණකොළ මත සතුටින් වාඩි වී අතපය දිගහැර සිටියා. "කොහොම වුණත් ඒ කන්ද නගින්න සිද්ධ නොවුණ එක ගැන මට හුඟාක් සතුටුයි." ග්වේන් කිව්වා. "අනික මේ ගිනි අව්වේ ! මම හිතනවා එයාලා නම් සතුටු වෙයි !"

තවත් ටික වේලාවක් වාඩි වී සිටි ඔවුන් ලුසී මහත්මියගේ කුඩා නිවස සොයා යාමට පිටත් වුණා.

මහලු කාන්තාව මඟ බලමින් සිටියා. ක්ලැරිසාට ආචාර කිරීමට පිටතට දුව ආ ඇ කුඩා දැරියකට මෙන් ඇගේ පිටට තට්ටු කළා. අනතුරුව ගොන්ඩොලින් දැක ගත් ඇ අනෙක් දැරියන් පෙනෙන්නට නොසිටි හෙයින් මහත් විමතියකට පත් බවක් පෙනුණා.

"කෝ අනිත් අය. මම විසි දෙනෙකුට තේ පිළියෙල කළා !" ඇ කිව්වා. "මම හිතුවේ මුළු පන්තියම එනවා කියලා, මිස් ක්ලැරිසා බබෝ ! අපොයි, අපි දැන් මොකද කරන්නේ ? ඔයාලාට පුළුවන්ද එයාලව හොයාගෙන ගිහින් එක්ක එන්න ?"

11

ඔයා එයාලව හොයන්න යන්න, ග්වේන්" ක්ලැරිසා කිව්වා. "එයාලා දැන් කන්දේ භාගයක් විතර නැගලා ඇති නිසා මට ඒතරම් දුරක් යන්න බයයි."

"ඔව්, ඇත්තටම මිස් ක්ලැරිසා. ඔයාට ඒ කන්ද උඩට දුවන්න කොහොමවත් ඉඩ දෙන්න බැහැ. ඔයා අර නරක පපුවේ අමාරුවෙන් යන්තම් සතිපවේගෙන එනවා විතරයි." ලුසී මහත්මිය හදිසියේම කිව්වා. "මම කිව්වේ මේ අනිත් ළමයාට යන්න කියලයි."

තමා අප්‍රිය කරන පිරිසක් අපූරු තේ සාදයක් භුක්ති විඳීමකට කැඳවාගෙන ඒම සඳහා ගිනි අව්වේ ලැන්ග්ලි කන්ද නැග යාමට ග්වේන් කිසි ලෙසකත් මනාප වූයේ නැහැ.

ඈ මුහුණ තරමක් ඇද කර ගත්තා. "ඇත්තටම, මම යනවා. ඒත් මගේ පපුවේත් මොකක්ද ලෙඩක් තියෙනවා. ගැහෙනවා, දන්නවානේ, ඒක වෙන්නේ ටිකක් මහන්සි වෙලා වැඩක් කරද්දී. එතකොට මට නිදාගන්න හිතෙනවා."

"අපොයි, මටත් ඒ දවස්වල එහෙම තමයි දැනුණේ." ක්ලැරිසා අනුකම්පාවෙන් හඬ නඟා කිව්වා. "මට අමතක වුණා, ඔයා ඒ ගැන මීට ඉස්සර වෙලා කිව්වා, ග්වේන්. හොඳයි, ඒකට කරන්න දෙයක් නැහැ. අපිට අනෙක් අයව තේ බොන්න මෙහාට එක්ක එන්න බැහැ."

"අපරාදේ !" දුකින් කී ලුසී මහත්මිය තේ බීම සඳහා ඔවුන්ව ඇගේ කුඩා නිවහන තුළට කැඳවා ගත්තා. නිවස තුළ මේසයක් මත සකසා තිබුණේ නිවසේ තැනූ ඉතා කදිම කැවිලි පෙවිලි රාශියක් !

මස් හා සලාද කොළ සහිත සැන්විච්, පාන් හා බටර් සමග කෑමට තැම්බූ බිත්තර, අලුතින් සෑදූ ක්‍රීම් චීස්, ලුසී මහත්මියගේ සහෝදරයාගේ ගෙවත්තේ වැවුණු තක්කාලි සමග කෑමට තැම්බූ මස්, ඉඟුරු පාන්, උණු උණු කේක්, ස්ට්‍රෝබෙරි පුඩිං හා නොයෙක් වර්ගයේ පලතුරු කේක් වැනි බොහෝමයක් දේ එහි තිබුණා !

"දෙවියනේ !" විස්මයට පත් ග්වේන්ට හා ක්ලැරිසාට කියවුණා. "පුදුම කෑම ජාති ගොඩක් !"

"ඉතින් වාඩි වෙලා කමුකෝ." ලුසී මහත්මිය කිව්වා. එහෙත් මුලදී ගත් ඉතා රසවත් දිවා ආහාරයට පසුව එවැනි කදිම ආහාර පාන තිබුණ ද ඔවුන්ට වැඩි යමක් රසවිඳීමට නොහැකි වුණා. බලාපොරොත්තු කඩ වූ සිතින් ගොන්ඩොලින් විශාල කෑම ගොඩ දෙස බැලුවා.

එමෙන්ම මෙහිදී ලුසී මහත්මියට නුවණක් පහළ වුණා.

"ඔයාලා ඉස්කෝලෙදි රෑ පාටි වගේ දේවල් දාන්නේ නැද්ද?" ඈ ක්ලැරිසාගෙන් ඇසුවා. "මට මතකයි ඔයාලගේ අක්කා, ළඟදි බැඳපු කෙනා, එයා බෝඩිං ඉස්කෝලේ ඉන්න කාලේ නිතරම ඒ වගේ දේවල් ගැන කිව්වා."

"රෑ පාටියක් !" මැලෝරි ටවර්ස්හිදී ඇය සහභාගී වූ මධ්‍යම රාත්‍රී සාදයක් දෙකක් මතක් වූ ගොන්ඩොලින් ඇසුවා. "අපොයි, ඒක අපූරු අදහසක්, ලුසී නෝනා ! ඒකට ගන්න අපිට මේ කෑම ඇත්තටම ගෙනියන්න පුළුවන් ද ?"

"ඇත්තටම පුළුවන්. එතකොට මම මේවා දෙන්න හිතාගෙන හිටපු බඩගිනිකාරියන්ටම මේවා කන්න පුළුවන්." දිලිසෙන දෙනෙතින් දැරියන් දෙදෙන දෙස බැලූ මහලු ලුසී මහත්මිය කිව්වා. "ඒත් ඔයාලා කොහොමද මේවා ගෙනියන්නේ ?"

ක්ලැරිසා හා ග්වේන් ඒ ගැන කල්පනා කර බැලුවා. ඒවා තනියම ඔසවා ගෙන යාමට ඔවුන්ට තිබුණ දුර වඩාත් වැඩියි. ඔවුන්ට අනිවාර්යයෙන්ම උදව් අවශ්‍ය බව පෙනුණා. ක්ලැරිසා මහත් ලෙස උනන්දුවට පත්ව තිබුණා. එමෙන්ම දැන් ඇය ද එවැන්නකට සහභාගී වීමට යනවා. එමෙන්ම ඊට ගැළපෙන කෑම ද සමග !

"මම දන්නවා" ග්වේන් හදිසියේම කිව්වා. "අපිට ඩැරල් එක්ක එන අනිත් අය පාරේ අතරමගදී මුණ ගැහෙන්න ඕනෑ පහ හමාරට අර ගල් වළ තියෙන තැනදි. අපි ළමයි කීප දෙනෙක් එක්කර ගෙන එමු මේවා අරගෙන යන්න."

"ඒක හොඳ අදහසක්" ක්ලැරිසා තම දැස් සනකම් උපැස් යුවළ තුළින් බබළමින් කිව්වා. මෙලෙස, ලුසී මහත්මියගේ ඔරලෝසුවේ පහ හමාර වීමට පෙර, ග්වේන් හා ක්ලැරිසා අනෙක් පිරිස හමු වීමට මාවතේ පහළට බැස යන්නට වුණා.

එහෙත් එහි සිටියේ දෙදෙනෙක් පමණයි. එමෙන්ම ඒ දෙදෙනා ද සිටියේ මහත් කේන්තියෙන්, ඒ ඇලිසියා හා බෙලින්ඩායි.

"අනේ, අනේ ! දන්නවාද වෙලාව කීය ද කියලා. හයට කාලයි. අපි විනාඩි විස්සක් මෙතැනට වෙලා බලා හිටියා." ඇලිසියා කේන්තියෙන් කතා කරන්නට පටන් ගත්තා. "අනිත් අය යන්න ගියා. අපිටයි බලා ඉන්න වුණේ. ඔයාලට ඔරලෝසු නැද්ද ?"

"නැහැ." ගොන්ඩොලින් කිව්වා. "හුඟාක් කනගාටුයි. මම හිතන්නේ ලුසී නෝනාගේ ඔරලෝසුවේ වෙලාව වැරදියි."

"හොඳයි, දෙවියන්ගේ නාමෙට, දැන්වත් අඩිය ඉක්මන් කරලා යමු." ඇලිසියා කන් කෙඳිරි ගෑවා.

එහෙත් ග්වේන් ඇගේ බාහුවෙන් අල්ලා නැවැත්වූවා. "ටිකක් ඉන්නකෝ, ඇලිසියා. ඔයාලා දෙන්නා අපිත් එක්ක ආපහු ලුසී නෝනලාගේ ගෙදරට යන්න එන්න ඕනැ. ඒ තරම් දුරක් නැහැ."

මහත් කෝපයට පත්ව ඇලිසියා හා බෙලින්ඩා ග්වේන් දෙස බැලුවා. මහත් කඩිනමින් සියල්ල කී ගොන්ඩොලින් ඉතුරුව තිබූ කෑම කන්දරාව ගැන විස්තර සැපයුවා. එමෙන්ම රාත්‍රී සාදයත්, ඒ සඳහා කෑම සැපයීමට ලුසී මහත්මිය සැදී පැහැදී සිටින බවත්.

ඇලිසියාගේ මුහුණේ සිනාවක් ඇඳුණ අතර බෙලින්ඩාගේ දෑසේ දඟකාර නපුරු බැල්මක් දිස් වුණා. රෑ පාටියක් ! කදිම දවසක අවසානය එලෙස විය යුතුමයි. හුඟක් කෑම ! මේ නාස්ති කළ යුතු අවස්ථාවක් නොවෙයි !

"හරි, ඒතරම් අපූරු කෑම ගොඩක් නරක් වෙන්න ඉඩ අරින එක පවක්." ඇලිසියා සතුටක් මවාගෙන කිව්වා. "මට තේරෙනවා ඔයාලට ඒක කරන්න බැරි බව. මම හොඳින්ම දන්නවා ඇවිදලා, කඳු නැගලා නැවට පස්සේ අද රෑ පාටියක් දාන එක අපි කාටත් ලොකු විනෝදයක් වෙයි. අපි හැමෝම ආපහු ගිහින් ඒ බඩු ටික අරගෙන එමු."

පමාවීම ගැන තවත් කිසිවක් කියැවුණේ නැහැ. ඔවුන් සිව් දෙනාම නැවතත් ඉක්මනින්ම ලුසී මහත්මියගේ කුඩා නිවහන බලා ගියා. ඈ සියල්ල හැකි පමණ හොඳින් කූඩවල හා ඇල් බෑගවල අසුරා තිබුණා. දැරියෝ මහත් සතුටින් කෑ ගසා ඇයට හෘදයාංගමව ස්තුති කළා.

"අපි පුළුවන් තරම් ඉක්මනට කූඩයි බෑග් ටිකයි ආපහු අරගෙන එන්නම්." ක්ලැරිසා පොරොන්දු වුණා. "අපොයි, මොන තරම් ගොඩක් තියෙනවාද අපිට අරගෙන යන්න !"

ඇත්තෙන්ම එය විශාල ගොඩක්. සිව් දෙනාටම කළ හැකි වූයේ අමාරුවෙන් සියල්ල මැලෝරි ටවර්ස් වෙතට ඇදගෙන යාමයි. ඔවුන් කඳුකර මාවතේ පහළට පහළට එන විට සැලී ඔවුන් එන තුරු මඟ බලමින් සිටියා. "ඔයාලා මොනවාද මේ තරම් වෙලා කළේ ?" ඈ ඇසුවා. "ඔයාලා අතරමං වෙලා හරි මොනවා හරි වෙලා හරි ඇති කියලා ඩැරල් හොඳටම බය වෙලා. ඔයාලා කන්දෙන් වැටිලා වෙන්න ඇති කියලා වාර්තා කරන්නයි එයා යන්නේ !"

ඇලිසියා හඬ නගා සිනාසුණා. "මේ කූඩ දිහා බලන්නකෝ." ඈ කිව්වා. "ඇයි මේ බෑග් ! ක්ලැරිසාගේ පරණ ආයා අපිට මේ ඔක්කෝම දුන්නා රෑට පාටියක් දාන්න !"

"දෙවියනේ !" ඇඩි සතුටට පත් සැලීට කියැවුණා. "කොයි තරම් අපූරුද ! ඔයාලා මේවා කොහේ හරි හංගන්න. පොට්ටි හරි, මම්සලී හරි දැක්කොත් ඉවරයි."

"අපි කොහේද මේවා තියන්නේ ?" ඇලිසියා කල්පනා කරමින් ඇසුවා. "අනික කොහේද අපි පාටිය දාන්නේ ? අද හුඟාක් රස්නේ නිසා එළිමහනේ කොහේ හරි කරුවළ තැනක් තමයි හොඳ. මම දන්නවා අපි පිහිනුම් තටාකය ළඟට රෑට යමු. එතකොට රෑට පිහිනන්නත් පුළුවන් !" මෙය ඉතා අනර්ඝ බව පෙනුණා. ඔයා ගිහින්

ඩැරල්ට කියන්න අපිට කරදරයක් නැහැ කියලා." ඇලිසියා කිව්වා. "අපි තටාකය ළඟට හොරෙන්ම ගිහින් මේවා ආරක්ෂක පටි, කුඩා භාණ්ඩ තියෙන කාමරෙන් තියන්නම්."

සැලී වේගයෙන් දුව ගිය අතර ග්වේන්, ක්ලැරිසා, ඇලිසියා හා බෙලින්ඩා කඩිනමින් තටාකය දෙසට ගමන් කරන්නට වුණා. වඩදිය රැල්ල පහළ ගොස් තිබුණා. එහෙත් මධ්‍යම රාත්‍රිය වන විට එය නැවත ඉහළ නඟිනු ඇත. එමෙන්ම තටාකය අවට සිට වතුර ඉස ගනිමින් දෙපා මතින් ජලය ඇදී යද්දී ඔවුන්ට රාත්‍රී සාදය භුක්ති විඳිය හැකියි. පුර හඳ ද පායා තිබූ අතර සියල්ල කදිමට ගැළපුණා !

සියලු දේ කුඩා භාණ්ඩ කාමරයේ ඇසිරූ ඇලිසියා එහි දොර වසා දැමුවා. ඉන් පසු සිව් දෙනාම ගල් තලාව මතින් ආපසු එන්නට වූ නමුත් අතරමඟදී තමා කුඩා කාමරයේ දොරට අගුල නොදැම්ම බව ඇලිසියාට හදිසියේම සිහි වුණා.

"අයියෝ !" ඇයට කියවුණා. "දොර ලොක් කළේ නැහැනේ. කවුරු හරි ඒ පැත්තේ ගියොත් ඉවරයි. ඔයාලා තුන් දෙනා යන්න. මම ඉක්මනට දොර ලොක් කරලා දුවගෙන එන්නම්."

ආපසු දුව ගිය ඈ දොරෙහි අගුල දමා කුඩා යතුර සාක්කුවේ ඔබා ගත්තා. ඇය හදිසියෙන්ම ආපසු හැරෙද්දී යමෙකුගේ පා හඬක් අසලින්ම නැගෙනු ඇයට ඇසුණා.

දෙවියන්ට ස්තුති වෙන්න, ඒ බෙටී, බටහිර කුලුනේ සිටින ඇගේ මිතුරිය. "හෙලෝ ! ඔයා මොනවාද මෙතැන කරන්නේ ?" බෙටී ඇසුවා. සිනාවක් පෑ ඇලිසියා කෑම කන්දරාව ගැන ඇයට කිව්වා. "ඔයාල මට එන්න කියන්නේ නැද්ද?" බෙටී ඇසුවා. "කවුරුහරි අකමැතිද ?"

"නැහැ, ඒත් ඩැරල් අකමැති වුණොත් විතරයි." ඇලිසියා අදිමදි කරමින් කිව්වා.

"ඔයා දන්නවානේ රෑට කුලුනුවලින් පිට ගිහින් අපිට එකතු වෙන්න තහනම් කියලා. ඒක එදා ඉඳලාම තියෙන ඇඩි නීතියක්."

"හොඳයි, අපේ නිඳන කාමරයේ ජනේලයෙන් මම පිටත බලා ඉද්දි පිහිනුම් තටාකය ළඟ මොකක්ද සිද්ධ වෙන සද්දයක්

ඇහෙනවා. ඒ මොකක්ද කියලා බලන්න මම එළියට එනවා. ඒක නවත්වන්නත් නීතියක් තියෙනවාද ?" නපුරු සිනාවක් පාමින් බෙටී ඇසුවා. "එතකොට හැම කෙනෙක්ම 'ඔයත් ඇවිදින් එකතු වෙන්න' කියලා කියන එක කොහොමවත් නවත්වන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ."

"ඔව්, ඒක නම් මාර අදහසක්." ඇලිසියා කිව්වා. "ඔයා එහෙම කරන්න. එතකොට මම ඔයාට මේ ගැන කිව්වා කියලා කවුරුවත් දැන ගන්නේ නැහැ ! මම කියන්නම් 'ඔයත් ඇවිදින් අපිට එකතු වෙන්න' කියලා. එතකොට හැම කෙනාම එහෙම කියයි. ඩැරල්ට එපා කියන්න බැරි වෙයි !"

"හරි," බෙටී සිනාසෙමින් කිව්වා. "එහෙනම් මටත් කාලා බීලා සෙල්ලම් කරන්න පුළුවන්, නැද්ද ? ඔයාලා අද කොහේද ගියේ ? ලැන්ග්ලි කන්දට ද ? අපි ලෝංබොටම්වලට ගිහින් විනෝද වුණා. මේ... මම හිතන්නේ මට පුළුවන් වෙයි බටහිර කුලුනෙන් තව දෙතුන් දෙනෙක්ව එක්ක එන්න. එහෙම බැරි වෙයිද ? කොහොම වුණත් ආරාධනා කරලා නෙවෙයිනේ. මොකක්ද මේ සද්දය කියලා බලන්නයි එන්නේ. කවුරුවත් සැක කරන එකක් නැහැ."

"ඒක හරි. එහෙනම් එලන්වයි, විනීවයි එක්ක එන්න." ඇලිසියා කිව්වා. "එයාලත් හුඟක් සතුටු වෙයි. ඒත් දෙවියන්ගේ නාමෙට මමයි මේක කිව්වේ කියලා කියන්න එපා. ඩැරල් දැන ගත්තොත් මගේ ඔළුව කයි ! එයා පන්ති නායිකාකම හරිම බරපතළ විදිහට සලකනවා!"

"එහෙම තමයි" කී බෙටී හඬ නඟා සිනාසුණා. එහෙනම් රෑට හමුවෙමු. මේ, අපිව දකිද්දි ඔයා හුඟාක් පුදුම වුණා වගේ පෙන්වන්න."

ඇය වේගයෙන් දිව ගිය අතර ඇලිසියා සෙසු පිරිසට එකතුවීමට ගියා.

"ඔයා මොකද මේ තරම් පරක්කු වුණේ ?" බෙලින්ඩා ඇසුවා. "අපි හිතුවා ඔයාට කලන්තයක් හැදිලා තටාකයට ඇදගෙන වැටෙන්න ඇති කියලා. ඉක්මන් කළේ නැතිනම් රෑ කෑමට පරක්කු වෙනවා.

"කෑම ගැනයි, රෑ පාටිය ගැනයි ඔයාලා ඩැරල්ට කිව්වාද ?" ඇලිසියා ඇසුවා.

"ඔව්." බෙලින්ඩා කිව්වා. "මුලින් එයා ටිකක් සැකෙන් වගේ හිටියා. ඒත් අපි එයාට මතක් කළා ගිය වාරයේ පහේ පන්තියේ ආපු පාටි එක ගැන. එතකොට එයා හිනාවෙලා කිව්වා 'පාටියක් නම් හොඳයි තමා' කියලා !"

"ඩැරල් හොඳයි !" සතුටට පත් ඇලිසියා කිව්වා. "තටාකය ළඟ පහළ ගල් තලාව හොඳයි කියලා ඔයාලා කිව්වා ද ?"

"ඔව්. එයා එකඟ වුණා එතැන හොඳයි කියලා." බෙලින්ඩා කිව්වා. "දැන් ඔක්කෝම හරි !"

# 12

"ඉඳිවියන්ගේ නාමෙට, අද රෑ සැලසුමක් තියෙන බව පොට්ටිටවත්, මම්සලීටවත් ඉව වැටෙන්න ඉඩ තියන්න එපා." ඩැරල් රෑ කෑමෙන් පසුව දැරියන්ට කිව්වා.

එදින රාත්‍රියේ නින්දට යාමට ඔවුන් වැඩි වේලාවක් ගත්තේ නැහැ. මන්දගාමී ග්වේන් පවා කඩිසර වුණා. සියල්ලන් අතරින් වඩාත් කඩිසර වූයේ අයිරින්. එය අයිරින්ට මහත් පුදුමයක් වුණා. එහෙත් කල්පනාවකින් තොරව ඇය බාගෙට ඇඳුම් ඇඳගෙන ඇඳට වැටී ඇති බවත් පසුව නැවත නිසි පරිදි ඇඳුම් සකසා ගෙන නින්දට ගිය බවත් අනාවරණය වුණා.

නාන ඇඳුම් කෙනෙකුගේ කබඩය තුළ සූදානම්ව තිබුණ අතර උඩු ගවුම හා සෙරෙප්පු එකිනෙකාගේ ඇඳන් අසල සූදානම්ව තිබුණා.

"සැලී, ඩැරල්, ඔයාලා දෙන්නාට නැඟිටලා ඉන්න වෙන එක ගැන නම් දුකයි." අයිරින් ඈනුම් හරිමින් කිව්වා. "කාටත් සුබ රාත්‍රියක්. තව ටිකකින් හමුවෙමු !"

සැලී පළමු පැය අවදිව සිට අනතුරුව මධ්‍යම රාත්‍රිය වන තුරු අවදිව සිටීමට ඩැරල්ව කුද්දන බව කිව්වා. එවිට දෙදෙනාට කෙටි විවේකයක් ගත හැකි වනු ඇත.

සැලී පළමු පැය නිර්භීත ලෙස අවදිව සිට ඉන්පසුව යාබද ඇඳෙහි නිඳා සිට ඩැරල්ව කිද්දුවා. ඩැරල් ඉතා තද නින්දේ පසු වූ අතර දෙනෙත් විවර කර ගැනීමට හෝ නොහැකි වුණා. එහෙත් අවසානයේ අවදි වූ ඇය තමා නැවතත් නින්දට ඇද වැටෙනු ඇතැයි බියෙන් ඇඳෙන් නැඟිට ඒ මේ අත ටිකක් ඇවිදීමට තීරණය කළා. එසේ නොවුණොත් මධ්‍යම රාත්‍රියේ පිබිදෙන කිසිවෙකු නොමැති හෙයින් සාදයක් නොතිබෙනු ඇති බවට ඇය ස්ථිරවම දැන සිටියා.

අවසානයේ, කුලුන මුදුනෙහි ඇති ඔරලෝසුවේ දොළහ කනිසම නාද වනු ඇයට ඇසුණා. ඇය පළමුව සැලී කිද්දූ පසුව දෙදෙනාම අනෙක් සෑම කෙනෙකුවම කිද්දූවා. සුපුරුදු පරිදි අපහසුම වුණේ ගොන්ඩොලින්ව කිද්දීමයි. ඇය අවදිවීමට සූදානම්ව නොමැති නිසා ඇය තනිකර දමා යනවාද නැද්ද යන්න ගැන ඩැරල් සිතින් තර්ක කළා. එහෙත් ක්ලැරිසාගේ සිත රිදෙනු ඇතැයි ඇයට කල්පනා වුණා. කෙසේ වෙතත් ඒ ක්ලැරිසාගේ සාදයයි!

ඔවුන් සියලු දෙනා උඩු ගවුම් හා සෙරෙප්පු දමා ගත්තා. සිහින් සිනා හඬින්, හාත්පසින් කතා කරන කෙඳිරිලි හඬින් නිදන කාමරය පිරී ගියා. සියලු දෙනාම හොඳින් පිබිදී සිටි අතර තැති ගත් සතුටින් යුතු වුණා.

"එන්න, අපි පහළ පැති දොර ළඟට ගිහින් ඒකෙන් ගෙවත්තේ ගේට්ටුවෙන් ගල්තලාවට යන පාරට යමු." ඩැරල් කෙඳිරිලි හඬින් කිව්වා. "ඒත් දෙවියන්ගේ නාමෙට පඩිපෙළේ වැටෙන්නවත්, වෙන මෝඩ වැඩක් කරන්නවත් එපා.

වැඩි වේලාවක් ගත වීමට පෙර, වචනයෙන් කිව නොහැකි ලෙස සිත් පැහැර ගන්නා අයුරින් සඳ එළියෙන් බබළන පිහිනුම් තටාකය අසලට ඔවුන් ආවා.

"අපි මුලින්ම කෑම එළියට අරගෙන බලමු." සැලී කිව්වා. "මට හරිම ආසයි ඒවා දැක ගන්න."

"ඇලිසියා පොඩි කාමරයේ යතුර කොහේද ?" ඩැරල් ඇසුවා.

"අපොයි !" ඇලිසියා කිව්වා. "ඒක මගේ ගවුම් සාක්කුවේ අලා ඇවිදින්. මම දුවලා ගිහින් අරගෙන එන්නම්. විනාඩියක් යන්නේ නැහැ !"

## 13

ඇලිසියා ගල් තලාවේ බෑවුම් මඟ ඔස්සේ හතිලමින් දුව
හියේ යතුර අමතක කිරීම ගැන තමා ගැනම අමනාපයෙන්. කුලුනේ
පැති දොරෙන් රිංගා ඇතුළු වූ ඈ තරප්පුව නැඟ ගියා. පළමු
පන්තියේ නිදන කාමර අසලින් ඇති කොරිඩෝව ඔස්සේ ඇය යත්ම
කොරිඩෝව පසෙක වූ ජනේලයෙන් පිටත බලාගෙන සිටින කුඩා
සුදු රුවක් ඈ දුටුවා.

'පළමු පන්තියේ ළමයෙක් වෙන්න ඕනෑ' ඈ සිතුවා. 'රාත්‍රියේ
මේ වෙලාවට එයා මොනවාට එළියට ආවාද ?'

ජනේලයෙන් පිටත බලා සිටින කුඩා සුදු තැනැත්තිය වෙත
සමින් පා තබා ගිය ඈ දැරියගේ උරපත්තෙන් ඇල්ලුවා. එක් වරම
නදින් හුස්මක් පිට කරනු ඇසුණා.

"ෂ් !" ඇලිසියා අනතුරු ඇඟෙව්වා. "දෙවියනේ, තමුසේ නේද,
ජූන් ? මේ මහ රෑ තමුසේ එළියේ කරන්නේ මොනවා ද ?"

"හරි, ඔයා මොනවාද කරන්නේ ?" ජූන් කපටි ලෙස ඇසුවා.

ඇලිසියා ඇයව සෙලෙව්වා. "තමුසේ වගේ හොර වැඩක්
නවෙයි." ඈ කිව්වා.

"මම බලාගෙන ඔයාලා ඔක්කෝම නාන ඇඳුම් අරගෙන
නවා." ජූන් රහසින් මෙන් කිව්වා. "ඔයයි, තව කෙනෙකුයි ඇඳුම්
ාරු කරන කාමරයෙන් නාන ඇඳුම් අරගෙන එනවා දැකලා මට
තුණා, හතර පන්තියේ අය මොනවාට හරි ලෑස්ති වෙනවා කියලා.
යාලා හිතුවේ මම දැක්කේ නැහැ කියලා වුණාට මම දැක්කා."

"ගිහින් නිදා ගන්නවා." කෝපයෙන් වෙව්ලන කටහඬකින් ඇ අණ කළා.

"ඔයාලා රෑ පාටියක් දානවාද ?". සෙලවීමක් හෝ නැතිව ජූන් මුරණ්ඩු ලෙස ඇසුවා.

"එපා කරපු හොර පූසියක්." කී ඇලිසියා ජූන්ව තදින් තල්ලු කර දැමුවා. "හතර පන්තියේ අපි කරන දේවල්වලින් තමුසෙට වැඩක් නැහැ. දැන් නිදා ගන්න යනවා !"

ඇලිසියාගේ අත තදින් පසෙකට තල්ලු කළ ජූන්ගේ කටහඬ භයානක වුණා. "පොට්ටි දන්නවාද ඔයාලගේ පාටිය ගැන !" ඇ ඇසුවා. "නැති නම් මම්සලී ? මේ ඇලිසියා, ඔයාලා ගැන කවුරු හරි එයාලට කිව්වොත් හරිම අවාසනාවක් නේද සිද්ධ වෙන්නේ."

ඇලිසියා ගැඹුරු හුස්මක් හෙළුවා. ජූන් සැබෑවටම ගොස් ගුරු මණ්ඩලයේ කෙනෙකු කුද්දා ඔවුන්ගේ සාදය කඩාකප්පල් කරන බවට තර්ජනය කරනවාවත්ද ? කෙනෙකු මෙතරම් කපටි ලෙස වංචාකාරීදැයි ඇයට ඇදහිය නොහැකි වුණා.

"ඇලිසියා, මටත් ඇවිත් පාටියට එකතුවෙන්න ඉඩ දෙන්න." ජූන් ආයාචනා කළා. "අනේ, කියන්නකෝ."

"බැහැ," කෙටියෙන් කී ඇලිසියා, ඉන් පසුව, තමා තව මොනවා කිව යුතු දැයි සිතා ගත නොහැකිව ජූන්ට ජනේලය අසල සිටගෙන සිටීමට ඉඩ හැර කුඩා කාමරයේ යතුර සොයාගෙන ඒමට පිටත්ව ගියා. ඇය කොතරම් කෝපව සිටියේ ද කිවහොත් පැටලිල්ලකින් තොරව ඇයට නිල ඇඳුම් සාක්කුවේ වූ යතුර ඉක්මනින්ම පිටතට ගත නොහැකි වුණා. එලෙස පළමු පන්තියේ දැරියක කපටිකම් කිරීම විශ්වාස කළ හැකිද ? තමාගේම ඥාති සහෝදරිය ! දොඩම් ඇටයක් තරම් නැති මීයෙක් වගේ කටහඬින් කරන තර්ජන ! මේ අවස්ථාව වන විට ජූන් ගැන ඇලිසියාට තිබුණේ දැඩි කෝපයක්.

යතුර අතට ගත් ඇ ආපසු පිහිනුම් තටාකය වෙතට දිව්වා. ජූන් හමුවීම ගැන ඇ කිසිම දෙයක් අනෙක් අයට පැවසුවේ නැහැ. ඒ වන විට වතුරට බැස සිටි සියලු දෙනා විනෝද වෙමින් සිටියා.

"අපරාදෙ, හඳ නැතිව ගියා." ඩැරල් සැලීට කිව්වා. "අපොයි,

හඬ වැහිලා ගියා නේද ? ඇලිසියා ආපහු ඇවිදින් නේද ? හේයි, ඇලිසියා, ඔයා මොන තරම් වෙලා ගියා ද, යතුර තිබුණා ද ?"

"ඔව්, මම දොර අරින්න යන්නේ," ඇලිසියා පිළිතුරු ලෙස කිව්වා. "මෙතැන ක්ලැරිසා ඉන්නවා. බඩු එළියට ගන්න එයා මට උදව් කරයි. අපොයි, දැන් හුඟාක් කරුවළයි. හඬ නැතිව ගියා."

හදිසියේ බටහිර අහස දෙසින් ගෙරවිලි හඬක් නැගුණා. අකුණු හඬක්, සුළං හමන හඬ සමග ගිගුරුම් හඬ.

"කුණාටුවක් එන්න වගේ" ඩැරල් කිව්වා. "මම හිතන්නේ ඉක්මනින්ම කුණාටුවක් එයි කියලා. අද හුඟාක් රස්නෙයි. මේ, ඇලිසියා, කුණාටුවක් එනවා නම් ඊට ඉස්සර අපි පාටි එක පටන් ගත්තොත් හොඳයි කියලා ඔයාට හිතෙන්නේ නැද්ද ?"

"ඒක ඇත්ත" ඇලිසියා කිව්වා. "ඕ, ඔන්න ආයෙත් හඬ ආවා.- දෙවියන්ගේ පිහිටයි."

තටාකයෙන් ඉවතට නැඟ ගත් දැරියෝ වතුර පිසදා ගන්නට වුණා. එතැන සිට කතා කරමින් හා හඬ නඟා සිනාසෙමින් ඔවුන් සිටින අතරේ පාසලේ සිට ගල් තලාවට එන මාවත ඔස්සේ එන අඳුරු සෙවණැලි තුනක් දැක ගැනීමට ඩැරල්ට හැකි වුණා. ඇගේ හදවත ගල් ගැසුණා. ඒ මෙම කෑකෝ ගැසීම් හඬ ඇසුණ ගුරුවරියෝ ද ?

ඇත්තෙන්ම ඒ බෙටී. එලන් හා විනී ද සමග හතර පන්තියේ දැරියන් මෙලෙස රොක්ව සිටිනු දැක විස්මය පළ කරන බවක් දක්වමින් ඔවුන් දුර සිටම නැවතී බලා සිටියා.

"මේ, ඔයාලා මේ මොනවාද කරන්නේ ?" බෙටී ඇසුවා. "අපිට මේ පැත්තෙන් සද්දයක් ඇහුණා කියලා හිතුණා. අද වගේ රෑකදි නාන්න තිබුණා නම් හොඳයි කියලා අපට හිතුණා."

"අපි නම් පාටියකුත් දානවා." ඇලිසියාගේ කටහඬ නැගුණා. "ඔයාලත් එන්න."

"අනේ එන්න, ඕනෑ තරම් කන්න තියෙනවා." අයිරින් කී අතර අනෙක් හැමෝම මෙන් ඒ දෙයම කියන්නට වුණා.ඩැරල් පවා ඔවුන්ව පිළිගත්තේ මේ වන විටත් බෙටී ඇලිසියාගෙන් ආරංචිය ලැබ සාදයට

සහභාගී වීමේ අදහසින්ම පැමිණ සිටින බව ඇයට කිසිසේත් සිතා ගැනීමට නොහැකි වූ නිසයි.

එමෙන්ම එක් කුලුනක කෙනෙක් තවත් කුලුනක කෙනෙකුව හමුවීමට රාත්‍රියේදී තම නිදන කාමරවලින් පිටතට පැමිණීම තහනම් යන දැඩි නීතියක් ඇති බව ද ඇයට මතක් වුණේ නැහැ. ඇයට කිසිසේත් ඒ ගැන කල්පනාවක් තිබුණේ නැහැ.

සාදය භුක්ති විඳීමට ඔවුන් හැමෝම වාඩි වුණා. ගෙරවිලි හඬ නැවතත් නැගුණ අතර මෙවර එය ඉතා සමීපයෙන් ඇසුණා. විදුලි කෙටීමකින් එක්වරම අහස ආලෝකමත් වුණා. සඳ විශාල කළු වලාවකින් වැසී ගිය අතර එදින රාත්‍රියේ සඳ තවදුරටත් දර්ශනය වුණේ නැහැ.

වඩාත් නරක වූයේ මහත් කලකිරීමක් ජනිත කරමින් විශාල වැහි බිඳු ගල්තලාව මතට වැටී හිරිකඩ විසුරුවීමයි.

"අපොයි, අපිට ආපහු යන්න වෙනවා." ඩැරල් කිව්වා. "වැස්සේ තෙතබරිත වෙලා ඉඳගෙන කන එක නම් කොහොමවත් විනෝදයක් වෙන්නේ නැහැ. එන්න, බඩු ටික එකතු කරගෙන අපි ආපහු දුවලා ඇතුළට යමු."

බෙටී ඇලිසියාට වැලමිටෙන් ඇන්නා. "අපිත් එන්නද ?" ඈ කෙඳිරිලි හඬින් ඇසුවා. "ඔව්, ගිහින් බලමු." ඇලිසියා ආපසු කෙඳිරුවා. "ඩැරල් ඔයාලට එන්න එපා කිව්වේ නැහැනේ."

මෙලෙස, බටහිර කුලුනේ සිටින බෙටී, එලන් හා විනී ද එකතුව හැමෝම සියලු කෑම හනි හනිකට අකුළාගෙන අඳුරේම වැනි වැනී ගල් තලා මාවතේ දුව යන්නට වුණා.

"අපි මේ කෑම කොහාටද ගෙනියන්නේ ?" ඩැරල් හති දමමින් සැලීගෙන් ඇසුවා. "අපේ පොදු කාමරයට ගෙනියන්න බැහැ. ඒකේ ජනෙල් තිර නැති නිසා එළිය පිටට පෙනෙනවා."

"පළමු පන්තියේ පොදු කාමරයට ගියොත් මොකද ?" සැලී ඇසුවා. ඒක ගුරු මණ්ඩලයේ අය ඉන්න කාමරයට ඉතා ඈතින් තියෙනවා වගේම ඒකේ එළිය පිටට පෙනෙන්නේ නැහැ.

"ඔව්, ඒක හොඳ අදහසක්." ඩැරල් කී අතර පළමු පන්තියේ

පොදු කාමරයේ සාදය පැවැත්වෙන ආරංචිය හැමෝම අතර පැතිරුණා. සැණෙකින් ඔවුන් හැමෝම එතුළට වැදුණා. දොර වැසූ ඩැරල් එළිය මඳක් හෝ පිටතට නොයන පරිදි පාපිස්ස දොර පාමුලට හිර කර තැබුවා.

ඔවුන්ගේ සැලසුම් සියල්ල කඩාකප්පල් කරමින් හදිසියේ ඇද හැළුණ කුණාටු වැස්ස නිසා මඳක් තෙත් වූ ගෙබිම මත තැන තැන දැරියෝ වාඩි වුණා. අකුණු පුපුරමින් අහස ගොරවන්නට හා වරින් වර විදුලි කෙටීම් සිදුවුණා. මේරි ලෝව් බියපත් පෙනුමක් ගෙන සිටි අතර ග්වේන් සුදුමැලිවී සිටියා. ඔවුන් දෙදෙනාම කුණාටුවලට බියක් දැක්වූවා.

"මම හිතනවා තන්ඩර් බයක් නැතිව ඇති කියලා." මස් සැන්ච්චයක් මුවට දමා ගනිමින් විල් කිව්වා. නිතරම ඇගේ පළමු සිතුවිල්ල වූවේ ඇගේ අශ්වයායි.

"මමත් හිතන්නේ...." කීමට පටන් ගත් ඇලිසියා එක්වරම නැවතුණා. සැම කෙනෙක්ම ගල් ගැසුණා. ඩැරල් මුවට ඇඟිල්ල තබා නිහඬ වන ලෙසට සංඥා කළා.

දොරට සෙමින් තට්ටු කරන හඬක් ඇසුණා. ටක්, ටක් ටක් ! ටක්, ටක්, ටක් !

ඩැරල් භීතියට පත් වුණා. මොන ලෝකේ කෙනෙක් වෙන්න පුළුවන් ද ? සියලු දෙනාටම නිසල වන ලෙසට ඈ තවත් සංඥාවක් දැක්වූවා.

තට්ටු කිරීම දිගටම සිදු වුණා. මෙවර එය මඳක් තදින් ඇසුණා. ඒ වන විටත් දැරියෝ නිසලව ඇඩි නිහඬ බවක් රැක්කා. රාත්‍රී නිහඬතාවය තුළ මහත් ශබ්දයක් ඇති කරමින් නැවතත් තට්ටු කරන හඬ නැඟුණා.

'අනේ දෙවියනේ !' ඩැරල්ට සිතුණා. 'තවත් හයියෙන් තට්ටු කළොත් පිට කාට හරි ඇහෙයි. එතකොට බළලා මල්ලෙන් එළියට පනිනවා.'

මෙම අමුතු තට්ටු කිරීම ගැන මහත් ලෙස බියපත් වූ ග්වේන් හා මේරි ලෝව් තදින්ම සුදුමැලි වුණා. ඔවුන් එකිනෙකා වැළඳගෙන බියපත් දෙනෙතින් බලා සිටියා.

තට්ටු කිරීම අවසානයේ ඇති වූ නිහඬ විරාමය තුළ දී ඩැරල් කතා කළා. "ඇතුළට එන්න."

දොර සෙමින් විවෘත වන අතරේ කුමක් සිදුවේවිදැයි බියපත්ව සිටි දැරියෝ ඒ වෙත ඇස් දල්වාගෙන සිටියා. ඇතුළට පැමිණියේ ජූන්. ඇයට පිටුපසින් සිටියේ තරමක් බියපත්ව සිටි ෆෙලිසිටි !



"ජූන් !" ගැඹුරු හුස්මක් අතරින් ඩැරල් කිව්වේ තම දෑස අදහා ගැනීමට නොහැකිව.

මවිතයට පත් කලෙක මෙන් ජූන් වටපිට බැලුවා.

"ඕ," ඈ කිව්වා. "මේ ඔයාලද ? මමයි, ෆෙලිසිටියි මේ වැස්සේ තිඟාගන්න බැරිව පිට පැත්ත දිහා බලන්න කියලා එළියේ ජනේලය ළඟට ආවා. එතකොට අපි මේවා බිම වැටිලා තියෙනවා දැක්කා." කී ඈ තැම්බූ බිත්තර තුනක් ගෙන හැර පෑවා ! "ඊට පස්සේ අපිට ඒක ලොකු පුදුමයක් හින්දා වටපිට බලද්දි අපිට මේ පැත්තෙන් යාන්තම් ශබ්දයක් ඇහුණ හින්දා අපේ පොදු කාමරයේ ඉන්නේ කවුද කියලා බලන්න හිතුණා. ඉතින් අපිට හිතුණා ඒ කවුරු වුණත් මෙතැන හොඳ

පාටියක් ඇති කියලා. ඉතින් අපි ආවේ ඔයාලගේ නැතිවුණු බිත්තර ටික දීලා යන්න."

මෙම කතාවෙන් පසු ඇඩි නිහඬතාවයක් ඇති වුණා. ඇලිසියා කෝපයෙන් දැවෙන්නට වුණා. කුණාටුව නිසා ඔවුන් ආපසු දුව එනු ජූන් බලා සිටි බව ඈ දැන සිටියා. ඔවුන් පළමු පන්තියේ පොදු කාමරයට රිංගනු ඇය දැක තිබුණා. බිම වැටුණු බිත්තර තුන දැක ඒ ගැන මහත් සේ සතුටින් යුතුව ඒවා ගෙනැවිත් දෙන මුවාවෙන් මෙම අවස්ථාවට සම්බන්ධ වීමට එය අවස්ථාව කරගෙන ඇති බව පෙනුණා.

"ඔහ්," කුමක් කිව යුතුදැයි සිතා ගත නොහැකිව ඩැරල් කිව්වා. "ස්තුතියි. ඔව් අපි පාටියක් දානවා."

"ඇයි ඔයාලා ඒකට අපේ පොදු කාමරය තෝරා ගත්තේ ?" අහිංසකව ඇසූ ජූන් එක් බිත්තරයක කට්ට කැඩුවා. "ඇත්තටම හතරෙ පන්තියේ ලොකු අය අපේ පොදු කාමරය පාටියකට තෝරා ගත්ත එක අපටත් නම්බුවක්. මේ... මේ බිත්තරය නම් හොඳටම හොඳයි. මේක කැඩුවේ මම බිඳක්වත් කන්න හිතාගෙන නෙමෙයි. මට කනගාටුයි."

"ඕ, ඔයාට ඕනෑ නම් ඕක කාලා දාන්න." වෙන කීමට දෙයක් සොයාගත නොහැකිව ඩැරල් කිව්වා.

"ස්තුතියි" කී ජූන් ෆෙලිසිටිට ද බිත්තරයක් දුන් අතර ෆෙලිසිටි ද එහි කටුව ඉවත් කර එය කන්නට වුණා.

ඩැරල්ට යම් අපහසුවක් දැනුණ ද ජූන් නැවතුණේ ෆෙලිසිටි ද සමග සාදය භුක්ති විඳීමට එකතු වීමටයි. එමෙන්ම පළමු වතාවට, තවමත් බටහිර කුලුනේ ඇරියන් තිදෙනෙකු ඔවුන් සමග උතුරු කුලුනේ සිටින බව ඇයට අවබෝධ වුණා. කිසිම හේතුවක් නැතිව ඔවුන් මෙහි නැවතී සිටීම සපුරා තහනම් ! එමෙන්ම, දැන් ඈ ඔවුන් කෙසේ ආපසු යවන්නද ? 'මේ බලන්න, ඔයාලා දැන් පිටවෙලා යන්න ඕනැ! මම දන්නවා අපි ඔයාලට කිව්වේ තටාකය ළඟදි අපි එක්ක ඉන්න කියලයි. ඒත් දැන් අපිට ඔයාලව තියාගන්න බැහැ.' යනුවෙන් කීමට ඇයට කෙසේවත් බැහැ. එවැනි වචන ඉතා අඥාන බව පෙනුණා.

ඩැරල් කිසිසේත් සාදයෙන් විනෝදයක් ලැබුවේ නැහැ. ජූන් හා ෆෙලිසිටි පිටත් කර හැරීමට ඇයට අවශ්‍ය වුව ද ඔවුන්

පාච්චි කරමින් සිටියේ පළමු පන්තියේ පොදු කාමරය වීමත්, ජූන් බිත්තර ඇහිඳ ගෙන ඒමත් නිසා එය ද කළ නොහැකි දෙයක් ලෙස පෙනුණා. එමෙන්ම ජූන්ව පිටත් කර හැරීම ගැන ඇලිසියා එතරම් සතුටු නොවනු ඇතැයි ද ඇයට සිතුණා. හිතුවක්කාර ජූන්ට කුමන ආකාරයේ කුරිරු දඬුවමක් දිය යුතුදැයි මේතාක් වන තුරු ඇලිසියා කල්පනා කරමින් සිටින බවක් ඩැරල් කිසිසේත් දැන සිටියේ නැහැ. අපොයි, ඔවුන් සුන්දරව ගත කිරීමට සැලසුම් කරගෙන තිබූ කාලය කෙසේ හෝ නරක අතට හැරී ඇති බවක් පෙනුණා.

ඉන්පසුව එය වඩාත් නරක අතට හැරුණා. ඇතින් එන අඩි හඬක් ඇසුණා.

# 14

"ඕයාලට ඇහුණද ?" සැලී කෙඳිරුවා. "කවුරු හරි එනවා ! ඉක්මන් කරලා තියෙන දෙයක් අකුළාගෙන අපි යමු !"

දැරියෝ අසල වූ දේවල් හැකි හැකි පමණ ඩැහැගත් අතර ඩැරල් උදුන අසල තිබූ කොස්ස ගෙන බිම විසිරී තිබූ පාන් රොඩු ඉක්මනින් පුටු යටට අතුගා දැමුවා. විදුලි පහන නිවා දැමූ ඈ දොර විවෘත කර පිටතට එබී බැලුවා. පිටත කොරිඩෝව තද අඳුරේ ගිලී තිබුණා. කිසිවෙකු එහි සිටින බවක් පෙනුණේ නැහැ. ඉදිරියෙන් ඇවිද ගියේ කවුරුන් විය හැකි ද ? ඉදිරියේ තිබුණේ පළමු පන්තියේ නිඳන කාමරයයි.

මේ වන විටත් ජූන් හා ෆෙලිසිටි හොඳටම බියව සිටියා. ඔවුන් එක්වරම පැන දිව්වා. තරප්පුව වෙතට දුව ගොස් අතුරුදහන් වූ බෙටී, විනි හා එලන් පැති දොර වෙතට දුව ගත්තා. ඉන් පසු ඔවුන්ට තම කුලුනට හොරෙන් රිංගා ගත හැකියි. ඩැරල් විසින් මෙහෙයවුණ අනෙක් පිරිස ප්‍රවේසමෙන් තරප්පුව නැඟ ඔවුන්ගේ නිඳන කාමර සොයා යන්නට වුණා.

වැරදීමකින් තොරව ඉතා සුපුරුදු සිහින් ලෙස කහින හඬක් අසලින් ඇසෙත්ම ඔවුන් වහා නැවතුණා. 'ඒ පොට්ටිගේ කැස්ස' ඩැරල් සිතුවා. 'අපොයි, අපේ කලබලේ එයාට ඇහිලාවත්ද ? ඒත් අපි කිසිම කිසි ශබ්දයක් කළේ නැහැ !"

බෙටී හා බටහිර කුලුනේ අනෙක් දෙදෙනාට කිසිවෙකුට අසු නොවී ආරක්ෂිතව පැන ගන්නට හැකි වේවායි ඈ ප්‍රාර්ථනා පිට ප්‍රාර්ථනා කළා. රාත්‍රියේදී එක් කුලුනක දැරියන් තවත් කුලුනක දැරියන්ව හමුවීමට යාම ඉතා තදබල වරදක් ලෙස ගණන් ගැනුණා. එයට එක් හේතුවක් වූවේ එක් කුලුනකින් තවකෙකට යාමට වහලයකින්

ආවරණය වූ මඟක් නොතිබීමයි. වෙනත් කුලුනකට යාමට සිදු වුවහොත් දැරියන්ට එළිමහනේ ගමන් කරන්නට සිදු වෙනවා.

පොට්ටි මොනවා කරමින් සිටිනවා විය හැකි ද ? ඇය කොහිද? ඉදිරියට යාමට සංඥාවක් එනතුරු දැරියෝ ගල් ගැසී බලා සිටියා. "එයා තුන්වැනි පංතියේ නිදන කාමරයේ" ඩැරල් අවසානයේ කෙඳිරුවා. "සමහර විට කාට හරි අසනීප වෙලා ඇති. මම හිතන්නේ අපි ඉක්මනටම පැන ගත්තොත් හොඳයි. පැය ගණනක් අපිට මෙහෙම හිටගෙන බලා ඉන්න බැහැ."

"හරි, ඊළඟ වතාවේ අකුණු ගහද්දි අපි දුවලා යමු. "සැලි සෙමින් කිව්වා. මෙම යෝජනාව කෙඳිරිලි හඬින් සියලු දෙනා අතර පැතිරුණ අතර දැරියෝ අකුණු හඬ එනතුරු නොඉවසිලිමත් වුණා. පළමුවන විදුලි කෙටීම පැමිණුණේ පේළියට සිට දිවීමට වක ගැසී සිටින දැරියන්ව පැහැදිලි ලෙස පෙන්නුම් කරමින්. ඊළඟට අකුණු ගැසීමේ ගෙරවිලි හඬ පැමිණියා.

එය දීර්ඝ වේලාවක් පැවතුණ මහා මේඝ ගර්ජනාවක් වූ අතර දැරියන් භීතියෙන් තම නිදන කාමරය බලා දුව යාමේදී නැඟුණ ශබ්දය එය තුළ ගිලී ගියා. තෙත නාන ඇඳුම් හා හැකි පමණ අතට ගෙන ආ දේවල් තම තමන්ගේ කබඩවල අඩියේම තැන්පත් කළ සියලු දැරියෝ ඇඳන්වලට නැඟ ගත්තා. මේතාක් වන තුරු කරදරයක් නොවීම ගැන ඔවුන් දෙවියන්ට ස්තුති පූර්වක වුණා.

පොට්ස් ගුරුතුමිය ඔවුන්ගේ නිදන කාමරයට නොපැමිණි නිසා ඔවුන් සැනසිලිදායකව සුසුම් හෙළුවා. තුන්වැනි පන්තියේ නිදන කාමරයේ යමෙකුට අසනීපව තිබුණා විය හැකියි. පොට්ස් ගුරුතුමිය තවම එතැන සිටිනවා විය හැකියි. අවසානයේ තුන්වන පන්තියේ නිදන කාමරය නිහඬ වනු හා එහි දොර වැසෙනු ඔවුන්ට ඇසුණා. පොට්ස් ගුරුතුමිය තම කාමරයට යන සියුම් අඩි හඬ ඔවුන්ට ඇසුණා.

එදින රාත්‍රියේ දැරියෝ ලී කොට මෙන් නින්දට වැටුණ අතර පසුදින ඉතා අපහසුවෙන් අවදි වුණා. ග්වේන් හා බෙලින්ඩා සුපුරුදු ලෙස ඔවුන්ගේ ඇඳන්වලින් බිමට ඇද දමන්නට සිද්ධ වුණා !. ඉතිරි වූ කෑම සියල්ල කඩිනමින් බෑගයකට යැවුණා. ඉන්පසුව ලැජ්ජාශීලී හා අහිංසක බවක් මවා ගනිමින් හතර පන්තියේ දැරියෝ උදේ කෑම සඳහා පහළට ගියා.

ෆෙලිසිටි ඩැරල්ට සිනාවක් නැඟුවා. ඈ පසුගිය රාත්‍රියේ දඩබ්බර වැඩයෙන් විනෝදයක් ලබා තිබුණා. එහෙත් ජූන් ඇලිසියාට සිනහවකින් සංග්‍රහ කළේ නැහැ. ඇලිසියාගේ මුහුණ අප්‍රසන්න බැල්මකින් යුතු වූ අතර ජූන්ට යම් අපහසුවක් දැනුණා.

විවේක කාලයේදී, ඇලිසියා පළමු පන්තියේ නායිකාව, හිල්ඩා, හමුවීමට ගියා.

“හිල්ඩා” ඇලිසියා කතා කළා. “ජූන්ගේ හැසිරීම ගැන නම් මම කොහෙත්ම සතුටු වෙන්නේ නැහැ. එයා දරන්න බැරි තරම් කරදරයක් වෙන්නයි එන්නේ අපි, හතර පන්තියේ අය තවත් ඉවසන්නේ නම් නැහැ. ඔයා එයාව නියම තැනට ගෙනෙන්න ඕනැ. නැති නම් අපිට එයාව හදන්න සිද්ධ වෙනවා. ඔයා මේ වැඩය කළොත් හුඟාක් හොඳයි.”

“ඔ, ඇලිසියා, මට හරිම කනගාටුයි.” හිල්ඩා කිව්වා. “අපිත් උත්සාහ කළා එයාව හදන්න. ඒත් එයා නිතරම කියන්නේ අපි එයාට ඕනැ විදිහට ඉන්න දුන්නේ නැති නම් ඔයා අපිට නිතරම ගෝරනාඩු කරයි කියලා. ඉතින් අපි එයාට හැම වෙලාවේම ඕනැ දෙයක් කරන්න ඉඩ දෙනවා.”

“මට ඒක තේරෙනවා.” අඳුරු කරගත් මුහුණින් යුතුව ඇලිසියා කිව්වා. “දැන් මම දන්නේ නැහැ පන්තියේ වැරදි කරන අනිත් අය ඔයා පාලනය කර ගන්නේ කොහොමද කියලා. හිල්ඩා, මම පළමු පන්තියේ ඉද්දී නම් මේවාට කරන්න හොඳ වැඩ තිබුණා. ඒ නිසා මොනවා හරි දෙයක් කරන්න. ඒ වගේම මම ඕනැ දේකට ඉඩ දීලා තියෙනවා කියන්න !”

“හරි. අපි කරන්නම්” හිල්ඩා කිව්වා. වංචනික, දඩබ්බර හා පුහු අහංකාරකමින් යුතු ජූන්ව පාලනය කර ගැනීමට බලතල ලැබීම ගැන මහත් සේ සතුටට පත් ඈ ජූන්ට දිය යුතු දඬුවම ගැන කල්පනා කළා. සතියක් යන තුරු කිසිවෙක් ඇය සමග කතා නොකර සිටිය හොත් ඇගේ පුහු ආඩම්බරකම් අඩු වනු ඇත.

ජූන් සමග කතා නොකරන බවට ෆෙලිසිටිට පවා පොරොන්දු වීමට සිදුව තිබුණා. අපොයි, ඒක නම් හරිම අපරාධයක්. එහෙත් ජූන්ට වඩා ඇයට තම පන්තියට පක්ෂපාතී වීමට සිදුව තිබුණා. එහෙයින් මුහුණ රතු කරගෙන සිටින ජූන් දෙස නොබලා ඇයට තම පොරොන්දුව පහත් හඬින් කීමට සිදු වුණා.

එදින සැඳෑවේ ෆෙලිසිටි දුක්බර මුහුණක් මවාගෙන ඩැරල් හමුවීමට පැමිණියා.

"ඩැරල්, මට ටිකක් ඔයා එක්ක කතා කරන්න ඕනෑ. ටිකක් නරක දෙයක් සිද්ධ වෙලා. ඊයේ රෑ අපි ඉතිරි කරපු පාන් රොඩු පුටු යට තියෙනවා අහුවුණා. තව සැන්විච් දෙකකුත් තිබුණා. පොට්ටි හිල්ඩාව අල්ලාගෙන ඇහුවා ඊයේ රෑ අපේ පන්තිය පාටියක් දැම්මා ද කියලා. පොට්ටි කිව්වා එයාට අපේ පොදු කාමරයෙන් ශබ්දයක් ඇහුණා වුණත් තුන්වැනි පන්තියේ නිදන කාමරයේ ළමයෙකුට අසනීප නිසා ඒක බලලා ඉවර වෙලා ඇවිදින් අපේ පොදු කාමරය බලද්දි කවුරුවත් හිටියේ නැහැ කියලා."

"අපොයි !" ඩැරල්ට කියැවුණා. අනතුරුව ඇගේ මුහුණ පැහැපත් වුණා. "හරි, ඒකෙන් ඇති වැඩේ මොකක්ද ? ඊයේ රෑ ඒ වෙනකොට හිල්ඩාට හොඳටම නින්ද ගිහින් තියෙන්න ඇති. එයාට කිසිම දෙයක් දැනගන්න විදිහක් නැහැ."

"ඔව්, ඒක ඇත්ත. එයාට නින්ද ගිහින්. ඒත් එයා කිව්වා එයා පාටියක් ගැන කිසිම දෙයක් දන්නෙත් නැහැ, අපේ පන්තියේ අය කිසිම දේකට එළියට නොගිය බව එයාට හොඳටම විශ්වාසයි කියලා." ෆෙලිසිටි කිව්වා. "අකුණු සද්දයට සමහර අය ඇහැරිලා තියෙනවා. ඒත් මමවත්, ජූන්වත් නැති අඩුව එයාලා දැකලා නැහැ."

"හරි, එහෙනම් ඇයි කලබල වෙන්නේ ?" ඩැරල් ඇසුවා. "ඔයා දන්නවානේ, ඊයේ රෑ ඔයා ජූන් එක්ක නොඑන්නයි තිබුණේ. ෆෙලිසිටි, මම හරියට පුදුම වුණා විතරක් නොවෙයි ඔයා එයත් එක්ක ඉන්නවා දකින්නවත් කැමති වුණේ නැහැ. මේ ඉස්කෝලයේ ඔයා ඉන්න පළමු වාරයේදී ඔයා මීට වඩා පරිස්සමින් වැඩ කරන්න ඕනෑ."

"මම දන්නවා." ෆෙලිසිටි කිව්වා. "ජූන් බල කරපු හින්දයි මම ආවේ. ඇත්තටම මට ඒ වෙලාවේ කරන්න දෙයක් තිබුණේ නැහැ, ඩැරල්. එයා හරි විහිළුකාරියක් වගේම ඕනෑම දෙයක් කරන්න බයත් නැහැ. දැන් අපි කවුරුවත් එයා එක්ක කතා කරන්නේ නැහැ. ඒ ගැන එයා හොඳටම පිස්සු වැටිලා ඉන්නේ. මේ හැමදේම ඇලිසියා නිසා කියලා එයා දන්න නිසා එයා කියනවා ඒකේ පළිය ගන්නවා කියලා. එයා ඒක කරයි."

"ෆෙලිසිටි, ජූන්ගෙන් ඈත් වෙලා ඉන්න !" ඩැරල් ආයාචනා කළා. "එයා යාළුවෙකුට හොඳ කෙනෙක් නෙවෙයි. ඇත්තටම එයා නරකම කෙල්ලෙක්. එයා ගැන හැම දෙයක්ම ඇලිසියා මට කියලා තියෙන්නේ."

එහෙත් මුරණ්ඩු වූ ෆෙලිසිටි හිස වැනුවා. "නැහැ, මම ජූන්ට කැමතියි. මට එයා එක්කමයි ඉන්න ඕනැ. එයා එහෙම නපුරු නැහැ. එයා ටිකක් විහිළුයි."

තම කුඩා සොයුරිය ගැන නොඉවසිලිවන්ත වූ ඩැරල් ෆෙලිසිටිට යන්න ඉඩ ඇරියා. කෙසේ වෙතත් දෙවියන්ට පිංසිදු වන්න පොට්ටිට කිසිම දෙයක් දැන ගන්න ලැබී නැහැ. පාන් කුඩු හා ආහාර කැබලි ගැනත්, සැන්ඩ්විච් ගැනත් ඈ හොඳටම ව්‍යාකූල වී සිටිනවා ඇත.

මේ සිද්ධිය යටපත්ව යන බවක් පෙනෙන්නට තිබුණා. එහෙත් ඊළඟ දිනයේ ඉතා කනස්සල්ලට පත් පෙනුමකින් යුතුව ෆෙලිසිටි ඩැරල් සොයා ආවා.

"ඩැරල් මට ඕනැ ඔයා එක්ක තනියම කතා කරන්න."

"දෙවියනේ ! ඒ මොකද දැන් ?" මැද මිදුලේ මුල්ලකට ෆෙලිසිටිව කැඳවා ගනිමින් ඩැරල් ඇසුවා.

"ජූන් ගැන. මට එයාව තේරුම් ගන්න බැහැ. එයා කියනවා දැන් එයා පොට්ටි ළඟට ගිහින් රෑ පාටිය ගැන ඇත්තම කියනවා කියලා." ෆෙලිසිටි කිව්වා. "එයා කියනවා මමත් ගිහින් ඇත්ත කියන එක හොඳයිලු."

කෝපයටත්, බියටත් පත්ව ඩැරල් ෆෙලිසිටි දෙස බැලුවා. හපොයි. මේ පළමු පන්තිය ! "ඒත් එයා එහෙම ගිහින් කිව්වොත් එයා අපේ කේළාම් හොයන්න ආවා කියලා අහුවෙනවා." ඩැරල් කෝපයෙන් කිව්වා. "කොහේද ඒ වසංගතය දැන් ?"

"සංගීත කාමරයක පුහුණු වෙනවා." ඩැරල්ගේ කෝපය ගැන බියපත්ව ෆෙලිසිටි කිව්වා. "එයා එක්ක කවුරුවත් කතා නැහැ, දන්නවානේ. මටත් බැහැ එයා එක්ක කතා කරන්න. එයා මට ලියුම් කෑල්ලක් එවලා තිබුණා. මම මොනවාද කරන්න ඕනැ ඩැරල් ? එයා ගිහින් පොට්ටිට ඇත්ත කියයි. මමත් නොගියොත් අනිත් අය හැමෝම හිතයි මම හරිම බයගුල්ලියක් කියලා."

"මම ගිහින් ජූන්ට කතා කරන්නම්." කී ඩැරල් ඇරියන් දිනපතා පුහුණු වන සංගීත කාමරයට කෙළින්ම ගියා. ඇය කෙතරම් කෝපයෙන් කාමරයට ඇතුළු වීද යත් පළමු පන්තියේ ඇරියෝ බියෙන් උඩ විසි වුණා.

"මේ බලනවා, ජූන්. මොකක්ද මේ වැඩේ." ඩැරල් කෝපයෙන් කෑ ගැසුවා. "එහෙම ගිහින් ඔයා ඕනෑ නැති කතා කීවොත් හතර පන්තිය ලොකු අමාරුවක වැටෙනවා කියලා ඔයා දන්නවා."

"මම ඕනෑ නැති කතා කියන්නේ නැහැ." ජූන් පියානෝව මත සරල තාලයක් වයමින් ශාන්තව කිව්වා. "මම නිකම් කියනවා මමත් ඊ පාටියේ හිටියා කියලා. මම කියන්නේ නැහැ පාටිය කාගේද කියලා. මම ... ආ... මට.. ඒක මගේ හෘද සාක්ෂියෙන් අයින් කර ගන්න ඕනෑ."

"ඔයා කපටි හෙරක් !" ඩැරල් කිව්වා. "ඔය වාදනය නවත්වලා මම කියන දේ අහනවා."

සරදම් සිනාවක් මුහුණේ මවාගත් ජූන් වෙනත් සරල වාදනයක් ආරම්භ කළා. ඩැරල් කෝපයෙන් පුපුරා යන්නට ආසන්න වුණා. ජූන්ගේ අත පියානෝවෙන් පිටතට විසිවන ලෙස රළුව පහරක් දුන් ඇය ජූන්ව තමාට මුහුණ පාන ලෙස කරකවා හැරෙව්වා.

"නවත්වනවා ඕක." ජූන් කිව්වා. "ඇලිසියාත් ඔයා වගේමයි. මට දැන් එයාවත් එපා වෙලා !"

ඇලිසියාගේ නම සඳහන්වත්ම, යමක් ඩැරල්ගේ සිතෙහි එක්වරම මතුව ආ අතර ජූන් හදිසියේ මෙලෙස 'ඇත්ත' කියන්නට යාමට ඇයට පහළ වූ ධාර්මික සිත ගැන ඩැරල්ට අවබෝධ වුණා. ඇයට අවශ්‍යව ඇත්තේ ඇලිසියාගෙන් පළිගැනීමටයි. ඇලිසියාව කරදරයට පත්කිරීම ඇයට මහත් සතුටක්. එමෙන්ම ඩැරල් පමණක් නොව හතර පන්තියේ සියලු දෙනාම කරදරයට පත් කළ යුත්තේ ඇයට අන් අය සමග කතා බස් කිරීමෙන් වැළකීමට හිල්ඩාව පෙලඹ වූ නිසයි.

"තමුසේ දෙපිටකාට්ටු තපුරියක්, නැද්ද ?" ඩැරල් අවඥා සහගතව කිව්වා. "ඔයා ගිහින් 'ඇත්ත' කිව්වොත් ඔයා හොඳටම දන්නවා අපේ පොට්ටි මේ ගැන අහද්දි මටත් ගිහින් තටාකය ළඟ හිටපු අයයි, පාටිය ගැනයි හැමදේම කියන්න සිද්ධ වෙනවා කියලා. ඒ වගේම ඊට පස්සේ වුණ දේවලුත්."

"ඕ, ඊට වඩා නරක වෙයි !" කෝප ගන්වන සුලු වංචනික හඬින් ජූන් කිව්වා. "වෙන කුලුනක අයත් එතැන සිටියා. ඕහ්, නැති නම් මට වැරදුණාද ?"

"ඔයා කියන්නේ ඔයා බෙටී එක්ක ආව අනිත් අයවත් පාවා දෙනවා කියල ද ?" දිගු හුස්මක් ගත් ඩැරල් ඇසුවා. "මේ ඔක්කෝම ඇලිසියාගෙන් පළිගන්නද ?"

"ඕ, රහස් එළි කරන්නවත්, නැතිනම් කේළාම් කියන්නවත් නොවෙයි." ජූන් කිව්වා. ඇය නැවතත් සිතුවිලි අවුස්සන ආකාරයට පියානෝව මතින් ඇඟිලි ගෙන ගියා. "ඇත්තටම මට ගිහින් ඇත්ත කියන්න පුළුවන්. බෙටීගේ නම ඕනෑ නම්... ආ.... අතහරින්න පුළුවන්, එක විදිහකට"

'ඇත්ත' කියන හොඳ කුඩා ගැහැනු ළමයෙකුගේ මුවාවෙන් සෑම කෙනෙකුගේම හොර අල්ලා දීමට ජූන් සූදානම්ය යන හැඟීමත් සමග ඩැරල්ගේ රතු කට්ට ඉක්මවා ගියා. සම්පූර්ණයෙන්ම තමාට තමාව පාලනය කරගත නොහැකි වූ ඩැරල් ජූන්ව පියානෝවෙන් පසෙකට ඇද වියරුවෙන් සොලවන්නට වුණා.

කටහඬක් පැමිණීමෙන් ඈ හදිසියේම නැවතුණා.

"ඩැරල් ! මොනවාද ඔය කරන්නේ ?"

# 15

දැස මහත් වූ ඩැරල් වියරුවෙන් හැරුණා. සම්පූර්ණ විමතියක් දනවන පින්තූරයක් ලෙස, පොට්ස් ගුරුතුමිය දොර අසල සිටගෙන සිටියා. කීමට වචනයක් හෝ සිතා ගැනීමට ඩැරල්ට නොහැකි වුණා. නැවත පියානෝ ආසනයෙන් වාඩි වී සියුම් තාලයක් වාදනය කිරීමට තරම් ජූන් සැබැවින්ම කපටි වුණා.

"ජූන් !" පොට්ස් ගුරුතුමියගේ කටහඬේ ස්වරය පළමු පන්තියේ දැරිය තම අසුනින් බිමට වැටෙන ලෙස උඩ විසි කිරීමට සමත් වුණා.

"එන්න මා එක්ක ඩැරල්" පොට්ස් ගුරුතුමිය කිව්වා. "ජූන්, ඔයත් එන්න."

මම්සලී ප්‍රශ්න පත්‍ර හරි වැරදි බලමින් සිටි ඇගේ කාමරය වෙත ඔවුන් ඇය පසුපසින් ගියා. පොට්ස් ගුරුතුමියගේ කේන්ති ගත් මුහුණත් දැරියන්ගේ බියපත් මුහුණු දෙසත් මම්සලී මවිතයෙන් බැලුවා. "හපෝයි!" කී මම්සලී කඩිනමින් තම ප්‍රශ්න පත්‍ර එකතු කරගෙන බියපත් ලෙසකින් කාමරයෙන් පැන දිව්වා. "මම නම් යනවා. මට බැහැ මිස් පොට්ස්ගේ වැඩවලට බාධා කරන්න."

මම්සලී සිටින බවක් හෝ දුටු බවක් පොට්ස් ගුරුතුමිය තුළින් ස්වූයේ නැහැ. තම අසුනේ වාඩි ගත් ඈ දැඩි බැල්මකින් යුතුව ජූන් ා ඩැරල් වෙත නෙත් හෙළුවා.

"ඔය දෙන්නා මොනවාද කර කර හිටියේ ?"

ඩැරල් කියන්නට ආ දේ තදින් ගිලගත්තා. මේ වන විටත් ඈ මන් ගැනම ලැජ්ජා වී සිටියා. අපොයි, පන්ති නායිකාවක්. ඇයට ැවතත් තරහා ගිහින් ! "මිස් පොට්ස්, ජූන්ට ඔයා එක්ක කියන්න ැයක් තියෙනවා." ඈ අවසානයේ කිව්වා.

"මොනවාද ඔයාට කියන්න තියෙන්නේ ?" තම දෙනෙත ජූන් වෙතට යොමු කරමින් පොට්ස් ගුරුතුමිය විමසුවා.

"හොඳයි, මිස් පොට්ස්, මට කියන්න ඕනැ වෙලා තිබුණේ මටත් රෑ පාටියකට සම්බන්ධ වෙන්න සිද්ධ වුණා කියලයි." ජූන් කිව්වා.

"හිල්ඩා කිව්වේ රෑ පාටියක් තිබුණේ නැහැ කියලයි." කී පොට්ස් ගුරුතුමිය පැන්සලෙන් මේසයට තට්ටු කරන්නට වූ අතර එය නරක සලකුණක් ලෙස ප්‍රචලිතව තිබුණා.

"ඒක අපේ පන්තියේ දෙයක් නොවෙයි කියලා මම දන්නවා."ජූන් අහිංසකව කිව්වා.

"මට ඩැරල්ගේ මුහුණ දිහා බලලා කියන්න පුළුවන් ඒක හතර පන්තියේ වැඩක් කියලා." පොට්ස් ගුරුතුමිය කිව්වා.

අසරණ වූ ඩැරල් හිස සැලුවා.

"හතර පන්තියේ අයයි, ඔයයි විතරයි කියලායි මම හිතන්නේ." පොට්ස් ගුරුතුමිය කිව්වා.

"ඔව්, ඒත් තව කීප දෙනෙක් හිටියා." මඳ පැකිළීමක් දක්වන බවට බොරු ඇඟවීමක් කරමින් ජූන් කිව්වා. "මම වගේම අපේ පන්තියේ තව කෙනෙක් හිටියා. මම එයාගේ නම කියන්නේ නැහැ."

"ඒ හිටියේ ෆෙලිසිටි." ඩැරල් කිව්වා. "මම ඒකේ වැරැද්ද භාර ගන්නවා. එයා එන්න නොවෙයි හිටියේ. තවත් මිස් පොට්ස්, බෙටී හිල් එක්ක එලන්, විනී දෙන්නත් ආවා."

නිහැඬියාවක් පැතිරුණා. පොට්ස් ගුරුතුමියගේ මුහුණේ කෝපය වැඩි වුණා.

"වෙන කුලුනක ළමයිනුත් ආවා ?" ඈ ඇසුවා. "ඒ ගැන මෙහේ තියෙන නීතිය ඔයා දන්නවා කියලයි මම හිතන්නේ ඩැරල්, එහෙම නේද ? එහෙම තියෙද්දීත් පළමු පන්තියේ දෙන්නෙකුටත් ආරාධනා කරන්න කොහොමද ඔයා තීරණය කළේ ? ෆෙලිසිටි ඔයාගේ නංගි බව ඇත්ත, ඒත්...."

"මම එයාලට ආරාධනා කළේ නැහැ." ඩැරල් කිව්වා. "ඉතින්,

හරි, ඒ වගේම බටහිර කුලුනේ ළමයින්ටත් මම ආරාධනා කළේ නැහැ."

"සමාවට කාරණයක් හැටියට දෙපිටකාට්ටු කතා කියන්න එපා." පොට්ස් ගුරුතුමිය නොඉවසිලිවන්තව කිව්වා. "වෙනදා ඔයා මේ වගේ වැඩ කරන ළමයෙක් නොවෙයි, ඩැරල්. මට හිතාගන්න පුළුවන්, ඔයා ජූන් එක්ක රණ්ඩු කළේ එයා ඇත්ත කියන්න හදපු නිසයි."

"ඔයාට දැන් යන්න පුළුවන්, ජූන්." හදිසියේම පොට්ස් ගුරුතුමිය කිව්වා. "මේකේ අගක් මුලක් හොයාගන්න ඕනෑ කියන එක දැන් මට විශ්වාසයි. ඔයාට හිරිහැර කරන්න ඩැරල්ට කිසිම අයිතියක් නැහැ. ඒත් ඉතා බරපතළ කාරණයක් නැතිව ඔයාට තරහා යන්නේ නැති නිසා මට ඔයා ඇත්ත කියන්න ඉදිරිපත් වෙන එක ගැන පැහැදෙනවා. ඒත් මේකේ තාර බර ඇරලා ගන්න වෙනවා. ඔයාට ප්‍රශංසා කරනවා ද දොස් කියනවා ද කියන එක මම හොයලා බලන්න ඕනැ !"

ඩැරල් දෙස පොට්ස් ගුරුතුමිය හෙළූ බැල්ම නිසා මහත් බියට පත් ජූන් වහාම කාමරයෙන් පිටතට පැන දිව්වා. "ඩැරල්, ඔයා දන්නවා වෙනත් කුලුනක ළමයින්ට රෑට ඔයාගේ කුලුනට එන්න ඉඩ දෙන්න තියෙන අවසරය ඔයාට විතරයි තියෙන්නේ කියලා, නේද ?" ඈ කිව්වා. "ඒ වගේම සංගීත කාමරයේදී ඔයා ජූන් එක්ක හැසිරුණ විදිහට මට සමාවක් දෙන්න බැහැ. මොන දෙයක් නිසා තරහා ආවත් ඔයා කළ දේට සමාවක් දෙන්න බැහැ."

"මම දන්නවා" අවාසනාවට පත් ඩැරල් කිව්වා. "මම හොඳ පන්ති නායිකාවක් නොවෙයි, මිස් පොට්ස්. මම අස්වෙන එක හොඳයි."

"හොඳයි, එක්කෝ ඔයා ඉල්ලා අස්වෙන්න වෙනවා. නැතිනම් ඔයාව අස්කරන්න වෙනවා." පොට්ස් ගුරුතුමිය දුකින් කිව්වා. "වෙලාවේ හැටියට සැලීව පන්ති නායිකාව කරන්න වෙයි. ඒක මේ ගැන අපි කතා කරලා බලන තුරු විතරයි. ඔයාට මේ තත්ත්වය නැවත ලැබෙනවා, ඩැරල්. ඒ ඔයාට ඔයාගේ තරහා පාලනය කරගන්න පුළුවන් නම් වගේම, අනිත් අයවත් පාලනය කරගන්න පුළුවන් නම්."

මෙම ආරංචිය පාසල පුරා ලැව් ගින්නක් සේ පැතිරුණා.

"ඩැරල් රිවර්ස් නායකකමින් ඉල්ලා අස්වෙලාලු, නේද ? දන්නේ නැද්ද ?"

"හරි වැඩක්නු, රෑ පාටියක් ගැනයි, අනිත් කුලුනුවල ළමයින්ට එන්න කියලා තියෙන එකයි විතරක් නොවෙයි, පළමු පන්තියේ ළමයිනුත් ඇවිල්ලාලු. හපොයි, ඔන්න මහා ලොකු ඩැරල් රිවර්ස්ගේ අවසානය !"

මෙම ආරංචිය ලැබුණ ෆෙලිසිටි මහත් සේ එයින් ත්‍රස්ත වුණා. ජූන් හා තවමත් කිසිම කතා බහක් නොමැති බව අමතක වූ ඈ සෘජුවම ජූන් වෙතට ගියා.

"ඔයා ගිහින් රහස් එළි කළා ද ?" ඈ තියුණු හඬින් ඇසුවා. "දැන් මොනවාද සිද්ධ වෙලා තියෙන්නේ ?"

සිදුව ඇති සියල්ල ගැන මහත් සතුටට පත්ව ජූන් සියලු දේ මුල සිට අගට කිව්වා. "මට කතා කරපු එක නවත්වපු හතර පන්තියේ අයට ඒක හොඳ පාඩමක්." ඈ කිව්වා.

ෆෙලිසිටිට තම දෙසවන් ඇදහිය නොහැකි වුණා. ඇගේ සිත ගත සලිතව ගැහෙන්නට වුණා. ජූන් පුදුමයට පත්ව එදෙස බලා සිටියා.

"මේ මොකද ?" ඈ ඇසුවා. "ඔයා මගේ යාළුවා නේ ද ?"

"ඔව්, එහෙම හිටියා. ඒත් ඔයාට අමතක ද ඩැරල් මගේම අක්කා කියන එක ?" උගුර හිරකරගෙන ෆෙලිසිටි ඇසුවා. ජූන් කිසිවක් සිතාගත නොහැකිව ඇය දෙස බැලුවා. තම ජයග්‍රහණය ගැන උදම්ව සිටි ජූන්ට ඩැරල්, ෆෙලිසිටිගේ වැඩිමහල් සොහොයුරිය බව අමතකව තිබුණා.

"මටත් හිතෙන්නේ ඩැරල්ට වගේමයි. ඔයාව ඇදලා අරගෙන කම්මුල හරහා පාර දෙකක් දෙන්න. ඔයා නම් හරිම දෙපිටකාට්ටු එකියක් !" ෆෙලිසිටි කෑ ගැසුවා. "ඒ හින්දම, මම ගිහින් හිල්ඩාට කියනවා ඔයා කියපු හැම දෙයක්ම. ඒක කේළාම් කීමක් නොවෙයි, ඇත්ත කතාවක් කියලා විශ්වාස කරන්නවත් බැරි තරම් දෙයක් ගැන කියන දෙයක්. හහ් ! ඔයාව මේ ඉස්කෝලයෙන් පන්නන්න තියෙන්නේ. අනේ හැබෑටම මට ඔයාව මගේ යාළුවා කරගන්න හිතුණ හැටි !"

මෙලෙස ෆෙලිසිටි හා ජූන් අතර මිතුරුකම හදිසි ලෙස අවසානව බිඳ වැටුණ අතර එය නැවත ගොඩනැඟිය නොහැකි වුණා.

මිතුරියක ලෙස සූසාන් ගැන බලා සිටි ෆෙලිසිටිට එම අවස්ථාවට සරිලන ලෙස සහනයක් ලැබුණා. ෆෙලිසිටි ඩැරල්ගේම සොහොයුරිය බව අමතක වීම ගැන තමාටම ශාප කරගත් ජූන්ට එම වැරැද්ද නිවැරදි කර ගැනීමට නොහැකි බව පෙනුණා. ජූන්ගේ සත්‍ය ස්වරූපය ෆෙලිසිටි දැකගෙන තිබුණා. ඒ වාගේම ෆෙලිසිටි ඇගේ කිසිම ගුණාංගයකට කැමති වුණේ නැහැ !

සිදුව තිබූ සියල්ල ගැන හතර පන්තියේ දැරියෝ මහත් ලෙස භීතියට පත්ව සිටියා. ඔවුන් සියලු දෙනාම, අනුකම්පාවෙන් වචන කීපයක් කතා කිරීමට පැමිණි ගොන්ඩොලින් පවා, ඩැරල් වෙනුවෙන් නැඟී සිටියා.

එහෙත් ගොන්ඩොලින්ගේ අනුකම්පාව, සුපුරුදු පරිදි මතුපිටට පමණක් සීමා වුණා. තමා මේ ගැන කොතරම් කනගාටු වෙනවා දැයි ඩැරල්ට කියා ආපසු ආ වහාම ඩැරල් මෙලෙස අපහාසයට ලක්වීම ගැන තමා කොතරම් සතුටු දැයි ඈ කිසිත් නොසඟවා ක්ලැරිසා සමග විශ්වාස කටයුතුව පැවසුවා.

හදිසියේ මතු වූ අප්‍රසන්නතාවයකින් යුතුව ක්ලැරිසා ගොන්ඩොලින් දෙස බැලුවා. "ඔයා මේ ගැන කනගාටු වෙනවා කියලා එයාට කියපු හැටියේම ඇයි ඔයා මේ විදිහට කතා කරන්නේ? අනික මේක නිරාකරණය කරන්න ඕනෑම දෙයක් කරන්න ඔයත් ලෑස්තියි කියලා ඔයා කිව්වා නේද ?" ක්ලැරිසා ඇසුවා. "මට පෙනෙන්නේ ඔයා හරිම නපුරියක් වගේ, ග්වේන්"

ගොන්ඩොලින්ට කියා ගත නොහැකි පුදුමයට මෙන්, නිහඬ කුඩා හා දුර්වල ක්ලැරිසා ඇයට විරෝධය දක්වමින් පිටුපා ඉවතට යන්න ගියත් එසේ කීම ඇයට උසුලා ගැනීමට නොහැකි තරම් දුකක් වූ හෙයින් ඈ යන අතරතුරේ කඳුළු සලන්නට වුණා.

තන්ඩර් පිට රවුමක් දිවීමට දුව එන විල්ගේ ඇගේ ඈ හැපුණේ නොදැනුවත්වයි. "මේ, කොහෙද යන්නේ, ක්ලැරිසා, ඕ... ඔයා අඬනවා වගේ, මොකක්ද වුණේ ?"

"මොකවත් නැහැ," ග්වේන්ට විරුද්ධව කිසිවක් කීමට අකමැති වූ ක්ලැරිසා කිව්වා.

අසතුටක් සඳහා ඇති එකම ප්‍රතිකර්මය විල් දැන සිටියා. ඒ

අසෙකු පිට නැඟ රවුමක් ගැසීමයි ! ඈ එම ප්‍රතිකර්මය ක්ලැරිසාට දීමට හිතට ගත්තා.

"එන්න අශ්වයෝ පිටේ යන්න. ඔයාට කැමති නම් අශ්වයෝ පදින්න ඉඩදෙන කතාවක් දවසක් ඔයා මට කිව්වා. තවත් අශ්වයෙක් ඉන්නවා. දැන් මිස් පීටර්ස් එයි අපිත් එක්ක යන්න. එයා හරිම හොඳයි."

වෙනත් අවස්ථාවකදී නම් ක්ලැරිසා මෙය ප්‍රතික්ෂේප කරන්නට තිබුණා. එහෙත් හිත හදාගෙන අලුත් යමක් කරන්නට මේ වන විට අපහසු වූ හෙයින් හා ඇයට දැන් අසුන් පැදීමට තරම් සුවයක් ඇති බව කියා තිබුණ ද ඇය තවමත් මැලෝරි ටවර්ස්හිදී අසුන් පැදීම ආරම්භ කර නොතිබුණ හෙයින් ඇය එකඟතාවය පළ කරමින් හිස වැනුවේ විල්ගේ සෘජු අවංක කරුණාවන්තකම ගැන පැහැදීමෙන් හා මේ අවස්ථාවේ ගොන්ඩොලින් මඟහැර කොහේ හෝ යාමට සිතුණ නිසයි.

"හරි, අශ්වයෝ පදින ඇඳුම අගෙන එන්නම්. මා එනකම් ඉන්න."

මෙලෙස විනාඩි පහළොවක කාලයක් තුළදී, ගොන්ඩොලින්ගේ මහත් විමතියට මෙන්, පීටර්ස් ගුරුතුමිය, විල් හා ක්ලැරිසා එකිනෙකාට හඬ නගා කතා කරමින් ඇයව පසුකරගෙන වේගයෙන් කඳුකර මාවතේ ඉහළට දුව ගියා. ක්ලැරිසා ! හොඳයි ! ක්ලැරිසා ළඟ අශ්වයින් පදින ඇඳුම් ආයිත්තම් තිබුණ බවක් හෝ ඈ දැන සිටියේ නැහැ. දැන් ඇය එක්ව සිටින්නේ අමුතු ස්වභාවයේ කෙල්ල විල්, පමණක් නොවෙයි, ඊටත් වඩා අමුතු පීටර්ස් ගුරුතුමිය සමගයි! ගොන්ඩොලින්ට එය කෙසේවත් තේරුම් ගත නොහැකි වුණා.

සැලී තාවකාලිකව පන්ති නායිකාව ලෙස පත් කෙරුණා.

"මම මේක ඔයා එක්ක බෙදාගෙන කරන්නේ." ඈ ඩැරල්ට කිව්වා. "මම ඇවිදින් ඔයාව හම්බවෙලා හැමදේකටම උපදෙස් ගන්නම්. ඊනෑම ඔට්ටුවක්, තව වැඩි කල් යන්න ඉස්සර ආයෙත් ඔයාව නායිකාව හැටියට පත් කරයි. මිස් ග්‍රේලින් දෙසැරයක්ම කිව්වා මාව පත්කරන්නේ තාවකාලිකව කියලා."

තම දෙමව්පියන්ට ලිපියක් ලියූ ඩැරල් මෙම නරක ආරංචිය ඔවුන්ට දන්වා තිබුණා. ඔවුන් කනගාටුවට හා කලකිරීමට පත් වන්නට පුළුවන් වුව ද ඔවුන් එය දැන ගත යුතුයි. "ඔයාලා වාර මැද

නිවාඩුවට මාවයි, ෆෙලිසිටිවයි බලන්න එන්න ඉස්සර ඔයාලා මේ ගැන දැනගෙන හිටියොත් හොඳයි කියලා මම හිතුවා." ඩැරල් ලිව්වා. "ඔයාලා අපිව බලන්න ආවාට පස්සේ, අනේ ඒ ගැන වචනයක්වත් කතා කරන්න එපා. මට ඇඬෙයි. කොහොම වුණත් ඒකෙන් එක හොඳ දෙයක් සිද්ධ වුණා. ෆෙලිසිටි එයාගේ පන්තියේ ඉන්න නරකම කෙල්ල එක්ක ආශ්‍රයක් නැහැ. දැන් එයා ඉන්නේ හොඳම ළමයෙක් එක්ක. සුසාන්, ක්‍රීඩා සංදර්ශනය දවසේ ඔයාලා එයාව දැක්කා, ගිය වාරයේ."

තම පන්තියෙන් දැක්වුණ අනුකම්පා කිරීම ඩැරල්ගේ හිතට හොඳින් වැදුණා. නිවුන්නියන් ඉතා කදිම බව ඩැරල්ට සිතුණා. සුපුරුදු ලෙස කිසිවක් රූත් නොකීව ද සෑම දෙයම කිව්වේ කොනීයි. ක්ලැරිසා ද එලෙසමයි. ඇය ඩැරල් වෙතට ආවේ ඇසේ කඳුළු පුරවාගෙනයි.

"මම හිතන්නේ ක්ලැරිසාගේ නිහඬ බවයි, ලැජ්ජාවයි යටින් හරිම අපූරු චරිතයක් තියෙනවා." ඩැරල් සැලී සමග කිව්වා.

"අපරාදේ එයාට කණ්ණාඩි දාන්න සිද්ධ වෙලා තියෙන්නේ! දවසක් එයා කණ්ණාඩිය ගලවපු වෙලාවේ එයා හුඟාක් ලස්සනයි කියලා ඔයාට හිතුණේ නැද්ද ? ගැඹුරු කොළ ඇස්, විලක ජලය වගේ."

සැලී හඬ නඟා සිනාසුණා. "ඔයා කවිකාරියක් වගේ." ඈ කිව්වා. "ඔව්, මමත් ක්ලැරිසාට කැමතියි. එයා විල් එක්ක අශ්වයෝ පදින්න ගිය එක ගැන ගොන්ඩොලින්ට කිසිම දෙයක් හිතාගන්න බැරිව ඇති නේද ? මම දැනගෙන හිටියේ නැහැ ක්ලැරිසා ඒතරම් අශ්වයින්ට ආසයි කියලා ! එයා විල් එක්ක අශ්වයෝ ගැන හුඟාක් දේවල් දොඩවනවා මට ඇහුණා. ගොන්ඩොලිනුත් මොනවාද කියන්න හැදුවත් එයාලා ගණන් ගත්තේ නැහැ."

"වාර මැද නිවාඩුව ලබන සතියේ." ඩැරල් කිව්වා. "ඕ, සැලී මාව නායිකාව කරපු දවසේ වගේ ආඩම්බරයක් කවදාවත් මට දැනිලා නැහැ. ඒත් වාර භාගයක් යන්නත් ඉස්සර මට ඒක නැතිවුණා. මම වැඩකට නැති කෙනෙක් ! පරාජිතයෙක් !"

"හුඟාක් අය කැමතියි ඔයා වගේ පරාජිතයෙක් වෙන්න !" සැලී සැබෑ පක්ෂපාතී ලෙස කිව්වා. "දැනට ඔයා පරාජිතයෙක්, ඒත් ඔයා හරිම විශේෂිත පරාජිතයෙක්, ඩැරල් ! තමන් ජයග්‍රාහකයෝ කියලා හිතාගෙන ඉන්න හුඟාක් අයට වඩා ඔයා හොඳයි."

# 16

වාර මැද නිවාඩු දිනය ඉක්මනින් පැමිණෙමින් තිබුණා ! පාසලේ නොයෙක් විදිහේ සංදර්ශන පැවැත්වීමට යෙදී තිබුණා. ප්‍රදර්ශන ටෙනිස් තරගයක්, පිහිනුම් හා කිමිදුම් සංදර්ශනයක්, විශාල මැද මිදුලෙහි පැවැත්වෙන නැටුම් සංදර්ශනයක්.

"ඉතින් ඊට පස්සේ" ඩැෆනි මුහුණ අඳුරු කරගෙන ඇසුවා. "ඊට පස්සේ පාසල් සහතික පත්‍ර විභාගය ! ඒ ගැන මතක් වෙන හැම වෙලාවේම මම පුදුම විදිහකට විඩාවට පත්වෙන්නේ."

"ඒක ඉවර වුණාට පස්සේ මොන තරම් සැහැල්ලුවක් දැනෙයිද කියලා හිතන්න !" බෙලින්ඩා කිව්වා.

"ඔව්, හරියට රිදෙන දතක් ගලවලා දැම්මා වගේ." ක්ලැරිසා කිව්වා.

"මුලදි හරිම මූසල බවක් දැනුණාට ඊට පස්සේ ඔයාට දැනෙන්නේ පුදුම විදිහේ සතුටක්."

හැමෝම හිනා වුණා. දන්ත වෛද්‍යවරයා සමග ක්ලැරිසාට තරක දසාවන් තිබුණ බව ඔවුන් දැන සිටිය අතර එමෙන්ම ඇගේ දත් පසුපසට ගැනීමට කම්බියක් දමා තිබීම ගැන ඇය නොසතුටින් සිටින බව ද ඔවුන් දැන සිටියා. එය වැඩි කල්යාමට පෙර ඉවත් කළ හැකි බව ඇ දැන සිටියා.

"මම මේ කම්බිය අයින් කරලා කණ්ණාඩි පාවිච්චිය නැවැත්තුවාට පස්සේ ඔයාලාට මාව හඳුනා ගන්න බැරි වෙයි !" කී ඇ තම තඹවන් කෙස් කළඹ සොලවා පහත දැමුවා.

ඇය විල් සමග සෑහෙන දුරක් අසු පැද තිබූ අතර ගොන්ඩොලින්ට එය නුහුරු දෙයක් වුණා. ක්ලැරිසාට ඉතා හොඳින්

අසුන් පැදීම පුරුදු බවත් ඇයට පාසල් ඉස්තාලයේ සිටින ඕනෑම අසෙකු හොඳින් පාලනය කර ගත හැකි බවත් පෙනුණ අතර තන්ඩ් පැදීමට ද ඇයට අවසර ලැබී තිබුණා !

ළඟ එන විභාගය ගැන ගොන්ඩොලින් මහත් සේ බියට පත්ව සිටියා. පාඩම්වලදී ඇය බොහෝ සේ පසුබට වූ අතර අන් අයගේ සහාය ලබමින් ඔවුන්ගෙන් කොපි කරමින් තම මොළය පාවිච්චි කිරීමට උත්සාහ නොකළ නිසා ඇයට තනිවම යමක් සිතා කිරීමට හැකියාවක් තිබුණේ නැහැ. විභාග ප්‍රශ්න පත්‍රය කිරීමට තිබුණේ ඇයට තනිව සිතීමෙන්. එවිට ඇයට වෙනත් කෙනෙකුගෙන් බලා ගත නොහැකියි. එමෙන්ම යමෙකුගෙන් බලා ලිවීමට තරම් හැකි දුරකින් ඇය වාඩි ගතහොත් නොවැරදීම විලියම්ස් ගුරුතුමිය එය දකින බව ද ඈ දැන සිටියා !

විභාගය ගැන ඇගේ සිත කරදර වුණා. අසමත් වන එකම කෙනා තමා බව ඇගේ සිත කරදර කරන්නට වුණා. එමෙන්ම එය කොතරම් අවමානයක් හා ලැජ්ජාවක් වනු ඇති ද ! ඇගේ පියාට සිත රිදෙන සේ කීමට කොතරම් දේ ලැබෙනු ඇති ද, එමෙන්ම මව හඬනු ඇත, තව ද ඇගේ මහලු ආයා එය තමාගේ වරද බව කියමින් වැලපෙනු ඇත. ගොන්ඩොලින් ඉතා කුඩා කාලයේදීම තමා ඇයට ඉගැන්විය යුතුව තිබුණේ යැයි ආයා දුක්වනු ඇත. අපොයි, මොනවාට මේ විභාග පවත්වනවා ද ?

විභාගයට පෙර ප්‍රශ්න පත්‍ර බලා ගැනීමට හැකියාවක් ඇතිදැයි ගොන්ඩොලින් බරපතළ ලෙස කල්පනා කරන්නට වුණා. එහෙත් එය අනුවණ ක්‍රියාවක් බව ඈ දැන සිටියා. නිතර ප්‍රශ්න පත්‍ර අගුල් තබා තිබෙන දෙයක්. එය ඇය අලුතින් සිතූ දෙයක් නොවෙයි. "මම එහෙම හිතන එක වැරදියි." ඈ නිකම්ම සිතුවා. "ප්‍රශ්න පත්‍ර බලා ගන්න අවස්ථාවක් තියෙනවා කියලා හිතන එකත් මගේ මෝඩකමක්"

ඇයට අසනීප විය හැකි ද ? ඇයට උගුරේ අමාරුවක් හෝ හිස රදයක් ගැන මැසිවිලි නැඟිය හැකි ද ? නැහැ, නේවාසිකාගාර පාලිකාව කිසිදින ඇයව කිසි ලෙස පිළිනොගනු ඇත. ඇගේ උණ බලන ඈ මෙසේ කියනු ඇත. "ගොන්ඩොලින් දුවේ, හිතේ ලෙඩකින් ඇවිලෙන අමාරුවක් ඔයාට තියෙන්නේ" එමෙන්ම නරකම තිත්ත බෙහෙත් වේලක් ද දෙනු ඇත.

ඈ ක්ලැරිසාගේ පපුවේ අමාරුව ගැන ඊර්ෂ්‍යාවෙන් සිතුවා.

පපුවේ අමාරු ගැන ගොන්ඩොලින් මඳ වේලාවක් සිතමින් සිටින අතරේ කදිම සැලසුමක් ඇගේ සිතෙහි දිග හැරෙන්නට වුණා. හදිසියේ පපුවේ අමාරුවක් ආ ලෙස හැසිරුණොත් කුමක් වනු ඇතිද? තම හදවත ඇති තැන යැයි ඇය සිතූ ස්ථානයට අත තබා ගත් ඈ වේදනාත්මක පෙනුමක් ආරූඪ කර ගත්තා. ඇය කුමක් කිව යුතුද ? "ඕ, මගේ පපුව, ආයෙත් ගැහෙනවා ! මම හිතුවේ ආයෙත් හැදෙන්නේ නැතිවෙයි කියලා. මට හරිම අමුතු අමාරුවක් තියෙන්නේ. අයියෝ, මම තරප්පු පෙළ දුවගෙන ආවේ නැති නම් මේ මොකවත් නැහැනේ!"

මේ ගැන සිතන තරමට එය කෙතරම් කදිම උපායකදැයි ඇයට සිතුණා. වාර මැද නිවාඩුව ළඟ සතියේ. මෙම පපුවේ අමාරු සෙල්ලම හරියට කර ගත හැකි වුවහොත් සමහර විට ඇගේ දෙමාපියන්ට මේ ගැන කියනු ඇත. එවිට බිය වන දෙමාපියෝ ඇයව නිවසට රැගෙන යනු ඇත. එවිට පාසල් සහතික පත්‍ර විභාගය ඇයට මඟ හැරෙනු ඇත. එය ඉතා ළඟකදීම පටන් ගනු ඇත !

තමාගේ කුඩා සැලසුම සිහිපත් වන හැම විටම ගොන්ඩොලින්ගේ හදවත ගැහෙන්නට වුණා. ඇත්තෙන්ම ඇයට සිතුණේ තම හදවත යම් නුහුරු බවක් නිසා ගැහෙන බවකුයි. ඇත්තෙන්ම ඇයට එවැනි අසනීපයක් වැලඳුණෙත් නැහැ. ඇත්තෙන්ම ඒ ඇගේ දක්ෂ හා අනෙක් අය පුදුම කරන සැලසුම නිසා හදවතේ ඇතිවන ස්පන්ධනයයි.

මෙසේ මඳින් මඳ, තමාට නිතර අසනීප ඇති බව දැක්වීමට ග්වේන් පටන් ගත්තා. "ඒ තරම් සනීපයක් නැහැ." ඈ ක්ලැරිසාටත්, විල්ටත් කිව්වා. "මොනවගේ අමාරුවක් හැදෙන්න එනවාද කියලා දැනගන්නේ කොහොමද ක්ලැරිසා. මගේ පපුව තටු ගහනවා වගේ ගැහෙනවා ! ඕ, මම ඒ තරම් වේගයෙන් තරප්පුව නැග්ගේ ඇයි ?"

ක්ලැරිසා අනුකම්පා සහගත වුණා. පපුවේ අමාරුව කොතරම් වේදනාකාරීදැයි ඈ දැන සිටියා. "මේ ගැන මිස් විලියම්ස්ට හරි, මිස් පොට්ස්ට හරි කිව්වොත් හොඳයි නේද?" ඈ මහත් කුතුහලයෙන් යුතුව ඇසුවා. "නැතිනම් මේට්‍රන්ට ?"

"නැහැ," නිර්භීත මුහුණක් මවා ගනිමින් ශෝකීය ලෙස ගොන්ඩොලින් කිව්වා. "මෙතැන කලබලයක් ඇති කරන්න වුවමනා

නැහැ. අනික, ඔයා දන්නවා විභාගයත් අත ළඟ. මට ඒක නොකර බැහැ."

ඇලිසියා, ඩැරල් හෝ සැලී අසලක සිටියේ නම් ඔවුන් කොක් හඬලා මෙයට සිනාවන්නට තිබුණ ද විල් හා ක්ලැරිසා එසේ කළේ නැහැ. ඔවුන් බරපතළ අයුරින් සවන් දීගෙන සිටියා.

"හොඳයි, ඔයාට මේ ගැන මොනවා හෝ කියන්න ඕනැ කියලා මට හිතෙනවා." ක්ලැරිසා කිව්වා. "මට සිද්ධ වෙලා තියෙන දේවල්වලට ඔයාට මුහුණපාන්න වෙලා තිබුණා නම්, සති ගණනක් නිදාගෙන ඉන්න, කිසිම දෙයක් නොකර, මම ආසම පිහිනීමයි, අශ්වයෝ පැදීමයි අත හැරලා, පපුවේ අමාරුවක් තියාගෙන අවදානම් දේවල් මොකවත් කරන්න බැහැ."

යමෙකු තරප්පුවේ ඉහළ සිටිනු දකින අවස්ථාවලදී, ගොන්ඩොලින් තරප්පුව වේගයෙන් නැගීමට පුරුදු වුණා. ඉන්පසු හැරෙන තැනට පැමිණෙන ඈ ගරාදි වැට අල්ලාගෙන අනෙක් අතින් වම් පසට අත තබාගෙන කෙඳිරි ගාන්නට වුණා.

"ඇයි, ඇවිලිල්ලක් ද ?" ඇලිසියා දුව විත් අනුකම්පා විරහිතව සමහර විටක අසනවා. "නැමිලා කකුලේ ඇඟිලි අල්ලන්න, ගොන්ඩොලින්, මට අමතක වුණා. ඒක කරන්න බැරි තරම් ඔයා මහතයි, නේද ?"

අනෙක් පසින් මේරි ලෝව් සමහර විටක මෙසේ කියනවා. "ඕ, ග්වේන්, මොකද අමාරුව ? ආයෙත් පපුවේ අමාරුවද ? මේකට නම් ඔයා මොනවා හරි කරන්න වෙනවා."

විලියම්ස් හෝ පීටර්ස් ගුරුතුමියන් ඉදිරියේදී ග්වේන් මෙම රඟපෑම කළේ නැහැ. ඇගේ රඟපෑම ඒ තරමට සාර්ථක නැති බව ඈ දැන සිටියා. එහෙත් පහසුවෙන් රැවටෙන මම්සලී හමුවේදී ඈ දක්ෂ ලෙස රඟපෑවා.

තරප්පුව මුදුනේ තම කාමරය අසල, පපුවට අත තබාගෙන කෙඳිරිගාමින් සිටියා. ගොන්ඩොලින්ව එක් උදයක දැක ගත් මම්සලී මහත් ලෙස කැලඹුණා.

"අපොයි දෙවියනේ, මොකක්ද අමාරුව ?" ඈ කෑ ගැසුවා. "ඔයාට අමාරුවක් තියෙනවා ද ? කොහේ ද ?"



"ඒකට, ඒකට කමක් නැහැ මම්සළී" ගොන්ඩොලින් හතිලමින් කිව්වා. "ඒක ඒ තරම් දෙයක් නොවෙයි. මගේ මේ අමුතු පපුවේ අමාරුව. මම දුවගෙන ආවොත් හරි ටිකක් මහන්සි වෙන වැඩක් කළොත් හරි අමුතු වැඩක් වෙනවා."

"ඔයාට පපුවේ හතිය තියෙනවා ද ? මට හිතෙන්නේ ඔයාට රක්තහීනතාවය !" මම්සළී කෑ ගැසුවා. "අනේ, මටත් අවුරුදු පහළොව වගේ වයසේදී මේ වගේම අමාරුවක් හැදුණා. එන්න මා එක්ක මේට්‍රන් ළඟට යන්න. එයා ඔයාගේ ලේ රතුම රතු වෙන්න හොඳම හොඳ බේත් දෙයි."

නේවාසිකාගාර පාලිකාවගේ බෙහෙත්වලින් තම ලේ 'රතුම රතු' කර ගැනීමට ගොන්ඩොලින්ට අවශ්‍ය වුණේ නැහැ. එය මෙලොවදී ඇයට කළ නොහැකිම දෙය වුණා ! වහාම ප්‍රකෘති බවක් පළ කළ ඇ දුර්වල සිනාවක් පා කතා කළා.

"දැන් හරි ! දැන් සනීපයි. රක්තහීනතාවය නොවෙයි මම්සළී මට ඒ ලෙඩේ හැදිලා නැහැ. මේක මගේ මේ පපුවේ ලෙඩේ. ඒක - ඒක මම හිතන්නේ අපේ පරම්පරාවෙන් එන ලෙඩක් වෙන්න ඕනැ. අනේ, මම දන්නේ නැහැ."

මෙය සම්පූර්ණ අසත්‍යයකි. එහෙත් තමාට ඇත්තේ රක්තහීනතාවය නොව හෘද රෝගයක් බව මම්සලීට ඒත්තු ගැන්වීමටයි ගොන්ඩොලින්ට අවශ්‍ය වුණේ ! ඉතාම අනුකම්පා සහගත වූ මම්සලී ඇයට සවස ටෙනිස් ක්‍රීඩා නොකර සිටින්නට අවසරයක් ද දුන්නා.

ගොන්ඩොලින්ගේ ඉහේ මලක් පිපුණා වගේ. එහෙත් තමාට හෘද අමාරුවක් ඇති බව සැලීට පෙන්වීමට නැවත අවස්ථාවක් ලබා ගැනීම සඳහා තමා ක්‍රීඩාවලට සහභාගී විය යුතු බව ඇයට සිතුණා. සැලී ඇගේ පපුව අමාරුව ගැන එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැහැ. එහෙයින් ඇය ක්‍රීඩාවට ගිය අතර එය දුටු පිරිස මහත් විමතියට පත් වුණා.

"නිර්භීත ගොන්ඩොලින් !" ඈ සිතුවා. "පපුවේ අමාරුව හැදුනත් කමක් නැහැ කියලා එයා සෙල්ලම් කරනවා ! මේ කෙල්ලෝ හරිම උනන්දුයි වගේම කිසිම දෙයකට බය නැහැ."

ගොන්ඩොලින් තවත් සැලසුම් දියත් කළා. වාර මැද නිවාඩුවේදී තම දෙමාපින්ට මම්සලීව මුණගස්වන ඈ මම්සලී හා දෙමාපියන්ට කතා කරන්නට අවස්ථාවක් සලසනවා. එවිට කිසියම් මොහොතක මම්සලී ඇගේ පපුවේ අමාරුව ගැන කතා කරන බවට ගොන්ඩොලින්ට විශ්වාසයක් තිබුණා. එවිට ගොන්ඩොලින්ගේ මව වහාම ඒ ගැන ගොන්ඩොලින්ගෙන් ප්‍රශ්න කරනු ඇත. මෙම සෙල්ලම හරි හැටි නිවැරදිව කළොත් ඉතා බියට හා තමා ගැන උනන්දුවට පත්වන මව වහාම ඇයව නිවසට රැගෙන යනු ඇත !

තම අඥාන මවාපෑම තුළින් දෙමව්පියන්ට දෙන වේදනාව හා චකිතය ගැන සිතීමට ග්වේන්ට අවශ්‍ය වූයේ නැහැ. ඇයට අවශ්‍ය වූවේ විභාගයෙන් ගැලවීම පමණක් වූ අතර එය කුමන ආකාරයකින් සිදුවුව ද ඇය ඒ ගැන සිතුවේ නැහැ. ඉතා සට කපට වූ ඈ නිතරම තමාට අවශ්‍ය දෙය කර ගැනීමට දක්ෂ වූවා.

'මම හොඳටම දන්නවා අම්මා මාව ගෙදර එක්කගෙන යනවා.' ඈ සිතුවා. 'මම හිතන්නේ මම බොරුවට විභාගයට පාඩම් කරන්න ඕනැ නැහැ කියලයි. මම විභාගය ගන්නේ නැති එකේ මම මොනවාට පාඩම් කරන්න ද ? අනිත් අය දිහා බලන්න එපායැ. ලතින්, ප්‍රංශ, ගණිතය හරි ඉතිහාසය හරි ගැන පාඩම් කර කර උදේ හවස කෙඳිරි ගානවා. හරි, මම නම් ඔය මොනවාවත් කරන්නේ නැහැ."

මෙසෙ, කාගෙත් පුදුමයට මෙන්, හදිසියේම පාඩම් කටයුතු නැවැත්වූ ගොන්ඩොලින් මහන්සිවී වැඩ නොකර සිටින්නට වුණා.

"ඔයාට බය නැද්ද අතුරු ප්‍රශ්න පත්‍ර එයි කියලා" විභාගය ගැන මහත් බියක් දැක්වූ මෙන්ම මහන්සි වී වැඩ කරන මෙල්විස් ඇසුවා.

"මම උපරිම හොඳින් වැඩ කරනවා." ගොන්ඩොලින් කිව්වා. "මට මීට වඩා මහන්සි වෙන්න බැහැ. මේ කරුම පපුවේ අමාරුව, ඔයා දන්නවානේ, මම මහන්සි වුණොත් පපුව මෝලක් වගේ ගැහෙනවා."

ගොන්ඩොලින්ගේ මෙම පපුවේ අමාරුව ගැන මෙල්විස්ට කිසිම විශ්වාසයක් නොවූ අතර මෙසේ නිකරුණේ කාලය නාස්ති කිරීම ඇයට ප්‍රහේලිකාවක් වුණා. එය බැරෑරුම් විභාගයක් සඳහා සූදානම් වීමට තිබූ වටිනා කාලයක්.

එහෙත් කාගේත් පුදුමයට මෙන්, නිවැරදි ලෙස හරිම ස්ථානයට ඇඟිල්ල දිගු කළේ කොනීයි.

දුබල බලපෑම් සහිත ගොන්ඩොලින් ගැන ඇයට බලවත් අප්‍රසාදයක් තිබුණා. ඇය බලගතු දැරියක මෙන්ම ශක්තිමත් සිත් ඇත්තියක් වුණා. ගොන්ඩොලින්ගේ වැලපීම් හා කන්කෙඳිරිගෑම් ඇයට දැරිය නොහැකි වුණා. කුමක් හෝ කාරණයක් නිසා පසුගිය සතිය පුරා ඉක්මන් කේන්තිකාරියකව සිටි ඈ එක් හැන්දෑවක හදිසියේම ගොන්ඩොලින් වෙත කෝපයෙන් කඩා පැන්නා.

පොදු කාමරයට පැමිණ තිබූ ගොන්ඩොලින් පුටුවකට බර වුණා. පොත්වලට නැඹුරු කරගත් හිස්වලින් යුතුව සියලු දෙනාම සුපුරුදු පරිදි විභාගය සඳහා වෙහෙස වී පාඩම් කරමින් සිටියා.

"මට නම් ආයෙත් බර දේවල් උස්සාගෙන යන්න හොඳ නැහැ." "මට නම් ආයෙත් බර දේවල් උස්සාගෙන යන්න හොඳ නැහැ." තුරුස්සන කටහඬින් ගොන්ඩොලින් කිව්වා. රවා බැලීමක් කළා මිස කිසිවෙකු එය තැකුවේ නැහැ.

"මට සිද්ධ වෙලා තියෙනවා පුස්තකාලයට පොත් ගෙනියන්න පොට්ටිට උදව් කරන්න." ගොන්ඩොලින් කියාගෙන ගියා. "හරි බර පොත් ගොඩවල් ! මගේ පපුව පුදුම විදිහට ගැහුණා."

"කට වහගන්න" කොනී කිව්වා. "අපි වැඩ"

"හරි, ඔයාට ඔහොම නපුරු වෙන්න ඕනෑ නැහැනේ." උදාරමව ග්වෙන් කිව්වා. "ඔයාටත් මට වගේ හදවතක් තිබුණා නම්.....!"

මෙවිට කොනී පුපුරන්නට වුණා. නැඟිට ගත් ඈ ගොන්ඩොලින් ඉදිරියේ සිට ගත්තා.

"ඔයාට හෘද රෝගයක් තියා හදවතක්වත් නැහැ. ඔයා මහා බොරුකාරියක් ! විභාගය මඟ හරින්න ඔයා බොරු රඟපෑමක් කරන්නේ. මට ඔයාගේ ඇතුළාන්තය පෙනෙනවා ! ඒ නිසා තමයි ඔයා වැඩ නොකර ඉන්නේ, නේද ? ඔයා දන්න විදිහේ මොනවා හරි ගැටයක් ගහලා බොරු පපුවේ අමාරුවක් ගත්තා ! හොඳයි, මෙන්න මේක අහගන්න. ඔයා විභාගය කළත් -නොකළත්, ඔයා වැඩ කළත් -නොකළත් මම තුට්ටුවකට ගණන් ගන්නේ නැහැ. ඒත් මගේ වැඩ මට ලොකුයි. අනිත් අයටත් එහෙමයි. ඒ නිසා විභාගය ඉවර වෙන තුරු ඔයාගේ ඔය මෝඩ පපුවේ අමාරුවත් අරගෙන පැත්තකට වෙලා ක..ට..ව..හ.. ගෙ..න ඉන්න !

මෙසේ කීමෙන් පසු, රවා ගත් කොනී තම ආසනයට ගියා. ගොන්ඩොලින් භීතියට පත් වුණා. කතා නොකළ හැකි තරමට භීතියට පත් වුණ කොනී කීවේ සත්‍ය බව සියල්ලන්ටම වැටහුණා.

"ඔයා මහා එපා කරපු නපුරියක්." ගොන්ඩොලින් වෙව්ලන කටහඬින් කිව්වා. "මම කියනවා ඔයා අසමත් වෙන්න කියලා ! බලන්නකෝ නැද්ද කියලා. අනිවාර්යයෙන් අසමත් ! ඕනෑ නම් ලකුණු ටිකක් ගනියි. ඔයා හැම තිස්සේම රූත්ගෙන් බලා ගන්න හින්දා ඒක අපි කවුරුත් දන්නවානේ ! එයා සමත් වෙයි, ඔයා අසමත් ! මම කියන්නේ ඔයා හරි නපුරියක්."

කඳුළු සලමින් හඬන්නට ගත් ඈ නැඟිට කාමරයෙන් පිටතට ගියේ කොතරම් තදින් දොර වසාගෙන ද කිවහොත් ඒ අසල තිබූ තම කාමරය වෙත යමින් සිටි මම්සලී හා පොට්ස් ගුරුතුමිය තිගැස්සී සිදුවන්නේ කුමක්දැයි පුදුම වුණා.

දැරියෝ එකිනෙකා දෙස බැලුවා. ඇලිසියා මුහුණ ඇදකර ගත්තා.

"හරි, මම හිතනවා කොනී හරි කියලා. ඔයා ටිකක් නපුරු වුණත්, නේද කොනී ?"

"සමහර වේලාවට ඔයා තරම් මම නපුරු වුණේ නැහැ." තරමක් ඔරවාගෙන කොනී කිව්වා. "කොහොම වුණත්, අපි ආයෙත් වැඩ පටන් ගනිමු. අපි හුඟ දෙනෙක් ඔයා වගේ නැහැ ඇලිසියා. ඔයා හැම විෂයක්ම ලිස්සලා ගියාට කරදරයක් නැතිව හැම දෙයක්ම හොඳින් කරනවා. ඔයාට තේරෙන්නේ නැහැ අපිට මේවා මොනතරම් අමාරුද කියලා. අපි පටන් ගනිමු."

කියවමින්, සටහන් ලියමින් හා කට පාඩම් කරමින් දැරියන් වැඩ ආරම්භ කළ නිසා කාමරය පුරා නිහැඬියාවක් පැතිරුණා. ක්ලැරිසා හා මේරි ලෝව් පමණයි ග්වේන් ගැන කරදර වුණේ. ක්ලැරිසා තවමත් ග්වේන්ගේ දුබල හදවත් අමාරුව විශ්වාස කළ අතර හඬන ඕනෑම කෙනෙකු ගැන මේරි ලෝව්ට දුක සිතුණා.

මෙහිදී ගොන්ඩොලින්ට තිබුණේ දුකට නොව කෝපය නිසා ඉනූ කඳුළුයි. යක්ෂ කොනී ! තම ලස්සන සැලසුම කොනී විනාශ නොකළා නම් කොතරම් අපූරුදැයි ඈ සිතුවා.

## 17

අවසානයේ වාර මැද නිවාඩුව එළැඹුණා. එය දීප්තිමත්ව හිරු පායා සුවදායක මඳ සුළඟින් යුතු දිනයක් වුණා. මහා තේපැන් සංග්‍රහය සඳහා විශාල වශයෙන් නොයෙක් දේ සෑදීමට මුළුතැන්ගෙයි කාර්ය මණ්ඩලය මහත් කැමැත්තකින් වැඩෙහි නියැළුණා. තම පවුලේ උදවිය දැක ගැනීමට දැරියෝ චකිතය මුසුව මඟ බලමින් සිටියා.

ක්ලැරිසාගේ දෙමව්පියන් එනු ඇතැයි සිතා තිබූ ගොන්ඩොලින් ඔවුන්ව තම දෙමව්පියන්ට හඳුන්වා දීමට මහත් බලාපොරොත්තු තබාගෙන තිබුණා. එවිට හදිසියේම ඇයට ඇසුණා වාර මැද නිවාඩු සෙනසුරාදාවේදී විල් හා ක්ලැරිසා එක්ව සවාරියක් යාමට සැලසුම් කරන අයුරු.

"ඒ දවසේම මගේ අයියලා දෙන්නෙකුටත් වාර මැද නිවාඩු ලැබෙනවා." විල් කිව්වා. "අම්මයි තාත්තයි එක්ක එයාලත් එනවා. අපි දවල් කෑම ගන්නේ ලැන්ග්ලි කන්ද මුදුනේ. අපි ඊට පස්සේ ගල් පොකුණේ නාලා ටෙනිස් තරගය බලන්න ආපසු එමු."

ග්වේන් මවිතයෙන් සවන් දීගෙන හිටියා. "ඒත් ක්ලැරිසාගේ අම්මයි තාත්තයි ඒකට මොනවා කියයිද ?" ඈ ඇසුවා. "එයාලා ක්ලැරිසාව එක්ක යන්නේ නැති වෙයි ද ?"

"සෙනසුරාදාට එයාලට එන්න බැහැ, අපරාදේ." ක්ලැරිසා කිව්වා. "එයාල සමහර විට ඉරිදා එයි. දන්නවානේ, එයාලට හුඟාක් වැඩ අධික අය - අඩු ගණනේ, තාත්තාට බැරි වුණත් අම්මට පුළුවන් වෙයි."

"ඉතින් මම කිව්වේ ක්ලැරිසාට අපි එක්ක එන්න කියලා." විල් කිව්වා.

"අපේ අය ඕනෑ තරම වගේ දෙගුණයක් කෑම බීම ගෙනෙනවා. අපි හොඳටම විනෝද වෙන්න පුළුවන් !"

ග්වේන්ට ඊර්ෂ්‍යාවක් ඇති වුණා. ඇයි, ඇය මෙය කලින් දැන තිබුණා නම් ක්ලැරිසා සමග දවස ගත කිරීමට ඇයට හැකි වෙන්න තිබුණා.

"හොඳයි, ඔයාලගේ අය එන්නේ නැති බව ඔයා මට කියන්නයි තිබුණේ" ඈ කිව්වා. "ඔයා දන්නවා අපේ ගෙදර අයත් එක්ක ඔයා එනවාට මම මොනතරම් කැමතිද කියලා."

ක්ලැරිසා වික්ෂිප්තව බලා සිටියා. ඇය හිතාමතාම ග්වේන්ට එය නොකියා තිබුණේ විල් හා ඇගේ සහෝදරයන් සමග යාමට ඇට මහත් වුවමනාවක් තිබූ නිසයි. සියල්ලෝම අශ්ව පවුලක් ! එහෙත් ඇයට එය ගොන්ඩොලින්ට පැහැදිලි කර දීමට නොහැකි වුණා. මෙම අඩුව පිරිමැසීමට මෙන් ඈ ගොන්ඩොලින්ට තවත් දයාබර වුණ අතර ගොන්ඩොලින්ගේ පවුලේ උදවිය පැමිණි විට ඔවුන් වෙතට පැමිණ කතා කිරීමට ද පොරොන්දු වුණා.

"ඔයා මගේ පපුවේ අමාරුව ගැනත් එයාලට කියන්න." ගොන්ඩොලින් කිව්වා. "මම ම ඒ ගැන කලබලයක් කරන එක හොඳ නැහැ. ඒත් ඔයාට ඒ ගැන මොනවා හරි කියන්න පුළුවන්, ක්ලැරිසා."

"ඇත්තෙන්ම මම කියනවා." ග්වේන්ගේ පපුවේ අමාරුව ගැන තවමත් විශ්වාස කරන ක්ලැරිසා කිව්වා. "මම හිතන්නේ ඒ ගැන මොනවා හරි කරන්න ඕනෑ."

මෙලෙස, වාර මැද නිවාඩු සෙනසුරාදාවේදී, ක්ලැරිසාව ගොන්ඩොලින්ගේ මව වන ලැසී මහත්මිය හා ඇගේ ආයා වන මෘදු ගති ඇති, වියපත් පෙනුමකින් යුතු මහලු වින්ටර් මහත්මිය වෙතට කැටුව යනු ලැබුණා. ඇගේ පියා පැමිණ තිබුණේ නැහැ.

ලැසී මහත්මිය තවත් මවක් සමග සල්ලාපයේ යෙදී සිටියා. ඇය එය අවසාන කරන තුරු ක්ලැරිසා හා ගොන්ඩොලින් තණ පලස මත වාඩි වුණා. ඩැරල්ගේ මව ද පසෙක සිටි අතර ඩැරල් ඇයව ක්ලැරිසාට හඳුන්වා දුන්නා.

ඒ වහාම ග්වේන් තම මවට හා වින්ටර් මහත්මියට කතා කරනු ඇයට ඇසුණා. "ඉතින් දුවේ," ඇගේ මව ආදරයෙන් කිව්වා. "ඉතින්

මොනවාද මගේ චූටි ගොන්ඩොලින් දූව මේ වාරයේ කරන්නේ ? ඔයත් ප්‍රදර්ශන ටෙනිස් තරගයට ඉන්නවා ද ?"

"නැහැ, අම්මා."ගොන්ඩොලින් කිව්වා. "මාවත් තෝර ගන්න තිබුණා. ඒත් අන්තිමේදී පහ හය පන්තිවල ළමයි විතරක් තෝරා ගන්න තීරණය වුණා."

"මොන මෝඩ වැඩක් ද ?" වින්ටර් මහත්මිය කිව්වේ පහ හය පන්තිවල ඕනෑම දැරියකට වඩා ගොන්ඩොලින් හොඳ බව ඒකාන්තයෙන් දැනගෙනයි.

"ඔයාගේ පිහිනීම කොහොමද, ග්වේන් ?" ඇගේ මව ඇසුවා. "ඔයාගේ එක ලියුමක කියලා තිබුණා ඔයා උඩුබැල්ලෙන් පිහිනන තරගයකින් දිනලා තිබුණා කියලා. මම හිතන්නේ ඒක ලොකු හපන්කමක්. උඩුබැලි අතට පිහිනන එක හුඟාක් අමාරුයි. මට මතකයි මම ඉස්කෝලෙදි මට ඒක කොහොමවත් කරන්න බැරි වුණා. ඔළුව වතුර යට යනවා."

ඩැරල්ගේ මව සමග කතා කරමින් සිටියද ක්ලැරිසාට මේ සංවාදය නොඅසා සිටිය නොහැකි වුණා. ඈ මහත් භීතියට පත් වුණා. ග්වේන් මින් කුමක් අදහස් කරනවාද ?

"නැහැ, මම අද පිහිනන්නේ නැහැ." ග්වේන් කිව්වා. "හරිම ඊර්ෂ්‍යාවක් මෙහේ තියෙන්නේ, දන්නවානේ අම්මා. හොඳ අයට අවස්ථාවක් දෙන්නේම නැහැ. ඒත්, මම නම් ඒවා ගණන් ගන්නේ නැහැ. මෙහේ අය ඕනෑම කෙනෙකුට වඩා හොඳට මට කිමිදෙන්න පුළුවන්."

ග්වේන් කිමිදෙන්නට උත්සාහ කරන සෑම විටකම ජල තලය මත මුණින් තලාව ඇද වැටී මහත් ජල කැලඹුමක් කරන හෙයින් මෙය මහත් හාස්‍යජනක වුණා. ඒ ඩැරල්ට, සැලීට හෝ ඇලිසියාට වන්නට පුළුවන්. එහෙත් ක්ලැරිසාට එය හාස්‍යයක් නොවෙයි. එය කම්පනයක්. මොන තරම් අසත්‍ය ද ! අමූලික බොරුවක් ! ග්වේන් කෙසේ නම් මේවා කියනවාද ? ග්වේන් හා අඥාන මෙන්ම ඉක්මනින් බොරු එලෙසම පිළිගන්නා ඇගේ මව සමග දවස ගත කිරීම වෙනුවට ආටෝපවලින් තොරව ඍජුව කතා කරන විල් සමග සිටීමට තමා ගත් තීරණය ගැන ඇය සතුටු වුණා. ග්වේන් මෙවැනි දැරියක බවට පත් වූයේ කෙසේදැයි ඇයට පැහැදිලිව පෙනුණා. ඇගේ මෙම මව ඇයව

නරක් කර, බෝනික්කෙකු බවට පත් කර ඇය කියන සෑම වචනයක්ම විශ්වාස කරන නිසා. ඒ මවගේ වරදයි. එමෙන්ම දුක්මුසු පෙනුමක් ඇති දුප්පත් ආයාද මෙයට වග කිව යුතුයි. ඔවුන් ගොන්ඩොලින්ව අඥාන, අහංකාර, කපටි දැරියක බවට පත් කර ඇත!

ග්වේන්ගේ බේගල් කන වැකුන නිසා ඇගේ මව සමග කතා කිරීමට නොව ඔවුන් හමුවීමට ද ක්ලැරිසාට කැමැත්තක් ඇති වූවේ නැහැ. ඇයට එය කළ නොහැකියි ! බොහෝ ආකාරවලින් ක්ලැරිසා නිහඬ හා දුර්වල වුවද ඈ අවංක හා සත්‍යගරුක ඍජු දැරියක්. මේ වන විට ඈ සැබැවින්ම කම්පනයට පත්ව සිටියා.

ග්වේන් තමාව දැක ගැනීමට පෙර රහසින් ඉවතට යාමට ඈ සැරසුණා. එහෙත් ග්වේන් මෙය දැක ඇගේ අතින් ඇද නවත්වා ගත්තා. එහෙයින් ඇයට මඳ සිනාවක් පා ග්වේන්ගේ මවට හා ආයාට කතා කිරීමට සිදු වුණා. "ඉතින් කොහොම ද ?"

"මට නවතින්න බැහැ" ක්ලැරිසා ඉක්මනින් කිව්වා. "විල්ගේ කට්ටිය ඇවිදින්. මම ඒ අය රස්තියාදු කරන්න හොඳ නැහැ."

ගොන්ඩොලින් ඇය දෙස බැලුවේ යම් අදහසක් පෙරදැරිවයි. ඒ කුමන අදහසක් දැයි ක්ලැරිසා දැන සිටියා. එහෙත්, අහෝ, තව දුරටත් එය ගොන්ඩොලින්ගේ පපුවේ අමාරුවක් නොවන බව ඇය දැන ගත්තා. ග්වේන්ගේ අමූලික බොරුවක් බව ඇය සොයා ගත්තා. එය මින් මොහොතකට පෙර ඇය කියූ මුසාවලින් එකක් පමණයි.

"ඉතින්, ඔයා පිහිනන හරි ටෙනිස් හරි තරගවලට ඉන්නවාද?" ලැසී මහත්මිය ඇසුවා. ඇගේ ඇස ද ග්වේන්ගේ මෙන් ලා නිල් පැහැයෙන් වූ විශාල ඇසක් වූ අතර ඒවා ක්ලැරිසාගේ කුඩා මුහුණ වෙතට එල්ල වී තිබුණා.

"නැහැ. මම ඒ එකකටවත් නැහැ." ක්ලැරිසා කිව්වා.

"බලන්නකෝ, ක්ලැරිසාට පපුවේ අමාරුවක් තියෙනවා." ගොන්ඩොලින් ක්ෂණයෙන් කීවේ ක්ලැරිසාට ඇගේ හෘදරෝගය ගැන කතා කිරීමට ඉතා කදිම අවස්ථාවක් ඒ සමගම පැන නැඟුණ නිසයි. එහෙත් ක්ලැරිසා ඒ ගැන වචනයක්වත් කතා කළේ නැහැ.

"අහිංසක ළමයා." ලැසී මහත්මිය කිව්වා. "කුඩා ළමයෙකුට හැදෙන්න පුළුවන් මොනතරම් දරුණු රෝගයක් ද ! මට කියන්නත්

සතුටුයි අපේ ග්වේන්ට සුළු අමාරුවක්වත් නැහැ. බලන්නකෝ මෙයා කොයි තරම සනීපෙන්ද කියලා - බෝල ගෙඩිය වගේ."

ග්වේන් ක්ලැරිසා දෙස කඩ වූ බලාපොරොත්තුවෙන් යුතුව බැලුවා. හැම දේම වරදිනවා ! ඈ ක්ලැරිසාට තියුණු වැලමිටි පහරක් ඇන්නා. එහෙත් ඒ වනතුරු ද ක්ලැරිසා ග්වේන්ගේ හදවත් අමාරුව ගැන වචනයක් හෝ කීවේ නැහැ ! ග්වේන් තරහින් ඇය දෙස රවා බැලුවා.

මේ වන විට ක්ලැරිසා ගොළු වී සිටියා. සන උපැස් යුවළ පිටුපස වූ දැස් තදින් ඇසිපිය හෙළමින් රතු වූ මුහුණින් යුතුව ඈ වාඩි වී සිටියේ ග්වේන් හා ඇගේ අඥාන මවගෙන් ගැලවී පැන යාමට මඟක් සොයමිනුයි.

හදිසියේම ඇගේ ගැලවිල්ලට මෙන් විල් ඇය සොයා පැමිණියා. "ක්ලැරිසා ! මේ, එන්න පුළුවන්ද ? අපි ලැහැස්තියි !"

"මට යන්න වෙනවා." ලැජ්ජාශීලීව කී ක්ලැරිසා මහත් සොම්නසින් නැඟී සිටියා. "ආයුබෝවන්, මිසිස් ලැසී."

"ඒත් ක්ලැරිසා !" ගොන්ඩොලින් ඇය පසුපසින් සිට කතා කළා. ක්ලැරිසා කරන්නට පොරොන්දු වූ දෙය නොකිරීම ගැන ඇය කලකිරීමටත්, කෝපයටත් පත්ව තිබුණා.

"ඒ ළමයා කවුරු කියලා ද ඔයා කිව්වේ ?" ලැසී මහත්මිය ඇසුවා. "මට ඒ නම මතක හිටියේ නැහැ."

"එයා ක්ලැරිසා කාටර්" බුම්මාගත් ග්වේන් කිව්වා. "එයා මොනවාටද ඒ තරම් හදිස්සියේ දිව්වේ ? නැහැදිච්චකම, මම නම් කියන්නේ !"

"කිසිම ලස්සනක් නැති ළමයෙක්." ලැසී මහත්මිය කිව්වා. "ගමේ ගොඩේ ළමයෙක් වගේ, ඇත්තෙන්ම. සිරිත් විරිත්වත් දන්නේ නැහැ. මම හිතන්නේ නැහැ ඒ ඔයාගේ යාළුවෙක් කියලා, ගොන්ඩොලින්"

"අපොයි, නැහැ, අම්මා !" ගොන්ඩොලින් කීවේ උදයේ කී පරිදි නොකිරීමට ක්ලැරිසා අපොහොසත් වීම නිසා නැවත කිසි දින ඇය සමග මිතුරුකමක් තබා නොගැනීමට හිත හදා ගනිමිනුයි. "මම එයාට කොහොමවත් කැමති නැහැ. ඔයා කිව්වා වගේ වැඩකට නැති

කෙනෙක්. හරිම කැතයි. ඒ වගේම ඇඟපතක්වත් නැහැ. කිසිම දේකට දක්ෂ කමක් නැති හින්දා එයාට අනිත් අයත් කැමති නැහැ."

"මටත් එහෙම හිතුණා." වින්ටර් මහත්මිය කිව්වා. "නරක විදිහට හැදුන ළමයෙක් වගේ. අපි කොහොමද අපේ ගොන්ඩොලින් එයත් එක්ක සංසන්දන කරන්නේ කියලයි මම බැලුවේ !"

ඔවුන්ගේ වර්ණනා මැද ගොන්ඩොලින් ප්‍රීතියෙන් ඉපිළුණා. එමෙන්ම මම්සලී දැක ගැනීමට ඈ තියුණු ඇසක් යොමු කළා. දැන් ඇයට ඇති එකම බලාපොරොත්තුව මම්සලීයි !

දවස ඉක්මනින් ගෙවී ගියා. ප්‍රදර්ශන ටෙනිස් තරගයට මහත් අත්පොළසන් හඬක් නැගුණා. එමෙන්ම පිහිනුම් හා කිමිදීම් තරගවලට ද විස්මිත වූ ප්‍රතිචාරයක් ලැබුණ අතර පියවරු පවා ඉතා කදිම පිහිනුම් ආරවලට හා දක්ෂ දැරියන්ගේ කිමිදුම් කුසලතා මහත් සේ අගය කළා.

ඉන් අනතුරුව විශාල මිදුලේ ආසනවලින් වට වූ රවුම් රංග භූමියේ නර්තන දැක්ම පැවැත්වුණා. ගල් ආසන මත වාඩි ගත් දෙමව්පියෝ නොයෙක් වර්ණ සිනිඳු සේද ඇඳුම් හා හිස් පලඳනා පැලඳ එන දැරියන් අතර තම දියණිවරුන් සොයන්නට වූ අතර පාවී ඇදී එන දැරියන් අතරින් තම දියණිය වඩාත්ම සුන්දර බව සිතන්නට වුණා.

එළිමහනේ සවාරිය හා දිවා ආහාරය විල් හා ඇගේ පවුලේ උදවිය සමග හමාර කළ ක්ලැරිසා පැමිනුණා. ඇය ග්වෙන් සිටි අසලකට නොගියා පමණක් නොව ඇය සිටින දිශාවකට හෝ නෙත් හෙළුවේ නැත්තේ ඇයට හිස වැනීමකින් හෝ කැඳවීමක් කරනු ඇතැයි බියෙනුයි. එහෙත් ග්වෙන් කිසිදු සංඥාවක් කළේ නැහැ. ඈ ක්ලැරිසා නම් දෙපිටකාට්ටු කුඩා හැතිරිය සමග ගනුදෙනු හමාර කර තිබුණා.

ගොන්ඩොලින්ගේ මහත් අවාසනාවට මෙන්, ඒ දිනය පුරාම මම්සලී සිටියේ ඇයට ළඟාවීමට නොහැකි තරම් දුරකයි. දැරියන්ගේ නර්තන ඇඳුම් සකස් කරමින්, ඔවුන්ගේ සිනිඳු සේද ගවුම් අන්දවමින් නැටුම් ගුරුතුමියට උදව් කරන ඇය ඉතා යුහුසුලු වුවද ඉන් මහත් වින්දනයක් ලබමින් සිටියා. ඊළඟ දිනයේදී මම්සලීව අල්ලා ගැනීමට හැකි බව සිතමින් ගොන්ඩොලින් තම සිත සනසා ගත්තා. ඒ සඳහා

ඇයට ඉතා කෙටි හා පහසු මාර්ගයක් තිබුණා. ඇ කළ යුත්තේ තම මවට හා ආයාට මම්සලී විසින් කරන ලද ඇඳ ඇතිරිල්ල පෙන්වන මෙන් කීම පමණයි. එය ඉතා අලංකාර නිර්මාණයක් ලෙස සිතමින් මම්සලී ඔවුන් සමග ඒ ගැන දිගු වේලාවක් කතා කරනු ඇත. මම්සලී ඒ තරමට තම ඇඳ ඇතිරිල්ල ගැන ආඩම්බරව සිටියා.

"මේ දවස ඉවර වෙන්නේ නැතිනම් කොයි තරම් හොඳ ද !" ඩැරල් එදින රාත්‍රියේ කිව්වා. "හරිම අපූරුයි. පුදුම තේ වේලක් !"

ඇය වඩාත් සතුටු වුණේ තව දුරටත් පන්ති නායිකාව නොවීම ගැන ඇගේ මව හෝ පියා වචනයක් හෝ කතා නොකළ නිසයි. එහෙත් ඔවුන් නිර්භීත ලෙස ඇයට උදව් කිරීමට සූදානම් බව ඇයට ඇඟවීමට ඔවුන් සමත් වුණා. ඇගේ පියා තරමක් තදින් ඇයව වැලඳ ගත් අතර කුලුනු වටා ඇවිද යන හැම විටම ඇගේ මව තදින් ඇගේ අත අල්ලා ගෙන සිටියා.

දෙමව්පියන් නැවත දැක ගැනීම ගැන ෆෙලිසිටි සතුටින් උමතුව සිටියා. "මම මැලෝරි ටවර්ස්වලට ආදරෙයි !" ඇ නිතරම කිව්වා.

# 18

ඊළඟ දිනයේ ද දෙමව්පියන් පැමිණ ඔවුන්ව පිටතට කැඳවාගෙන යනු ඇතැයි බොහෝ දැරියෝ අපේක්ෂාවෙන් යුතු වුණා. ක්ලැරිසා ඉතා උනන්දුවෙන් මඟ බලමින් සිටියා.

ගොන්ඩොලින් ඇය දුටුවා. 'මම හිතන්නේ එයා අම්මා එනවාද බලනවා.' ඈ සිතුවා. 'නරක කෙල්ල. මම නම් එයා එක්ක කතා කරන්නේවත් නැහැ."

හදිසියේම ක්ලැරිසා සතුටින් අත වනනු ඈ දුටුවා. ඉන් පසු කාමරයෙන් පැන දිවූ ඈ තරප්පුව පසෙකින් අතුරුදහන් වුණා. ඇගේ මව කොයි වගේ දැයි දැක ගැනීමට ග්වේන් පිටත බැලුවා. මෝටර් රථය ඉතා උසස් වර්ගයේ එකක් විය හැකියි.

පුදුමයට මෙන් ඈ දුටුවේ පරණ කාලයේ ඔස්ටින් රථයක් මිදුලේ නතර කර ඉන් පිටතට පා තබන ඉතා සාමාන්‍ය පෙනුමැති කාන්තාවක්. නිල් ඇඳුමක් මතින් සුදු බ්ලවුසයක් ඇඳ සිටි ඇය පැසුණු හිසකෙස් වටා ලොකු ලේන්සුවක් ගැට ගසාගෙන සිටියා. කණ්ණාඩි පැලඳ සිටි ඈ තරමක් විශාල දෙපාවල සාමාන්‍ය පාවහන් පැලඳ සිටියා.

'අපොයි, මට නම් ක්ලැරිසාගේ අම්මාගේ හිතන්න තරම් දෙයක් නැහැ. කාර් එකත් වැඩක් නැහැ !' ග්වේන් තනියම සිතුවා. 'කාර් එක හෝදලාවත් නැහැ ! ඔළුවේ ලොකු ලේන්සුවක් බැඳගෙන එයි කියලා හිතන්නවත් පුළුවන් ද ? අපේ අම්මා නම් එහෙම දෙයක් හීනෙන්වත් හිතන්නේ නැහැ !'

තම මවගේ මල් වැටුණු ඇඳුම්, විශාල මල් සහිත හිස් වැස්ම, මල් සහිත ලොකු ලේන්සු, මල් කුඩය හා පබළු පොට වැනි දේ ගැන ඈ සිතුවා. ක්ලැරිසා තව දුරටත් තම යෙහෙළියක් නොවීම ගැන

සතුටු සිතින් යුතුව මුහුණේ උපහාසාත්මක සිනාවකින් යුතුව ඇ ඉවතට හැරුණා.

"අපූරු විරිත්තීම !" උස් කට හඬක් කී අතර ඉක්මනින් පැන්සල ඇද ගත්තා බෙලින්ඩා ඇයට දැක ගත හැකි වුණා. "ඔහොම ම ඉන්න ග්වේන්, ඔය විදිහට !"

බල්ලෙකු කෙඳිරිගාන ලෙස මුවින් හඬක් නැඟූ ග්වේන් කාමරයෙන් ඉවතට ගියා. දැන් ඇය මිස්සලී සොයා ගොස් තම මවට ඇගේ ඇඳ ඇතිරිල්ල බැලීමට අවශ්‍ය බව පැවසිය යුතුයි. මෙය ඇත්තෙන්ම සාර්ථක වුණා. මිස්සලී එය රැගෙන ඒමට කඩිසරව දුව ගියා. "අනේ මිසිස් ලුසී හරිම කරුණාවන්තයි !"

සෑම ගැහැනු ළමයෙක්ම තම දෙමව්පියන් හෝ වෙනත් අයෙකුගේ දෙමව්පියන් සමග දිනය පුරා විනෝද වීමට පිටතට ගොස් තිබුණා. වෙහෙස වී වැඩ කරන ඇරියන්ට කෙටි විවේකයක් තුළ විනෝද වීම පිණිස වාර මැද නිවාඩුව පාසල් සහතික පත්‍ර විභාගයට පෙර පැමිණීම ගැන ග්‍රේලින් මහත්මිය සතුටු වුණා. ඔවුන් සැබැවින්ම මහන්සි වී වැඩ කරන බවට විලියම්ස් ගුරුතුමිය වාර්තා කළා. "ගොන්ඩොලින් ලැසී හැර වෙන අසතුටුදායක ළමයෙක් නැහැ !"

රාත්‍රී හත වන විට ගොන්ඩොලින් හැර සෑම කෙනෙක්ම ආපසු පැමිණ තිබුණා.

"කෝ අපේ හුරතල් ගොන්ඩොලින් ?" රාත්‍රී කෑම මේසය වටා බලමින් ඇලිසියා ඇසුවා. කිසිවෙක් දැන සිටියේ නැහැ. එවිට උඩඟු පෙනුමක් දක්වමින් මිස්සලී ඔවුන්ට දැනුවත් කළා.

"අසරණ ගොන්ඩොලින් - එයාගේ පපුවේ අමාරුව නිසා එයාව ගෙදර එක්ක ගෙන ගියා." මිස්සලී කිව්වා. "එයාට නරක විදිහට පපුවේ හතිය තියෙනවා. අසරණම අසරණ කෙල්ල. අනික ඔයාලා විශ්වාස කරනවාද , මම ලැසී නෝනාට කියද්දී... ඕ, අහිංසක ගෑනි, ගොන්ඩොලින්ගේ අමාරුව ගැන .... එයා කිව්වා මේ නිර්භීත ළමයා ඒ ගැන වචනයක්වත් කියලා තිබුණේ නැහැ කියලා. මේ ළමයාව අගය කරන්න වටිනවා."

මෙම පුදුම සහගත තොරතුරුත් සමග ඇරියෝ මෙම සිද්ධිය දෙස පිළිකුලින් බැලුවා. ඔවුන් එකිනෙකා දෙස බැලුවා. "එහෙනම්

ග්වේන් කොහොම හරි වැඩේ කර ගත්තා." සැලී කිව්වා. "එයාට විභාගය මඟ හැරෙනවා !"

මම්සලීට එය ඇසුණා. "ඔව්, එයාට විභාගය මඟ හැරෙනවා. ඒ ගැන එයා මොන තරම් දුක් වුණාද, 'නැහැ අම්මා' එයා හරිම නිර්භීත විදිහට කිව්වේ. 'මට ඔයත් එක්ක ගෙදර යන්න බැහැ. මම විභාගය කරන්නම ඕනැ. මම ඔයාට මගේ අමාරුව ගැන නොකිව්වේ විභාගය මඟ හැරෙන එක මට දරා ගන්න බැරි නිසයි !" අන්න එහෙමයි එයා කිව්වේ. එහෙම කියනවා මගේ මේ කන් දෙකටම ඇහුණා."

හතර පන්තියේ දැරියන්ට මහත් අසහනයක් දැනුණා. මොන තරම් ලැජ්ජාවක් ද ! මව එලෙස රැවටීමට ගොන්ඩොලින් කොතරම් පිළිකුල් සහගත ද ! කෙසේ හෝ ඇය තමාට අවශ්‍ය දේ කර විභාගය මඟ හැර තිබුණා. දක්ෂ, කපටි, වංචනික ගොන්ඩොලින් !

"ඔයා හරි, කොනී" ඇලිසියා කිව්වා. "හරියටම හරි ! මම්සලී, දැන් අපේ හුරතල් ගොන්ඩොලින්ට මොකක්ද වෙන්න යන්නෙ ? ඇත්තක් ද කියලා හිතන්නවත් බැහැ !"

"මම දන්නේ නැහැ." මම්සලී කිව්වා. "වැඩි යමක් මම දන්නේ නැහැ. ලැසී නෝනාට මේක කියන්න ලැබුණු එක ගැන මම සතුටු වෙනවා. මම මගේ ඇඳ ඇතිරිල්ල එයාට පෙන්වන්න අරගෙන නොගියා නම් එයාට ඒ ගැන කවදාවත් දැන ගන්න ලැබෙන්නේ නැහැ."

"මම හිතන්නේ ග්වේන් ඔයාට ඇඳ ඇතිරිල්ල ගෙනෙන්න කියන්න ඇති ?" කොනී කිව්වා. "ඉතින්, මම හිතන්නේ ඔයා ඉන්න තැනදීම එයාට පපුව ගැහිල්ලකුත් හැදෙන්න ඇති ?"

"මට තේරෙන්නේ නැහැ. ඇයි ඔයා ඔලොක්කුවට වගේ කතා කරන්නේ කියලා, කොනී" පුදුමයට පත් මම්සලී කිව්වා. "ඔහොම නපුරු වෙන්න එපා. ඔයා අනුකම්පා කරන්න ඕනැ."

දැරියෝ නොයෙක් සැර පරුෂ හඬ නැඟුවා. මම්සලී තවත් පුදුමයට පත් වුණා. ඇයි මේ හා - හෝ ගෑමක් හා මුහුණු ඇද කර ගැනීමක් ? නැහැ, නැහැ, ඒක කරුණාවක් නොවෙයි, සිතූ මම්සලී දෙතොල් තද කර මුව වසා ගත්තා.

"ඒකත් එහෙමයි." එදින රාත්‍රියේ නිදන කාමරයේදී ඩැරල් කතා

කළා. "ග්වෙන් මග හැරියා කියමුකෝ. ඒත් මම්සලීත් මේ වංචාවට අහු වුණ එක ගැන පුදුමයි. මම්සලී රොජර් නම් කවදාවත් අහු වෙන්නේ නැහැ. එයාට පුළුවන් ගොන්ඩොලින්ගේ කපටිකම දුර තියාම දකින්න. ඒ වගේම මිස් විලියම්ස්ටත් පුළුවන්."

"කොහොම වුණත් විභාගයෙන් ගැලවෙන්න එයා වාසනාවන්ත වුණා." බෙලින්ඩා කෙඳිරිගෑවා. "මටත් එහෙම කරන්න පුළුවන් වුණා නම් ! අපූරු නිවාඩුවකට පස්සේ ආයෙත් පාඩම් - පාඩම්, එපා වෙනවා. ඊට පස්සේ - ලබන සඳුදා විභාගය. මගේ පපුව කඩා වැටෙන්න එනවා !"

සතිය ගෙවී යද්දී ඇරියෝ තව තවත් වියරුවෙන් වැඩ කළා. විභාගයට පෙර ඉරිදා දිනයේ කිසිම වැඩක් කිරීම විලියම්ස් ගුරුතුමිය තහනම් කළ අතර තදින් කෙඳිරිගෑම් නැඟුණා.

එමෙන්ම තවත් පුදුමයක් සිදු වුණා. ගොන්ඩොලින් මැලෝරි ටවර්ස් වෙත ආපසු පැමිනුණා !

තරමක් මෙල්ල වී දෙනෙත්වල කඳුළු පුරවාගෙන ඈ පැමිණියේ ඉරිදා රාත්‍රී ආහාරයට මඳකට පෙරයි. ග්‍රේලින් මහත්මිය සමග කෙරුණ කෙටි කතා බහකට පසුව ඒ වන විට රාත්‍රී ආහාරයට ගොස් තිබූ අනෙක් අය වෙතට ඇයව එවනු ලැබ තිබුණා.

"ඇයි, ග්වෙන් !" ඇයව පළමුව දුටු මෙල්විස් ඇසුවා. "අපි සිතුවේ ඔයා ආපසු එන්නේ නැහැ කියලයි."

"ඕහ්, මෙන්න ගොන්ඩොලින් ආපහු ඇවිදින්." මම්සලී කිව්වා. "ඉතින් කොහොමද ඔයාගේ පපුවේ අමාරුව."

"දැන් හොඳයි. ස්තුතියි." කියමින් ගොන්ඩොලින් ආසනයට බර වුණා. තමා එතැන නැති කලක මෙන් හැසිරීමට ඈ උත්සාහ කළා.

ඇය අඬා තිබෙන බව දුටු ඇරියෝ ඇය දෙස සෘජුව නොබැලීමට උත්සාහ කළා. රතු වූ දෙනෙත් දෙස අන් අය බලන විට ඇතිවන්නේ කුමන බියකරු සිතුවිලි ද යන්න ඔවුන් දැන සිටියා.

"ඊළඟ සතියේ ඔයා හුඟාක් වාසනාවන්ත වෙයි." සුහද කතාබහක් ඇති කර ගැනීමට උත්සාහ කරමින් සැලී කිව්වා. "අපි

හැමෝම විභාගයට ලියද්දී මිදූලට වෙලා නිකම් ඉඳගෙන ඔයාට කැමති දෙයක් කරන්න පුළුවන් වෙයි.

මඳ විරාමයක් ගත වුණා. "මටත් විභාගය කරන්න වෙනවා." උගුර හිරවෙමින් ග්වේන් කිව්වා. "ඒකයි මාව ආපසු එව්වේ. හරිම නරකයි."

දැරියන් සසල කරමින් ගොන්ඩොලින්ගේ කඳුළු බිංදු වේගයෙන් ඇගේ සලාද පිඟානට වැටෙන්න පටන් ගත්තා. ඔවුන් අපහසුවෙන් එකිනෙකා දෙස බැලුවා. මොනවා සිද්ධ වෙලා ද ?

"තවත් මොකවත් නොකියා ඉඳිමු." ඩැරල් කෙඳිරුවා. "එයා දිහා බලන්න එපා. අසරණ ග්වේන් !"

# 19

ග්වේන්ට සිදුව තිබුණේ කුමක්දැයි කිසිවෙකුට දැන ගන්න ලැබුණේ නැහැ. සිදුව තිබූ දේ කිසිවකු සමග පැවසීමට නොහැකි තරමට ඈ දුකටත්, ලැජ්ජාවටත් පත්ව සිටියා. එලෙස ඇය කිසිවක් නොකී නමුත්, මුළු සති අන්තය පුරාම රතු වූ දෑසින් යුතුව ඈ මෙල්ල වූ ආකාරයකින් කල්ගත කළා.

මුලදී සියල්ල ඉතා හොඳින් සිදුව තිබුණා. ග්වේන්ගේ අමුතු හදවත් ගැස්ම ගැන මිස්සලී ඇගේ මව සමග කී පසුව බියපත් මව ඇය වහාම නිවසට කැටුව ගියා. ඇයට විවේක ගැනීමට ඇඳක සැතපවූ මව හා වින්ටර් මහත්මිය ඇය අසලටම වී සිටියේ එක් පැටවකු සිටින කිකිළියක ලෙසයි. ගතවන සෑම මිනිත්තුවකටම ප්‍රිය කළ ඈ එක්වරම රෝගියෙකුගේ මළානික විලාසයෙන් හා දුර්වල කටහඬින් යුතු වුණා.

පියා නිවසේ නොමැති බවත්, බොහෝ විට සතිය අවසන් වනතුරු නොපැමිණෙන බවත් දැනගත් ඈ දැඩිසේ ප්‍රීතියට පැමිණියා. ඒ වනතුරු අර්ධ ලෙස රෝගාතුරව සිටීමට ග්වේන් අදහස් කර ගත්තා. ඇයට විභාගය මඟ හැරෙන අතර විභාග අන්තරාව අවසන් වූ පසු ක්‍රම ක්‍රමයෙන් සුව අතට හැරීමට ඇය බලාපොරොත්තු වුණා.

වෛද්‍යවරයා පැමිණි අතර ග්වේන්ගේ මවගේ බියපත් පැහැදිලි කිරීමට ඔහු සාවධානව සවන් දුන්නා. "මට හුඟාක් බය එයාගේ අසනීපය තියෙන්නේ හදවතේ නිසයි, ඩොක්ටර්" ඈ කිව්වා. "ඉස්කෝලේ ක්‍රීඩා හරි අමාරුයි, දන්නවානේ."

වෛද්‍යවරයා ග්වේන්ව හොඳින් පරීක්ෂා කළා. "මට නම් කිසිම දෝෂයක් හොයා ගන්න බැහැ." ඔහු කිව්වා. "කිසිම දෙයක් අවශ්‍ය නැහැ. සතියක විවේකයකින් හරි යයි. කොහොම වුණත් එයා ටිකක්

මහත වැඩියි නේද ? ආහාර පාලනයක් කළොත් හොඳයි, මම හිතන්නේ."

"ඔ, ඩොක්ටර්, ඒත් ළමයාගේ පපුවේ මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා ඇති." ලැසී මහත්මිය තරයේම කියා සිටියා. "මිස් වින්ටරුයි, මමයි හුඟාක් කලබල වුණා, එයා නිදන කාමරයට යන්න තරප්පුව නැඟලා අමාරුවෙන් හුස්ම ගනිද්දී."

"හොඳයි, තවත් විදිහකට හිතමුකෝ. ඔයා ගොන්ඩොලින්ගේ තත්ත්වය ගැන දැනට සෑහීමකට පත් වුණොත් හොඳයි." වෛද්‍යවරයා කිව්වා.

"මම විශේෂඥයෙක් ළඟට ගෙනියන්නම්" ලැසී මහත්මිය එක් වරම කිව්වා. "හොඳ කෙනෙක් කියන්න පුළුවන්ද, ඩොක්ටර් ?"

වෛද්‍යවරයාට එය කළ හැකි වූ අතර බදාදා දිනයේ මළානික රෝගියාව ඉතා ප්‍රවේසමෙන් ලන්ඩනයට රැගෙන යනු ලැබුවේ වෛද්‍යවරයා නිර්දේශ කළ විශේෂඥයා හමුවීමටයි. ඇය වෙත එක බැල්මක් හෙළූ ඔහු ගොන්ඩොලින්ව අල්ලා ගත්තා.

ඇත්තෙන්ම ඔහු ඇයව ඉතා ප්‍රවේසමෙන් පරීක්ෂා කළ අතර ගොන්ඩොලින්ට බියක් දැනෙන්නට පටන් ගත්තා. සැබැවින්ම ඇයට ඉහෙන් බහින රෝගයක් නොතිබූ අතර එසේ වූවේ නම් ඈ මිය යනු ඇත !

විශේෂඥ වෛද්‍යවරයා ලැසී මහත්මිය සමග හුදෙකලාව වචන කීපයක් කතා කළා. "මම මේ ගැන හිතලා බලන්නම්. මම ඔයාලගේ ඩොක්ටර්ට මගේ තීරණය විස්තර ඇතිව ලියලා එවන්නම්. ඒ අතර මේ ගැන කලබල වෙන්න එපා." ඔහු කිව්වා.

සිකුරාදා දිනයේ විශේෂඥ වෛද්‍යවරයාගේ ලිපිය වෛද්‍යවරයාට ලැබුණ අතර එය කියවූ ඔහුගේ මුහුණේ සිනාවක් ඇඳුණා. ඇත්තෙන්ම ගොන්ඩොලින්ගේ හදවතේ කිසිදු දෝෂයක් තිබුණේ නැහැ. ඇගේ මහත බව හැරුණ විට ඇයට වැඩිපුර ශාරීරික ව්‍යායාම අවශ්‍යව තිබුණා. 'ක්‍රීඩාව, ව්‍යායාම, ඇවිදීම වැඩිපුර අවශ්‍යයි. වැඩිපුර කෑම, රසකැවිලි අගුණයි. මහන්සි වී වැඩ කිරීම අවශ්‍යයි. ඒ ළමයා ගැන කොහෙත්ම හිතන්න අවශ්‍ය නැහැ !" විශේෂඥ වෛද්‍යවරයා ලිව්වා. "එයා කුඩා කපටි හෙරක් ! පිහිනීම ඇයට හුඟාක් හොඳයි. එතකොට ඇගේ තෙල් ගතිය අඩු වෙයි."

ගොන්ඩොලින්ට කිසිදු අසනීපයක් නැති බව දැන්වීමට ලැසී මහත්මියට දුරකථන ඇමතුමක් දෙන විට වෛද්‍යවරයාට මේ විස්තර කෙටි කිරීමට සිදු වුණා. "එයාව වහාම ඉස්කෝලයට පිටත් කර යැවිය යුතුයි." ඔහු කිව්වා. "ළමයා නිකන් නිදාගෙන ඉන්න එක හොඳ නැහැ."

මේ සියල්ල ඇසුණ විට ග්වේන් කෝපයටත්, අවාසනාවටත් පත් වුණා. පපුව රිදෙන කලෙක මෙන් ඈ පපුව මත අත තබා ගත්තා. "ඕ, අම්මා !" ඈ කිව්වා. "ඔයා කියන විදිහට මම ආපහු යන්නම්. ඒත් මට එක සතියක් දෙන්න. එතකොට මට ලොකු සනීපයක් දැනෙයි."

ග්වේන්ව සතියක් හෝ ඊට වැඩි කාලයක් ආපසු පාසල් නොයවන බවට ලැසී මහත්මිය පොරොන්දු වුණා. ග්වේන් ඉත් සෑහීමකට පත් වුණා. ඇයට විභාගය මඟ හැරෙන්නේ නම් එය හොඳටම ප්‍රමාණවත් !

ග්වේන් ගැන සඳහන් කර තම බිරිඳ එවූ ලිපිය හා දුරකථන ඇමතුම් හේතුවෙන් කුතුහලයට පත් ඇගේ පියා හදිසියේම නිවසට පැමිනුණා. කවිච්චියේ වැතිර සිටි ග්වේන් ශෝකය උපදවන බැල්මක් ඔහු වෙත හෙළුවා. ඇයව සිප ගත් ඔහු විශේෂඥ වෛද්‍යවරයා කුමක් කීවේදැයි චකිතයෙන් යුතුව ඇසුවා.

"මොනවා ! අසනීපයක් නැහැ." ඔහු මවිතයෙන් ඇසුවා. "මම ගිහින් ඩොක්ටර්ව හම්බ වෙන්නම්. විශේෂඥ වෛද්‍යවරයාගේ ලියුම මමම කියවලා බලන්න ඕනැ. එතකොට මට සෑහීමකට පත් වෙන්න පුළුවන්."

මෙලෙස සිදු වූ නිසා ග්වේන්ගේ පියාට අවංක අදහස් සහිත ලිපිය කියවීමට හැකි වුණා. එමෙන්ම 'කුඩා කපටි හෙරක්' යන කොටස ද දැක්කා. තම දියණිය නැවත වරක් වංචාවකට පෙළඹී ඇති බව දැන ගත්තා. දෙමව්පියන්ව මහත් හිරිහැරයට පත් කළ බලවත් වංචාවක් ! මේ සියල්ලම විභාගය සඳහා මහන්සි වී වැඩකිරීමෙන් ගැලවී සිටීමට කළ දේවල් පමණයි.

ඔහු කෝපයටත්, උපහාසයට හා නපුරු බවටත් පත්ව සිටියා. අවසානයේ ඔහු මෙසේ කිව්වා. "ඔයා මගේ එකම දරුවා. මට ඕනෑ ඔයාට ආදරය කරන්න, ඔයා ගැන ආඩම්බර වෙන්න. හැම දෙමව්පියෙක්ම එහෙමයි. ඇයි ඔයා මෙහෙම අපිට දුක් දෙන්නේ,

ඔයාට ආදරය කරන්නවත් ඔයා ගැන ආඩම්බර වෙන්නවත් බැරි විදිහට. ගොන්ඩොලින්, මේකෙන් ඔයාගේ අම්මත් අසනීප වෙලා, මටත් තරහා ගිහින් - හරිම දුකයි."

"මම ආයෙත් එහෙම කරන්නේ නැහැ." ලැජ්ජාවටත්, භීතියටත් පත් ගොන්ඩොලින් ඉකි බින්දා.

"ඔයා හෙටම ආපහු ඉස්කෝලෙට යන්න ඕනෑ." ඇගේ පියා කිව්වා.

"ඕ, බැහැ, තාත්තා ! මට බැහැ ! විභාගයට" ගොන්ඩොලින් වැලපුණා.

"මම පාඩම් කරලා නැහැ."

"මට කමක් නැහැ. ඔය විදිහටම විභාගයත් කරන්න. අසමත් වෙලා ලැජ්ජා වෙන්න." ඇගේ පියා කිව්වා. "මේ ඔක්කෝම ඔයාම කර ගත්ත දේවල්. ඔයාව අපරාදේ ගෙදර ගෙනාවෙ. ඒකට සමාව ඉල්ලලා මම මිස් ග්‍රේලින්ට ටෙලිෆෝන් කරන්නම්. විශේෂඥ වාර්තාවේ තියෙන උපදෙස් මම එයාට කියන්නම්. වැඩිපුර ක්‍රීඩා, ව්‍යායාම, ඇවිදීම්, අනික වැඩියෙන්ම පිහිනීම !"

"පිහිනීම !" ග්වේන් මේ සියල්ලෙන්ම වඩාත්ම අප්‍රිය කළ දෙය. නැවතත් කළුළු ගඟක කිමිදුණ ඇ එදින සැඳෑව පුරාත්, පසුදින කෝන්වෝල් බලා එන මඟ දිගටත් වැලපුණා. ඇ තමාටම කරගෙන තිබුණේ කුමක් ද ? කෙසේ වෙතත් ඇ එතරම් දක්ෂ වී තිබුණේ නැහැ! එය අවසානව තිබුණේ ඇයට සූදානමකින් තොරව විභාගයට පෙනී සිටීමටත්, වැඩිපුර ක්‍රීඩාවට හා ව්‍යායාම්වලට යාමටත්, එමෙන්ම මහත් වේදනා ගෙන දෙන සීතල තටාකයේ සෑම දිනකම පාහේ නෑමට යාමටත් සිදුවීමෙනුයි !

විභාගය ආරම්භ වුණා. සෑම කෙනෙක්ම කලබලයට පත්ව සිටියා. කුතුහලය දනවන ලෙස ඇලිසියා පවා. දිනෙන් දින වැඩ කෙරීගෙන ගිය අතරතුරේ ජූලි මාසයේ හිරු විවෘත ජනේලවලින් රිංගා විත් බැබළෙද්දී මී මැස්සන් මිදුලේ මල් අතර ගුමු ගුමු නද නැඟුවා. සෑම දිනකම තේ වේලාවෙන් පසු තටාකයට දුව යාමට ලැබීම ගැන දැරියෝ මහත් ලෙස සතුටු වුණා. ඉන්පසුව ආපසු පැමිණෙන ඔවුන් ඊළඟ දිනයේ විභාගය සඳහා පාඩම් කිරීම ඇරඹුවා.

ඇලිසියාට අරුම පුදුම යමක් සිදුව තිබුණා. ඇයට එය තේරුම් ගැනීමට නොහැකි වුණා. පළමු දිනයේදී විභාගයට වාඩි වූ ඈ ප්‍රශ්න ඉතා පහසු බව සිතමින් ප්‍රශ්න පත්‍රය දෙස බැල්මක් හෙළුවා. ඒවා ලේසි ප්‍රශ්න. එහෙත් සිත එක් තැන් කර ගැනීමට ඇයට නොහැකි වුණා. ඈ තම දෑත ඔළුවේ ඔබා ගත්තා. ඇත්තෙන්ම ඇයට හිසරදයක් වැලඳෙන්නට පටන් ගන්නවා විය නොහැක !

ඈ ප්‍රශ්න සමග ඔට්ටු වුණා. ඔව්, පොර බැදුවා. ඇලිසියා කිසි දිනක මින්පෙර මෙලෙස ප්‍රශ්න පත්‍ර ගැන කලබල නොවී තිබුණේ ඇගේ ක්ෂණයෙන් ක්‍රියාත්මක වන බුද්ධිය නිසයි. ව්‍යාකූල වූ ඈ වටපිටාවේ සිටින අනෙක් අය දෙස බැලුවා. දෙවියනේ, ඔවුන් කෙසේ නම් එතරම් කඩිනමින් ලියනවා ද ? ඇයට කුමක් සිදුවෙලා ද ?

එක් දිනක් හෝ අසනීපව සිට ඇති බවක් ඇලිසියා දැන සිටියේ නැහැ. ඈ ශක්තිමත්, සෞඛ්‍ය සම්පන්න මෙන්ම දක්ෂ කෙනෙක්. මේ විභාගය එතරම් දුෂ්කර වූයේ මන්දැයි ඇයට සිතා ගත නොහැකි වුණා. රාත්‍රියේදී නිඳා ගැනීමට අසීරු වූ ඈ ඇඳේ ගැස්සෙමින් ඒ මේ අත පෙරළෙන්න වුණා. ඇය අනවශ්‍ය ප්‍රමාණයට මහන්සි වී තිබුණාද? නැහැ, එය විය නොහැකියි. සෙසු පිරිස ඇය මහන්සි වී තිබුණාට වඩා බොහෝමයක් මහන්සි වී තිබුණා. එමෙන්ම ඔවුන් තමා එතරම් මහන්සි වී පාඩම් නොකිරීම ගැන ඇයට ඊර්ෂ්‍යා කර තිබුණා. හොඳයි, එහෙම නම් මේ මොකක් ද ?

"අපොයි" තම නිඳන කොට්ටයේ සීතල තැනක් සොයමින් ඇලිසියා සිතන්නට වුණා. "අසරණ ගොන්ඩොලින්ගේ දුර්වල මතකය හරි ඩැෆනිගේ වගේ අඩු මොළයක් හරි තියෙනකොට දැනෙන්නේ මොනවගේද කියලා දැන් මට තේරෙනවා. මට කිසිම දෙයක් මතක් කර ගන්න බැහැ. මම උත්සාහ කළත් මොළය වැඩ කරන්නේ නැහැ. මොළයට තෙල් දාන්න වෙලා වගේ දැනෙන්නේ !"

එම සතියේ ඇලිසියා තරමක් නිහඬව මෙල්ල වී සිටින බවක් අනෙක් අය දුටුවා. එහෙත් සියලු දෙනාම එවන් තත්ත්වයක පසු වූ නිසා කිසිවෙක් ඒ ගැන ප්‍රශ්න කළේ නැහැ. ඔවුන්ගෙන් කීප දෙනෙක්ම කරදරයට පත්ව ඇති බවත් පළ කළා. රූත් සුදුමැලිව කෙට්ටු වී සිටියා. ගොන්ඩොලින් අවාසනාවට පත් පෙනුමක් ඉසිලුවා. ඩැෆනී ප්‍රංශ ගැන සිතා කඳුළු පිරි දෙනෙතින් යුතු වුණා. විභාගයක් පැමිණි

විට ඒ සඳහා පෙනී සිටින පත්තිවල ස්වභාවය ගැන සිටි විලියම්ස් ගුරුතුමියට මෙය අමුත්තක් වුණේ නැහැ. ඒකට කමක් නැහැ. ඊළඟ සතිය වන විට ඔවුන් නැවත ජීවයෙන් පිරී සිටිනු ඇත !

පිළිතුරු පත් එකතු කරන අතරේ ඇ ඒවා දෙස බැල්මක් හෙළුවා. ඩැරල් හොඳින් වැඩ කර තිබුණා. ලකුණු හතරෙන් එකක් ලබා ගතහොත් එය ගොන්ඩොලින්ගේ වාසනාව ! මේරි ලෝව් නොසිතූ ලෙස යහපත්ව සිටියා. කොනී දුර්වලව සිටි අතර රූත් ද ඊට වඩා යහපත් වූයේ නැහැ. හරි පුදුමයි ! රූත් නිතරම අවශ්‍ය මට්ටමේ ඉඳ තිබුණා. ඉතිරි ප්‍රශ්න පත්‍ර ඇය හොඳින් නොකරන්නේ නම් ඇය සමත් වනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකි වුණා. එමෙන්ම ඇලිසියා ! ඇයට කුමක් නම් සිදු වී ද ? ලිවීම දුර්වලයි. දෙවියනේ, ඇලිසියා මෝඩ වැඩ කරනවා ද ?

එහෙත් එය ඇලිසියාගේ වරදක් නොවෙයි. ඇයට කළ හැකි දෙයක් තිබුණේ නැහැ. එම සතිය ඇයට යමක් සිදුවී තිබූ අතර ඇ ඒ ගැන බිය වී සිටියා.

'මම වගේ දක්ෂ, කඩිසර නැති දුර්වල අයට මම නිතරම විහිළු කරලා රිදෙව්වාට මේක මට දඬුවමක් !' ඇ කලකිරීමෙන් යුතුව සිතුවා. "මගේ මොළය අවුල් වෙලා. ග්වේන්ගේ, ඩැෆනිගේ වගේ දුර්වල වෙලා, මෝඩ වෙලා. මට කිසිම දෙයක් මතක නැහැ. හපොයි, පුදුම වැඩක් ! තදින් කල්පනා කරද්දී ඔළුව පුපුරන්න වගේ එනවා. අනිත් අය අමාරුවෙන් පොත් දිහා බලාගෙන පාඩම් එක්ක ඔට්ටු වෙද්දි මම හිනාවෙන කොට එයාලටත් මේ වගේ දැනෙනවාද ? හරිම අමාරුයි, අමාරුයි, හරිම අමාරුයි ! අනේ මගේ ඔළුව වෙනදා වගේ වැඩ කරනවා නම් ! මට බයයි."

"මොකක් හරි අමාරුවක් ද, ඇලිසියා ?" ඩැරල් විභාගය අවසාන දිනයේ දී ඇසුවා. "ඔයාගේ පෙනුම හරි නැහැ."

තමාට කුමන අසනීපයක් තිබුණ ද ඇලිසියා කිසි දින ඒ ගැන මැසිවිලි නැඟුවේ නැහැ. "නැහැ" ඇ කිව්වා. "මට අමාරුවක් නැහැ. මේ විභාගය නිසා වෙන්න ඇති."

විභාගය සඳහා ඇය වාඩි වී සිටියේ ඩැරල්ට යාබදවයි. හිස එස වූ ඩැරල් කෑ ගැසුවා. ඇලිසියා ප්‍රශ්න පත්‍ර මත වැටී සිටියා ! "මිස් විලියම්ස් ! ඇලිසියාට ක්ලාන්තයක් !" ඇ කෑගැසුවා. නේවාසිකාගාර

පාලිකාව කැඳවුණ අතර ඇලිසියා නැවත පියවි සිහියට පැමිණුනා. බියපත් අසාමාන්‍ය පෙනුමකින් යුතු වූ ඇයව අසනීප කාමරයට යැවුණා. ඇගේ ඇඳුම් ඉවත් කළ පාලිකාව පුදුමයෙන් කෑ ගැසුවා.



"ඔයාට සරම්ප, ඇලිසියා. මේ බලන්න මේ බිබිලි - මෙහෙම දෙයක් මගේ ජීවිතේට දැකලා නැහැ. ඔයා මේවා දැක්කේ නැද්ද?"

"ඔව් - දැක්කා. ඒත් මම හිතුවා ආඩිය බිබිලි කියලා." මඳ සිනාවක් නැගීමට උත්සාහ කරමින් ඇලිසියා කිව්වා. "ඕ, මේට්‍රන් - සරම්ප නම් කමක් නැහැ. මම හිතුවේ ඇත්තටම මේ සතියේ මගේ මොළයට මොනවා හරි වෙලා කියලා. මම මෝඩ වෙන්න වගේ ආවා. මම හුඟාක් බය වුණා."

ඇඳට නැග තම වේදනාකාරී හිස සිසිල් කොට්ටා මත සතපවා විවේක ගැනීමට ලැබීම ගැන ඇලිසියාට මහත් සහනයක් දැනුණා. ඇයට අසනීප ගතියක් දැනුණ ද සතුටින් යුතු වුණා. එම අභාග්‍ය සම්පන්න සතියේ ඇයට වැලඳී තිබුණේ සරම්ප ! ඇගේ මොළය අවුල් වී හෝ ඇය මෝඩියක් වී තිබුණේ නැහැ. ඇයට වඩා දුර්වල අයට සරදම් කර සිනාසීම නිසා එය ඇයට ලැබුණ දඬුවමක් නොව ඒ සරම්ප වැලඳීමක් පමණයි.

මේ සිතුවිල්ලත් සමග නින්දට වැටුණු ඇලිසියාගේ සිරුරේ උෂ්ණත්වය පහළ යන්නට වුණා. අවදිවන විට ඇයට මහත් සුවයක් දැනුණා. ඇගේ හිස ද බොහෝ සේ සුවපත්ව තිබුණා.

"මේ සතියේ, ඔයාව බලන්න කවුරුවත් එන එකක් නැහැ, ඇලිසියා." අසනීප කාමරය භාර කන්‍යා සොහොයුරිය කිව්වා. මේ වන විට නේවාසිකාගාර පාලිකාව ආපසු පාසල බලා පිටත්ව ගොස් තිබුණා. "තනියම කල්පනා කර කර ඉන්න වෙන්නේ !"

ඔව්, ඇයට හුදෙකලාව කල්පනා කරන්න සිදුවුණා. කෙසේ වෙතත් ඇගේ මොළය දුර්වල වීමට හෝ ඇය අනුවණ වීමට යන්නේ නැහැ. ඇයට වඩා දුර්වල අයට අවඥා සහගත ලෙස කවටකම් කිරීම ලැජ්ජාවට කරුණක්. ඉතාම අමාරු ප්‍රශ්න පත්‍ර කර අසමත්වීම දුකට කරුණක්. නැවත වතාවක් පාසල් සහතික පත්‍ර විභාගය සඳහා පෙනී සිටීමට ඇයට සිදුවනු ඇත. කොතරම් අභාග්‍යයක් ද ?

ඇගේ සිරුරින් අසනීපය පහව යන්නට වන අතරම ඇගේ හිස සැහැල්ලුව මනස නැවත යථා පරිදි වැඩ කරන බවක් ඇයට හැඟුණා. "හොඳයි - මට වුණේ හොඳ පාඩමක්. මම නම් ආයේ කවදාවත් නපුරු වෙන්නේ නැහැ. ඒත් මම අවංකවම දැන ගෙන හිටියේ නැහැ දුර්වල මොළයක් තියෙන එක මොනවගේ ද කියලා. දැන් මම දන්නවා. ඒක හරි භයානකයි. ජීවිතය පුරාම දුර්වල මොළයක් තියෙන අතරේ ඒක වෙනස් කරන්න බැහැ කියලා දැන ගන්න එක ගැන හිතා ගන්නවත් බැහැ. ආයෙත් නම් මම අනිත් අයට ඔච්චම් කරන්නේ නැහැ. මට මේක මතක තියෙන කාලයකට එහෙම කරන්නේ නැහැ. ඒක මගේ නරක පුරුද්දක්." ඈ තනිව සිතුවා.

සැබැවින්ම එය එසේ වුණා. තමාට වෙනස් වීම ඉතා අමාරු බව ඇලිසියාට වැටහෙන්නට වුණ ද මේ වන විට ඇය පළමු වැදගත් පියවර අරගෙන තිබුණා. තමා තුළ වෙනස් කිරීමට යමක් ඇති බව ඈ අවබෝධ කරගෙන තිබුණා. නැවත ඇය එතරම් සැර පරුෂ නොවනු ඇත.

අන්තිමේදී විභාගය හමාර වුණා ! දැරියෝ උමතු සතුටකින් හැසිරෙන්නට වූ අතර ගුරුතුමියෝ එයට අවසර දුන්නා. පිහිණුම් තටාකය පිරී සෝෂාකාරී වුණා. ටෙනිස් පිටියේ ආධිපත්‍ය පැතිරෙව්වේ හතර පන්තියේ දැරියෝයි. දිනයේ හැම පැයකම අයිස්ක්‍රීම් හා සිසිල්

බීම ඉල්ලා මුළුතැන්ගෙයි කාර්යමණ්ඩලයට කරදර කෙරුණා. ඇරියන් සිනා මුසුව ගී ගයමින් තැන තැන සැරිසැරුව අතර නිතර ඇඹුල් කර ගත් මුහුණින් යුතු මම්සලී රොජර් පවා විහාගයෙන් පසුව ඔවුන්ගේ සතුට දැක සිනාමුසුව පසු වුණා.

කෙසේ වෙතත් ගොන්ඩොලින්ට සතුටක් තිබුණේ නැහැ. ශ්‍රේලින් මහත්මිය ඇගේ පියාගේ උපදෙස් බැරෑරුම් ලෙස පිළිගෙන තිබූ අතර ග්වේන්ට වැඩිපුර ක්‍රීඩා හා ඇවිදීම ලැබුණා. එමෙන්ම මින් පෙර කවදාවත් නැති පරිදි වැඩිපුර පිහිනීම. එහෙත් මැසිවිලි නැඟීමේ හෝ කන් කෙඳිරිගෑමේ පළක් තිබුණේ නැහැ. මේ සියල්ල තමාට උදා කර ගත්තේ ඇයමයි. එය අන් කවරෙකුගේවත් නොව ඇගේම වරදයි.

# 20

"වාරයේ ඉතිරි ටිකේ අපිට හොඳ කාලයක් එයි." සතුටට පත් ඩැරල් කිව්වා. "පාඩම් කරන්න නැහැ. අපි හොඳට උත්තර ලියලා කියලා මිස් විලියම්ස් කියන නිසා තවත් සූදානම් පන්ති නැහැ. අපිට විනෝද වෙන්න පුළුවන් !"

"මේ වාරයේ හුඟාක් අපූරුවට අවසාන වෙන්න පුළුවන්." සැලී කිව්වා.

"ඇලිසියා ආපහු ආවාට පස්සේ තවත් අපූරු වෙයි."

වාරය හුඟාක් අපූරුවට අවසන් වේ යැයි සැලී කීවද එය ඇයට වැරදුන තැනක්. ඒ ඊළඟ දිනයේම කොනීගේ සිද්ධිය ආරම්භ වීම නිසයි.

එය ආරම්භ වූවේ ඉතා සුළුවෙන්. මකන කෑල්ලක් නැතිවීම. එක් පිටුවක් අතුරුදහන් වීම නිසා රචනාවක් දෝෂ සහිත වීම. සමහර විට පිටුවක් ඉරා දමා ඇති බව පෙනෙන්නට තිබීම. සමහර විටක කොනීගේ සපත්තු පටියක් නැතිවීම වැනි දේවලින්.

මුලදී කිසිවෙක් ඒ ගැන සැලකිල්ලක් දැක්වූවේ නැහැ. කෙසේ හෝ යම් යම් දේ අතුරුදහන් වුවද ඒවා ඉතා හාස්‍යජනක ස්ථානවලින් මතුවී පෙනුණා. එමෙන්ම පොත්වල පිටු ඉරා දැමුණ අතර සපත්තු පටි අතුරුදහන් වීම සිරිතක් වුණා.

එහෙත් කොනීගේ සිද්ධිය එතැනින් අවසන් වුණේ නැහැ. කිසියම් දෙයකින් කොනී නිතරම කරදරයට පත් වුණා. "ඔන්න දැන් මගේ ප්‍රංශ කවි පොත නැති වෙලා !" ඈ මැසිවිලි නැඟුවා. "මැහුම් පෙට්ටියේ තිබුණ නූල් පන්දුව නැහැ." හැම විටම එකක් හෝ අනෙකක් !

"ඒත් කොනී - ළඟකදී ඉඳලා ඔයාට මේ වගේ මොනවා හරි සිද්ධ වෙන්නේ ඇයි ?" ව්‍යාකූල වූ ඩැරල් ඇසුවා. "මට තේරෙන්නේ නැහැ. කවුරු හරි ඔයාට හිරිහැර කරනවා වගේ. ඒත් කවුද ? අපි කවුරුවත් මේ වගේ මොට්ට තකතීරු වැඩ කරන්නේ නැහැ. පළමු පන්තියේ අයත් පිළිකුල් කරන දේවල් !"

කොනී තම හිස වැනුවා. "කවුරු කරනවාද කියලා මටත් හිතා ගන්න බැහැ." කොනී කිව්වා. "ඒත් කවුරු හරි කරනවා. මේ විදිහට දිගටම අතපසුවීම් වෙන්න බැහැ. ඒ තරමට හුඟාක් දේවල්."

"මේ ගැන මොනවාද හිතන්නේ, රූත්." ඩැරල් ඇසුවා. ඒත් පළමුව පිළිතුරු දුන්නේ කොනී.

"ඕ, රූත්ටත් හිතා ගන්න බැහැ ඒ කවුද කියලා. නිවුන් අය හුඟාක් එකිනෙකාට බැඳිලා නිසා එයත් දුකෙන් ඉන්නේ. මගේ දේවල් නැති වුණාම එයාගේ දේවල් මට දෙනවා."

"හරි, ඒත් මේක ඇත්තටම අමුතු දෙයක්." ඩැරල් කිව්වා. "මේ ගැන මමත් හුඟාක් කනගාටු වෙන්නේ මේක හතර පන්තිය නිසා. මේ වගේ දේවල් සිද්ධ වෙන්න බැහැ."

දැරියන් කොනීගේ සිද්ධිය ලෙස හැඳින් වූ මේ දෙය ගැන ඔවුන් ව්‍යාකූලව ඒ ගැන කතා බහ කළා. එක් කෙනෙක් හෝ දෙන්නෙක් මේවාට ගොන්ඩොලින්ගේ සම්බන්ධයක් ඇතිදැයි සැකයෙන් බැලුවා.

"ඔයාලට මතක නැද්ද කොනී ග්වේන්ගේ පපුවේ අමාරුව ගැන කතා කරපු හැටි. අර එයා බොරු පපුවේ අමාරුවක් ගත්ත දවස්වල?" ඩැෆනි ඇසුවා.

"අනික දන්නවානේ, මීට ඉස්සර ග්වේන් ඔය වගේ කපටිකම් කරලා තියෙනවා. මතක නැද්ද ? අපි දෙවැනි පන්තියේ ඉද්දි එයා මේරි ලෝව්ට කරපු දේවල්."

"එක වැරැද්දක් කරපු පළියට එයාටම අපහාස කරන්න එපා." ඩැරල් තාලයකට කිව්වා. "ග්වේන් මේ වගේ කරපු එක ඇත්ත වුණාට එයා ඒකට අහු වුණාට පස්සේ ආයෙත් ඒ දේම කරනවා කියලා අපට චෝදනා කරන්න බැහැ. දෙවියන්ගේ නාමෙට, තීරණයකට එන්න ඉස්සර ටිකක් හිතලා බලන්න."

"ඔන්න, නායිකාවක් කතා කරනවා." අයිරින් කිව්වා.

ඩැරල් ලැජ්ජාවේ රතු වුණා. "මම නායිකාවක් නොවෙයි." ඈ කිව්වා. "එහෙම වුණා නම් තමයි හොඳ. ඒත් ඇත්තටම, මේක හරි අමුතු දෙයක්. මේ වැඩේ අනික මොට්ට වැඩක්. ඔයාලා දන්නවාද, කොනීගේ තීන්ත කුප්පියට කඩදාසි ගුලියක් ඔබලා අද උදේ"

"අපොයි !" බෙලින්ඩා කිව්වා. "හරිම කැතයි."

"ඔව්, හුඟාක් දේවල් කැත වගේම නීච වැඩ. අනික පලකට නැති දේවල්." ඩැරල් කිව්වා. "ඔයාලට හිතෙන්නේ නැද්ද මේක මීට වඩා දරුණු වෙයි කියලා ? මම කියන්නේ කැත වැඩ කරලා දරුණු වැඩ කරන එක නවත්වන්න ඕනෑ කියන එක ?"

"එහෙම වෙන්නේ නැහැ කියලා අපි හිතමු." මෙල්විස් කිව්වා. "මෙන්න නිවුන්නියෝ එනවා. හලෝ කොනී, මොනවාද අලුත් දේවල්?"

"තියෙනවා - කවුරු හරි මගේ ජැකට් එකේ මිට කපලා." කී ඈ එය ඔවුන්ට දැක්වූවා. "හරියටම මම අල්ලන තැන. කැතයි, නේද?"

"ඔයා මගේ එක ගන්න, කොනී. මම කිව්වනේ." මහත් දුකට පත්ව සිටි රූත් කිව්වා. "ඔයා මගේ ඕනැම එකක් ගන්න."

"මම දන්නවා රූත්, ඒත් ඔයාගේ දේවලුත් නැති වෙන්න ගත්තොත් ?" කොනී කිව්වා. "මට හැම දේම එපා වෙයි."

"මේක නම් හරිම හරි අමුතුයි." කී අයිරින් තමා සොයාගත් අලුත් තනුවක් ගයන්නට වුණා. "ටූටි-ටූ-ටි-ටූ-ටී !"

මෙල්විස් ඒ අනුව ගායනා කළා. "මේක - හරිම -අමු -තුයි- මේක හරිම - අමු - තුයි !"

"මේ" ඩැරල් කතා කළා. "ඔයාගේ කට හඬ හරි යනවා ! ඔය විදිහටම තමයි ඔයා ඒ දවස්වල සිංදු කිව්වේ. ඇත්තටම, මෙල්විස්!"

"ඔව්" මෙල්විස් කිව්වා. ඇගේ මුහුණ සතුටින් රතු වුණා. "මම තනියම ඉද්දි උත්සාහ කරලා බැලුවා. ඒත් වෙනදා වගේම නැහැ. මම සිංදුවක් කියන්නම්. එතකොට ඔයාලට කියන්න පුළුවන් හරියටම මගේ කට හඬ ඇවිදින්ද කියලා."

පහළ පන්තිවලදී ගායනා කරන ගීතයක් ඈ ගායනා කළා. ඔව්, එහි සැකයක් නැහැ. මෙල්විස්ගේ ඉතාම සුන්දර බලවත් කට හඬ නැවත ආපසු ඇයට ලැබී තිබෙනවා, වෙනදාටත් වඩා හොඳින්. මෙවර එම කට හඬ ලැබී තිබුණේ පෙරදී මෙන් වැදගැම්මකට නැති අයෙකුට නොව යහපත් දැරියකටයි !

"අපිට ආයෙත් ඇහෙන්න පටන් ගනියි ඔයා කියනවා. 'මම ඔපෙරා ගායිකාවක් වුණාම සිංදු කියන්නේ රෝමයේයි, නිව්යෝර්ක්වලයි' කියලා" ඩැරල් පටන් ගත්ත නමුත් මෙල්විස් හිස වැනුවා.

"නැහැ, එහෙම වෙන්නේ නැහැ. දැන් මම ඒ වගේ කෙනෙක් නොවෙයි නේද ? එහෙම කෙනෙක් නොවෙයි කියලා කියන්නකෝ."

"නැහැ, ඔයා එහෙම නැහැ." සෑම කෙනෙක්ම කිව්වේ සෑම කෙනෙකුම ඇයට ඇලුම් කරන බව පෙන්වීමටයි.

ඩැරල් ඇගේ පිටට තට්ටු කළා.

"මට සතුටුයි මෙල්විස්. මේ කොනීගේ විකාර සිද්ධිය නොතිබුණා නම් තවත් සතුටුයි. ඊළඟ වාරයේ ඉඳලා ඔයාට ගායනා පන්තියට යන්න පුළුවන් වෙයි."

දිනකට දෙකකට කොනීගේ සිද්ධිය අවසාන වී තිබුණ බවක් පෙනුණා. තව දුරටත් අමුතු සිදුවීම් ගැන කොනී වාර්තා කළේ නැහැ. නමුත් ඊළඟට ඈ දෙනෙත් කඳුළින් පුරවා ගෙන පොදු කාමරයට පැමිණියා.

"බලන්න" කී ඈ ඇගේ අශ්වයින් පදින කසය ඔසවා පෙන්නුවා. එය ඇය තරගයකදී දිනා ගෙන තිබූ එකක් වූ අතර ඒ ගැන ආඩම්බරයෙන් යුතුව සිටියා.

දැරියෝ හිස් ඔසවා බැලුවා. කවුරුන් හෝ එය දෙකට වෙන් වන තරමටම කපා තිබුණා. "අද හවස මම මේක අශ්වයෝ පදින්න අරගෙන ගියා." කොනී සැලෙන කටහඬින් කිව්වා. "ආපසු ඇවිදින් මම අශ්වයාව ඉස්තාලයට අරගෙන ගියා...."

"ඔයා අශ්වයෝ දෙන්නෙක් අරගෙන ගියා." විල් කිව්වා. "ඔයාගෙයි, රූත්ගෙයි අශ්වයෝ, මම දැක්කා."

"මම අශ්වයෝ දෙන්නාම ඉස්තාලයට අරගෙන ගියා." කොනී කිව්වා. "මම කසය එතන අලා ආවා. මම ඒක ආපහු ගන්න යද්දි මෙහෙම සිද්ධ වෙලා තිබුණේ !"

"කවුරුවත් ඉස්තාලයේ හිටියද ?" ඩැරල් ඇසුවා.

"නැහැ, කවුරුවත්ම හිටියේ නැහැ. විල් ඉඳලා තිබුණා. ෆෙලිසිටියි, ජූනුයි ඉඳලා තිබුණා. මම හිටියේ රූත් එක්ක. වෙන කවුරුවත් නැහැ."

"හොඳයි, ඒ අයගෙන් කෙනෙක් තමයි මේක කරන්න ඇත්තේ." ඩැරල් කිව්වා. "ඒත් අවංකවම එයාලා කරයි කියලා මට හිතන්න බැහැ. රූත්වත්, විල්වත් කරන්නේ නැහැ. මගේ නංගි ෆෙලිසිටි ඒ වගේ දෙයක් හිතන්නේවත් නැහැ. කපටි හෙර, ජූන්ට, මම කොයි තරම් අකමැති වුණත් මට හොඳටම විශ්වාසයි එයා මේ වගේ දෙයක් කරන්නේ නැහැ."

සෑම කෙනෙක්ම ව්‍යාකූල වුණා. කාමරයෙන් පිටව ගිය රූත් ඇගේ කසය රැගෙන ආපසු පැමිණියා. එය ඉතා කදිම එකක්.

"ඔයා මේක ගන්න, කොනී" ඇ කිව්වා. "මටත් හරි දුකයි සිද්ධ වෙන දේවල් ගැන. ඔයා මේක ගන්නම ඕනැ."

"බැහැ, බැහැ," කොනී කිව්වා. "රබර් කෑල්ලක්, සපත්තු පටියක් නම් ගන්න තිබුණා. ඒත් ඔයාගේ ලස්සන කසය එපා."

එදින සැඳෑවේ ඩැරල් හිටියේ විල් සමග හුදෙකලාවයි. ඇ තැවුලටත්, ව්‍යාකූලත්වයටත් පත්ව සිටියා. "විල්" ඇ කතා කළා. "අද හවස නිවුන්නියෝයි, ඔයයි හැර වෙන කවුරුවත් ඉස්තාලයේ හිටියේ නැහැ කියලා ඔයාට විශ්වාස ද ? මම කියන්නේ - හොඳයි - ගොන්ඩොලින් ඒ හරියේ හිටියේ නැහැ, නේද ?"

"නැහැ," විල් කිව්වා.

"මම කැමති නැහැ, එහෙම අහන්න." ඩැරල් කිව්වා. "ඒත් මේක ග්වේන් කරන ජාතියේ වැඩක්."

"අපිට එයා ගැන එහෙම හිතන්න වෙන්නේ එයාගේම වරද නිසයි." විල් කිව්වා.

"ඇයි කොනී, රූත්ගේ අශ්වයාව පිරිසිදු කරන්නේ ?" ඩැරල් ඇසුවා.

"රූත් ඒ තරමම කම්මැළි ද ? එයා හැම දෙයක්ම කොනීට කරන්න ඉඩ හරිනවා !"

"නැහැ. එයා කම්මැළි නැහැ." විල් කිව්වා. "එයා ටිකක් අමුතුයි, මම හිතන්නේ කොනීගේ හෙවණැල්ල ! හරි, මම දැන් ගිහින් තන්ඩර්ට සූකිරි කෑල්ලක් දෙන්න ඕනෑ. ඩැරල්, පස්සේ හමුවෙමු."

ඩැරල්ට තව දුරටත් කල්පනා කිරීමට ඉඩ හැර ඇය පිටතට ගියා. අමුතු හැඟීමක් ඇගේ සිතට ඇතුළුව තිබුණා. කැබලි අමුණන ප්‍රහේලිකාවක මෙන් ඈ එක් එක් සිද්ධීන් එකට තබන්නට වුණා. කොනීට කර තිබූ අකාරුණික දේවල් සියල්ලම ඇයට සිහි වූ අතර සෑම අකාරුණික දෙයකදී ම කරුණාව දැක්වීමට රූත් කර තිබූ සෑම දෙයක්ම ඇයට සිහිවුණා.

එදින සැඳෑවේ රූත් පිරිනැමූ කසය කොනී ප්‍රතික්ෂේප කරන විට රූත්ගේ මුහුණේ වූ අසාමාන්‍ය පෙණුමත් ඇයට සිහිවුණා.

'බය වුණ, ටිකක් තරහා ගිය පෙනුමක්' ඩැරල් සිතුවා. 'සමාව ගනිද්දී ඒක ප්‍රතික්ෂේප කළ නිසා තරහා ගිය පෙනුමක්.'

එවිට හදිසියේම යමක් ඇගේ සිත තුළ ඉස්මතු වී කොනීට මෙම සියලුම අශෝභන දේවල් කළ අධම තැනැත්තිය කවුරු විය හැකිදැයි යන්න ඇයට පෙනුණා.

"මම මේකට මොකද කරන්නේ ?" ඈ තැවුණා. "මට මේ ගැන කා එක්කවත් කියන්න බැරි මම වැරදි නම් එහෙම. ඒත් මේක නවත්වන්න ඕනෑ. වෙන කෙනෙක් මේකට මැදිහත් කරගෙන විසඳන්න යන්න මට බයයි. ඒත් මම කරන්න ඕනෑ. මේක බරපතලයි."

නැඟිට ගත් ඈ රූත් සොයා ගෙන ගියා. ඔව්, ඇයට අවශ්‍ය වුණේ රූත්වයි. ඇයට අල්ලා ගැනීමට අවශ්‍ය වුණේ රූත්වයි.

## 21

රූත් කොහි ද ? ඇය පොදු කාමරයේ හෝ නිදන කාමරවල හෝ පන්ති කාමරයේ හෝ සිටියේ නැහැ. ඇය කොහි විය හැකි ද ?

'කවුරුවත් රූත්ව දැක්කා ද ?" සොයා යන ගමනේදී ඩැරල් හමු වන සෑම දැරියකගෙන්ම විමසුවා. කිසිවෙක් දැක තිබුණේ නැහැ. එහෙත් දෙවැනි පන්තියේ එක් දැරියක් තමා රූත් ගෙවත්තේ මඩුව දෙසට යනු දුටු බව මතක යැයි කිව්වා. ඉස්තාලය අසල තිබූ එය කම්කරු මඩුවයි.

ඩැරල් එදෙසට වේගයෙන් දුව ගියා. කම්කරු උපකරණ තබන මඩුව වෙතට පැමිණි ඈ තමා කුමක් කිව යුතුදැයි සිතා ගැනීමට දොර අසල නැවතුණා.

ඇය එතැන සිටගෙන සිටින අතරේ ඇයට අමුතු ශබ්දයක් ඇසුණා. ඒකාන්තයෙන්ම කෙනෙකු මඩුව තුළ සිටියා. එමෙන්ම ශබ්දය යමෙකු කෙඳිරි ගාන කලෙක මෙන් වුණා. හඬ නොනගා දොර තල්ලු කළ ඈ ඇතුළට එබී බැලුවා.

පිටු පස ගෝනි මත වාඩි වී සිටියේ රූත්. ඇගේ අතේ කපා විනාශ කළ අශ්ව කසය තිබූ අතර ඇය එය යථා පරිදි සැකසීමට උත්සාහ කරන බවක් පෙනුණා.

මුලදී ඈ ඩැරල් දුටුවේ නැහැ. ඇතින් මුහුණ වසා ගත් ඈ නැවතත් හඬක් නැඟුවා. කෙඳිරියක් හෝ ඉකියක්. ඩැරල්ට එය තේරුම් ගත නොහැකි වුණා.

"රූත්" ඇතුළට යමින් ඩැරල් කතා කළා. "රූත් ! මොකද මේ?"

බියපත් වූ රූත් වහා නැඟිට්ටා. ඒ ඩැරල් බව දැක ගත් ඈ

නැවත ගෝනි මත වාඩි වී විනාශයට පත් කසය අතෙහි තබා ගෙනම ඉවත බලා ගත්තා.

"රූත්" දැරිය වෙත සෘජුවම යමින් ඩැරල් කතා කළා. "ඇයි ඔයා කොනිගේ ලස්සන කසය කැපුවේ ?"

හදිසියේම රූත් හිස ඔසවා බැලූ අතර ඇගේ මුහුණේ විස්මය හා කෝපය සටහන්ව තිබුණා. "ඔයා මොනවාද කියන්නේ ?" ඈ ඇසුවා. "මම මේක කැපුවේ නැහැ. කවුද කිව්වේ මම කැපුවා කියලා. කවුද එහෙම කිව්වේ, කොනී ද ?"

"නැහැ, කවුරුවත් එහෙම කිව්වේ නැහැ. ඒත් මම දන්නවා ඔයා කළා කියලා." ඩැරල් කිව්වා. "අනික අනිත් හැම නරක දෙයක්ම කළේත් ඔයා, නැද්ද ? අරක මේක ගත්තා, සමහර දේවල් හැංගුවා, කැඩුවා. ඔයාට ගන්න පුළුවන් වුණ කොනිගේ හැම දෙයක්ම."

"තවත් කියන්න එපා." රූත් ඩැරල්ගේ අත තරයේ අල්ලා ගනිමින් ආයාචනා කළා. "අනේ එපා. මම ආයෙත් කවදාවත් එහෙම කරන්නේ නැහැ."

"ඒත් රූත්, ඔයා ඇයි එහෙම කළේ ?" තදින් ව්‍යාකූල වූ ඩැරල් විමසුවා. "ඕනෑම කෙනෙක් හිතයි ඔයා ඔයාගේ නිවුන්නියත් එක්ක තරහයි කියලා."

රූත් කැඩුණ කසයෙන් ගෝනියට පහරක් දුන්නා. මුහුණ බුම්මා ගත් ඈ කතා කළා. "මට එයාව පෙනෙන්න බැහැ. මට එපා වෙලා ඉන්නේ, ඕ, ඩැරල්, මම එයාට ආදරෙයි ඇත්තමයි !"

ඩැරල් මෙයට සවන් දුන්නේ පුදුමයෙන්. "එක සැරේ කෙනෙකුට ආදරය කරන්නයි, ඒ එක්කම එයාට වෛර කරන්නයි පුළුවන් ද ?" ඈ අවසානයේ කිව්වා.

"පුළුවන්." රූත් නපුරු හඬකින් කිව්වා. "ඒක පුළුවන් ඩැරල්. මම කොනිට ආදරේ එයා මගේ නිවුන්නිය හින්දයි. මම එයා එක්ක තරහා මොකද - මොකද කියන්නම් - අනේ මට බැහැ ඒක කියන්න."

රූත්ගේ නැමුණ හිස දෙස බොහෝ වේලාවක් බලා සිටි ඩැරල්ට ඇගේ කම්මුල් දිගේ කඳුළු රූරා වැටෙනු දැක ගත හැකි වුණා. "මට හිතා ගන්න පුළුවන්, මම හිතන්නේ, ඇයි ඔයා කොනී ගැන

ඔය තරම් තරහා කියලා." අවසානයේ ඈ කිව්වා. "එයා ඔයාව යට කරගෙන ඉන්න නිසා ද - ඔයා වෙනුවෙන් හැම දේටම උත්තර දෙනවා, ඔයාටම කරගන්න පුළුවන් දේවල් එයා කරලා දෙනවා, හැම දේටම එයා ඉස්සර වෙනවා. හරියට එයා ඔයාට වඩා අවුරුදු දෙකක් විතර වැඩි මහල් විදිහට හැසිරෙන නිසා ද ?"

"ඔව්." රූත් කීවේ කඳුළු පිස ගනිමින්. "මට හිතෙන දෙයක් කියන්න කවදාවත් ඉඩක් ලැබෙන්නේ නැහැ. කොනී හැම තිස්සේම ඉස්සර වෙනවා. ඇත්තෙන්ම මම දන්නවා එයාට මට වඩා හොඳ ඔළුවක් තියෙනවා කියලා, ඒත්...."

"එයාට හොඳ ඔළුවක් නැහැ." ඩැරල් එක්වරම කිව්වා. "ඇත්තටම එයා ඉන්න ඕනෑ පහළ පන්තියක, හතර පන්තියේ නොවෙයි. මිස් විලියම්ස් එහෙම කියනවා මට ඇහුණා. එයාව ඔයා ඉන්න පන්තියටම දැම්මේ ඔයාලා නිවුන්නියෝ නිසා. අනික ඔයාලගේ අම්මා කියලා තියෙනවා ඔයාලව වෙන් කරන එකට ඔයාලා කැමති නැහැ කියලා. කොනී පන්තියේ වැඩ කර ගෙන යන්නේ ඔයා එයාට හුඟක් උදව් කරන නිසයි !"

නිහැඬියාවක් ඇති වුණා. සෑම දෙයක් ගැනම ඩැරල් නැවතත් කල්පනා කර බැලුවා. මෙය කොතරම් අසාමාන්‍ය ද ! එවිට ඇගේ සිතට ප්‍රශ්නයක් නැඟුණ අතර එක්වරම ඈ එය ඇසුවා.

"රූත්.... ඇයි ඔයා මේ හදිස්සියේම කොනීට නපුරු විදිහට සලකන්න පටන් ගත්තේ. මම දැකලා තියෙන විදිහට ඔයා ඉස්සර එහෙම නැහැ. මේවා හදිස්සියේම පටන් ගත්ත දේවල් වගේ."

"ඒක මට ඔයා එක්ක කියන්න බැහැ." රූත් කිව්වා. "ඒත් අනේ මම ඒ ගැන හරි දුකින් ඉන්නේ."

"හොඳයි, ඔයා කියන්නේ නැති නම් මම ගිහින් කොනීගෙන් අහගන්නම්." නැඟිටිමින් ඩැරල් කිව්වා. "මොකක් හරි ලොකු වැරැද්දක් වෙලා තියෙනවා රූත්. මම දන්නේ නැහැ මට ඒක හරිගස්සන්න පුළුවන්ද කියලා. ඒත් මම හොඳින්ම උත්සාහ කරලා බලනවා."

"කොනී ළඟට යන්න එපා." රූත් අයැදුවා. "එයාට නපුරු වැඩ කළේ මම කියලා ඔයා එයාට කියන්න එපා. එයාගේ දේවල් නැති වෙලා එයා දුකින් ඉන්නවා දකින කොට මටත් හරිම දුකයි.

කෙනෙක් එක්ක තරහා වෙලා එයාව දුකට පත් කරලා ඊළඟට එයාට ආදරෙයි කියලා හිතිලා එයාව සනසන්න උත්සාහ කරන එක හරිම අවාසනාවක්."

"මම හිතන්නේ ඒ නිසා තමයි ඔයා ඔයාගේ දේවල් කොනීට දෙන්නේ" බාල්දියක් මත වාඩි වෙමින් ඩැරල් කිව්වා. "මේක අමුතු වැඩක් ! මුලින් ඔයා නිවුන්නිය එක්ක තරහා වෙලා එයාට රිදවන්න එයා කැමතිම දේවල් කඩලා ඊළඟට එයාට ආදරය නිසා කනගාටු වෙනවා. එයාව සනසන්න ඔයාගේ දේවල් දෙද්දී එයා ඒවා නොගත්තොත් ඔයාට හිතට අමාරුයි වගේ මට පෙනෙන්නේ."

"ඩැරල් - මම කියන්නම් ළඟදි ඉඳලා මම කොනී එක්ක තරහා ඇයි කියලා." රූත් දෑසේ කඳුළු පිස ගනිමින් හදිසියේම කිව්වා.

"මට හිතෙනවා මේ ගැන කාට හරි කියන්න ඕනැ කියලා. හරි, මේක හරිම නරක දෙයක්."

"මොකක්ද ඒක ?" ඩැරල් කුතුහලයෙන් යුතුව ඇසුවා.

"බලන්නකෝ, කොනී මට ආදරෙයි, මාව රැක ගන්නවා, මට හැම දේම කරලා දෙනවා" රූත් කතාව පටන් ගත්තා. "මේ වන තුරු අපි ඉඳලා තියෙන්නේ එකම පන්තියේ. ඒත් මේ විභාගයෙන් අසමත් වෙයි, මම විතරක් සමත් වෙයි කියලා එයා බය වුණා."

"ඒක ඇත්ත" ඩැරල් කිව්වා. "ඇත්තටම කොනී අසමත් වෙනවා!"

"හරි - මම සමත් වෙලා, එයා අසමත් වෙලා එයාට මේ පන්තියේ තනියම ඉඳලා වෙන වාරයකදී එයාට ආයෙත් විභාගය ලියන්න වෙයි කියලා කොනී හිතුවා." රූත් කියාගෙන ගියා.

"ඒ කියන්නේ එයාට මාත් එක්ක තව දුරටත් ඉන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා එයා මට කිව්වා මමත් අසමත් වෙන විදිහට උත්තර නරකට ලියන්න කියලා. එතකොට අපි දෙන්නාට ආයෙත් එකට ඉන්න පුළුවන්නේ."

මෙම ප්‍රකාශයෙන් ඩැරල් කොතරම් පුදුම වී ද යත් ඇයට වචනයක් හෝ කතා කර ගත නොහැකි වුණා. අවසානයේ ඈ කට හඬ අවදි කළා.

"රූත් ! හරි නපුරු වැඩක් ! ඔයාට ලේසියෙන් සමත් වෙන්න

පුළුවන් විභාගයක් එයා ඔයාව අසමත් කරනවා නම් එයා ඔයාට ආදරය කරනවා වෙන්න බැහැ."

"ඕ, එයා මට ආදරෙයි- හුඟාක් !" රූත් කිව්වා. "කොහොම වුණත්, මම කිව්වා මම නරකට උත්තර ලියනවා කියලා. කොහොම හරි, මොන තරම් අමාරු දෙයක් වුණත් කොනී කියනවා නම් මට නොකර ඉන්න බැහැ. මේ වගේ නරකම දෙයක් වුණත් කරන්න දෙයක් නැහැ. ඉතින් මම හරියට උත්තර ලිව්වේ නැහැ. ඊට පස්සේ තමයි මට කොනීව එපා වුණේ. මේ කරපු දේ නිසා ඊළඟට මම පටන් ගත්තා එයාට රිදවන්න !"

අසරණ රූත් දෑතින් මුහුණ වසාගෙන ඉකි බිඳින්න පටන් ගත්තා. නැඟිට ගත් ඩැරල් ඇය පසෙකින් ගෝනිය මත වාඩි වී ඇගේ ශක්තිමත් අතක් රූත්ගේ උරහිස වටා දමා ගත්තා.

"මට තේරෙනවා." ඈ කිව්වා. "මේක අමුතු අසාමාන්‍ය දෙයක් වුණාට තේරුම් ගන්න පුළුවන් දෙයක්. මේ හැම දේම ඔයාලා නිවුන්නියෝ නිසා, මම හිතන්නේ. කොනී ඔයාගේ අක්කා වුණා නම් මේක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ ! සාමාන්‍ය අක්කලා නංගිලා වගේ ඔයාලා ආදරෙන් ඉන්න තිබුණා. එතකොට ඔයාලා වෙනම පන්තිවල ඉන්න නිසා මේ වගේ දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. දැන් දුක් වෙන්න එපා රූත්. මේක ඔයාට ලොකු වදයක් හිරිහැරයක් වුණත් මට තේරුම් ගන්න පුළුවන් සිද්ධ වුණ දෙය."

ඩැරල්ගේ සරල කරුණු දැක්වීම නිසා සහනයට පත් රූත් හිස ඔසවා බැලුවා.

"ඩැරල්, අනේ මේ දේවල් කළේ මම කියලා කොනීට කියන්න එපා." ඈ කිව්වා. "මේවා කළ එක ගැන මම හුඟාක් දුක් වෙනවා. එයාට මේවා තේරෙන්නේ නැති නිසා හුඟාක් දුක හිතෙයි. එතකොට මට ඒක දරා ගන්න බැහැ."

"ඔව්, ඔයාට දිගටම මෙහෙම ඉන්න බැහැ. කොනීට යටත් වෙලා එයාගේ හෙවණැල්ල වගේ ඉන්න." ඩැරල් කල්පනාකාරී ලෙස කිව්වා. "අපි ඒක එයාට තේරුම් කරලා නොදී මේක නවත්වන්න ක්‍රමයක් මට පෙනෙන්නේ නැහැ. ඔයා කැමති නම් මමත් ඔයා එක්ක එන්නම්."

එහෙත් ඩැරල් මෙසේ කියන විට රූත් වඩාත් ඉකි ගසන්නට වූ හෙයින් ඇයට එම අදහස අත හැර දැමීමට සිදු වුණා. ඇතින් සීනු නාදයක් ඇසුණ අතර ඇ නැඟී සිටියා. "ඔයා ගිහින් මුහුණ සෝදා ගන්න." ඈ කාරුණිකව කිව්වා. "මේ ගැන කොනීට නොකියා බේර ගන්න ක්‍රමයක් ගැන මම හිතන්නම්. ඒත් අමාරු වැඩක් වෙයි."

හුස්ම ඉහළට අදිමින් රූත් පිටව ගිය ද ඈ මහත් සහනයට පත්ව සිටියා. ව්‍යාකූල වූ සෑම විටකම කරන පරිදි ඩැරල් තම නාසය තදින් ඇතිල්ලුවා. 'කරන්න තියෙන්නේ එක දෙයයි.' ඈ සිතුවා. "මිස් විලියම්ස්ට කියන්න ඕනැ. මොනවා හරි දෙයක් කරන්න වෙනවා!"

එලෙස, එදින සැන්දෑවේ, රාත්‍රී ආහාරයට පසු, තමා හමුවීමට අවශ්‍ය බව කියමින් ඩැරල් තම දොර අසල සිටිනු දුටු විලියම්ස් ගුරුතුමිය පුදුමයට පත් වුණා. තමාව නැවත පන්ති නායිකා තනතුරෙහි පිහිටුවන ලෙස අයැදීමට ඩැරල් පැමිණ ඇතිදැයි ඈ සැක කළා. එහෙත් කාරණය එය නොවෙයි.

ඩැරල් නිවුන්නියන්ගේ අසාමාන්‍ය කතන්දරය දිග හැරියා. මහත් මවිතයකින් විලියම්ස් ගුරුතුමිය සවන් දුන්නා. අදාළ දැරියන් දවස පුරා තම ඇල්ම බැල්ම යටතේ සිටිය ද පාසලේ සිදුවන, කිසිවෙකු නොදන්නා දේවල් !"

"ඉතින්, තේරෙනවානේ මිස් විලියම්ස්" ඩැරල් කතාව හමාර කළා. "රූත්ට මේ ගැන කොනී එක්ක කතා කරන එක දරා ගන්න බැරි නම්, තත්ත්වය වෙනදා වගේම නරක විදිහට තියෙයි ! දෙන්නාම විභාගය අසමත් වෙයි. දෙන්නා ඉහළ පන්තියකට නොගිහින් හතර පන්තියේම නවතියි. ඒ වගේම කොනී හැමදාම අහිංසක රූත්ව යටකර ගෙන ඉඳියි. රූත් කොනීට ආදරය කරනවා වගේම වෛර කරයි. මේක හරිම භයානක දෙයක්."

'හරිම භයානකයි.' විලියම්ස් ගුරුතුමිය සිතුවා. 'හරිම භයානකයි. මොකද මේ වගේ දේවල් හුඟාක් බරපතල වෙන්න පුළුවන් ! විලියම්ස් ගුරුතුමිය මේ බව ඩැරල්ට කීවේ නැහැ. ඩැරල් වාඩි වී උනන්දුවෙන් බලා සිටියේ යම් උපදෙසක් ලැබෙන තුරුයි.

"ඩැරල්, මේ වගේ දෙයක් හොයා ගත්ත එක ඔයාගේ දක්ෂකමක් කියලයි මම හිතන්නේ." විලියම්ස් ගුරුතුමිය අවසානයේ

කිව්වා. "ඒ වගේම මෙතැනදි ඔයා ඉතාම ඥානවන්ත විදිහට වැඩ කරලා තියෙනවා. මට ඇත්තටම ඔයා ගැන හුඟාක් සතුටුයි."

ඩැරල් රතු වූ මුත් සතුටින් යුතු වුණා. "මේක නිරාකරණය කරන්න ක්‍රමයක් හොයන්න පුළුවන් ද ?" ඈ ඇසුවා. "ඕ, මිස් විලියම්ස්, රූත් වැරදියට උත්තර ලියපු එක පව් වැඩක්, නේද ? එයා එහෙම නොකළා නම් මේක ඉබේම විසඳෙන්න තිබුණා. දෙන්නා වෙනම පන්ති දෙකකට වැටෙනවා."

"ඩැරල්" මොහොතක් කල්පනා කළ විලියම්ස් ගුරුතුමිය කතා කළා. "මම දැන් කියන්න යන දේ අපි දෙන්නා අතර විතරයි. උත්තර පත්තර යවන්න ඉස්සර මම ඒ සෑම එකක්ම උඩින් පල්ලෙන් බැලුවා. රූත් හිතන තරමටම එයා නරකට උත්තර ලියලා තිබුණේ නැහැ ! ඇත්තටම, මට හුඟාක් දුරට විශ්වාසයි එයා යම්තම් හරි සමත් වෙයි කියලා."

"ඕ, හොඳයි !" ඩැරල් සතුටින් කිව්වා. "මට එහෙම හිතුණේ නැහැ. එහෙම නම්, කොහොම හරි ඊළඟ වාරයේ ඉඳලා ඒ දෙන්නා පන්ති දෙකකට වැටෙයි !"

"මම එහෙම හිතනවා." විලියම්ස් ගුරුතුමිය කිව්වා. "ඒකෙන් රූත්ට අවස්ථාව ලැබෙයි කොනීගේ හෙවණැල්ල නොවී තමාගේම දෙපයින් හිටගෙන තමාගේම පෞරුෂයක් වර්ධනය කර ගන්න. එතකොට කොනීට නවත්වන්න වෙයි රූත්ව පාලනය කරගෙන ඉන්න එක. මේ හැම දෙයක්ම ඉබේම ක්‍රම ක්‍රමයෙන් සමථයකට පත්වෙයි. මේ අමුතු සිද්ධියේදී සිදුවෙන්න ඕනැ හොඳම දෙය ඒකයි."

"එතකොට කොනී කිසි දෙයක් දැන ගන්න එකක් නැද්ද ?" ඩැරල් ඇසුවා. "එයාට මේ ගැන කියන්න ඕනැ නැද්ද ?"

"ඒක රූත්ගේ වැඩක්. ඒක ගැන වෙන කවුරුවත් වද වෙන්න ඕනැ නැහැ." විලියම්ස් ගුරුතුමිය කිව්වා. "කවදා හරි දවසක, නියම වේලාව ආපුවාම, එයා මේ ගැන කොනී එක්ක ඇත්ත කතා කරයි. සමහර විට එයාලට මේ දේවල් ගැන හොඳටම හිනා යයි. ඔයා රූත් ගැන ඇහැ ගහගෙන ඉන්න ඩැරල්. මේ වාරයට තව ටික දවසයි තියෙන්නේ. එයා දැන් ඔයාගේ විශ්වාසය දිනාගෙන ඉන්න නිසා ඒ දෙන්නා අතර අවුලක් ඇති නොවෙන්න වග බලා ගන්න මම ඔයාට පවරනවා."

"හොඳයි මම බලාගන්නම්." මේ ඉල්ලීම ගැන සතුටට පත් වැරල් කිව්වා. "ඒකට මම කැමතියි. මම රූපෙට කැමතියි."

"ඒ වගේම වැරල්, තව දවස් දෙකකින් මම ඔයාව නැවත පාසැලට හැරියට ගත් කරනවා." විලියම්ස් ආචාර්යතුමිය කිව්වා. "මම එතකොට මම ඔයා ගැන බොහොමයි ආඩම්බර වෙනවා."

# 22

දින දෙකකට පසුව, විලියම්ස් ගුරුතුමිය තම ශාන්ත කට හඬින් ඩැරල් නැවතත් පන්තියේ නායිකාව ලෙස පත් කරන බව නිවේදනය කරන විට සෑම දෙනාම මහත් සතුටට පත් වුණා. "මේ තනතුරේ තාවකාලිකව කටයුතු කළාට ඔයාට බොහෝම ස්තුතියි." ඇ සැලීට කිව්වා. "මම අවබෝධ කර ගත්තා ඩැරල් නැවතත් මේ තනතුරට පත් කරන්න සුදුසුයි කියලා."

"ඇයි, ඩැරල් ? ඇයි මිස් විලියම්ස් ඔයාව ආයෙත් මේ සතියේ නායිකාව කළේ ?" බෙලින්ඩා මෙන්ම සෙසු අය ද පන්තියට පසුව ඇසුවා. එහෙත් ඩැරල් ඔවුන්ට කිසිවක් කීවේ නැහැ. විලියම්ස් ගුරුතුමිය ද ඒ ඇය නිවුන්නියන්ගේ ආරවුල සමථයකට පත් කිරීමට උත්සාහ කළ නිසා බව ඔවුන්ට කියා තිබුණේ නැහැ. එහෙත් ඩැරල් දැන සිටියා හේතුව එය බව. ඇය සැබැවින්ම වගකිව යුතු පන්ති නායිකාවක ලෙස කටයුතු කර තිබුණා.

තව දුරටත් නපුරු දේවල් කොනීට සිදු නොවූ අතර දැරියන් කොනීගේ සිද්ධිය ලෙස හැඳින්වූ එම කාරණය අමතක වුණා. රූත් තම නොකැමැත්ත හා අමනාපය අමතක කර ඇති බවක් පෙනුණ අතර ඇ කොනීට තවත් දයාබර වුණා. 'ඊළඟ වාරයේ' ඩැරල් සිතුවා 'හැම දෙයක්ම හරි යයි, එයාලා වෙනම පන්තිවල ඉඳියි. රූත් හරියයි. එයාට ඔළුව පාවිච්චි කරලා ඉස්සරහට යන්න පුළුවන්. කොනීට තමන්ගේ පාඩුවේ වැඩ කර ගෙන රූත්ගෙන් ඈත් වෙලා ඉන්න පුළුවන්.'

වාරය ඉක්මනින් ගෙවී යන්නට වුණා. ඇලිසියා සුවපත් වූ අතර වාසනාවට මෙන් අන් කිසිවෙකුට ඇගෙන් සරම්ප බෝ වුණේ නැහැ. හතර පන්තියේ දැරියෝ බොහෝ දෙනෙකුට ඒ වන විටත් රෝගය වැළඳී තිබූ නිසා එය වාසනාවක් වුණා. තමා අසමත් බව

ඒකාන්තයෙන් දැනගත් ඇලිසියා නැවත පාසල් සහතික විභාගයට වාඩි වීමට සිදුවන නිසා කෙඳිරි ගෑවා.

නිවාඩුවට සතියකට පෙරයි ඇය ආපසු පන්තියට ඒමට නියමිතව සිටියේ. දැරියෝ ඇඩි සොම්නසට පත් වුණා. ඔවුන්ට ඇලිසියාගේ මුබරිකම හා විනෝද ජනක හැසිරීම නැතිව පාළු බවක් දැනී තිබුණා. සමහර විට ඇය ආපසු එන එකට අකමැති වූයේ ගොන්ඩොලින් පමණක් විය හැකියි. අසරණ ග්වේන්! බොහෝ ක්‍රීඩා කිරීම, වැඩිපුර ඇවිදීමට යාම හා පිහිනීම හෝ සෑම දිනකම එසේ කිරීමට උත්සාහ කිරීම නිසා මේ වන විට ඇගේ තරබාරු බව යම් දුරකට අඩුව තිබුණා. එහෙත් සැබැවින්ම ඇයට නිරෝගී පෙනුමක් තිබුණ අතර සිරුර පැහැපත් වී තිබුණා.

දිනක් දන්ත වෛද්‍යවරයා හා අක්ෂි වෛද්‍යවරයා හමු වීමකින් පසුව ආපසු පන්තියට පැමිණි ක්ලැරිසා පන්තිය විස්මය ජනක ලෙස සතුටට පත් කළා. ඈ සම්පූර්ණයෙන්ම වෙනස් රුවක් ගෙන සිටියා. "මට තවත් කණ්ණාඩි දමන්න සිදු වෙන්නේ නැහැ !" ඈ ප්‍රකාශ කළා. "අර විකාර කම්බියත් මගේ දත්වලින් ගලවලා දැම්මා. මාව දැන් අඳුරන්න පුළුවන් ද, ළමයි ?"

"අමාරුයි !" ඩැරල් කී අතර බෙලින්ඩා පැන්සල අතට ගත්තේ මෙම වෙනස් වූ ඉතාම සුන්දර ක්ලැරිසාව සිතුවමට නැඟීමටයි !

ඈ දැරියන් ඉදිරියේ සිටගෙන සිනාසෙමින් සිටියා. ඇගේ ගැඹුරු කොළ පැහැ දෙනෙත් දීප්තිමත්ව පන්තිය වටා ගිය අතර ඇගේ සුදුවන් දත් දෙපළ තවදුරටත් අවලස්සන කම්බියකින් වැසී තිබුණේ නැහැ. ඇගේ තඹවන් රැළි කොණ්ඩය ඇගේ දෙනෙතට ගැලපුණ අතර ඇයට තිබුණේ අසාමාන්‍ය සම්භාවනීය පෙනුමක්.

"දවසක ඔයා රූප සුන්දරියක් වෙනවා, ක්ලැරිසා." බෙලින්ඩා තම කලාත්මක ඇසින් ක්ලැරිසා වයස විසි එකේදී කුමන රුවක් ගනු ඇතිදැයි දැක ඇගේ සිත් ඇද ගන්නා සුන්දර රූ සපුව ගැන අනාවැකි පළ කළා. "හොඳයි, හොඳයි. කැත තාරාවෙක් ලස්සන හංසයෙක් වුණ හැටි කතා කරමු !"

විල්ගේ මහත් සොම්නසට මෙන් ක්ලැරිසා ඇගේ සමීපතම මිතුරිය වුණා. තම අශ්වයා තන්ඩර් ගැන පමණක්ම සැලකිලි දැක්වූ හා ඊට දෙවනුව පීටර්ස් ගුරුතුමියට පමණක් ඇලුම් කළ විල් පිරිමි

දරුවෙකු සේ හැසිරුණු නිසා තම පන්තියේ මිතුරියක තෝරා ගනු ඇතැයි කිසිවෙකු සිතුවේ නැහැ. එහෙත් ඇය මිතුරියක තෝරාගෙන තිබූ අතර ඔවුන් නිතරම එක්ව අසූන් ගැන කතා බහේ යෙදුනා මෙන්ම හැකි සෑම විටම අසූන් පැද්දා. ගොන්ඩොලින් එය තැකුවේ නැහැ. වාර මැද නිවාඩුවේදී ක්ලැරිසා අශෝභන ලෙස හැඳ පැලඳ ගත් මහලු ස්ත්‍රියක් සමග පරණ ඔස්ටින් කාරයකින් පිටතට ගිය දා සිට ඈ ක්ලැරිසා ගැන තව දුරටත් උනන්දු වූවේ නැහැ.

ගොන්ඩොලින්ට අවශ්‍ය වූවේ උසස් ගණයේ මිතුරියක්. වාර මැද නිවාඩුවට පාසලට එන විට මෝටර් රථය හෝ පිරිසිදු කර නොගන්නා පිරිසක් සිටින සාමාන්‍ය පවුලක අයෙක් නොවෙයි ! එලෙස ග්වේන් නැවත වතාවක් කතා කිරීමට හෝ එකට සිනාසීමට කෙනෙක් නොමැතිව මිතුරියකගෙන් තොරව තනි වුණා.

"ඇලිසියාගේ ආපසු ඒම සමරන්න අපි මොනවා හෝ කළ යුතුයි." බෙලින්ඩා කිව්වා. "එයා හෙට එනවා."

"ඔව්, අපි මොනවා හරි කරමු." ඩැරල් එක්වරම කිව්වා.

"පිස්සු හැදෙන දෙයක් කරන්න ඕනැ" මැද මිදුලේ අනෙක් ඇරියත් සමග සිටි බෙටී කිව්වා.

"විජ්ජාවක් !" අයිරින් කිව්වා. "වාර දෙකක් පුරාම අපි මොකවත් දඟ වැඩක් කරලා නැහැ. ඒත් බලන්නකෝ ! අපිට මොකද වෙන්නේ. අපි ටික ටික වයසට යනවා."

"ඔව්, අපි විජ්ජා වැඩක් කරමු." සැලී කිව්වා. "කොහොම වුණත් විභාගත් ඉවරයි. අපි මහන්සි වුණා හොඳටම. අපිට ටිකක් හිනාවෙන්න ඕනැ."

"මොකක්ද අපි කරන විජ්ජාව ?" මෙල්විස් ඇසුවා. "බෙටී, මේ වාරයේ දී ඔයා මොකවත් ගෙනාවේ නැද්ද? ගිය වාරයේ ඔයා අරගෙන ආවා සීලිමෙන් එල්ලෙන මකුළුවෙක්. ඇත්තම එකෙක් වගේ, ඒත් අපිට ඒක පාවිච්චි කරන්න වෙලාවක් ලැබුණේ නැහැ. අපොයි, අපි ඒ මම්සලීගේ මේසය උඩට වැට්ටුවා නම් මම ආසාවේ හිටියේ මම්සලීගේ මුහුණ බලා ගන්න !"

සෑම කෙනෙක්ම කැකිරි පැළුවා. "මම මේ වාරයේ ඒක අරගෙන ආවේ නැහැ." බෙටී කනගාටුවෙන් කිව්වා. "මම නිවාඩුව ගත කළේ

ඇලිසියලාගේ ගෙදර. එයාගේ සහෝදරයෙක් ඒක ගත්තා. ඒත් මම කියන්නම්කෝ මා ළඟ තියෙන දේ !

"මොකක්ද ?" මහත් උද්වේගයට පත් හැමෝම ඇහුවා.

"මම ඒක තවම කරලා බලලා නැහැ." බෙට්ටි කිව්වා. "ඒක අමුතුම දෙයක්. රවුම් පැතලි පෙති වර්ගයක්. එක පැත්තක් ඇලෙනවා. ඒක සීලිමේ අලවන්න ඕනෑ."

"එතකොට මොකද වෙන්නේ ?" අයිරින් ඇහුවා.

"ඒ පෙත්තේ මොනවා හරි දියරයක් ගාන්න ඕනෑ." කළ යුතු දේ මතක් කර ගැනීමට උත්සාහ කරමින් බෙට්ටි කිව්වා. "ඔව්, මට මතක හැටියට එච්චරයි. ඊට පස්සේ හෙමින් ඒකෙන් බුබුලු මතු වෙලා පා වෙලා ඇවිත් 'පිං' ගාලා පුපුරනවා.

සෑම කෙනෙක්ම සතුටින් සවන් දීගෙන හිටියා. "බෙට්ටි, ඒක් නම් අපූරුම වැඩක් වගේ." අයිරින් ඇඩි ප්‍රීතියෙන් කිව්වා. "ඇලිසියාගේ ආපසු පැමිණීම සමරන්න අපි මේ විජ්ජාව හෙට කරමු. පෙති සීලිමේ අලවන්න අපි අකුළන ඉණිමඟ අරන් එමු. මම්සලී පන්තියට එන වෙලාවට සෙල්ලම පටන් ගනිමු. එයා තමයි විජ්ජාවලට අල්ලා ගන්න හොඳ"

මෙලෙස, ඉතා රහසිගතව, ලෝහ ඉණිමඟ හතර පන්තිය පිටත ඇති කබඩය පිටුපස සැඟවුණා. එමෙන්ම පසු දින උදෑසන පන්තිය පටන් ගැනීමට පෙර පෙති තුනක් සීලිමේ ඇලවුණ අතර දැරියන්ට මහත් විස්මයක් ගෙන දෙමින් ඒවා තදින් ඇලවුණා මෙන්ම ඒවා කිසිවෙකුට දැක ගත නොහැකි වුණා.

පෙති සමග එවා තිබූ කුඩා කුප්පියකින් විශේෂ දියරයක් ගත් බෙට්ටි ඉක්මනින් එය පෙතිවල ආලේප කළා. ඉන් පසුව අකුලන ලද ඉණිමඟ කබඩය පිටුපස හැංගුවා. ඒ මොහොතේම මම්සලීගේ අඩි උස් පාවහන්වලින් නැගෙන හඬ කොරිඩෝව ඔස්සේ ඇසෙන්නට වුණා. ඇයට දොර විවෘතව තැබීමට ඩැෆනි දොර වෙතට දුව ගිය අතර සෙසු අය තම ස්ථානවල සූදානම්ව නැඟී සිටියා.

"ස්තුතියි, ඩැෆනි" මම්සලී කඩිනමින් කිව්වා. "ඕ, ඇලිසියා - ඔයා ආපහු ඇවිදින් ඉන්න එක බොහොම හොඳා. සරම්ප හැදිලා හුඟාක් අමාරු වුණාද ?"

"නැහැ, ඇත්තටම, පළමු වෙනි දවසින් පස්සේ මම ඒක ඒ තරම් ගණන් ගත්තේ නැහැ." මඳ සිනාවක් පාමින් ඇලිසියා කිව්වා. ඇය හොඳින් සුවපත් වී සිටියා.

"ඔයාගෙන් කාටවත් සරම්ප බෝ නොවුණ එක හොඳයි." මම්සලී මේසය අසල වාඩි වෙමින් කිව්වා.

"මට ගිය අවුරුද්දේ සරම්ප හැදුනා." අයිරින් කී අතර තමන්ට ද සරම්ප වැලඳී තිබූ බව කතා කිරීමට මේක අවස්ථාවක් වුණා. මම්සලීට ඔවුන්ගේ කතාව නවත්වන්නට සිදු වූවේ එය මහත් විනෝද ජනක ඝෝෂාවක් වන්නට පටන් ගත් නිසයි.

"අපිට තවත් සරම්ප කතා ඕනෑ නැහැ." තදින් කී මම්සලී මෙය එතරම් සිනහා උපදවන කතා බහක් වූවේ මන්දැයි සැක මුසුව කල්පනා කරන්නට වුණා.

ඔවුන් වරින් වර සීලිම දෙසට ඉක්මන් සැක මුසු බැලුම් හෙළන්නට වුණේ අලුත් උපාය ක්‍රියාත්මක වන්නට ප්‍රමාද ඇයි දැයි කුතුහලයෙන් යුතුවයි. ඇලිසියා මේ පිළිබඳ සියල්ල අසා තිබූ අතර ඇත්තෙන්ම ඇගේ ආපසු පැමිණීම සැමරීමට යොදා ගෙන තිබූ අලුත් උපක්‍රමය ගැන ප්‍රීතියට පත්ව සිටියා. ඈ සැම කෙනෙකුටම කියා තිබුණා බුබුළු පුපුරණ විට, නොපෙනෙන බවත් 'පිං' ශබ්දය නොඇසෙන බවටත් බොරුවට අඟවන ලෙස.

"මම්සලීට හිතෙයි එයාගේ ඔළුව නරක් වෙලා කියලා."

"අද මම ඔයාලා පිළිතුරු ලියපු ප්‍රශ්න පත්‍රය සාකච්ඡා කරනවා." මඳ සිනාවක් සමග පන්තිය වටා බැලූ මම්සලී කිව්වා.

"ඔයාලා කියන්න ඔයාලා ලියපු උත්තරය, එතකොට මම කියන්නම් හරිද වැරදිද කියලා."

"අනේ, බැහැ, මම්සලී." ඇලිසියා අකමැත්ත ප්‍රකාශ කළා. "අපි විභාගය කරලා ඉවරනේ. අපි ඒක අමතක කරමු. එතකොට ඉවරනේ. අනික මම උත්තර ලිව්වේ හරිම නරකට නිසා මම දන්නවා මම අසමත් වෙලා කියලා. මට ආයෙත් විභාග ප්‍රශ්න ගැන හිතන්නවත් බැහැ."

අයිරින් බෙලින්ඩාට වැළමිටෙන් ඇන්නා. එක් අලු පැහැ

පෙත්තක් එහි ක්‍රියාකාරීත්වය ආරම්භ කර තිබුණා. අලු පැහැ කුඩා බුබුලක් සීලිමෙන් මතුවෙමින් තිබුණා. එය තවත් මඳක් විශාලව වෙන්ව වැටීමට තරම් බරින් යුතු වූ පසු ගැලවී සෙමින් පහළට පාවී ආවා. සියලුම මැජික් පෙති අලවා තිබුණේ ගුරු මේසයට ඉහළින් වූ අතර මම්සලී සිටගෙන සිටියේ එතැනයි.

මැඩගත් සුසුමින් යුතුව, දැරියෝ පහතට එන බුබුල දෙස බැලුවා. එය හරියටම මම්සලීගේ හිස මතට පහත් වන්නට මෙන් පැමිණි මඟ වෙනස් කර ඇගේ හිස කෙස්වල ගෑවී නොගෑවී ඇගේ වම් කන සමීපයට පාවී ගියා. ඒ අසලට සමීපවත්ම හදිසියේම එය 'පිං' යනුවෙන් ලෝහමය හඬක් නඟමින් පිපිරුණා.



මම්සලී උඩ විසි වුණා. "දෙවියනේ," ඇයට කියවුණා. "මොකක්ද ඒ ?"

"මොකක්ද, ඒ මොකක්ද කියන්නේ මම්සලී ?" සැලී අහිංසකව ඇසුවා.

"පිං ! අමුතු ශබ්දයක්" මම්සලී කී අතර නැවතත් 'පිං' ශබ්දයක් නැගුණා. "පිං - අමුතු දෙයක්. ඔයාට 'පිං' ඇහුණේ නැද්ද, සැලී ?"

"පිං ? මොකක්ද ඔයා ඇත්තටම කියන්නේ, සැලී ව්‍යාකූල වූ පෙනුමක් ආරූඪ කර ගනිමින් මම්සලීගෙන් ඇසූ අතර එය දැක ඩැරල්ට කෑ ගසා හිනා යන්නට ආවා. "ඔයා කියන්නේ 'පොං' නේද?"

"සමහර විට එයා කියන්නේ පිං-පොං වෙන්න ඕනැ." කී අයිරින් සිහින් හඬින් සිනාසෙන්නට පටන් ගත්තා. මෙල්විස්ට ද සිනා පහළ වුණා. ඩැරල් ඔවුන් දෙස රවා බැලුවා.

"මම මෙතැන ඉඳගෙන ඉන්නකොට හදිසියේම මගේ කන ළඟ 'පිං' ගෑවා." මම්සලී කිව්වා. "ඒක මගේ කන ඇතුළෙන් ආවා වගේ."

"ඕ, මම හිතුවා ඔයාට කවුරු හරි පිං - පොං කිව්වා කියලා." සැලී කිව්වා.

# 23

ඇත්තෙන්ම, මේ වන විට දැරියන්ට මහ හඬින් සිනා නොවී සිටීමට නොහැකි වුණා. ඩැරල්ගේ කම්මුල් දිගේ කඳුළු රූරා වැටෙන්නට වූ අතර වේදනා දෙන තම කුස දෙපස සැලී තදින් අල්ලා ගත්තා. අයිරින්ගේ හුස්ම හිරවී තිබූ අතර ඇලිසියා හා බෙටී කර ගත හැකි දෙයක් නොමැතිව එකිනෙකා තරයේ අල්ලා ගෙන සිටියා.

මම්සලී විලියම්ස් ගුරුතුමිය සොයා වේගයෙන් දුව ගියා. ඇය දෙවැනි පංතියේ උගන්වමින් සිටි අතර මම්සලීගේ හදිසි ඇතුළුවීමෙන් මවිතයට පත් වුණා.

"මිස් විලියම්ස් ! අනේ, මාත් එක්ක ඔයාගේ පන්තියට යන්න එන්නකෝ." මම්සලී පුදුමයට පත්ව සිටි විලියම්ස් ගුරුතුමියට ආයාචනා කළා. "එහෙ පිං ගානවා, ආයෙත් පොං ගානවා - හරියටම මගේ කන ඇතුළේ වගේ."

විලියම්ස් ගුරුතුමිය පුදුමයෙන් බැලුවා. "මම්සලීට පිස්සු වැහිලාද? මොකක්ද මේ පිං - පොං සිද්ධිය ?" දෙවැනි පන්තියේ ැරියෝ සිහින් සිනා හඬ නඟන්නට වුණා.

"මම්සලී, හරියටම මොකක්ද ඔයා කියන්නේ ?" විලියම්ස් ගුරුතුමිය තරමක කේන්තියෙන් ඇසුවා. "තව පැහැදිලි කරලා කියන්න."

"ඔයාගේ පන්තියේ පිං ගානවා - පොං ගානවා." මම්සලී ැවතත් කිව්වා. "ළමයින්ට ඒවා ඇහෙන්නේ නැහැ.. ඒත් මට ැහෙනවා. අනේ මට නම් බැහැ ඕ, මිස් විලියම්ස් එන්න මාත් ක්ක, අනේ !"

මම්සලී දණින් වැටීමට ආසන්න බව පෙනුණ හෙයින් ඉක්මනින් ැගිට ගත් විලියම්ස් ගුරුතුමිය මම්සලී සමග හතර පන්තිය වෙත

ගියා. ඇරියවා මදක් සනහව නතර කරගෙන කවුරුන් පැමිණේදැයි විමසිල්ලෙන් යුතුව බලා සිටියා. තවත් බුබුලක් දෙකක් පහළට පාව එක් බුබුලක් පහළට ඒමට ආසන්නව තිබුණා. තවත් බුබුලක් සකස් වෙමින් තියෙද්දී චිත් පුපුරා ගොස් තිබුණ අතර

"ෂ්..ෂ්... මිස් විලියම්ස් එන්නේ" මෙල්විස් හදිසියේම දොර අසල සිට කිව්වා. "හිනාව නවත්වල මූහුණ හදා ගන්න."

මහත් අමාරුවෙන් දැරියෝ මුහුණුවලට සාමාන්‍ය පෙනුමක් ආරූඪ කර ගනිමින් මම්සලී සමග විලියම්ස් ගුරුතුමිය ඇතුළට පැමිණෙත්ම නැගී සිටියා.

"මොකක්ද මේ ?" විලියම්ස් ගුරුතුමිය නොඉවසිල්ලෙන් ඇසුවා. "මොකක්ද මේ මම්සලී කියන්නේ ? මට මේකේ අගක් මුලක් තේරෙන්නේ නැහැ."

"පිං ගානවා" මෙය විලියම්ස් ගුරුතුමියට තේරුම් කර දීමට නොහැකිව කඩ වුණු බලාපොරොත්තුවෙන් යුතුව මම්සලී වැලපුණා.

"මම හිතන්නේ මම්සලීගේ කන්වල ශබ්දයක් තියෙනවා." ඇලිසියා විනීත ලෙස කිව්වා. "එයාට පිං - පොං ශබ්ද ඇහෙනවා කියලා කියනවා."

ඒ සමගම තවත් බුබුලක් මම්සලී අසලටම පහත්ව පිපිරුණා. "පිං !"

වියරුවෙන් උඩ පැන්න මම්සලී ඇගේ ඇඟිලිවලින් හරියටම විලියම්ස් ගුරුතුමියගේ ඉල ඇටවලට ඇන්නා. "ආයෙත් ඇහෙනවා, පිං ගෑවා !"

"මට එහෙම අනින්න එපා, මම්සලී" විලියම්ස් ගුරුතුමිය කේන්තියෙන් කියන විටම තවත් බුබුලක් පුපුරද්දීම තවත් බුබුලක් එකටම පිං හඬ නගමින් පිපිරුණ අතර විලියම්ස් ගුරුතුමිය ද ව්‍යාකූල වන්නට පටන් ගත්තා.

"මම යනවා." කී මම්සලී දොර දෙසට පියවර තැබුවා. "මම යනවා. මේ කාමරයේ මොකක් හරි අසික්කිත දෙයක් තියෙනවා."

විලියම්ස් ගුරුතුමිය මම්සලීව තදින් ආපසු ඇද්දා. "මම්සලී, ඔළුව පාවිච්චි කරන්න. මටත් ඒ ශබ්දය ඇසුණා. මට හිතා ගන්න බැරි ළමයින්ට ඇහෙන්නේ නැත්තේ ඇයි කියලයි !"

ඊළඟ පිං හඬ ඇසුණ බව පෙන්වීම හොඳ බව දැරියෝ හදිසියේම තීරණය කළා. එලෙස හඬ නැගෙත්ම ඔවුන් සියලු දෙනා එක හඬින් කෑ ගැසුවා.

"පිං ! මට ඇහුණා, මට ඇහුණා."

"නිශ්ශබ්ද වෙන්න." විලියම්ස් ගුරුතුමිය කී අතර දැරියෝ එක්වරම නිහඬ වුණා. ඒ මොහොතේම මම්සලීගේ නාසය මතට පාව ආ බුබුලක් වඩාත් මහත් වූ පිං හඬකින් පුපුරා ගියා.

මම්සලී යටි ගිරියෙන් හඬ තැළුවා. "ඒක බුබුලක්. මම බුබුලක් දැක්කා. ඒක පිං ගාලා පිපිරුණා."

අද උදයේ ඇත්තෙන්ම මම්සලී උමතු වී ඇති බව විලියම්ස් ගුරුතුමියට හිතුණා. "දැන් ඒ පාර මොකක්ද මේ 'බුබුල' ?

එවිට විලියම්ස් ගුරුතුමියම මම්සලී බුබුල ලෙස හැඳින්වූ දෙය දැක ගත්තා. බුබුල පාවී ඇගේ නාසය අසලින් ඇදී යත්ම ඇය මුව අයා හුස්ම ඉහළට ඇද ගත්තා. එය ඉතා කදිමට මේසය මතට පහත් වී පිං හඬ නගමින් පුපුරා අතුරුදහන් වුණා.

විලියම්ස් ගුරුතුමිය නිහඬව හිස හරවා සීලිම දෙස බැලුවා. ඇගේ තියුණු ඇස්වලට එහි අලවා තිබූ පැතලි පෙති තුන දැක ගත හැකි වුණා. එමෙන්ම එකක් මත සෙමින් බුබුලක් සැකසෙන අයුරුද දැක ගත හැකි වුණා. ඇය ආපසු පන්තිය දෙස හැරී බැලූ අතර සිනා නොවී සිටීමට වෙර දරන දැරියෝ ඉන් අසමත්ව අහිංසක ලෙස ඈ දෙස දෙනෙත් දල්වා සිටියා.

විලියම්ස් ගුරුතුමියගේ දෙතොල් ඇඹරුණා. මේ උපාය කෙසේ සකසන ලද්දක්ද යන්න ඈ දැන සිටියේ නැහැ. එහෙත් කෙසේ වෙතත් එය ඉතා දක්ෂ උපායක් බව ඇයට නොසිතා සිටිය නොහැකි වුණා. එමෙන්ම අසාමාන්‍ය ඕනෑම දෙයකදී මහත් භීතියට පත්වන මම්සලී බූපොන්ට් වැනි අයෙකුට එවැනි දඟ වැඩක් කිරීම තවත් හාස්‍ය උපදවන එකක් බව ඇයට සිතුණා.

"මම්සලී, පාඩම අවසාන කරන්න මේ පන්තිය මිදුලට අරගෙන යන්න." ඈ කිව්වා. "එතැන තවත් පිං ගාන්න දේවල් නැහැ. අනික නැවතත් කාමරය ඇතුළේ පන්තිය කරනවානම් ඊට ඉස්සර සේවිකාවට කියන්න ඕනෑ කොස්ස අරගෙන සීලිම පිහලා දාන්න කියලා."

මෙම අවසාන යෝජනාව මම්සලීව කොතරම් විමතියෙන් යුතු අඩියකට ඇද දැමුවේද යත් මම්සලී අයා ගත් මුවින් යුතුව පිටව යන විලියම්ස් ගුරුතුමිය දෙස ඇදහිය නොහැකිව බලා සිටියා. කොස්ස අරගෙන සීලිම පිහලා දාන්න ? මිස් විලියම්ස්ගේ ඔළුව නරක් වෙලා ද ?

මම්සලීගේ විමතිය පිරි මුහුණ දැක ගත් දැරියෝ කැකිරි පළා සිනාසෙන්නට වුණා. එමෙන්ම නැවතත් පිං හඬක් නැගුණ අතර මම්සලී කඩාගෙන බිඳගෙන දොරෙන් එළියට පැන දිව්වා. "දුවපියෝ!, අපි මිදුලට යනවා." ඈ කෑ ගැසුවා. "මේ පන්තියේ හුඟාක් බාධා තියෙනවා. එන්න ඉක්මනට අපි එළියට යමු. මෙහේ ඕනැ තරම් පිං - පොං ගෑවට කමක් නැහැ. අපට වැඩ කරන්න තියෙනවා."

පිං-පොං කතාව හා කුඩා පෙති පිළිබඳව මුළු පාසල පුරාම ඉතා ඉක්මනින් පැතිරුණ අතර එය ඇසූ දැරියෝ පුදුමයෙන් හුස්ම ඉහළට ඈ මහ හඬින් සිනාසුණා. හතර පන්තිය බැලීමට එන අමුත්තන්ගේ ප්‍රමාණය වැඩි වන තරමට විලියම්ස් ගුරුතුමියගේ ද කේන්තිය වැඩි වුණා.

ඈ දොර අසල මුසුනක් හේත්තු කර තැබුවා. "බලන්න එන ඕනෑම කෙනෙක් හය වතාවක් සීලිම පිහින්න ඕනෑ." ඈ කිව්වා. "අනික දැනගන්න - පෙනෙන තරමට වැඩේ ලේසි නැහැ."

"ඕ- මට නම් ඒකෙන් හොඳක් වුණා." එදින රාත්‍රියේ ඇලිසියා කිව්වා. "මගේ ජීවිතේට ඒ තරම් හිනාවෙලා තිබුණේ නැහැ. පළමු වෙනි බුබුල පුපුරද්දී මම්සලීගේ මුහුණ..... මට පණ යන්න ආවා !"

"මිස් විලියම්ස් වුණත් ඒක සෙල්ලමට ගත්තා, නැද්ද" ඩැරල් කිව්වා. "එයා විජ්ජාව දැක්කා. එයාටත් හිනා යන්න ආවා. මම දැක්කා එයාගේ තොල් ඇඹරෙනවා. එයාගේ පන්තියෙන් අයින් වෙලා පහේ පන්තියට යන්න මට දුකයි."

"ඔව් - ඊළඟ වාරයේදී අපි හුඟ දෙනෙක් පහේ පන්තියට යනවා." සැලී කිව්වා. "දෙවියනේ, ඉස්කෝලයේ හුඟාක් ඉහළ පන්තියකට යන එක හරි අමුතු දෙයක් වගේ පෙනෙන්නේ."

"මට නම් මේ වාරය හුඟාක් හොඳයි." ඩැරල් කිව්වා. "මගේ පන්ති නායිකාකම නැති වුණා වගේ ටිකක් නරක දේවල් සිද්ධ වුණත් මේ වාරයේ හුඟාක් විනෝදයෙන් ගෙවුණා."

"ඔයා ආයෙත් ඒ තත්ත්වයට පත් වුණ එක ගැන මට හුඟාක් සතුටුයි." රූත් හදිසියේම කිව්වා. මෑතක සිට ඇය තනිවම යමක් ප්‍රකාශ කරන්න පුළුවන් මට්ටමකට පැමිණ තිබුණා. ඈ ඩැරල් දෙස සෙනෙහසින් යුතුව බලා සිටියා. තම ගැටළුව නිරාකරණය කළ දා සිට ඈ ඩැරල් දෙස බැලුවේ මහත් ප්‍රශංසාවෙන් යුතුවයි.

වාරයේ ඉතිරි දින කීපය වේගයෙන් පියඹා ගියා. නිවාඩුවට වෙන්ව යන දවස ඉක්මනින්ම එළඹෙන බවක් පෙනුණා. සුපුරුදු කලබලකාරී බව උදා වුණා. ඇරියන් ඒ මේ අත දුවමින් කෑගසමින් ට්‍රන්ක පෙට්ටි අසුරන්නට හා නැති වූ අත් බෑග වැනි නොයෙක් දේ සොයන්නට වූ අතර මේ කලබලය ගුරුතුමියන්ව උමතු කරන්නට සමත් වුණා. ටෙනිස් පිති වැනි නොයෙක් දේ ගෙබිම පුරා විසිරී තිබුණ අතර ඒවා මතින් පැන පැන බඩු අසුරණ ඇරියන්ගේ සෝෂාව සෑම කුලුනකින්ම නැගෙන්නට වුණා.

දුම්රියෙන් පිටත් වන ඇරියන් මුලින් පිටත් වූ අතර ප්‍රීතියෙන් කෑගසමින් ඔවුන් මිදුල හරහා බස් රථ බලා කඩිනමින් දුව යන්නට වුණා. "අපිට ලියුම් එවන්න ! ලබන වාරයේ හමුවෙමු ! හොඳට ඉන්න බලන්න ! හුරේ !

නිතර නිතර අතුරුදහන් වන ෆෙලිසිටි සෙවීමට ඩැරල් ඔබ මොබ ගියා. සූසන් සමග ලිපින හුවමාරු කරගන්නා ෆෙලිසිටිව දැක ගැනීමට ඇයට හැකි වුණා. ජූන් දුම්රියෙන් පිටත් වන ඇරියන් සමග පිටත්ව තිබූ අතර ඇයට අත වනා සුබ පැතීමට හෝ ෆෙලිසිටි උනන්දු නොවූ බව ඩැරල් දැක ගෙන තිබුණා. එලෙස ඔවුන්ගේ මිතුරුදම අවසන්ව තිබුණා. හොඳටම හොඳයි. මේ වන විට ජූන් තව දුරටත් තම කුඩා නැගණිය ඒ මේ අත ඇදගෙන නොයනවා මෙන්ම ෆෙලිසිටිට දැන් තම දෙපයින් නැඟී සිටීමට හැකියාව ලැබී තිබෙන නිසා ජූන්ගේ කම්මුල හරහා පහරක් දීමට තිබූ ආශාව ඩැරල් අතහැර දමා තිබුණ ද ඩැරල් තවමත් කුඩා කපටි කෙල්ල, ජූන්ව අප්‍රිය කළා !"

"ෆෙලිසිටි ! මම ඔයාව හොයාගෙන ඇවිදින් ඉස්සරහා දොර ළඟදි ඔයා ළඟටම එද්දි ඔයා ආයෙත් අතුරුදහන් වුණා." ඩැරල් කිව්වා. "තාත්තා තව ටිකකින් කාර් එක අරගෙන එයි. දෙවියන්ගේ ාමෙට මා එක්ක ඇවිදින් ආයෙත් නම් එහේ මෙහේ යන්න එපා. යාගේ රවුම් තොප්පිය කොහේද ? නිවාඩු කාලයේදී අශ්වයෝ දිනවා නම් ඔයාට ඒක ගෙදර ගෙනියන්න වෙනවා."

"දැන් ටිකකට ඉස්සර ඒක මෙතැන තිබුණා." වටපිට බලමින් ෆෙලිසිටි කිව්වා. "ඕ, නැහැ. බලන්න - අර කැතී කියන යක්ෂ කෙල්ල ඒක අරගෙන. බූරුවෙක් වගේ පෙනෙන්නේ. ඒක එයාට හුඟාක් ලොකුයි. කැතී ! කැ...තී....! මගේ තොප්පිය ආපහු දෙනවා !"

"ෆෙලිසිටි ! මේ විදිහට කෑ ගහන්න වුවමනාවක් තියෙනවාද?" පොට්ස් ගුරුතුමිය ඒ අසලින් ගමන් කරද්දී ඇගේ කන් බිහිරි වීමට ආසන්න වූ නිසා ඇසුවා.

"ඕ, පොට්ටි. මම ඔයාට ආයුබෝවන් කිව්වේ නැහැ. පොට්ටි !" ෆෙලිසිටි හඬ තැළුවා. තම පන්තිභාර ගුරුතුමියට ෆෙලිසිටි පොට්ටි ලෙස අමතනු ඇසුණ ඩැරල් කම්පනයට පත් වුණා.

"ෆෙලිසිටි !" ඈ කතා කළා. "එයාට එහෙම කියන්න එපා."

"හරි ! ඔයානේ කිව්වේ වාරයේ අවසාන දවසේ ඕනෑම කෙනෙකුට එහෙම කතා කරන්න පුළුවන් කියලා." ෆෙලිසිටි කිව්වා. "පො...ට්..ටී..."

අයිරින්ගේ සංගීත භාණ්ඩ ඇසුරුම ගෙන බෙලින්ඩා පැමිණියා. "කවුරු හරි අයිරින්ව දැක්කාද ? එයා මේ සංගීත පෙට්ටිය හොය හොයා හිටියේ. මට ඒක හම්බ වුණා."

ඇය දැරියන් අතරේ අතුරුදහන් වෙද්දී කන් කෙඳිරි ගාමින් අයිරින් පැමිණියා. "අනේ මගේ සංගීත භාණ්ඩ කොහේද ? මම ඒක ටිකකට පැත්තකින් තියද්දීම කවුද මෝඩියෙක් ඒක උස්සාගෙන ගියා."

"ඒක බෙලින්ඩා ළඟ තිබුණා."

"කවුරු ළඟ ?"

"බෙලින්ඩා ළඟ. හේයි ! බෙලින්ඩා. බෙ-ලින්-ඩා !"

මම්සලී කන්වල ඇඟිලි ගසාගෙන මුහුණේ මහත් වූ කලකිරීමක පනුමකින් යුතුව පැමිණියා. "මේ ළමයි හැමෝටම පිස්සු හැදිලා ! ම මේ ඉන්නේ පිස්සන් කොටුවක ද ? මම උගන්වන්නේ මේ පිස්සු කල්ලෝ රැළකට ද ? අපොයි, මේ සෝෂාව ! මගේ කන් පසාරු රගෙන යනවා."

"මම්සලී ! මම්-සලී - ! ආයුබෝවන්. මගේ වාහනය ඇවිදින්"

"අපොයි, මමසලී ! ඔයා බිහිරි වෙලාද ?"

ක්ලැරිසා පැමිනුණ අතර මේ චකිතය මුසු විනෝදමත් වටාපිටාව දැක ඇගේ කොළ පැහැ දෙනෙත් තවත් දීප්තිමත්ව බැබළුණා.

"අම්මා ඇවිදින්" ඈ විල්ට කෑ ගැසුවා. "එන්න. එයාව හම්බ වෙන්න. එයාට දැනගන්න ඕනෑ නිවාඩු කාලයේදී ඔයාට අපේ ගෙදර එන්න පුළුවන් ද කියලා. විල්, ඇවිදින් අපේ අම්මා එක්ක කතා කරන්න."

විල් හා ක්ලැරිසා පිටතට එත්ම ගොන්ඩොලින් ද ඒ සමගම පිටතට පැමිනුණා. විශාල පියගැට පෙළ අසළට ඇදී විත් තිබුණේ දිලිසෙන අද්විතීය ගණයේ විශාල බෙන්ට්ලි මෝටර් රථයක්. තඹවන් හිස කෙස් ඇති ඉතාම මන බඳිනා රූ සපුවකින් යුත් කාන්තාවක් ඉන් පිටතට පා තැබුවා. ඇය ඉතා දැකුම්කලු ලෙස ඇඳ පැලඳ සිටි අතර ඇය සමගම සිටියේ ඉතා කඩවසම් හා සම්භාවනීය පෙනුමක් ඇති පුරුෂයෙක්.

"අම්මා !" ක්ලැරිසා කෑ ගැසුවා. "ඔයා ඇවිදින්. මේ විල්, ඔයා කිව්වේ නිවාඩුවේදී අපේ ගෙදර එන්න කියනවා කියලා."

දිලිසෙන මෝටර් රථයත්, එවැනි දෙමාපියනුත් දැක මවිතයට පත් ගොන්ඩොලින් මුව අයාගෙන බලා සිටියා. සැබැවින්ම ආඩම්බර විය හැකි දෙමව්පියෝ ! එහෙත් ඒ ක්ලැරිසාගේ දෙමව්පියන් විය හැක්කේ කෙසේ ද ? පරණ ඔස්ටින් මෝටර් රථයකින් පැමිණ, අවලස්සනට ඇඳ පැලඳ ගත් හිස කෙස් පැසුණ ඇගේ මව වාර මැද නිවාඩුවේදී පැමිණ ක්ලැරිසාව පිටතට කැඳවාගෙන යනු ග්වේන් දැක තිබුණා නේද ?

"ආයුබෝවන් ග්වේන්" ඇය අසලම සිටගෙන බලා සිටිනු දුටු ක්ලැරිසා කීව ද ඇයව දෙමව්පියන්ට හඳුන්වා දීමට ක්ලැරිසාට අවශ්‍ය වුණේ නැහැ.

"වාර මැද නිවාඩුවේදී ඔයාව එක්ක යන්න ආවේ ඔයාගේ අම්මා කියලයි මම හිතුවේ." තම පුදුමය සඟවා ගැනීමට අපොහොසත් වූ ග්වේන් කිව්වා.

"ඕ, නැහැ... ඒ මගේ ආයා." මෝටර් රථයට නගිමින් ක්ලැරිසා කිව්වා. "එදා අම්මාට එන්න බැරි වුණා. ඒ නිසා මිස් චෙරි ආවා පරණ කාර් එකෙන් මාව රවුමක් එක්ක ගෙන යන්න. ඒ මගේ අම්මා කියලා හිතුවා නම් ඒක ලොකු වැරදීමක්."

ග්වේන්ගේ මෝටර් රථය ඒ පසු පසම තිබූ අතර ලැසී මහත්මිය හිස පිටතට දමා අත වැනුවා.

"ග්වේන් ! කොහොමද ? ඔයාට දැන් හොඳටම සනීප පාටයි! දැන් අර ලස්සන බෙන්ට්ලි කාර් එකේ ගිය හරිම ලස්සන ළමයා කවුද? එයා ඉන්නෙත් ඔයාගේ පන්තියේ ද ?"

"ඔව්," තම මවට හාද්දක් දෙමින් ග්වේන් කිව්වා.

"ඕ, මම හිතන්නේ එයා ඔයාගේ යාළුවෙක් කියලා." ඇගේ මව කිව්වා. "මම කැමති අන්න ඒ වගේ ළමයින්ට තමයි."

"ඔයා එයාව ගිය වාරයේදිත් දැක්කා." ග්වේන් බුම්මාගෙන කිව්වා. "එදා ඔයා එයාට කැමතියි කිව්වේ නැහැ. ඒ තමා ක්ලැරිසා කාටර්."

ඩැරල් හා ෆෙලිසිටි එකිනෙකා දෙස බලා සිහින් සිනා හඬ නැගුවා. ග්වේන්ට ක්ලැරිසාගේ මිත්‍රත්වය නොලැබීම මොන තරම් දුකක් ද ! එසේ වූ නිසා මෙවර ක්ලැරිසා සමග නිවාඩු ගත කරන්න යන්නේ විල්, ග්වේන් නොවෙයි. අසරණ ග්වේන්ට කොහේ හෝ යාමට සුපුරුදු පරිදි කිසිවෙකුගෙන් ඇරයුම් ලැබුණේ නැහැ.

"අන්න අපේ කාර් එක" ෆෙලිසිටි හදිසියේම කෑ ගැසුවා. ඈ මම්සලීගේ ඉණ වටා අත යැව්වා. "ආයුබෝවන්, අපේ මම්සලීට. ලබන වාරයේදී හමුවෙමු."

"ඕ, හොඳ දුව !" මම්සලී කිව්වේ ෆෙලිසිටිගේ හදිසි වැලඳගැනීම ගැන ප්‍රීතියෙන්. ඈ ෆෙලිසිටිගේ දෙකම්මුලටම පුරවා හාදු දෙකක් දුන්නා. ෆෙලිසිටිගේ ප්‍රියජනක හැසිරීම දැක සෑම කෙනෙක්ම මඳ සිනාවෙන් යුතුව බලා සිටියා.

"ආයුබෝවන් !" ඩැරල් අත වනමින් සෙසු දැරියන්ට කෑ ගැසුවා. "සැප්තැම්බර් මාසයේදී හමු වෙමු. ඔන්න බලාගෙන බෙලින්ඩා, ඔයා ආගෙද තොප්පියක් පාගාගෙන ඉන්නේ !"

"ඒක මගේ. ඒක මගේ" ෆෙලිසිටි කෑ ගැසුවා. "ඔයාගේ අලි කකුල් පැත්තකට ගන්න, බෙලින්ඩා."

"ලොකු අයට විනීතව කතා කරන්න කියලා ඔයා ඔයාගේ නංගිට උගන්වන්න !" බෙලින්ඩා කෑ ගසන අතරේ ඩැරල් හා ෆෙලිසිටි පියගැට පෙළ බැස ගෙන ගියේ අසරණ නිවාස පාලිකාව ද පෙරළාගෙනයි.

"ආයුබෝවන් මේට්‍රන් ! ආයුබෝවන් මිස් විලියම්ස් ! ආයුබෝවන් පොට්ටි !, හලෝ අම්මා ! තාත්තා, ඔයා අද ලස්සනයි ! හුරේ ! හුරේ! දැන් නිවාඩු කාලේ !"

සතුටින් උමතු වූ දැරියෝ දෙදෙන මෝටර් රථය තුළට පැන ගත්තා. ඔවුන් ජනේලයෙන් හිස එළියට දමා ගත්තා.

"ආයුබෝවන් ! ප්‍රීතිමත් නිවාඩුවක් ! නැවත ඉක්මනින්ම හමුවෙමු! අනේ අපේ මැලෝරි ටවර්ස් - අපි ආපසු සැප්තැම්බරයේදී එනවා!"

මීළඟට මැලෝරි ටවර්ස් පාසල - 05

**"අක්ක නඟාලා"** තුළින් හමුවෙමු.